2025



# වාර්ෂික කාර්යසාධන වාර්තාව

රාජ්‍ය පරිපාලන,පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# 2025

## රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

*අමාත්‍යාංශයේ වැය ශීර්ෂය වන 130 ට අදාළ සමස්ත මූල්‍ය වාර්තාව රාජ්‍ය පරිපාලන අංශයෙහි පිටු අංක **41-47** යටතේ ඇතුළත් කර ඇති අතර විගණන වාර්තාව අවසානයෙහි අමුණා ඇත.*

| | රාජ්‍ය පරිපාලන අංශය | ස්වදේශ කටයුතු අංශය | පළාත් සභා සහ පළාත් පාලන අංශය |
|---|---|---|---|
| | නිදහස් චතුරස්‍රය<br>කොළඹ 07<br>ශ්‍රී ලංකාව | “නිල මැදුර”<br>ඇල්විටිගල මාවත<br>නාරාහේන්පිට<br>කොළඹ 05<br>ශ්‍රී ලංකාව | අංක 330<br>ආචාර්ය ද කොල්වින් ආර්.ද සිල්වා මාවත<br>(යූනියන් පෙදෙස)<br>කොළඹ 02<br>ශ්‍රී ලංකාව |
| | 011-2696211/13,<br>011- 2166000 | 011 - 2050450 | 011 – 2 305326 / 3272303280 |
| | 011–2695279 | 011 - 2551071 | 011 - 2699720 |
| | information@pubad.gov.lk | info@moha.gov.lk | info@pclg.gov.lk |
| | www.pubad.gov.lk | www.moha.gov.lk | www.mpclg.gov.lk |

## රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන ගරු අමාත්‍යතුමාගේ පණිවිඩය



ශ්‍රී ලංකාවේ රාජ්‍ය යාන්ත්‍රණයේ පරිපාලන කේන්ද්‍රස්ථානය වන රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ 2025 වර්ෂයේ කාර්යසාධන වාර්තාව සහ ගිණුම් ප්‍රකාශනය සඳහා මෙලෙස පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම පිළිබඳව මම බෙහෙවින් සතුටු වෙමි.

පසුගිය වසර පුරා අප අමාත්‍යාංශය අවධානය යොමු කළේ හුදෙක් පරිපාලනමය කටයුතු පවත්වාගෙන යාමට පමණක් නොව, වඩාත් ඵලදායී, විනිවිදභාවයකින් යුතු සහ ජනතාවාදී රාජ්‍ය සේවාවක් නිර්මාණය කිරීම කෙරෙහි ය. විශේෂයෙන් ම, අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන දෙපාර්තමේන්තු හා ආයතන මගින් රාජ්‍ය සේවා සැපයීම වඩාත් කාර්යක්ෂම කිරීමටත්, පළාත් සභා හා පළාත් පාලන ආයතන හරහා ග්‍රාමීය මට්ටමේ සංවර්ධන ප්‍රතිලාභ සෘජුව ම මහජනතාව වෙත සමීප කිරීමටත් අපට හැකි විය. රාජ්‍ය සේවාව ඩිජිටල්කරණය තුළින් රාජ්‍ය ආයතන අතර සම්බන්ධීකරණය සහ මහජන සේවා කටයුතු වඩාත් වේගවත් කිරීම සඳහා නව තාක්ෂණික ක්‍රමවේද හඳුන්වා දීමට හැකි වීම වත්මන් රජයේ ප්‍රමුඛතම වැඩසටහනක් වන ඩිජිටල් ආර්ථිකය ගොඩනැඟීමට මනා පසුබිම් සැලසීමක් විය. පළාත් සභා සහ පළාත් පාලන ආයතන හරහා ප්‍රාදේශීය මට්ටමේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වැඩි ප්‍රමුඛතාවයක් ලබා දීම මගින් අප පළාත් පාලන ව්‍යුහය සවිබල ගැන්වීමකට ප්‍රවේශ විය.

දීර්ඝ කාලයක් බඳවා ගැනීම අත්හිටුවා තිබූ රාජ්‍ය සේවයේ විවිධ සේවා ශ්‍රේණි සඳහා නවක නිලධාරීන් බඳවා ගැනීමත් රාජ්‍ය නිලධාරීන්ගේ කුසලතා වර්ධනය වෙනුවෙන් නව පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත් ඔස්සේ වෘත්තීය අභිමානය සුරැකෙන ලෙස මානව සම්පත් කළමනාකරණය හා සංවර්ධනය කරලීමට හැකි වීම සතුටුදායක ය. එපමණක් නොව සීමිත සම්පත් කළමනාකරණය කරමින් උපරිම ඵලදායීතාවයක් අත්කර ගැනීම සඳහා දැඩි මූල්‍ය විනයක් අනුගමනය කිරීමට පියවර තැබීම තුළින් නාස්තිය අවම කර ගැනීමට හැකි වීම සුබදායී ලක්ෂණයකි.

අඩු ආදායම්ලාභී ග්‍රාමීය පවුල්වල ජීවනෝපාය මාර්ග ශක්තිමත් කරමින් සහ ප්‍රජා සහභාගීත්වය දිරිගන්වමින් දිළිඳුකම පිටුදැකීම සඳහා 2025 ආරම්භ වූ 'ප්‍රජා ශක්ති' වැඩසටහන ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා පළාත් පාලන ආයතන හරහා ගොඩනැගෙන සම්බන්ධීකරණයෙන් ග්‍රාමීය ආර්ථිකය නගාසිටුවීමට දායක වන පරිදි සිදුකරන සේවා සැපයීම කෙරෙහි ඉදිරියටත් අමාත්‍යාංශයේ විශේෂ අවධානයක් යොමු කළ යුතු ය. එමෙන් ම වඩාත් පිරිසිදු හා මනරම් පරිසරයක් උදෙසා ක්‍රියාත්මක වන 'ක්ලීන් ශ්‍රී ලංකා' වැඩසටහන යටතේ, පළාත් පාලන ආයතන ඒකාබද්ධ කරමින් විධිමත් අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලියක් ජාතික මට්ටමින් ස්ථාපිත කිරීමට 2025 වර්ෂයේදී අපට හැකි විය.

මෙම ජයග්‍රහණ සාක්ෂාත් කර ගැනීම සඳහා කැපවීමෙන් කටයුතු කළ අමාත්‍යාංශ ලේකම්තුමා ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයටත්, අනෙකුත් සියලු ම අනුබද්ධ ආයතනවල නිලධාරීන්ටත් මාගේ ස්තුතිය පිරිනමමි.

2026 වර්ෂය සඳහා අප පා තබන්නේ, මීට වඩා දියුණු සහ ජනතාවට වගකියන රාජ්‍ය පරිපාලන ව්‍යුහයක් ගොඩනැගීමේ අභිලාෂය ඇතිව ය. මෙම කාර්යසාධන වාර්තාව අපගේ පසුගිය වසරේ ගමන් මග විමසා බැලීමටත්, අනාගත සැලසුම් වඩාත් ශක්තිමත් කිරීමටත් මනා පිටිවහලක් වනු ඇතැයි මම විශ්වාස කරමි.

**මහාචාර්ය චන්දන අබයරත්න (පා.ම.)**
**රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය**

# පළාත් සභා සහ පළාත් පාලන නියෝජ්‍ය අමාත්‍යතුමන්ගේ පණිවුඩය



අප අමාත්‍යාංශයට පැවරී ඇති වගකීම වනුයේ රාජ්‍ය අංශයේ ප්‍රධාන ක්ෂේත්‍රයක් වන පළාත් සභා සහ පළාත් පාලන ආයතන සඳහා සහායවීම හා මඟ පෙන්වීමයි. දියුණු රටවල ඉහළ කාර්ය සාධනයක් අත්කර ගෙන ඇති පළාත් පාලන ආයතන මට්ටමට අපගේ පළාත් පාලන ආයතන ද ඔසවා තැබීම අපගේ අරමුණ වේ.

දියුණු ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් ගොඩනැගීමට නම් ප්‍රශස්ථ ප්‍රාදේශීය පරිපාලන ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම අත්‍යවශ්‍ය වන අතර ඒ සඳහා පළාත් සභා සහ පළාත් පාලන ආයතන ව්‍යුහයේ පවතින සාධණීය තත්ත්වයන් මෙන්ම දුර්වලතා ද හඳුනාගත යුතුව ඇත. විශේෂයෙන් නගර සභා ආඥාපනත සහ මහ නගර සභා ආඥාපනත, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්මත වීමටත් පෙර පනවන ලද නීතීන් වන අතර ප්‍රාදේශීය සභා පනතද සංශෝධනය විය යුතුව ඇත.

අතිශය ශක්තිමත් ආණ්ඩුවක් ජනතාව විසින් පත්කරනු ලැබුවේ පොහොසත් රටක් ලස්සන ජීවිතයක් ගත කිරීමේ අහිංසක බලාපොරොත්තු සිත් තුළ රෝපණය කර ගනිමින් බව අප දන්නා කරුණකි. එය සාක්ෂාත් කර ගැනීම සඳහා ග්‍රාමීය දිළිඳුකම පිටුදැකීම, ඩිජිටල් ආර්ථිකයක් හා Clean Sri Lanka යන ප්‍රධාන උපාය මාර්ගික කුළුණු තුන මත තිරසාර සංවර්ධනයක් ගොඩනැගීම අත්‍යවශ්‍ය කරුණකි. එහිදී අපට දායකවිය හැකි ප්‍රධාන රාජ්‍ය මෙවලම පළාත් පාලන ආයතන බව මාගේ විශ්වාසයයි. ඒ සඳහා යන ගමනේදී මතුවන අභියෝගවලට ශක්තිමත්ව මුහුණ දෙමින් නිර්මාණශීලී ප්‍රවේශයක ගමන් කළ යුතුව ඇත.

ඒ නිසාම වසර දෙකකට ආසන්න කාලයක් අඛණ්ඩව ආර්ථිකය සංකෝචනය වීමෙන් පසු 2024 වසරේ 5% ක ආර්ථික වර්ධනයක් වාර්තා වීමත්, වසර 6 කට පසු සැම කාර්තුවකම සැලකිය යුතු ආර්ථික වර්ධන අනුපාතයක් වාර්තා කිරීමත් දළ දේශීය නිෂ්පාදනයෙන් 2.2% ප්‍රාථමික ගිණුමේ අතිරික්තයක් වාර්තා කිරීමත් 2024 වර්ෂයේ පෙන්වීම පශ්චාත් අර්බුදයෙන් පසු ආර්ථික ප්‍රකෘතියෙහි කැපී පෙනෙන සංධිස්ථානයක් පිළිබිඹු කරන්නකි. රාජ්‍ය ණය කළමනාකරණය කර ගනිමින් සංවර්ධනය සඳහා ප්‍රාග්ධනය යෙදවිය හැකි ශක්තිමත් මූල්‍ය ස්ථාවරත්වයක් ගොඩනගා ගෙන ඇත. 2025 වර්ෂය සඳහා පළාත් සභා සඳහා විශාල ප්‍රතිපාදන ප්‍රමාණයක් රජය විසින් වෙන් කර දෙන ලදී. 2025 වර්ෂයේ පළාත් සභා ක්‍රියාවලියේ ප්‍රගතිය සමාලෝචනය මූලික කර ගනිමින් කාර්යක්ෂමතාවය පිළිබඳ පසු විපරමක් පළාත් මට්ටමින් සිදුකර ගන්නා ලදී. ඒ සඳහා පළාත් රාජ්‍ය නිලධාරීන් මෙන්ම ඒ ඒ පළාත් වල දේශපාලන අධිකාරියද සක්‍රියව මැදිහත් විය. දැනට ලඟා වී ඇති ඉලක්කයන් මෙන්ම තවදුරටත් අපේක්ෂිත ඉලක්කයන් සඳහා ලඟාවීමේදී අප මුහුණදෙන ගැටළු ද සමාලෝචනයට ලක් විය. එහිදී, උතුරේ ජනතාවගේ මෙන්ම නිලධාරීන්ගෙන් දැකගත් ප්‍රබෝධය ද සතුට දනවන්නක් විය.

2025 මැද සිට පළාත් පාලන ආයතනද මහජන නියෝජිතයන් ගෙන් සමන්විත වූ අතර, එහි ප්‍රධානීන් මෙන්ම සභිකයන්ද බොහොමයක් නවක මුහුණු වීම හේතුවෙන් ඔවුන්ට පළාත් පාලන ක්‍රමවේදය හා එහි කටයුතු පිළිබඳ ප්‍රමාණාත්මක අවබෝධයක් ලබාදීමට අමාත්‍යාංශයක් ලෙස අපට හැකිවිය. පළාත් මට්ටමින් ඒ සඳහා දැක්වූ සහයෝගය ද අගය කරමි.

පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල කාර්යයන් වන ආපදා කළමනාකරණය, යටිතල පහසුකම් සංවර්ධනය, පළාත් මාර්ග සංවර්ධනය, පිරිසිදු පරිසරයක් නිර්මාණය කිරීම, පුහුණු හා ධාරිතා වර්ධනය ආදිය සඳහා අමාත්‍යාංශය සක්‍රියව මැදිහත් විය. විශේෂයෙන් මහජනතාවට හා සංචාරකයින්ට සනීපාරක්ෂක පහසුකම් සැලසීම, පළාත් පාලන ආයතනවල ආදායම් උත්පාදනය සඳහා වන ව්‍යාපෘති ආරම්භ කිරීම, කාර්යය සාධනය මත පදනම්ව ප්‍රාග්ධන ප්‍රදානය, ද්‍රව්‍ය ප්‍රතිශෝධන මධ්‍යස්ථාන හා ජලය සහ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන ඉදිකිරීම, ග්‍රාමීය පාලම් ව්‍යාපෘති, නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සැපයීම, මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය, මහ කොළඹ ජල හා අපජල කළමනාකරණය වැඩි දියුණු කිරීම, සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය ආදිය සඳහා දේශීය මූලධනය මෙන්ම විදේශීය ආධාර සපයන ජාත්‍යන්තර ආයතනවල අරමුදල් හා ආධාර දෙන විදේශීය රාජ්‍යයන්ගේ මූල්‍ය ආධාර මත ක්‍රියාත්මක කිරීමට හැකිවිය. මෙම ව්‍යාපෘති නිසි කලට ක්‍රියාත්මක කිරීමේ අභියෝගයද අප භාරගත යුතුව ඇත.

වසර 9 කට පසු පළාත් පාලන ආයතන 341 ආවරණය වන පරිදි පළාත් පාලන සතියක් ක්‍රියාත්මක කිරීමට හැකිවීම සතුටට කරුණක් වන නමුත් එහි ක්‍රියාකාරකම් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමේ අභියෝගයට සාර්ථකව මුහුණ දිය යුතුව ඇත.

අකාර්යක්ෂමව පැවැති පළාත් පාලනය සඳහා වන ශ්‍රී ලංකා ආයතනය සඳහා නව පාලක මණ්ඩලයක් පත්කර කාර්යක්ෂමව ක්‍රියාවට නංවමින් එහි අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට හැකිවීම අප ලැබූ ජයග්‍රහණයකි.

අපට පැවරී ඇති වගකීම් සඳහා වගවෙමින් ජනතා අවශ්‍යතාවයන් ඉටුකිරීමට කැපවෙන අතර ඒ සඳහා නොමඳ සහයක් ලබාදෙන ගරු රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාට, අමාත්‍යාංශ ලේකම්තුමා ඇතුළු සියළුම කාර්යය මණ්ඩලයට මාගේ අවංක ස්තූතිය පල කරමි.

**පී. රුවන් සෙනරත් (පා.ම.)**

පළාත් සභා සහ පළාත් පාලන නියෝජ්‍ය අමාත්‍ය

# රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ

## ලේකම්ගේ සුබ පැතුම් පණිවිඩය



2024 හා 2025 වර්ෂවල පැවති මැතිවරණවලින් පසු රට තුළ පෙන්නුම් කළ දේශපාලන ස්ථාවරත්වයත් සමඟ ශ්‍රී ලංකා ආර්ථිකය යළි යථා තත්ත්වයට පත් වෙමින් පැවති අතර ඒ සඳහා, නව රජය විසින් අනුගමනය කල නාස්තිය හා දූෂණය පිටුදැකීම පදනම් කරගත් සාර්ව ආර්ථික ප්‍රතිපත්තීන් හේතුවෙන් දේශීය-විදේශීය ආයෝජකයින්ගේ විශ්වාසය නව රජය කෙරෙහි වැඩි දියුණු විය.

2025 වර්ෂයට අදාළව මෙම අමාත්‍යාංශය සඳහා වෙන් කළ ප්‍රතිපාදන අමාත්‍යාංශය වෙත පැවරී ඇති කාර්යභාර හා වගකීම්වලට ප්‍රමුඛත්වය ලබා දෙමින් අනවශ්‍ය වියදම් සීමා කරමින්, දැඩි මූල්‍ය විනයක් යටතේ කාර්යක්ෂමව යොදවා ගැනුණි. ඒකාබද්ධ සේවා, දීප ව්‍යාප්ත සේවා ඇතුලු අනෙකුත් සේවාවන් සඳහා බඳවාගැනීම්, උසස්වීම් සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම, ස්ථාන මාරුවීම්වලට අදාළ ක්‍රියාවලිය පවත්වාගෙන යාම, නවක පත්වීම්ලාභී මාණ්ඩලික නිලධාරීන් සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය හරහා සේවාරම්භක පුහුණු ලබා දීම, එම ආයතනය හරහා ඒකාබද්ධ හා දීප ව්‍යාප්ත සේවාවන්හි සියලුම ශ්‍රේණීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම, දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය හරහා නිලධාරීන් වෙත පාඨමාලා ලබාදීම, අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය සඳහා ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන් මෙහෙයවීම හා නිලධාරීන්ගේ පශ්චාත් උපාධි සඳහා මූල්‍ය පහසුකම් සැපයීම සිදු කෙරේ. තව ද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සම්බන්ධ නිරීක්ෂණ, චක්‍රලේඛ නිකුත් කිරීම, 2025 අයවැය අනුව නව වැටුප් වැඩිවීම ක්‍රියාත්මක කිරීම, විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ සුබසාධනය, නව විශ්‍රාම වැටුප් සංශෝධන ක්‍රියාත්මක කිරීම, රජයේ නිවාඩු නිකේතන හා අමාත්‍යාංශ ගොඩනැඟිලි නඩත්තු කිරීම වැනි කටයුතු ද අඛණ්ඩව සිදු විය.

දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරී වසම් හා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව ආදී ආයතන මඟින් මහජනයාගේ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීම්, 1905 මහජන පැමිණිලි සේවාව පවත්වාගෙන යාම, අස්වැසුම වැනි ජනතා සුබසාධනයන්ට අදාළ කාර්යයන් ද ඩිජිටල්කරණය සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමට ද පියවර ගනිමින් පවතී.

එමෙන්ම "ක්ලීන් ශ්‍රී ලංකා" වැඩසටහනට සමගාමීව සියලු රාජ්‍ය ආයතන ආවරණය කරමින් "සෙයිරි සතිය" ද ක්රියාත්මක කරන ලදි.මහා භාණ්ඩාගාරය හරහා පළාත් සභා හා පළාත් පාලන අංශ සඳහා වෙන් කළ ප්‍රතිපාදන භාවිතා කරමින් ජනතා යහපැවැත්ම ඉහළ නැංවීම සඳහා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ, රොන්මඩ කළමනාකරණ සහ කසල කඳු පුනරුත්ථාපන ව්‍යාපෘති ජාතික හා පළාත් මට්ටමින් ක්‍රියාත්මක විය. ඒ යටතේ 2025 වසරේදී "පුනරුදයේ පුරවරය" නමින් පළාත් පාලන සතියක් දිවයිනම ආවරණය වන පරිදි ක්‍රියාත්මක කරන ලදී. මෙවැනි ව්‍යාපෘතින්හී දී දේශීය ණය සහ සංවර්ධන අරමුදල මඟින් සුවිශේෂි කාර්යභාරයක් ඉටු කරනු ලැබේ.

මෙම කාර්යභාරයන් සාර්ථකව හා ඵලදායීව ඉටු කිරීම සඳහා මඟ පෙන්වීම හා උපදෙස් ලබාදුන් ගරු රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය මහාචාර්ය ඒ.එච්.එම්.එච්.අබයරත්න මැතිතුමාටත්, සහයෝගය ලබාදුන් ගරු පළාත් සභා සහ පළාත් පාලන නියෝජ්‍ය අමාත්‍ය පී.රුවන් සෙනරත් මැතිතුමාටත්, මාගේ ගෞරවය හා ස්තූතිය පළ කරමි.

මෙම කාර්යභාරයන් සාර්ථකව හා ඵලදායීව ඉටු කිරීම සඳහා මඟ පෙන්වීම හා උපදෙස් ලබාදුන් ගරු රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය ආචාර්ය ඒ.එච්.එම්.එච්.අබයරත්න මැතිතුමාටත්, සහයෝගය ලබාදුන් ගරු පළාත් සභා සහ පළාත් පාලන නියෝජ්‍ය අමාත්‍ය පී.රුවන් සෙනරත් මැතිතුමාටත්, මාගේ ගෞරවය හා ස්තූතිය පළ කරමි.

එමෙන්ම, අමාත්‍යාංශයේ කාර්යභාරය සාර්ථකව ඉටු කිරීම සඳහා කැප වූ අතිරේක ලේකම්වරුන්, අධ්‍යක්ෂ ජනරාල්වරුන්, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරුන්, ප්‍රධාන මූල්‍ය නිලධාරීන් ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයටත්, අමාත්‍යාංශයට අනුයුක්ත දෙපාර්තමේන්තු, සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනවල ප්‍රධානීන් සහ කාර්ය මණ්ඩලයටත්, මාගේ හදපිරි ස්තූතිය පළ කරමි.

තවදුරටත් රාජ්‍ය සේවයේ කාර්යක්ෂමතාවය හා ඵලදායිත්වය ඉහළ නැංවීමටත් මහජන සේවා සැපයීම හා සංවර්ධන කාර්යයන් සඳහා සැම දෙනාගේම සාමූහිකව ක්‍රියාත්මක කිරීම හා සහය අපේක්ෂා කරමි.

**එස්. ආලෝකබණ්ඩාර**
**ලේකම්**
**රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය**

# පෙළගැස්ම


| # | අංශය | වර්ණය | පිටු අංක |
|---|---|---|---|
| 1. | රාජ්‍ය පරිපාලන | | 1 - 74 |
| 2. | ස්වදේශ කටයුතු | | 1 - 64 |
| 3. | පළාත් සභා සහ පළාත් පාලන | | 1 - 96 |

# රාජ්‍ය
# පරිපාලන
# අංශය

## පරිච්ඡේද


01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ ........ 1
1.1. හැඳින්වීම ........ 1
1.2. දැක්ම, මෙහෙවර හා අරමුණු ........ 1
1.3.රාජ්‍ය පරිපාලන අංශයේ ප්‍රධාන කාර්යයන් ........ 2
1.4. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු සහ ආයතන ........ 2
1.5.සංවිධාන සටහන ........ 3
02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම ........ 4
2.1. දීපව්‍යාප්ත සේවා ........ 4
2.1.1. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවා අංශය........ 4
2.1.2. ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවා අංශය ........ 4
2.1.3 ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා අංශය........ 5
2.1.4. ශ්‍රී ලංකා පරිපාලන සේවා අංශය........ 6
2.1.5. ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවා අංශය ........ 6
2.1.6. ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවා අංශය ........ 7
2.1.7. ශ්‍රී ලංකා තාක්ෂණ සේවය*........ 7
2.2. ඒකාබද්ධ සේවා අංශය ........ 8
2.2.1.භාෂා පරිවර්තක සේවය........ 8
2.2.2.පුස්තකාලයාධිපති සේවය........ 8
2.2.3. සංවර්ධන නිලධාරි සේවය ........ 8
2.2.4. කළමනාකරණ සේවා නිලධාරී ........ 9
2.2.5. රියදුරු සේවය........ 9
2.2.6.කාර්යාල කාර්ය සහයක සේවය........ 10
2.2.7.තොරතුරු සන්නිවේදන තාක්ෂණ සේවය ........ 10
2.3. අභ්‍යන්තර විගණන අංශය ........ 10
2.3.1. සපුරාගෙන ඇති ඉලක්ක........ 11
2.4.අභ්‍යන්තර පාලන අංශය ........ 16
2.4.1.සපුරාගෙන ඇති ඉලක්ක........ 16
2.4.2.අපේක්ෂිත ඉලක්ක ........ 17
2.5. ආයතන අංශය........ 17
2.5.1.සපුරාගෙන ඇති ඉලක්ක........ 17
2.5.2. අපේක්ෂිත ඉලක්ක ........ 24

2.6. නිවාස සංවර්ධන අංශය ........ 24
2.6.1. සපුරාගෙන ඇති ඉලක්ක ........ 25
2.6 2.අපේක්ෂිත ඉලක්ක ........ 27
2.7. විශ්‍රාම වැටුප් අංශය ........ 28
2.7.1. සපුරාගෙන ඇති ඉලක්ක ........ 29
2.8. රාජ්‍ය සේවා ප්‍රතිසංස්කරණ අංශය ........ 30
2.8.1. සපුරාගෙන ඇති ඉලක්ක ........ 30
2.9. මූල්‍ය අංශය ........ 31
2.9.1. සපුරාගෙන ඇති ඉලක්ක ........ 31
2.10. තොරතුරු තාක්ෂණ අංශය ........ 31
2.10.1. සපුරාගෙන ඇති ඉලක්ක ........ 31
2.11. මානව සම්පත් සංවර්ධන අංශය ........ 34
2.11.1. සපුරාගෙන ඇති ඉලක්ක ........ 34
03.පරිච්ඡේදය - වර්ෂය සඳහා සමස්ථ මූල්‍ය කාර්යසාධනය ........ 41
3.1.මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය ........ 41
3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය ........ 42
3.2.1. අක්මුදල් ගැලපුම් ගිණුම ........ 43
3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය ........ 44
3.4. මූල්‍ය ප්‍රකාශ සටහන් ........ 45
3.5. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය ........ 46
3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය ........ 46
3.7. මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන ........ 46
3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය ........ 47
04. පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක ........ 48
05. පරිච්ඡේදය - 2025.12.31 -දිනට තිරසර සංවර්ධන අරමුණු )SDG) ලගා කරගැනීමේ ප්‍රගතිය........ 49
06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ........ 51
6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය........ 51
6.2 කාර්ය මණ්ඩල විස්තරය ........ 52
6.3 කාර්ය මණ්ඩල ධාරිතා සංවර්ධනය ........ 55
07. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ අනුකූලතා වාර්තාව ........ 67

# 01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ

## 1.1 හැඳින්වීම

සිවිල් පරිපාලනයේ කේන්ද්‍රස්ථානය වෙමින් ජනතා කේන්ද්‍රීය රාජ්‍ය සේවයක් වෙනුවෙන් රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, රාජ්‍ය යාන්ත්‍රණය තුළ ප්‍රමුඛතම කාර්යභාරයක් සිදු කරනු ලබයි. එහිදී රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය, මානව සම්පත් කළමනාකරණය, ආයතනික සංවර්ධනය පෙරදැරි කොට ගෙන ක්‍රියාත්මක වන පුළුල් විෂය පථයක් සහිත සුවිශාල කාර්යභාරයක් අමාත්‍යාංශයේ රාජ්‍ය පරිපාලන අංශය තුළින් ඉටු වේ. ජාතික සංවර්ධන ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා දීප ව්‍යාප්ත සේවාවන් හා සමස්ථ ඒකාබද්ධ සේවාවන්හි පරිපාලන කටයුතු සිදු කරමින් රාජ්‍ය සේවය තුළ මානව සම්පත වඩාත් ඵලදායී ලෙස කළමණාකරණය කිරීම මෙම අංශයේ මූලික පරමාර්ථය වේ.

මහජනතාවට තෘප්තිමත් රාජ්‍ය සේවයක් සැපයීම සඳහා සාධාරණත්වය, සමරූපීතාවය හා කාර්යක්ෂමතාවය කෙරෙහි විශේෂයෙන් සැලකිලිමත් වෙමින්, පරිපාලන විධිවිධාන හා රෙගුලාසි සකස්කිරීම මෙම අමාත්‍යාංශය සතු මූලික වගකීමකි. ඒ අනුව ආයතන සංග්‍රහය හා අදාල රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ සකස් කරමින්, සංශෝධනය කරමින්, අවශ්‍ය අවස්ථාවලදී ඒ සම්බන්ධ නිරීක්ෂණ ලබා දීම ද මෙම අංශයෙන් සිදු කරනු ලබයි. රාජ්‍ය සේවා කටයුතු සම්බන්ධයෙන් ජාතික මට්ටමේ ප්‍රතිපත්ති සම්පාදනය, අර්ථකථනය හා ඒ සම්බන්ධ මාර්ගෝපදේශ සැපයීම, රාජ්‍ය සේවයේ කාර්යය මණ්ඩල නිපුණතාව ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පුහුණුවීම් ලබා දීමද මෙම අමාත්‍යාංශය මගින් ඉටුවන තවත් සුවිශේෂී කාර්යයකි. එමඟින් වඩා ඵලදායී සේවාවක් ලබා දීමට හැකිවන පරිදි සමස්ත රාජ්‍ය සේවයෙහි ම ක්‍රියාකාරිත්වය ගොඩනැගීම හා පාලනය සිදු කරනු ලබයි.

## 1.2 දැක්ම, මෙහෙවර හා අරමුණු

**දැක්ම**

**"දැයට විශිෂ්ඨ රාජ්‍ය සේවයක්"**

**මෙහෙවර**

**"මානව සම්පත නිසි පරිපාලනය, කළමණාකරණය හා ප්‍රතිසංස්කරණය තුළින් විශිෂ්ඨ රාජ්‍ය සේවයක් තහවුරු කිරීම"**

**අරමුණු**

1. රාජ්‍ය සේවයේ මානව සම්පත් පිළිවෙතට අනුගත වෙමින් බඳවා ගැනීම්, පාරිශ්‍රමික සහ අනෙකුත් සේවා කොන්දේසි පිළිබඳ ඵලදායී රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීම
2. මහජන අවශ්‍යතා සඳහා ප්‍රතිචාර දැක්වීමේදී දැනට රාජ්‍ය සේවයේ සිටින සේවකයින්ගේ සිතුම් පැතුම් සහ ආකල්ප නව මානයන් කරා මෙහෙයවීම.
3. රාජ්‍ය සේවයේ ඵලදායිතාව සහ ගුණාත්මක බව ඉහළ නැංවීම උදෙසා නව කළමනාකරණ ව්‍යුහයක් සම්පාදනය කිරීම යහ ක්‍රියාත්මක කිරීම.
4. හර පද්ධතියක් ස්ථාපිත කොට බෙදා හදා ගැනීම (ප්‍රතිඵලාභිමුඛ ආකල්ප, වගවීම, සම්පත් විචක්ෂණශීලී ලෙස යොදා ගැනීම, අපක්ෂපාතීත්වය, පාරදෘෂ්‍යබව ආදියෙන් සමන්විතව)
5. රාජ්‍ය අංශයේ පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම සහ පුහුණු වැඩසටහන් පැවැත්වීමට ඇවැසි පහසුකම් සැපයීම.
6. විශ්‍රාම වැටුප් සම්බන්ධ ගැටළුවලට පිළියම් යෙදීම සඳහා විශ්‍රාම වැටුප් වැඩසටහන් සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
7. රජයේ සංවර්ධන ඉලක්ක සහ ප්‍රමුඛතා සපුරාලීමේ හැකියාව සහිත රාජ්‍ය අංශයේ ආයතනික සංවර්ධනය සඳහා රාමුවක් සකස් කර ගැනීම.
8. සේවා සැපයීමේ ඵලදායිතාව සහ ගුණාත්මක බව ඉහළ නැංවීම සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම ප්‍රවර්ධනය කිරීම.
9. රාජ්‍ය සේවයේ කාර්ය මණ්ඩලයේ නිපුණතාව වැඩි දියුණු කිරීම.
10. වෙනස් වෙමින් පවතින තත්ත්වයන්ට අනුව කටයුතු කීම පිණිස පද්ධති සරල කිරීම සහ ක්‍රියාදාම යළි සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ වැඩි දියුණු කිරීම, වර්ධනය කිරීම සහ ක්‍රියාවට නැංවීම.

### 1.3 රාජ්‍ය පරිපාලන අංශයේ ප්‍රධාන කාර්යයන්

1. රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්ති මත පිහිටා රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන විෂයයන්ට සහ මෙම අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතනවල විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, උපායමාර්ග, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
2. අමාත්‍යාංශ විශය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින්ලබා දීම
3. රාජ්‍ය සේවයට අදාළව පවතින නීති රීති හා රෙගුලාසි සමාලෝචනයට ලක්කර සරල කිරීම
4. රාජ්‍ය සේවයේ ආරවුල් විසඳීම සඳහා බේරුම්කරණ ක්‍රියාවලියක් හඳුන්වා දීම
5. සේවා ව්‍යවස්ථාවන්හි ගැටළු නිරාකරණය කර ඒවා සංශෝධනය කිරීම
6. දෙපාර්තමේන්තු සහ එහි කාර්ය මණ්ඩලය නියමිත ඉලක්කයන් සාක්ෂාත් කරන බව සහතික කිරීම සඳහා කාර්යසාධන කළමණාකරණ ක්‍රියාපටිපාටියක් හඳුන්වා දීම
7. රජයේ සේවයේ සියලුම සේවාවන් සඳහා නිලධාරීන් පත් කිරීම සහ උසස් කිරීම සඳහා අවශ්‍ය නීති රීති නිශ්චිත කාල රාමුවක් තුල සංශෝධනය කිරීම
8. රාජ්‍ය අංශයේ කුසලතා මත පදනම් වූ උසස්වීම් ක්‍රියාත්මක කිරීම
9. පහත සඳහන් සේවාවන්හි පරිපාලනය හා පිරිස් කළමණාකරණය
   - ශ්‍රී ලංකා පරිපාලන සේවය
   - ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය
   - ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය
   - ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය
   - ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය
   - ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය
   - ශ්‍රී ලංකා තාක්ෂණ සේවය
10. ඒකාබද්ධ සේවා පරිපාලනය කිරීම
11. ආයතන සංග්‍රහය යටතේ වන කාර්යයන්
12. රාජ්‍ය සේවා පුහුණුව
13. විශ්‍රාම වැටුප් සංග්‍රහය ක්‍රියාත්මක කිරීම
14. පහත ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයන්ට අදාළ කටයුතු හා ඒවා අධීක්ෂණය කිරීම
   - විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
   - රාජ්‍ය සේවා විශ්‍රාමිකයන්ගේ භාර අරමුදල
   - ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
   - ඩිස්ටන්ස් ලර්නිං සෙන්ටර් ලිමිටඩ්
   - මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව

### 1.4 රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු සහ ආයතන

1. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
2. රාජ්‍ය සේවා විශ්‍රාමිකයන්ගේ භාර අරමුදල
3. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
4. ඩිස්ටන්ස් ලර්නිං සෙන්ටර් ලිමිටඩ්
5. මානව සම්පත් සංවර්ධන කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව

## 1.5 සංවිධාන සටහන


රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
සංවිධාන සැලැස්ම
ලේකම්
අතිරේක ලේකම් (රාජ්‍ය පරිපාලන)
ශ්‍රී ලං.ප.සේ (විශේෂ)
අතිරේක ලේකම් (අභ්‍යන්තර පාලන)
ශ්‍රී ලං.ප.සේ (විශේෂ)
අතිරේක ලේකම් (රාජ්‍ය සේවා ප්‍රතිසංස්කරණ හා සැලසුම්)
ශ්‍රී ලං.ප.සේ (විශේෂ)
ප්‍රධාන මූල්‍ය නිලධාරී
ශ්‍රී ලං.ග.සේ (විශේෂ)
අතිරේක ලේකම් (මානව සම්පත් හා සංවර්ධන)
ශ්‍රී ලං.ප.සේ (විශේෂ)
අතිරේක ලේකම් (විමර්ශන)
ශ්‍රී ලං.ප.සේ (විශේෂ)
ආයතන අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලං.ප.සේ (විශේෂ)
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලං.ප.සේ (විශේෂ)
පරිපාලන නිලධාරී
පරිපාලන නිලධාරී
පරිපාලන නිලධාරී
පරිපාලන නිලධාරී

# 02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

## 2.1 දීපව්‍යාප්ත සේවා

රාජ්‍ය පරිපාලන අංශය විසින් දීප ව්‍යාප්ත සේවාවන් 07ක පරිපාලනය හා පිරිස් කළමනාකරණය සිදු කරනු ලබයි. එම සේවාවන් හි 2025 වර්ෂය තුළ ප්‍රගතිය හා ඉදිරි දැක්ම පහතින් දක්වා ඇත.

### 2.1.1 ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවා අංශය

#### 2.1.1.1 බඳවා ගැනීම්

2025 වර්ෂය තුළ පැවති පුරප්පාඩු සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයට නවක නිලධාරීන් 223ක් බඳවා ගෙන ඇත.

| පදනම | සංඛ්‍යාව |
|---|---|
| සීමිත | 96 |
| විවෘත | 118 |
| සෘජු | 09 |
| එකතුව | 223 |

#### 2.1.1.2 සපුරාගෙන ඇති ඉලක්ක

| කාරණය | සංඛ්‍යාව |
|---|---|
| බඳවා ගැනීම් | 223 |
| ස්ථිර කිරීම් | 52 |
| උසස් කිරීම් - III – II | 71 |
| II – I | 40 |
| I - විශේෂ/අධි | 20 |
| ස්ථාන මාරු | 139 |
| සේවාරම්භක පුහුණු | 234 |
| විනය කටයුතු ආරම්භ කර ඇති සංඛ්‍යාව | 34 |

#### 2.1.1.3 අපේක්ෂිත ඉලක්ක

| කාරණය | තත්‍ය සංඛ්‍යාව | *ළඟා කරගත යුතු ගණන |
|---|---|---|
| බඳවා ගැනීම් | 223 | 285 |
| ස්ථිර කිරීම් | 52 | 57 |
| උසස් කිරීම් | 131 | 282 |
| සේවාරම්භක පුහුණු | 234 | - |

*තොරතුරු මූලාශ්‍රය: 2026 ක්‍රියාකාරී සැලැස්ම

#### 2.1.1.4 වෙනත් කාර්යයන් හා විශේෂ සිදුවීම්

2025 වර්ෂය තුළ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නවක නිලධාරීන් 234 සඳහා සේවාරම්භක පුහුණු ලබා දී ඇති අතර 2013 කණ්ඩායමේ II ශ්‍රේණියේ නිලධාරීන් I ශ්‍රේණියට උසස් කිරීමට අදාළ කටයුතු අවසන් කර ඇත.

**රාජකාරී කටයුතු පහසු කර ගැනීම සඳහා හඳුන්වා දෙන ලද නව ක්‍රියාමාර්ග**

1. අංශය තුළ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට හා කඩදාසි භාවිතය අවම කිරීමට එක් එක් විෂයයන් සඳහා ජාලගත පොදු ගොනු භාවිතා කිරීම
2. ජ්‍යෙෂ්ඨතා ලේඛනය යාවත්කාලීන කිරීමට පහසුවන පරිදි මාසිකව තොරතුරු එක්රැස් වන ආකාරයට පොදු ආකෘතියක් යටතේ සකස් වුනු Excel ගොනුවක් භාවිතා කිරීම
3. කඩිනම් ලිපි ලේඛන Email හා Whatsapp මඟින් ගෙන්වා ගැනීම

### 2.1.2 ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවා අංශය

#### 2.1.2.1 බඳවා ගැනීම්

2025 වර්ෂය තුළ පැවති පුරප්පාඩු සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයට නවක නිලධාරීන් 102ක් බඳවා ගෙන ඇත.

#### 2.1.2.2 සපුරාගෙන ඇති ඉලක්ක

| කාරණය | සංඛ්‍යාව |
|---|---|
| බඳවා ගැනීම් | 102 |
| ස්ථිර කිරීම් | 3 |
| උසස් කිරීම් - III – II | 61 |
| II – I | 104 |
| I - විශේෂ/අධි | 24 |
| ස්ථාන මාරු | 198 |
| සේවාරම්භක පුහුණු | 102 |
| විනය කටයුතු ආරම්භ කර ඇති සංඛ්‍යාව | 8 |

#### 2.1.2.3 අපේක්ෂිත ඉලක්ක

| කාරණය | තත්‍ය සංඛ්‍යාව | *ළඟා කරගත යුතු ගණන |
|---|---|---|
| බඳවා ගැනීම් | 102 | 135 |
| ස්ථිර කිරීම් | 3 | 50 |
| උසස් කිරීම් | 189 | 782 |
| සේවාරම්භක පුහුණු | 102 | 135 |
| විනය කටයුතු | 8 | - |

*තොරතුරු මූලාශ්‍රය: 2026 ක්‍රියාකාරී සැලැස්ම

**2.1.2.4 වෙනත් කාර්යයන් හා විශේෂ සිදුවීම්**

1. ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ III ශ්‍රේණියට සීමිත පදනම මත 2024.10.14 දින සිට බඳවා ගත් නිලධාරීන් 43 දෙනා 2025.02.10 දින සිට සේවා ස්ථාන වෙත ස්ථානගත කරන ලදි.
2. ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා අදියර දෙකක් යටතේ 2023.07.29 සහ 2024.05.25 දිනවලදී පැවති පොදු (විවෘත) තරඟ විභාගයේ ප්‍රතිඵල මත අයදුම්කරුවන් 179 දෙනෙකු සඳහා සුදුසුකම් පරීක්ෂා කිරීමේ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය 2025.03.01 සහ 2025.03.02 යන දිනවල පවත්වන ලදි. එයට අයදුම්කරුවන් 164 දෙනෙකු පෙනී සිටින ලදි.
3. යථෝක්ත සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල මත 2025.07.01 දින සිට නිලධාරීන් 105 දෙනෙකු ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ III ශ්‍රේණියට පත්වීම් ලැබූ අතර ඉන් 102නෙකු පත්වීම භාර ගන්නා ලදි.
4. මෙලෙස විවෘත පදනම මත බඳවා ගත් නිලධාරීන් සඳහා වන සේවාරම්භක පුහුණුවේ පළමු අර්ධය අවසන් කළ පසු එම නිලධාරීන් 2025.10.02 දින සිට සේවා ස්ථාන වෙත අනුයුක්ත කරන ලදි.
5. ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ විශේෂ ශ්‍රේණියේ තනතුරුවල 2025.01.01 දිනට පැවති පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා 2025.02.14 දිනද 2025.07.01 දිනට පැවති පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා 2025.08.20 දිනද සුදුසුකම් පරීක්ෂා කිරීමේ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ පැවැත්වූ අතර එම සම්මුඛ පරීක්ෂණ මණ්ඩල නිර්දේශ මත පදනම්ව 2025.01.01 දිනට නිලධාරීන් 17 දෙනෙකුද 2025.07.01 දිනට නිලධාරීන් 7 දෙනෙකුද ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කර ඇත.
6. වරින්වර රටේ සිදුවන ජාතික ප්‍රතිපත්තිමය තීරණවල වෙනස්වීම්වලට අනුකූලව අංශය මඟින් සිදු කෙරෙන කාර්යයන් සංශෝධනය කර එම තීරණවලට අනුගත වෙමින් කටයුතු ඉදිරියට පවත්වා ගෙන යාම සහ අවශ්‍ය අවස්ථාවලදී ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට කටයුතු කිරීම.
7. ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධාරීන්ගේ දේශීය / විදේශීය නිවාඩු ඉල්ලීම් සඳහා ප්‍රතිචාර දැක්වීම.
8. වරින්වර ඇතිවන ගැටළුකාරී අවස්ථාවලදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව හා අදාළ නිලධාරීන් අතර සම්බන්ධීකරණය සිදු කර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් අනුව ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධාරීන්ගේ ගැටළු සඳහා අවශ්‍ය විසඳුම් හා සහන සලසා දීම.
9. රාජ්‍ය සේවා කොමිෂන් සභාව, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව හා අනෙකුත් අදාළ ආයතන සමඟ නිරන්තර සම්බන්ධතාවය පවත්වා ගෙන යමින් අංශයේ කටයුතු සුමටව පවත්වා ගෙන යාමට කටයුතු කිරීම.
10. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මඟින් කාර්යක්ෂමතා කඩඉම් විභාග පවත්වා එහි ප්‍රතිඵල ලේඛන යොමු කළ අතර 2025 වසරේ නිලධාරීන් 54 දෙනෙකුගේ කාර්යක්ෂමතා කඩඉම් ප්‍රතිඵල දැනුම් දීමට අදාළ කටයුතු මෙම අංශය මඟින් සිදු කර ඇත.
11. පහත ධාරිතා සංවර්ධන පුහුණු පාඨමාලා පැවැත්වීම සඳහා වන කටයුතු සිදු කර ඇත.
    - 2008 කණ්ඩායම - නිලධාරීන් 203ක්
    - 2009 කණ්ඩායම - නිලධාරීන් 125ක්
    - 2013 කණ්ඩායම - නිලධාරීන් 155ක්

## 2.1.3 ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා අංශය

**2.1.3.1 බඳවා ගැනීම්**

2025 වර්ෂය තුළ පැවති පුරප්පාඩු සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට නවක නිලධාරින් 198ක් බඳවා ගෙන ඇත.

**2.1.3.2 සපුරාගෙන ඇති ඉලක්ක**

| කාරණය | සංඛ්‍යාව |
|---|---|
| බඳවා ගැනීම් | 198 |
| ස්ථිර කිරීම් | 85 |
| උසස් කිරීම් - III – II | 65 |
| II – I | 66 |
| I - විශේෂ/අධි | 22 |
| ස්ථාන මාරු | 46 |
| සේවාරම්භක පුහුණු | - |
| විනය කටයුතු ආරම්භ කර ඇති සංඛ්‍යාව | 08 |

**2.1.2.3 අපේක්ෂිත ඉලක්ක**

| කාරණය | තත්‍ය සංඛ්‍යාව | *ළඟා කරගත යුතු ගණන |
|---|---|---|
| බඳවා ගැනීම් | 198 | 171 |
| ස්ථිර කිරීම් | 85 | 132 |
| උසස් කිරීම් | 153 | 316 |
| සේවාරම්භක පුහුණු | - | 176 |

*තොරතුරු මූලාශ්‍රය: 2026 ක්‍රියාකාරී සැලැස්ම

## 2.1.4 ශ්‍රී ලංකා පරිපාලන සේවා අංශය

**2.1.4.1 බඳවා ගැනීම්**

2025 වර්ෂය තුළ පැවති පුරප්පාඩු සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකා පරිපාලන සේවයට නවක නිලධාරින් 193ක් බඳවා ගෙන ඇත.

| පදනම | සංඛ්‍යාව |
|---|---|
| විවෘත | 151 |
| කුසලතා | 42 |
| එකතුව | 193 |

**2.1.4.2 සපුරාගෙන ඇති ඉලක්ක**

| කාරණය | සංඛ්‍යාව |
|---|---|
| බඳවා ගැනීම් | 193 |
| ස්ථිර කිරීම් | 127 |
| උසස් කිරීම් - III – II | 165 |
| II – I | 162 |
| I - විශේෂ/අධි | 46 |
| ස්ථාන මාරු | 657 |
| සේවාරම්භක පුහුණු | - |
| විනය කටයුතු ආරම්භ කර ඇති සංඛ්‍යාව | 48 |

**2.1.4.3 අපේක්ෂිත ඉලක්ක**

| කාරණය | තත්‍ය සංඛ්‍යාව | *ළඟා කරගත යුතු ගණන |
|---|---|---|
| බඳවා ගැනීම් | 193 | 134 |
| ස්ථිර කිරීම් | 127 | 87 |
| උසස් කිරීම් | 337 | 190 |
| සේවාරම්භක පුහුණු | - | - |

*තොරතුරු මූලාශ්‍රය: 2026 ක්‍රියාකාරී සැලැස්ම

## 2.1.5 ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවා අංශය

**2.1.5.1 බඳවා ගැනීම්**

2025 වර්ෂය තුළ පැවති පුරප්පාඩු සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයට නවක නිලධාරින් 12ක් විවෘත පදනමින් බඳවා ගෙන ඇත.

**2.1.5.2 සපුරාගෙන ඇති ඉලක්ක**

| කාරණය | සංඛ්‍යාව |
|---|---|
| බඳවා ගැනීම් | 12 |
| ස්ථිර කිරීම් | 31 |
| උසස් කිරීම් - III – II | 23 |
| II – I | 18 |
| I - විශේෂ/අධි | 04 |
| ස්ථාන මාරු | 05 |
| සේවාරම්භක පුහුණු | 52 |
| විනය කටයුතු ආරම්භ කර ඇති සංඛ්‍යාව | 01 |

**2.1.5.3 අපේක්ෂිත ඉලක්ක**

| කාරණය | තත්‍ය සංඛ්‍යාව | *ළඟා කරගත යුතු ගණන |
|---|---|---|
| බඳවා ගැනීම් | 12 | 170 |
| ස්ථිර කිරීම් | 31 | - |
| උසස් කිරීම් | 45 | 91 |
| සේවාරම්භක පුහුණු | 52 | 120 |

*තොරතුරු මූලාශ්‍රය: 2026 ක්‍රියාකාරී සැලැස්ම

**2.1.5.4 වෙනත් කාර්යයන් හා විශේෂ සිදුවීම්**

1. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පැවති ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ තනතුරුවලට පත් කරන ලදී.
2. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පර්යේෂණ) තනතුරට පත් කරන ලදී.
3. විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ හා I ශ්‍රේණියේ තනතුරුවලට පත් කරන ලදී.
4. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී.ලං.වි. සේවයේ I ශ්‍රේණියේ තනතුරට පත් කිරීම.
5. පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ, පරිසර අමාත්‍යාංශයේ විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ තනතුරුවලට පත් කිරීම.

6. 2025 වර්ෂය තුළ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධරයන් 50 දෙනෙකු සඳහා විද්‍යාත්මක සංස්කෘතියක් ප්‍රවර්ධනය කර ගැනීමේ පුහුණු වැඩසටහන් පැවැත්විය.
7. ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධාරීන්ගේ දැනුම වැඩිදියුණු කිරීම හා යාවත්කාලීන කිරීම අරමුණු කර ගනිමින් විද්‍යාත්මක සංස්කෘතියක් ප්‍රවර්ධනය කර ගැනීමේ පුහුණු වැඩසටහන් ආරම්භ කිරීම.
8. ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ තනතුරුවල පුරප්පාඩු පිරවීම.
9. ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ විශේෂ ශ්‍රේණියේ තනතුරුවල පුරප්පාඩු පිරවීම.
10. ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ ඇති පුරප්පාඩු අනුව සීමිත හා විවෘත බඳවා ගැනීම් සිදුකිරීම.
11. ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනුවලට අදාළ (ස්ථිර කිරීම්, උසස් කිරීම්, කාර්යක්ෂමතා කඩඉම්, විශ්‍රාම ගැන්වීම් ආදිය) කටයුතු සම්බන්ධ ප්‍රගතිය පිළිබඳ වර්තමාන තත්ත්වය ඔවුන්ගේ ජංගම දුරකථනවලට කෙටි පණිවිඩ (SMS) වලින් දැනුම් දීම.
12. ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධාරීන්ගේ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් සැකසීම.
13. ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ බඳවා ගැනීම් සහ උසස්වීම් සුදුසුකම් තක්සේරු කිරීම සඳහා වන කමිටු සැසිවාරය 2025 වර්ෂයේ දී දෙසැම්බර් මස 13 සහ 14 යන දෙදින පැවැත්විණි.
14. ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධරයන් සඳහා විද්‍යාත්මක පර්යේෂණ නිබන්ධනයක්/ පත්‍රිකාවක් සකස් කිරීම සම්බන්ධයෙන් වූ පුහුණු වැඩසටහනට සමගාමීව එම පුහුණුව සඳහා සහභාගී වූ විද්‍යාත්මක සේවයේ නිලධරයන් විසින් නිම කරනු ලැබූ ප්‍රකාශන ඇතුළත් කර තැනූ අන්තර්ජාල ජර්නල් සඟරාව 2025.09.25 හා 26 යන දිනවල අමාත්‍යාංශ වෙබ් අඩවියේ පළකරන ලදී.

## 2.1.6 ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවා අංශය

### 2.1.6.1 බඳවා ගැනීම්

2025 වර්ෂය තුළ පැවති පුරප්පාඩු සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයට විවෘත පදනමින් නවක නිලධාරින් 03ක් බඳවා ගෙන ඇත.

### 2.1.6.2 සපුරාගෙන ඇති ඉලක්ක

| කාරණය | සංඛ්‍යාව |
|---|---|
| බඳවා ගැනීම් | 03 |
| ස්ථිර කිරීම් | 05 |
| උසස් කිරීම් - III – II | 03 |
| II – I | 02 |
| I - විශේෂ/අධි | - |
| ස්ථාන මාරු | 01 |
| සේවාරම්භක පුහුණු | 03 |
| විනය කටයුතු ආරම්භ කර ඇති සංඛ්‍යාව | - |

### 2.1.6.3 අපේක්ෂිත ඉලක්ක

| කාරණය | තත්‍ය සංඛ්‍යාව | *ළඟා කරගත යුතු ගණන |
|---|---|---|
| බඳවා ගැනීම් | 03 | 13 |
| ස්ථිර කිරීම් | 05 | - |
| උසස් කිරීම් | 05 | 03 |
| සේවාරම්භක පුහුණු | 03 | 16 |

*තොරතුරු මූලාශ්‍රය: 2026 ක්‍රියාකාරී සැලැස්ම

### 2.1.6.4 වෙනත් කාර්යයන් හා විශේෂ සිදුවීම්

1. ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ ඇති පුරප්පාඩු විවෘත බඳවා ගැනීම් සිදුකිරීම.
2. ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනුවලට අදාළ (ස්ථිර කිරීම්, උසස් කිරීම්, කාර්යක්ෂමතා කඩඉම්, විශ්‍රාම ගැන්වීම් ආදිය) කටයුතු සම්බන්ධ ප්‍රගතිය පිළිබඳ වර්තමාන තත්ත්වය ඔවුන්ගේ ජංගම දුරකථනවලට කෙටි පණිවිඩ (SMS) වලින් දැනුම් දීම.
3. ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ නිලධාරීන්ගේ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් සැකසීම.

## 2.1.7 ශ්‍රී ලංකා තාක්ෂණ සේවය*

* ශ්‍රී ලංකා තාක්ෂණ සේවය සංවෘත/ දෙපාර්තමේන්තුගත සේවයක් ලෙස ක්‍රියාත්මක වන අතර එම සේවා ව්‍යවස්ථාව හා සම්බන්ධ කටයුතු හා වෙනත් ප්‍රතිපත්තිමය කටයුතු පමණක් මෙම අමාත්‍යාංශය මඟින් සිදු කෙරේ. ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට අදාල බඳවා ගැනීම් ඇතුළු අනෙකුත් කටයුතු ඒ ඒ දෙපාර්තමේන්තු හා ආයතන මඟින් සිදු කරන අතර ඒවායේ පරිපාලන බලධාරීත්වයද එම ආයතන විසින් දරනු ලබයි.

## 2.2 ඒකාබද්ධ සේවා අංශය

ඒකාබද්ධ සේවා අංශය යටතේ සේවාවන් 07ක් ක්‍රියාත්මක වේ.

### 2.2.1 භාෂා පරිවර්තක සේවය

**2.2.1.1 බඳවා ගැනීම්**

2025 වර්ෂය තුළ දී භාෂා පරිවර්තක සේවයට නවක නිලධාරින් බඳවා ගෙන නොමැත.

**2.2.1.2 සපුරාගෙන ඇති ඉලක්ක**

| කාරණය | සංඛ්‍යාව |
|---|---|
| බඳවා ගැනීම් | - |
| ස්ථිර කිරීම් | - |
| උසස් කිරීම් - III – II | - |
| II – I | - |
| I - විශේෂ/අධි | - |
| ස්ථාන මාරු | 42 |
| සේවාරම්භක පුහුණු | - |
| විනය කටයුතු ආරම්භ කර ඇති සංඛ්‍යාව | - |

**2.2.1.3 අපේක්ෂිත ඉලක්ක**

| කාරණය | තත්‍ය සංඛ්‍යාව | *ළඟා කරගත යුතු ගණන |
|---|---|---|
| බඳවා ගැනීම් | - | 238 |
| ස්ථිර කිරීම් | - | 54 |
| උසස් කිරීම් | - | 35 |
| සේවාරම්භක පුහුණු | - | 238 |

*තොරතුරු මූලාශ්‍රය: 2026 ක්‍රියාකාරී සැලැස්ම

### 2.2.2 පුස්තකාලයාධිපති සේවය

**2.2.2.1 බඳවා ගැනීම්**

2025 වර්ෂය තුළ දී පුස්තකාලයාධිපති සේවයට නවක නිලධාරින් බඳවා ගෙන නොමැත.

**2.2.2.2 සපුරාගෙන ඇති ඉලක්ක**

| කාරණය | සංඛ්‍යාව |
|---|---|
| බඳවා ගැනීම් | - |
| ස්ථිර කිරීම් | 10 |
| උසස් කිරීම් - III – II | 04 |
| II – I | 03 |
| I - විශේෂ/අධි | 08 |
| ස්ථාන මාරු | - |
| සේවාරම්භක පුහුණු | - |
| විනය කටයුතු | - |

**2.2.2.3 අපේක්ෂිත ඉලක්ක**

| කාරණය | තත්‍ය සංඛ්‍යාව | *ළඟා කරගත යුතු ගණන |
|---|---|---|
| බඳවා ගැනීම් | - | 100 |
| ස්ථිර කිරීම් | 10 | 35 |
| උසස් කිරීම් | 15 | 20 |
| සේවාරම්භක පුහුණු | - | 100 |
| විනය කටයුතු | - | - |

*තොරතුරු මූලාශ්‍රය: 2026 ක්‍රියාකාරී සැලැස්ම

ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවය සඳහා නිලධාරීන් 100ක් බඳවා ගැනීම සඳහා බඳවා ගැනීම් සමාලෝචන කමිටුවේ අනුමැතිය අනුව 2025.11.07 දින අයදුම්පත් කැඳවා ඇත.

### 2.2.3 සංවර්ධන නිලධාරි සේවය

**2.2.3.1 බඳවා ගැනීම්**

2025 වර්ෂය තුළ දී සංවර්ධන නිලධාරි සේවයට නවක නිලධාරින් බඳවා ගෙන නොමැත.

**2.2.3.2 සපුරාගෙන ඇති ඉලක්ක**

| කාරණය | සංඛ්‍යාව |
|---|---|
| බඳවා ගැනීම් | - |
| ස්ථිර කිරීම් | 5169 |
| උසස් කිරීම් - III – II | 5049 |
| II – I | 460 |
| I - විශේෂ/අධි | - |
| ස්ථාන මාරු | 2614 |
| සේවාරම්භක පුහුණු | - |
| විනය කටයුතු ආරම්භ කර ඇති සංඛ්‍යාව | 48 |

**2.2.3.3 අපේක්ෂිත ඉලක්ක**

| කාරණය | තත්‍ය සංඛ්‍යාව | *ළඟා කරගත යුතු ගණන |
|---|---|---|
| බඳවා ගැනීම් | - | - |
| ස්ථිර කිරීම් | 5169 | 5000 |
| උසස් කිරීම් | 5509 | 8500 |
| සේවාරම්භක පුහුණු | - | - |

*තොරතුරු මූලාශ්‍රය: 2026 ක්‍රියාකාරී සැලැස්ම

## 2.2.4 කළමනාකරණ සේවා නිලධාරි

### 2.2.4.1 බඳවා ගැනීම්

2025 වර්ෂය තුළ පැවති පුරප්පාඩු සැලකිල්ලට ගෙන කළමණාකරණ නිලධාරි සේවයට විවෘත පදනමින් නවක නිලධාරින් 2927ක් බඳවා ගෙන ඇත.

### 2.2.4.2 සපුරාගෙන ඇති ඉලක්ක

| කාරණය | සංඛ්‍යාව |
|---|---|
| බඳවා ගැනීම් | 2927 |
| ස්ථිර කිරීම් | 812 |
| උසස් කිරීම් - III – II | 1051 |
| II – I | 235 |
| I - විශේෂ/අධි | 16 |
| ස්ථාන මාරු | 4274 |
| සේවාරම්භක පුහුණු | 669 |
| විනය කටයුතු ආරම්භ කර ඇති සංඛ්‍යාව | 38 |

1. අමාත්‍යාංශයීය මානව සම්පත් සංවර්ධන අංශය විසින් කළමනාකරණ සේවා නිලධාරි සේවයට සීමිත පදනමින් බඳවාගත් නිලධාරින් 669ක් සඳහා සේවාරම්භක පුහුණුව දිස්ත්‍රික් මට්ටමින් සිදු කර ඇති අතර කළමනාකරණ සේවා නිලධාරි සේවයට විවෘත පදනමින් පළමු වටයෙන් බඳවා ගත් නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණුව දිස්ත්‍රික් මට්ටමින් සිදු කරමින් පවතී.
2. ඉදිරියේ දී කළමනාකරණ සේවා නිලධාරි සේවයට විවෘත පදනමින් දෙවන වටයෙන් බඳවා ගන්නා නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණුව දිස්ත්‍රික් මට්ටමින් සිදු කරනු ඇත.

### 2.2.4.3 අපේක්ෂිත ඉලක්ක

| කාරණය | තත්‍ය සංඛ්‍යාව | *ළඟා කරගත යුතු ගණන |
|---|---|---|
| බඳවා ගැනීම් | 2927 | 1759 |
| ස්ථිර කිරීම් | 812 | 5426 |
| උසස් කිරීම් | 1302 | 6510 |
| සේවාරම්භක පුහුණු | - | 1759 |

*තොරතුරු මූලාශ්‍රය: 2026 ක්‍රියාකාරී සැලැස්ම

1. කළමනාකරණ සේවා නිලධාරී සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2019(2025) ට අදාළව සම්මුඛ පරීක්ෂණ 2025 අගෝස්තු 22,23, සහ 24 දිනවල පවත්වන ලදී. ඔක්තෝබර් 01 වන දින සුදුසුකම් ලද නිලධාරීන් 1913ක් සඳහා පත්වීම් ලබා දුන් අතර එමගින් සම්පූර්ණ නොවූ පුරප්පාඩු පිරවීම සඳහා දෙවන වටය ලෙස අයදුම්කරුවන් 345ක් සඳහා 2026.02.02 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්වීම් ලබා දී ඇත.
2. කළමනාකරණ සේවා නිලධාරී සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2024(2025) ට අදළව අයදුම්පත් කැඳවා ඇති අතර විභාගය, විභාග දෙපාර්තමේන්තුව විසින් ඔක්තෝබර් 05 දින විභාගය පවත්වා ඇත. ප්‍රතිඵල ඉදිරියේ දී නිකුත් කිරීමට නියමිතය.
3. කුසලතා පදනම මත කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අධිශ්‍රේණියට උසස් කිරීමේ තරග විභාග විභාග දෙපාර්තමේන්තුව මගින් 2025 ඔක්තෝබර් 26 දින පවත්වා මේ වන විට ප්‍රතිඵල නිකුත් කර ඇති අතර මාර්තු මාසයේ මුල් සතිය තුළ සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට කටයුතු සූදානම් කරමින් පවතී.

## 2.2.5 රියදුරු සේවය

### 2.2.5.1 බඳවා ගැනීම්

2025 වර්ෂය තුළ පැවති පුරප්පාඩු සැලකිල්ලට ගෙන රියදුරු සේවයට විවෘත පදනමින් නවක නිලධාරින් 169ක් බඳවා ගෙන ඇත.

### 2.2.5.2 සපුරාගෙන ඇති ඉලක්ක

| කාරණය | සංඛ්‍යාව |
|---|---|
| බඳවා ගැනීම් | 169 |
| ස්ථිර කිරීම් | 112 |
| උසස් කිරීම් - III – II | 346 |
| II – I | 107 |
| I - විශේෂ/අධි | 61 |
| ස්ථාන මාරු | 371 |
| සේවාරම්භක පුහුණු | - |
| විනය කටයුතු ආරම්භ කර ඇති සංඛ්‍යාව | 20 |

### 2.2.5.3 අපේක්ෂිත ඉලක්ක

| කාරණය | තත්‍ය සංඛ්‍යාව | *ළඟා කරගත යුතු ගණන |
|---|---|---|
| බඳවා ගැනීම් | 169 | 1000 |
| ස්ථිර කිරීම් | 112 | 80 |
| උසස් කිරීම් | 514 | 326 |
| සේවාරම්භක පුහුණු | - | - |

*තොරතුරු මූලාශ්‍රය: 2026 ක්‍රියාකාරී සැලැස්ම

1. ඒකාබද්ධ රියදුරු සේවයේ III ශ්‍රේණියට නිලධාරීන් 1000ක් බඳවා ගැනීම සඳහා බඳවා ගැනීම් සමාලෝචන කමිටුවේ අනුමැතිය ලැබී ඇත අතර විභාග නිවේදන කෙටුම්පත නිරීක්ෂණ සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත 2026.01.02 දින යොමු කර ඇත.

## 2.2.6 කාර්යාල කාර්ය සහයක සේවය

### 2.2.6.1 බඳවා ගැනීම්

2025 වර්ෂය තුළ පැවති පුරප්පාඩු සැලකිල්ලට ගෙන කාර්යාල කාර්ය සහයක සේවයට විවෘත පදනමින් නවක නිලධාරින් 371ක් බඳවා ගෙන ඇත.

### 2.2.6.2 සපුරාගෙන ඇති ඉලක්ක

| කාරණය | සංඛ්‍යාව |
|---|---|
| බඳවා ගැනීම් | 371 |
| ස්ථිර කිරීම් | 423 |
| උසස් කිරීම් - III – II | 963 |
| II – I | 60 |
| I - විශේෂ/අධි | 238 |
| ස්ථාන මාරු | 783 |
| සේවාරම්භක පුහුණු | - |
| විනය කටයුතු ආරම්භ කර ඇති සංඛ්‍යාව | 27 |

### 2.2.6.3 අපේක්ෂිත ඉලක්ක

| කාරණය | තත්‍ය සංඛ්‍යාව | *ළඟා කරගත යුතු ගණන |
|---|---|---|
| බඳවා ගැනීම් | 371 | - |
| ස්ථිර කිරීම් | 423 | 660 |
| උසස් කිරීම් | 1261 | 1307 |
| සේවාරම්භක පුහුණු | - | - |

*තොරතුරු මූලාශ්‍රය: 2026 ක්‍රියාකාරී සැලැස්ම

## 2.2.7 තොරතුරු සන්නිවේදන තාක්ෂණ සේවය

### 2.2.7.1 බඳවා ගැනීම්

2025 වර්ෂය තුළ දී තොරතුරු සන්නිවේදන තාක්ෂණ සේවයට නවක නිලධාරින් බඳවා ගෙන නොමැත.

### 2.2.7.2 සපුරාගෙන ඇති ඉලක්ක

| කාරණය | සංඛ්‍යාව | | |
|---|---|---|---|
| | තො. තා. I පන්තිය | තො. තා. නිලධාරි | තො. තා. සහකාර |
| බඳවා ගැනීම් | - | - | - |
| ස්ථිර කිරීම් | 04 | 43 | 120 |
| උසස් කිරීම් - III – II | - | - | 23 |
| II – I | 01 | 02 | 73 |
| I - විශේෂ/අධි | - | - | - |
| ස්ථාන මාරු | 07 | 16 | 115 |
| සේවාරම්භක පුහුණු | - | - | - |
| විනය කටයුතු ආරම්භ කර ඇති සංඛ්‍යාව | - | 07 | - |

### 2.2.7.3 අපේක්ෂිත ඉලක්ක

| කාරණය | *ළඟා කරගත යුතු ගණන | | |
|---|---|---|---|
| | තො. තා. I පන්තිය | තො. තා. නිලධාරි | තො. තා. සහකාර |
| බඳවා ගැනීම් | 48 | 189 | 555 |
| ස්ථිර කිරීම් | 20 | 23 | 100 |
| උසස් කිරීම් | - | - | 83 |
| සේවාරම්භක පුහුණු | 48 | 189 | 555 |

*තොරතුරු මූලාශ්‍රය: 2026 ක්‍රියාකාරී සැලැස්ම

1. ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ සේවයේ 1 පන්තියේ (III) ශ්‍රේණියට නිලධාරින් 48ක්, 2 පන්තියේ II ශ්‍රේණියට නිලධාරින් 189ක් සහ 3පන්තියේ III නිලධාරින් 555ක් බඳවාගැනීම සඳහා බඳවා ගැනීම් සමාලෝචන කමිටුවේ අනුමැතිය අනුව අයදුම්පත් කැඳවීමේ නිවේදන පිළිවෙලින් 2025/11/07 සහ 2025/10/17 දිනවල ප්‍රසිද්ධියට පත් කර ඇත.

## 2.3 අභ්‍යන්තර විගණන අංශය

2024 නොවැම්බර් 25 දිනැති අංක 2412/ 08 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ, රාජ්‍ය පරිපාලන අංශයට අදාළව අනුමත කරගන්නා ලද අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව අමාත්‍යාංශයේ විවිධ අංශයන් හා පහත සඳහන් දෙපාර්තමේන්තු හා

ආයතනයන්ට අදාළව විගණන කටයුතු හා අවශ්‍යතාවය අනුව විශේෂ විගණන පරීක්ෂණ හා විමර්ශන සිදුකරනු ලැබේ.

| දෙපාර්තමේන්තු | ආයතන |
|---|---|
| 01. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 01.ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) |
| | 02.දුරස්ථ අධ්‍යාපන මධ්‍යස්ථානය (DLC) |
| | 03.මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාව (NHRDC) |

## 2.3.1 සපුරාගෙන ඇති ඉලක්ක

**රාජ්‍ය පරිපාලන අංශයට අදාල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම**

1. පළමු කාර්තුව - 2025.03.26
2. දෙවන කාර්තුව - 2025.06.26
3. තෙවන කාර්තුව - 2025.09.23
4. සිව්වන කාර්තුව - 2025.12.18





### 2.3.1.1 2025.01.01 දින සිට 2025.12.31 දින දක්වා නිකුත් කරන ලද අභ්‍යන්තර විගණන විමසුම් සහ විශේෂ විගණන විමසුම් පිළිබඳ සාරාංශය

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ ආයතනය/ අංශය | යොමුකර ඇති විගණන විමසුම් සංඛ්‍යාව |
|---|---|
| 01. රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය (රාජ්‍ය පරිපාලන අංශය) | 24 |
| 02. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 25 |
| 03.මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව | 07 |
| 04. දුරස්ථ අධ්‍යාපන ආයතනය | 03 |
| 05. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 01 |
| 06. අභ්‍යන්තර විගණන අංශය විසින් සිදුකරන ලද විශේෂ විගණන පරීක්ෂාවන් හා වාර්තාවන් | 06 |
| එකතුව | 66 |

**2.3.1.2 2025.01.01 දින සිට 2025.12.31 දින දක්වා නිකුත් කරන ලද අභ්‍යන්තර විගණන වාර්තාවල විස්තර**

| ආයතනයේ නම | නිකුත් කරන ලද දිනය | කාරණය/ විෂය (කෙටියෙන්) |
|---|---|---|
| රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය - රාජ්‍ය පරිපාලන අංශය | 2025.01.21 | 01. සංචාරක බංගලා පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව - බණ්ඩාරවෙල 01 රාජ්‍ය පරිපාලන සංචාරක බංගලාව |
| | 2025.01.29 | 02. ගෙවීම් වවුචර්පත් පරීක්ෂාව - 2024 |
| | 2025.02.10 | 03. අමාත්‍යාංශයේ ප්‍රධාන ගබඩාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව - 2024 |
| | 2025.02.19 | 04. සංචාරක බංගලා පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව - දියතලාව A රාජ්‍ය පරිපාලන සංචාරක බංගලාව |
| | 2025.02.24 | 05. සංචාරක බංගලා පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව - දියතලාව B රාජ්‍ය පරිපාලන සංචාරක බංගලාව |
| | 2025.02.24 | 06. සංචාරක බංගලා පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව - බණ්ඩාරවෙල 02 රාජ්‍ය පරිපාලන සංචාරක බංගලාව |
| | 2025.03.20 | 07. නිවාඩු බංගලා වෙන්කිරීම හා පවත්වාගෙන යාමේ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම |
| | 2025.04.23 | 08. මානව සම්පත් කළමනාකරණ ක්‍රියාවලීන් සහ කාර්යයන් ඩිජිටල්කරණය කිරීම, ලිපිලේඛන කළමනාකරණ පද්ධතිය ස්ථාපිත කිරීමට අදාල ප්‍රසම්පාදන ක්‍රියාවලිය පරීක්ෂා කිරීම |
| | 2025.04.29 | 09. අමාත්‍යාංශයේ බැංකු සැසඳුම් (ලංකා බැංකු ගිණුම් අංක 7040712) පරීක්ෂාව - 2025 මාර්තු |
| | 2025.05.30 | 10. කොළඹ 07 ග්‍රෙගරි මාවතේ අංක බී 89 (වරිපනම් අංක 46) රජයේ බංගලා නිවාසය පවරාදීම හා කුලී අයවීම පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂණය |
| | 2025.06.06 | 11. 2024 වර්ෂයේ වාර්ෂික මානව සම්පත් සංවර්ධන සැලැස්ම ප්‍රකාරව අමාත්‍යාංශයේ පුහුණු පාඨමාලා පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂණය |
| | 2025.06.19 | 12. අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ පැමිණීම, පිටවීම හා නිවාඩු විධිමත් පරිදි පවත්වාගෙන යාම පරීක්ෂාව - 2024-2025 |
| | 2025.07.04 | 13.රාජ්‍ය පරිපාලන අංශය මඟින් (130 වැය ශීර්ෂය යටතේ) අත්තිකාරම් බී ගිණුම යටතේ රජයේ නිලධාරීන් වෙත ලබාදුන් ණය අයකර ගැනීමට කටයුතු කිරීම සම්බන්ධව පවතින අභ්‍යන්තර පාලන ක්‍රමවේදය පරීක්ෂාව |
| | 2025.07.18 | 14. අමාත්‍යාංශයේ බැංකු සැසඳුම් (ලංකා බැංකු ගිණුම් අංක 7040712) පරීක්ෂාව - 2025 ජුනි |
| | 2025.07.28 | 15. සංචිතයේ සිටින නිලධාරීන් පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂණය |
| | 2025.08.19 | 16. අමාත්‍යාංශයේ ඉංජිනේරු අංශය යටතේ පවත්වාගෙන යනු ලබන ගබඩාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂණය |
| | 2025.09.26 | 17. රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ගෙවීම් වවුචර්පත් පරීක්ෂාව |

| | | |
|---|---|---|
| | 2025.09.30 | 18. අමාත්‍යාංශයේ ගිවිසුම්ගත සේවා සම්බන්ධ අභ්‍යන්තර විගණන පරීක්ෂණය |
| | 2025.10.23 | 19.අමාත්‍යාංශයේ ආරක්ෂක සේවාව පවත්වාගෙන යාම පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව |
| | 2025.10.27 | 20. අමාත්‍යාංශයේ බැංකු ගිණුම් පරීක්ෂාව (ලංකා බැංකු ගිණුම් අංක 7040712) පරීක්ෂාව - 2025 සැප්තැම්බර් මාසය |
| | 2025.11.18 | 21.රාජ්‍ය පරිපාලන අංශයට අදාල වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම - 2025 පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව |
| | 2025.11.21 | 22.අමාත්‍යාංශයේ වාහන අලුත්වැඩියා හා නඩත්තු කටයුතුවලට අදාල ප්‍රසම්පාදන ක්‍රියාවලිය පරීක්ෂාව - 2025 |
| | 2025.12.01 | 23.අමාත්‍යාංශය තුළ සෙයිරි (2025.09.01 - 2025.09.04) සතියෙහි කටයුතු සිදු වූ ආකාරය පිළිබඳ පසුවිපරම් පරීක්ෂාව |
| | 2025.12.09 | 24.අමාත්‍යාංශයේ දෛනික ධාවන සටහන් පරීක්ෂාව - 2024 ( ජනවාරි - දෙසැම්බර් ) |
| විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 2025.01.27 | 25. විශ්‍රාම වැටුප් විගණන පරීක්ෂාව - 2024 (බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය) |
| | 2025.01.30 | 26. විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය විගණන පරීක්ෂාව 2024 නොවැම්බර් (ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය) |
| | 2025.01.30 | 27. විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය විගණන පරීක්ෂාව 2024 නොවැම්බර් ( රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය) |
| | 2025.01.31 | 28. විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය විගණන පරීක්ෂාව 2024 නොවැම්බර් ( පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය) |
| | 2025.03.18 | 29. විශ්‍රාම වැටුප් විගණන පරීක්ෂාව - 2025 (කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය) |
| | 2025.02.27 | 30. විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය විගණන පරීක්ෂාව 2024 නොවැම්බර් ( කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය) |
| | 2025.07.04 | 31. විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය විගණන පරීක්ෂාව 2025 ජුනි ( මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය) |
| | 2025.07.08 | 32. විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය විගණන පරීක්ෂාව 2025 ජුනි ( ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය) |
| | 2025.07.14 | 33. විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය විගණන පරීක්ෂාව 2025 ජුනි ( කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය) |
| | 2025.07.21 | 34. විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය විගණන පරීක්ෂාව 2025 ජුනි ( මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය) |
| | 2025.07.18 | 35. විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය විගණන පරීක්ෂාව 2025 ජුනි ( පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය) |
| | 2025.07.22 | 36. විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය විගණන පරීක්ෂාව 2025 ජුනි (වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය) |
| | 2025.07.22 | 37. විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය විගණන පරීක්ෂාව 2025 ජුනි (හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය) |
| | 2025.07.24 | 38. විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය විගණන පරීක්ෂාව 2025 ජුනි (අනුරාධපුරය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය) |

| | | |
|---|---|---|
| | 2025.07.25 | 39. විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය විගණන පරීක්ෂාව 2025 ජුනි ( බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය) |
| | 2025.07.25 | 40. විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය විගණන පරීක්ෂාව 2025 ජුනි ( මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය) |
| | 2025.07.25 | 41. විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය විගණන පරීක්ෂාව 2025 ජුනි ( අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය) |
| | 2025.07.28 | 42. විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය විගණන පරීක්ෂාව 2025 ජුනි ( කෑගල්ල දිස්ත්රික් ලේකම් කාර්යාලය) |
| | 2025.07.28 | 43. විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය විගණන පරීක්ෂාව 2025 ජුනි ( ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය) |
| | 2025.08.19 | 44. විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය විගණන පරීක්ෂාව 2025 අගෝස්තු (නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය) |
| | 2025.08.18 | 45. විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය විගණන පරීක්ෂාව 2025 අගෝස්තු (කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය) |
| | 2025.09.26 | 46. විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය විගණන පරීක්ෂාව 2025 අගෝස්තු (විදේශ) |
| | 2025.10.07 | 47. විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය විගණන පරීක්ෂාව 2025 අගෝස්තු (මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය) |
| | 2025.10.07 | 48. විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය විගණන පරීක්ෂාව 2025 අගෝස්තු (කිළිනොච්චිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය) |
| | 2025.10.07 | 49. විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය විගණන පරීක්ෂාව 2025 අගෝස්තු (මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය) |
| මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව | 2025.05.19 | 50. මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ ගෙවීම් වවුචර්පත් පරීක්ෂාව - 2024 |
| | 2025.05.22 | 51. මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ අතුරු අග්‍රිම පරීක්ෂාව - 2024 |
| | 2025.07.22 | 52. මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ ගබඩාවේ කටයුතු පරීක්ෂාව |
| | 2025.08.14 | 53. මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ ඉන්වෙන්ට්‍රි ලේඛන හා භාණ්ඩ සමීක්ෂණ කටයුතු පරීක්ෂාව - 2025 |
| | 2025.10.28 | 54. මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාවේ වාහන නඩත්තු කටයුතු පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව - 2025 |
| | 2025.12.02 | 55. මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාවේ වැටුප් ගෙවීමේ ක්‍රියාවලිය පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව - 2025 |
| | 2025.12.11 | 56. මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාවේ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම - 2025 පරීක්ෂා කිරීම |
| ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 2025.10.17 | 57. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ බැං කු සැසඳුම් ප්‍රකාශ පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂණය - 2025 සැප්තැම්බර් |
| දුරස්ථ අධ්‍යාපන ආයතනය | 2024.10.14 | 58. දුරස්ථ අධ්‍යාපන ආයතනයේ ඉන්වෙන්ට්‍රි ලේඛන හා භාණ්ඩ සමීක්ෂණ කටයුතු පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව |

| | | |
|---|---|---|
| | 2025.07.03 | 59. දුරස්ථ අධ්‍යාපන ආයතනයේ 2025 ජනවාරි සිට මාර්තු දක්වා ගෙවීම් වවුචර්පත් පරීක්ෂාව |
| | 2025.10.22 | 60. දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය සතු ස්ථාවර තැන්පතු පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව |
| අභ්‍යන්තර විගණන අංශය විසින් සිදුකරන ලද විශේෂ විගණන පරීක්ෂාවන් හා වාර්තාවන් | 2025.01.01 දින සිට 2025.03.28 දක්වා | 61. රජයේ කාර්යාල පරිශ්‍රයන් සම්බන්ධයෙන් ක්‍රියාකළයුතු ආකාරය පිළිබඳ රාජ්‍ය ආයතන වෙත චක්‍රලේඛයක් සකස් කිරීම සඳහා සාකච්ඡා පවත්වා කෙටුම්පත් වාර්තාවක් සකස් කර ලේකම්තුමා වෙත ඉදිරිපත් කිරීම. |
| | 2025.04.30 | 62. 2025 පළමු කාර්තුව විගණන හා කළමනාකරණ සාකච්ඡා වූ පරිදි 2024/2025 අනුමත විගණන සැලැස්මට අනුව සිදුකරන ලද විගණන විමසුම් වලින් පැනනැඟී කරුණු සාකච්ඡා කිරීමේ රැස්වීමක් පැවැත්වීම සහ සාකච්ඡා සටහන් සකස් කිරීම. |
| | 2025.08.27 | 63. ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ සභාපතිතුමා සංචිත වාහනයක් භාවිත කිරීම සම්බන්ධයෙන් වූ මු.රෙ. 104 (4) යටතේ සිදුකළ පරීක්ෂණය හා පරීක්ෂණ වාර්තාව |
| | 2025.10.13 | 64. 2025 තෙවන කාර්තුවට අදාල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී සාකච්ඡා වූ පරිදි අමාත්‍යාංශයේ ඉංජිනේරු අංශය යටතේ පවත්වාගෙන යනු ලබන ගබඩාවේ ක්‍රියාකාරීත්වය විගණන පරීක්ෂාවේදී පෙන්වා දුන් කරුණු අනුව පැනනැඟී ගැටළු සම්බන්ධයෙන් සාකච්ඡාවක් 2025.09.26 දින පැවැත්වීම සහ සාකච්ඡා සටහන් සකස් කිරීම. |
| | 2025.12.10 | 65. 2025 තෙවන කාර්තුවට අදාළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී සාකච්ඡා වූ පරිදි හා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛ 2025/DMA/01 ප්‍රකාරව අනු කමිටුවක් පත්කිරීම හා 2025.12.10 දින රැස්වීමක් පැවැත්වීම සහ සාකච්ඡා සටහන් සකස් කිරීම. |
| | 2025 නොවැම්බර්/ දෙසැම්බර් | 66. භාණ්ඩ සමීක්ෂණ කටයුතු හා අංශ ගත ඉන්වෙන්ට්‍රි කටයුතු විධිමත් කිරීම උදෙසා මූල්‍ය අංශයේ ප්‍රධානත්වයෙන් චක්‍රලේඛයක් කෙටුම්පත් කිරීම. |

### 2.3.2 2025.12.31 දින දක්වා සිදු කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවන් සම්බන්ධ විස්තර

කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් ගෙවීම් සම්බන්ධ දත්ත පද්ධතිය, ලිපිගොනු පරීක්ෂාව හා භෞතික පරීක්ෂාව සිදුකරන ලදී.

1. ඊට අමතරව, සෑම මාසයකම හත්ලක්ෂ දසදහසකට ආසන්න විශ්‍රාමිකයින් සඳහා මාසිකව ගෙවනු ලබන විශ්‍රාම වැටුප් ගෙවීම් දත්ත පද්ධතිය විගණනය කිරීම මඟින් හඳුනාගනු ලබන වැරදි හා අඩුපාඩු නිවැරදි කරගැනීම සඳහා 2025 වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාල 22ක් සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 280ක් ආවරණය වන පරිදි විගණන වාර්තා යොමු කරනු ලදී. තව ද විදේශගත විශ්‍රාම වැටුප් ලබාගන්නා විශ්‍රාමිකයින් සම්බන්ධයෙන්ද පරීක්ෂා කර බලා විගණන වාර්තා ඉදිරිපත් කරන ලදී.

2. අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු හා ආයතනයන්හි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සඳහා සහභාගී වීම.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ ආයතනය/ අංශය | පළමු කාර්තුව | දෙවන කාර්තුව | තෙවන කාර්තුව | සිව්වන කාර්තුව |
|---|---|---|---|---|
| 01. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 2025.03.21 | 2025.06.25 | 2025.10.15 | 2025.12.16 |
| 02.ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 2025.04.03 | 2025.06.26 | 2025.09.22 | 2025.12.19 |
| 04. දුරස්ථ අධ්‍යාපන ආයතනය | - | 2025.05.22 | - | - |
| 03.මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව | 2025.03.21 | 2025.06.12 | 2025.09.19 | 2025.12.19 |

3. 2025 වර්ෂය සඳහා වූ අමාත්‍යාංශයේ මූලික වාර්තාව ජනවාරි 31දිනට පෙර පිළියෙල කර ලේකම්තුමා වෙත ඉදිරිපත් කිරීම හා පාලිත ආයතනවල මූලික වාර්තාව පිළියෙල කිරීමට සහාය වීම හා උපදෙස් ලිපි නිකුත් කිරීම සිදුකරන ලදී.
4. ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ කාර්තුමය ඇගයීම් වාර්තාව අදාල අංශ හා ආයතනවලින් ලිපියොමුකර තොරතුරු ගෙන්වාගෙන සෑම කාර්තුවක් අවසානයේදීම කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත යොමුකිරීම.

## 2.4 අභ්‍යන්තර පාලන අංශය

එක් එක් අංශ අතර මනා සම්බන්ධතාවයක් ගොඩනගමින් ඔවුන්ගේ කාර්යය මණ්ඩලය වෙත අවශ්‍ය යටිතල පහසුකම් ලබාදෙමින් හා ආයතන පරිශ්‍රයේ යහපැවැත්ම ඇති කරමින්, අමාත්‍යාංශය වෙතින් මහජනතාවට හා සේවාවන් බලාපොරොත්තුවෙන් පැමිණෙන පාර්ශවයන්ට සුදුසු මහපෙන්වීම හා සහයෝගය ලබා දීමට හැකි පරිසරයක් සකස් කිරීම මෙම අංශය වෙතින් ඉටු කරනු ලබයි.

### 2.4.1 සපුරාගෙන ඇති ඉලක්ක

1. ජුනි මස 05 වන දින ජගත් පරිසර දිනයට සමගාමීව අමාත්‍යාංශ පරිශ්‍රය තුල රුක් රෝපණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.
2. මහජනතාව වෙත වඩාත් සුහදශීලී සහ වඩාත් කාර්යක්ෂම රාජ්‍ය සේවාවක් සැපයීම උදෙසා 2025 අගෝස්තු මස අවසන් සතියේ සිට අමාත්‍යාංශයීය මහජන දිනය ක්‍රියාත්මක කිරීම.
3. Clean Sri Lanka වැඩසටහන යටතේ අමාත්‍යාංශ පරිශ්‍රයේ "සෙයිරි සතිය" ක්‍රියාත්මක කිරීම තුලින් සුහුරු වැඩ පරිසරයක් නිර්මාණය කිරීමේ ක්‍රියාන්විතය ආරම්භ කිරීම.
4. අමාත්‍යාංශයේ සුපිළිපන්නභාවය වර්ධනය කිරීම උදෙසා "අභ්‍යන්තර කටයුතු ඒකකය" පිහිටුවීම.
5. අමාත්‍යාංශයේ සන්නිවේදන පහසුකම් යථාවත් කිරීම සඳහා නව අභ්‍යන්තර දුරකථන ඇමතුම් පද්ධතියක් ස්ථාපනය කිරීම.
6. ගුවන් හමුදාවේ ශ්‍රම දායකත්වය සහිතව අමාත්‍යාංශයේ ප්‍රධාන ගොඩනැගිල්ලේ පිටත අලුත්වැඩියා කිරීම සහ තීන්ත ආලේප කිරීමේ කටයුතු සිදුකිරීම.



#### 2.4.1.1 ආරක්ෂක වියදම්




1. ආරක්ෂක සේවා බිල්පත සකස් කිරීම ආරක්ෂක සේවයේ යොදවන නිලධාරීන්ගේ දෛනික පැමිණීම මත සිදු කරනු ලබන අතර සේවා මුරය සඳහා 2025 මාර්තු මස සේවයේ යොදවා සිටි සේවක සංඛ්‍යාවත් ඊට අනුපාතිකව ගෙවීම්

කරනු ලබන එකතු කල අගය මත වන බදු අගයත් මත 2025 මාර්තු මස, නොවැම්බර් මස සහ දෙසැම්බර් මස ආරක්ෂක පිරිවැය වැඩිවී ඇත.

#### 2.4.1.2 ගොඩනැගිලි නඩත්තු වියදම්




#### 2.4.1.3 2025.01.01 වන දින සිට 2025.12.31 වන දින දක්වා 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ පනත යටතේ අත්කර ගෙන ඇති ප්‍රගතිය

| අදාළ කරුණ | සංඛ්‍යාව |
|---|---|
| 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ මෙම අමාත්‍යාංශය වෙත යොමු කර ඇති ලිපි ප්‍රමාණය | 651 |
| ලියාපදිංචි මුළු තොරතුරු ඉල්ලීම් සංඛ්‍යාව (රාජ්‍ය පරිපාලන අංශය) | 471 |
| දැනට පිළිතුරු යවා ඇති තොරතුරු ඉල්ලීම් සංඛ්‍යාව | 437 |
| තවදුරටත් ඉල්ලුම්කරුවන් වෙත පිළිතුරු යොමු කළ යුතු ලිපි | 34 |
| ප්‍රතික්ෂේප කළ මුළු තොරතුරු ඉල්ලීම් සංඛ්‍යාව | 13 |
| ලියාපදිංචි මුළු අභියාචනා සංඛ්‍යාව | 44 |
| අභියාචනා විභාග සඳහා තීන්දු - තොරතුරු කොමිසම වෙත | 10 |
| තොරතුරු පනතට අදාල නොවන ලිපි( අප අමාත්‍යාශයේ විෂය පථයට අයත් නොවන වෙනත් අමාත්‍යාංශ වලට අදාල තොරතුරු ඉල්ලීම්) | 180 |

#### 2.4.2 අපේක්ෂිත ඉලක්ක

1. අමාත්‍යාංශ පරිශ්‍රයේ නඩත්තු කටයුතු, උද්‍යාන අලංකරණ සහ අලුත්වැඩියා කටයුතු සිදුකිරීම.
2. අමාත්‍ය කාර්යාලයේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකිරීම.
3. ලේකම් කාර්යාලයේ සහ විශේෂ ශ්‍රේණියේ මාණ්ඩලික නිලධාරී කාමර අලුත්වැඩියා කටයුතු සිදු කිරීම.
4. 2026 වර්ෂයේ අමාත්‍යාංශයේ සියලුම සේදුම්කාරක පද්ධති නවීකරණය සහ අලුත්වැඩියාව සිදුකිරීමට යෝජිතය.
5. ස්ටීල් ගොඩනැගිල්ලෙහි බිම් මහලේ සිදුකලයුතු ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම.
6. අමාත්‍යාංශ ප්‍රධාන ශ්‍රවණාගාරයේ ඇතුළත සහ පිටත වහලය සහ බිත්ති අලුත්වැඩියා කටයුතු සිදුකිරීම.
7. අමාත්‍යාංශයේ අංශවල පවතින පැරණි වායු සමීකරණ අලුත්වැඩියා කිරීම සහ අලුත්වැඩියා කටයුතු සිදුකිරීමට නොහැකි යන්ත්‍ර සඳහා නව වායුසමීකරණ යන්ත්‍ර ස්ථාපනය කිරීම .

## 2.5 ආයතන අංශය

#### 2.5.1 සපුරාගෙන ඇති ඉලක්ක

| අනු අංකය | සිදු කරන ලද කාර්යයන් | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | නිකුත් කරන ලද චක්‍රලේඛ සංඛ්‍යාව | 16 |
| 2 | නිකුත් කරන ලද චක්‍රලේඛ ලිපි | 05 |
| 3 | අංශය වෙත යොමු කර ඇති ලිපි සංඛ්‍යාව (ගොනුකළ හා අංශයට අදාළ නොවන ලිපි හැර) | 3988 |
| 4 | ලිපි සඳහා යවා ඇති පිළිතුරු සංඛ්‍යාව | 3783 |
| 5 | බඳවා ගැනීමේ පරිපාටි සඳහා ලබා දී ඇති නිර්දේශ සංඛ්‍යාව | 61 |
| 6 | සේවා ව්‍යවස්ථා සඳහා ලබා දී ඇති නිර්දේශ සංඛ්‍යාව | 04 |
| 7 | අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ | 28 |
| 8 | නිරීක්ෂණ සඳහා ලද අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව | 184 |
| 9 | අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා ලබා දී ඇති නිරීක්ෂණ සංඛ්‍යාව | 179 |
| 10 | තොරතුරු පනතට අදාළව ලද අයදුම්පත් සංඛ්‍යාව | 196 |
| 11 | තොරතුරු පනතට අදාළව ලබා දී ඇති පිළිතුරු සංඛ්‍යාව | 196 |
| 12 | අනුමත කරන ලද වන්දි ලිපි ගොනු සංඛ්‍යාව | 174 |
| 13 | අනුමත කරන ලද මුළු වන්දි මුදල | රු.99,074 ,140.83 |

**2.5.1.1. 2025 අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

| අනු අංකය | චක්‍රලේඛ අංකය | නිකුත් කළ දිනය | කාරණය | යොමුව |
|---|---|---|---|---|
| 01 | 01/2025 | 2025.01.06 | ආයතන සංග්‍රහයේ විධිවිධාන සංශෝධනය කරමින් නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ - 2024 | - |
| 02 | 02/2025 | 2025.01.17 | 2024 වර්ෂයේ නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ නාමාවලිය | - |
| 03 | 03/2025 | 2025.01.20 | රාජ්‍ය නිලධරයන් වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත් දරු විශ්‍රාම වැටුප් ක්‍රමයෙහි ලියාපදිංචි කිරීම සහ ඔවුන්ගේ ප්‍රතිලාභ තොරතුරු සත්‍යාපනය, නව මාර්ගගත තොරතුරු පද්ධතියක් ඔස්සේ සිදු කිරීම | 2017.10.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 26/2017 හා ආනුෂාංගික චක්‍රලේඛ |
| 04 | 04/2025 | 2025.01.31 | ජල ගැලීම්/ ගංවතුර, නායයෑම් හා මාර්ග අවහිරතා හේතු කොටගෙන සේවයට නොපැමිණි රාජ්‍ය නිලධරයන් සඳහා නිවාඩු ලබා දීම 2024 නොවැම්බර් | |
| 05 | 05/2025 | 2025.01.31 | 2025 රාමලාන් (රාමසාන්) විශේෂ නිවාඩු ලබා දීම | |
| 06 | 07/2025 | 2025.03.17 | පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ ඒ ආකාරයේ අනෙකුත් වැඩසටහන් මෙහෙයවන සම්පත්දායකයින්ට දීමනා ගෙවීම | |
| 07 | 08/2025 | 2025.02.21 | ආයතන සංග්‍රහයේ I වන කාණ්ඩයේ XII වන පරිච්ඡේදයේ 8:5 උප වගන්තිය සංශෝධනය කිරීම | ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 8 වගන්තිය |
| 08 | 09/2025 | 2025.04.02 | රාජ්‍ය ආයතන වල ඝණ අපද්‍රව්‍ය කළමණාකරණ කටයුතු විධිමත් කිරීම | මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිකුත් කරන ලද අංක 2341/30 සහ 2023 ජූලි මස 19 දිනැති ගැසට් නිවේදනය |
| 09 | 10/2025 | 2025.03.25 | 2025 අයවැය යෝජනා අනුව රාජ්‍ය සේවයේ වැටුප් සංශෝධනය | ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ 5 වගන්තිය<br>ආයතන සංග්‍රහයේ VIII වැනි පරිච්ඡේදයේ 10 වගන්තිය<br>ආයතන සංග්‍රහයේ VIII වැනි පරිච්ඡේදයේ 12 වගන්තිය<br>ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 5 වගන්තිය<br>2014.07.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 (XI)<br>2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 සහ අනුෂංගික චක්‍රලේඛ<br>2018.02.20 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2018<br>2019.07.08 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2019<br>2019.04.22 දිනැති රාජ්‍ය |

| | | | | |
|---|---|---|---|---|
| | | | | පරිපාලන චක්‍රලේඛ 09/2019<br>2022.01.13 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2022<br>2024.01.10 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2024<br>2024.08.07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2024 |
| 10 | 11/2025 | 2025.04.11 | ජල ගැලීම්/ ගංවතුර, නායයෑම් හා මාර්ග අවහිරතා හේතු කොටගෙන සේවයට නොපැමිණි රාජ්‍ය නිලධරයන් සඳහා නිවාඩු ලබා දීම 2024 ඔක්තෝබර් | - |
| 11 | 12/2025 | 2025.05.09 | ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 10 වගන්තිය - ආපදා ණය | 2008.12.31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/2008<br>2025.03.22දිනැති අයවැය චක්‍රලේඛ 01/2025 හි 04.4 උපවගන්තිය<br>2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 |
| 12 | 13/2025 | 2025.06.18 | රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී “20.02.01.01” සඳහා හිඟ ආදායම් වාර්තා ඉදිරිපත් කිරීම - 2028.06.30 | රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2015.07.20 දිනැති අංක 01/2015 චක්‍රලේඛය<br>මුදල් රෙගුලාසි 113<br>මුදල් රෙගුලාසි 128 (2) (ඇ) |
| 13 | 14/2025 | 2025.06.18 | රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී “20.02.01.01” සඳහා ආදායම් ඇස්තමේන්තු - 2026 | මුදල් රෙගුලාසි 85 (1),(2) |
| 14 | 15/2025 | 2025.07.01 | 2025 අයවැය යෝජනා අනුව 2018.01.01, 2019.01.01 හා 2020.01.01 දිනට හිමිගැන්විය යුතු වැටුප මත විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය කිරීම. | 2015.06.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 16/2015<br>2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016<br>2019.05.31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2019<br>2024.01.10 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2024<br>2016.04.29 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ 03/2016<br>2018.08.22 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ 03/2018(I)<br>2018.04.02 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2018<br>2016.04.27 දිනැති විශ්‍රාම වැටුප් |

| | | | | |
|---|---|---|---|---|
| | | | | චක්‍රලේඛ 03/2016<br>2022.01.20 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 01/2022<br>අංක: අමප/17/2936/755/035 හා 2017.12.19 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය<br>අංක: අමප/24/1992/704/007 හා 2024.10.14 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය |
| 15 | 16/2025 | 2025.07.11 | කුසලතා පදනම මත කළමණාකරණ නිලධාරී සේවයේ අධිශ්‍රේණියට උසස් කිරීමේ තරඟ විභාගය - 2025 | අංක 1840/34 දරන 2013.12.11 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය<br>2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 |
| 16 | 17/2025 | 2025.07.15 | ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය - 2026 | - |
| 17 | 18/2025 | 2025.07.14 | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය - 2026 (I, II හා III ශ්‍රේණි) | අංක: අමප/11/1090/523/087 හා 2011.05.11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය<br>අංක: අමප/14/0286/523/007 හා 2014.04.23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය |
| 18 | 19/2025 | 2025.07.14 | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය - 2026 | 2022.12.14 දිනැති අංක 2310/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පටිපාටික රීති 1වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදයේ 251 රීතිය |
| 19 | 20/2025 | 2025.07.15 | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය - 2026 (I, II හා III ශ්‍රේණි) | - |
| 20 | 21/2025 | 2025.09.03 | දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය ලිපිකාර සේවයේ හා දුම්රිය කාලගණක ලිපිකරු සේවයේ නිලධාරින් රාජ්‍ය කළමණාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය කිරීම | අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 22/0874/510/016 හා සම්බන්ධ 2022.07.04 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය<br>2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 |
| 21 | 22/2025 | 2025.08.18 | “ක්ලීන් ශ්‍රී ලංකා” “(Clean Sri Lanka)” ජාතික වැඩසටහනට සමගාමීව රාජ්‍ය ආයතන තුල සංවිධිත බව පවත්වා ගැනීම සඳහා “සෙයිරි සතිය” ක්‍රියාත්මක කිරීම | ආයතන සංග්‍රහය XXVIII වැනි ඡේදයේ 9.2 වගන්තිය<br>2019.02.27 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2019 මඟින් ආයතන සංග්‍රහයේ XXVIII වැනි පරිච්ඡේදය සඳහා එක්කර ඇති 9.2.1 වගන්තිය<br>2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත<br>අල්ලස් හා දූෂණ චෝදනා විමර්ෂණ කොමිෂන් සභා ලේකම්ගේ අංක |

| | | | | |
|---|---|---|---|---|
| | | | | BC/PRV/15/2024 හා 2024..10.21 දිනැති ලිපිගොනු සංරක්ෂණ හා ඒවා විධිමත් ලෙස බැහැර කිරීම සඳහා මාර්ගෝපදේශ<br>2020.10.02 දිනැති අංක 5/2020 දරන වත්කම් කළමණාකරණ චක්‍රලේඛය<br>2024.12.18 දිනැති අංක 5/2024 දරන වත්කම් කළමණාකරණ චක්‍රලේඛය<br>මුදල් රෙගුලාසි අංක 770<br>මුදල් රෙගුලාසි අංක 772<br>මුදල් රෙගුලාසි අංක 756<br>2020.08.28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 මගින් සංශෝධිත මුදල් රෙගුලාසි අංක 770(4), 770(6), 767(1) |
| 22 | 23/2025 | 2025.08.21 | කළමණාකරණ සේවා නිලධාරි සේවයේ නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරුවීම් - 2026 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 2310/29 හා 2022.12.14 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ කාර්ය පටිපාටික රීති (කාණ්ඩ අංක 1) හි XVIII කාර්ය පටිපාටික රීති 251, 254 වගන්ති |
| 23 | 24/2025 | 2025.10.03 | රාජ්‍ය පරිපාලනය පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය යටතේ පවතින නිවාඩු බංගලා වල ගාස්තු | ආයතන සංග්‍රහයේ I වැනි කාණ්ඩයේ XX වැනි පරිච්ඡේදයේ 6:1 උපවගන්තිය සහ 19 වැනි පරිශිෂ්ඨය |
| 24 | 25/2025 | 2025.09.26 | 2023 පළාත් පාලන ඡන්ද විමසීමට ඉදිරිපත් වීමට නාමයෝජනා භාරදුන් දේශපාලන අයිතිවාසිකම් හිමි රාජ්‍ය නිලධරයන්ට සහන සැලසීම | ආයතන සංග්‍රහයෙහි XXXII වැනි පරිච්ඡේදයේ 2:3:2 උපවගන්තිය |
| 25 | 26/2025 | 2025.10.24 | මූලික විමර්ශන සඳහා ගෙවීම් | 2014.05.30දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2018<br>ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVII වැනි පරිච්ඡේදයේ 13 වගන්තිය |
| 26 | 27/2025 | 2025.10.24 | විනය පරීක්ෂණ කටයුතු සඳහා ගෙවීම් සිදු කිරීම | 2018.07.13 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2018<br>ආයතන සංග්‍රහයේ XIV වැනි පරිච්ඡේදයේ 28:6 , 29:8 උපවගන්ති<br>ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ 19:7 උපවගන්තිය<br>2003.12.11 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2003 |

| | | | | |
|---|---|---|---|---|
| 27 | 28/2025 | 2025.10.24 | සම්මුඛ පරීක්ෂණ සාමාජිකයන් ලෙස සේවය කිරීම වෙනුවෙන් හා සහය කාර්ය මණ්ඩලය වෙනුවෙන් ගෙවීම | 2017.12.05 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/2017 |
| 28 | 29/2025 | 2025.11.26 | විෂ මත්ද්‍රව්‍ය මුලිනුපුටා දැමීම සඳහා වන “රටම එකට ජාතික මෙහෙයුම” වැඩසටහනට සමගාමීව ඒ සඳහා වන සාමූහිකයක් (Collectives)/ කව (Circles) ආයතනික මට්ටමින් පිහිටුවීම | අමප/25/1937/801/026 හා 2025.10.13 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය.<br>ජනාධිපති ලේකම් විසින් නිකුත් කර ඇති PS/ADA/Circular/13/2025 හා 2025.11.14 දිනැති චක්‍රලේඛය<br>ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVII වැනි පරිච්ඡේදයේ 2 වගන්තිය |
| 29 | 30/2025 | 2025.11.27 | රාජ්‍ය නිලධාරින් සඳහා විශේෂ නිවාඩු දිනයක් ප්‍රකාශයට පත් කිරීම | - |
| 30 | 31/2025 | 2025.12.10 | රජයේ නිලධරයන්ට විශේෂ අත්තිකාරම් | ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 3 වගන්තිය<br>මුදල් රෙගුලාසි අංක 238 |
| 31 | 32/2025 | 2025.12.15 | ජලගැලීම්/ ගංවතුර, නායයෑම් හා මාර්ග අවහිරතා හේතු කොටගෙන සේවයට නොපැමිණි රාජ්‍ය නිලධරයන් සඳහා නිවාඩු ලබා දීම 2025 නොවැම්බර් | - |
| 32 | 33/2025 | 2025.12.15 | රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී “20.02.01.01” සඳහා හිඟ, ආදායම් වාර්තා ඉදිරිපත් කිරීම - 2025.12.31 | රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2015.07.20 දිනැති අංක 01/2015 චක්‍රලේඛය<br>මුදල් රෙගුලාසි 128 (2) (ඇ)<br>මුදල් රෙගුලාසි 113 |
| 33 | 34/2025 | 2025.12.30 | 2026 වසර රාජකාරි කටයුතු ඇරඹීම | - |

**2.5.1.2 2025 වර්ෂයේදී අමාත්‍යාංශය මඟින් නිකුත් කරන ලද සංශෝධිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

| අනු අංකය | චක්‍රලේඛ අංකය | නිකුත් කළ දිනය | කාරණය | යොමුව |
|---|---|---|---|---|
| 01 | 03/2019 (VI) | 2025.01.17 | ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 19:5 උපවගන්තිය යටතේ වූ විනය පරීක්ෂණ නිලධර නාම ලේඛනය | 2019.02.20 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2019 හා අනුෂංගික චක්‍රලේඛ<br>ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 19:14 උපවගන්තිය |
| 02 | 20/2011 (I) | 2025.01.29 | විනය පරීක්ෂණ සඳහා අවශ්‍ය ඡායාස්ථ පිටපත් ලබා දීමේදී අයකළ යුතු ගාස්තු | ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 14:11 උපවගන්තිය<br>2011.10.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 20/2011 |
| 03 | 18/2020 (II) | 2025.05.26 | රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම | 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 |

| | | | | |
|---|---|---|---|---|
| | | | | 2020.10.28 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 (I) |
| 04 | 04/2017 (II) | 2025.06.04 | ප්‍රායෝගික පුහුණුව සඳහා අභ්‍යාසලාභීන් රාජ්‍ය ආයතන වලට අනුයුක්ත කිරීම | 2017.08 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2017<br>2017.08.10 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2017 (I) |
| 05 | 02/2016 (I) | 2025.08.20 | ආයතන සංග්‍රහයේ 1 පරිශිෂ්ඨය සංශෝධනය කිරීම | 2016.01.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2016 |
| 06 | 05/2008 (II) | 2025.09.01 | පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වා දීම | 2008.02.06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 05/2008 හා අනුෂංගික චක්‍රලේඛ<br>ජනාධිපති ලේකම් ගේ අංක PS/SB/Circular/2/2025 හා 2025.02.18 දිනැති චක්‍රලේඛයේ 4.0 (viii) වගන්තිය |
| 07 | 15/2025 (I) | 2025.11.14 | 2025 අයවැය යෝජනා අනුව 2018.01.01, 2019.01.01 හා 2020.01.01 දිනට හිමිගැන්විය යුතු වැටුප මත විශ්‍රාම වැටුප ප්‍රතිශෝධනය කිරීම | 2025.01.01දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/2025 |
| 08 | 03/2025 (I) | 2025.11.17 | රාජ්‍ය නිලධරයන් වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත් දරු විශ්‍රාම වැටුප් ක්‍රමයෙහි ලියාපදිංචි කිරීම සහ ඔවුන්ගේ ප්‍රතිලාභ තොරතුරු සත්‍යාපනය, නව මාර්ගගත තොරතුරු පද්ධතියක් ඔස්සේ සිදු කිරීම | 2025.01.20 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2025 |
| 09 | 14/2022 (V) | 2025.12.05 | ජ්‍යෙෂ්ඨතාවයට හා විශ්‍රාම වැටුපට හානියක් නොවන පරිදි රාජ්‍ය නිලධරයන්ට දේශීය / විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා දීම | 2022.06.22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 හා ආනුෂංගික චක්‍රලේඛ |

**2.5.1.3 2025 වර්ෂයේ අමාත්‍යාංශය මඟින් නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි**

| අනු අංකය | චක්‍රලේඛ ලිපි අංකය | නිකුත් කළ දිනය | කාරණය | යොමුව |
|---|---|---|---|---|
| 01 | 01/2025 | 2025.03.06 | අංක අමප/19/2618/103/069-I හා 2019.09.24 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව පොලිස් හෝ විශේෂ කාර්ය බලකා සාමාජිකයින් වෙත ප්‍රතිලාභ හිමිගැන්වීම | 2020.07.15 දිනැති ආරක්ෂක අමාත්‍යාංශ චක්‍රලේඛ MOD/01/2020<br>විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2:17 හා 14 වගන්ති |
| 02 | 02/2025 | 2025.03.26 | රාජ්‍ය සේවයේ වැටුප් සංශෝධනය - 2025 Salary 2025 මෘදුකාංගය මඟින් වැටුප් පරිවර්තන ලිපි සැකසීම | 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 |
| 03 | 03/2025 | 2025.04.07 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 අනුව වැටුප් ගෙවීම | 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 |
| 04 | 04/2025 | 2025.06.30 | රාජ්‍ය ආයතන වෙත අතින් භාරදෙනු ලබන ලිපි ලේඛන සම්බන්ධව කටයුතු කිරීම | - |

| | | | | |
|---|---|---|---|---|
| 05 | 05/2025 | 2025.06.27 | 2025 අයවැය යෝජනා අනුව රාජ්‍ය සේවයේ වැටුප් සංශෝධනය | 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ 12 වගන්තියේ විධිවිධාන |
| 06 | 06/2025 | 2025.10.16 | රාජ්‍ය ආයතන හා රාජ්‍ය නිලධරයන් විසින් නීතිපති උපදෙස් හෝ අදහස් ලබා ගැනීම | ආයතන සංග්‍රහයේ I වැනි කාණ්ඩයේ XXXIII වැනි පරිච්ඡේදයේ පළවැනි වගන්තිය |

**2.5.1.4 2025 වර්ෂයේ ක්‍රියාත්මක කළ වෙනත් වැඩසටහන්**

1. කාර්යාලීය කටයුතු වඩාත් විධිමත් අයුරින් කාර්යක්ෂමව පවත්වා ගැනීමේ අරමුණ පෙරදැරිව ආයතන අංශයේ සියලු මාණ්ඩලික නිලධාරීන්ගේ, විෂය නිලධාරීන් සහ කාර්යාල සේවක සේවයේ නිලධාරීගේ අනිවාර්ය සහභාගීත්වයෙන් 2025.12.13 දින ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ සම්පත්දායකත්වයෙන් වූ පුහුණු වැඩමුළුව අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේදී පැවැත්වීය. එම වැඩසටහන රාජකාරී ලේඛන කටයුතු සිදුකෙරෙන ආකාරය, රාජකාරී පරිසරය තුළ නිලධාරීන්ට ඇතිවන ප්‍රායෝගික ගැටලු හා විසඳුම් පිළිබඳව සාකච්ඡා කිරීම හා වෙනත් ප්‍රයෝගික ක්‍රියාකාරකම් වලින් සමන්විත විය.
2. එම අවස්ථාව පුහුණු වැඩසටහනෙහි අපේක්ෂිත ඉලක්ක ද සපුරාගනිමින් අංශයේ සියලු නිලධාරීන්ගේ සුහදතාවය වර්ධනයට ඉවහල් වූ අතරම, නවක නිලධාරීන් හට ආයතන අංශයේ සමස්ථ ක්‍රියාවලිය පිළිබඳ අවබෝධය වර්ධනය වීමට ඉවහල් විය.

**<u>2.5.2 අපේක්ෂිත ඉලක්ක</u>**

1. ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කළ යුතු කරුණු හා ඒවා ඉදිරිපත් කළ යුතු ආකාරය පිළිබඳව අවධානය යොමු කරවූ 12/2012 හා 12/2012(1) චක්‍රලේඛ පදනම් කර ගනිමින් නව ප්‍රතිපාදන ද ඇතුළත් කර එක් චක්‍රලේඛයක් නිකුත් කිරීම.
2. රාජකාරියේ යෙදී සිටියදී තුවාල ලබන රාජ්‍ය නිලධරයන්ට වන්දි ගෙවීම සඳහා විධිවිධාන සැලසූ 22/93, 22/93(I), 22/93(III), 22/93(IV), 22/93(V), 22/93(VI) යන චක්‍රලේඛ පදනම් කරගනිමින් නව ප්‍රතිපාදන ද ඇතුළත් කර එක් චක්‍රලේඛයක් නිකුත් කිරීම.
3. 1 වන, 2 වන, හා 4 වන කාර්තු සඳහා ආයතන සංග්‍රහයේ විධිවිධාන සම්බන්ධයෙන් රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ අරමුණින් පුහුණු වැඩසටහන් 03ක් සංවිධානය කිරීම.

## 2.6 නිවාස සංවර්ධන අංශය

රාජ්‍ය නිලධාරීන්ට නිල නිවාස පහසුකම් සැපයීමේ අරමුණ පෙරදැරිව, රජයේ නිල නිවාස වෙන් කිරීම හා පරිපාලනය, දිවයින පුරා නව නිල නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, රජයේ නිවාඩු බංගලා හා නිකේතන වෙන් කිරීම හා පරිපාලනය සහ නිවාස හිමි නොවූ රජයේ නිලධාරීන් වෙත මහල් නිවාස ලබා දීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම යන මූලික කාර්යයන් හා ඊට අදාළ සෙසු කටයුතු මෙම අංශය මඟින් සිදු කෙරේ.

**නිල පියස නිල නිවාස ව්‍යාපෘති**

මෙම අංශය මඟින් පහත සඳහන් නිල නිවාස ව්‍යාපෘතීන්හි කටයුතු සම්පූර්ණයෙන් නිමකොට රාජ්‍ය නිලධාරීන්ගේ නිල නිවාස පහසුකම් වෙනුවෙන් වෙන්කර ඇත.

- කොළඹ නිල පියස
- මහනුවර නිල පියස
- මොණරාගල නිල පියස
- ගම්පහ නිල පියස

එහිදී මහනුවර නිල පියස හා මොණරාගල නිල පියසයන්හි පරිපාලන කටයුතු අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වලට ලබා දී ඇති අතර, කොළඹ නිල පියස හා ගම්පහ නිල පියසයන්හි පරිපාලන කටයුතු මෙම අමාත්‍යාංශය යටතේ සිදුවේ. තවද පොළොන්නරුව දිස්ත්‍රික්කය කේන්ද්‍ර කර ගනිමින් අරඹන ලද නිවාස ඒකක 32 කින් සමන්විත නිල පියස නිල නිවාස ව්‍යාපෘතිය මොරටුව විශ්ව විද්‍යාලයීය උපදේශන සේවය යටතේ සෙන්ට්‍රල් ඉංජිනියරින් පුද්ගලික සමාගම් විසින් ඉදිකිරීම් කටයුතු සිදු කරන ලද ව්‍යාපෘතියක් වන අතර රටෙහි පැවති අභියෝගකාරී වාතාවරණය හමුවේ රාජ්‍ය වියදම් කළමනාකරණ 03/2022 චක්‍රලේඛය ප්‍රකාරව මෙම ව්‍යාපෘතියෙහි ඉදි කිරීම් කටයුතු තාවකාලිකව නවතා දමන ලදි. එනමුත් අංක : අමප/25 /1569/816/068 හා හා 2025.09.16 දිනති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීමට අනුමැතිය ලැබී ඇත.

**රජයේ නිල නිවාස**

මෙම අමාත්‍යාංශය මඟින් පාලනය වන පහත නිල නිවාස ගරු අමාත්‍යවරුන්, රාජ්‍ය අමාත්‍යවරුන්, රජයේ මාණ්ඩලික නිලධාරීන් මාණ්ඩලික නොවන නිලධාරීන්ගේ පදිංචිය සඳහා වෙන්කර දීමට කටයුතු කරනු ලබයි.

- කැප්පෙටිපොළ මාවත සමූහ නිවාස (නිවාස 104)
- බංගලා නිවාස (නිවාස 52)
- ජයවඩනගම නිවාස (නිවාස 18)
- ලොරිස් පටුමඟ නිවාස සංකීර්ණය (නිවාස 20)
- කොළඹ 08, ගෝතමී පාර නිවාස (නිවාස 02)
- කොළඹ 07 " නිල පියස" නිවාස සංකීර්ණය (නිවාස 40)
- ගම්පහ "නිල පියස" නිල නිවාස සංකීර්ණය (නිවාස 32)

**නිවාඩු බංගලා හා නිවාඩු නිකේතන**

දිවයින පුරා විසිරී සිටින රාජ්‍ය නිලධරයන්ගේ රාජකාරි හා පෞද්ගලික සංචාරක අවශ්‍යතා සපුරාලීම සඳහා නිවාඩු බංගලා 08ක් ද, රාජ්‍ය නිලධාරීන් ඇතුළු සියලු මහජනතාවගේ සංචාරක අවශ්‍යතා සපුරාලීම වෙනුවෙන් නිවාඩු නිකේතන 07 ක්ද මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

| නිවාඩු බංගලා | නිවාඩු නිකේතන |
|---|---|
| නුවරඑළිය( පැරණි ) | පොළොන්නරුව |
| නුවරඑළිය නව A1 | යාපනය |
| නුවරඑළිය නව A2 | මිහින්තලය |
| නුවරඑළිය නව B | මහියංගනය |
| දියතලාව A | මුලතිව් |
| දියතලාව B | කතරගම |
| බණ්ඩාරවෙල 1 | මොණරාගල |
| බණ්ඩාරවෙල 2 | |

**2.6.1 සපුරාගෙන ඇති ඉලක්ක**

1. රජයේ ආයතන සතු නිවාඩු නිකේතන සහ සංචාරක බංගලා වඩාත් ඵලදායී ලෙස භාවිතයට ගැනීම යටතේ මහියංගනය, මොනරාගල සහ මුලතිව් යන ප්‍රදේශවල පිහිටි නිවාඩු නිකේතන නවීකරණය කිරීම සඳහා රුපියල් මිලියන 62 ක ප්‍රතිපාදන වෙන් කරන ලදි. මෙම ප්‍රතිසංස්කරණ කටයුතු හරහා එම නිකේතනවල ප්‍රමිතිය ඉහළ නැංවීමටත්, එමඟින් රජයට ලැබෙන ආදායම් මාර්ග ශක්තිමත් කිරීමට කටයුතු කර ඇත.






මහියංගනය නිවාඩු නිකේතනය (ප්‍රතිසංස්කරණයෙන් පසු)



මොනරාගල නිවාඩු නිකේතනය (ප්‍රතිසංස්කරණයෙන් පසු)



මුලතිව් නිවාඩු නිකේතනය (ප්‍රතිසංස්කරණයෙන් පසු)

2. නිවාස හා සංවර්ධන අංශය සහ තොරතුරු තාක්ෂණ අංශය එක්ව ක්‍රියාත්මක කළ විශේෂ ව්‍යාපෘතියක් ලෙස, බංගලා සහ නිවාඩු නිකේතන වෙන්කරවා ගැනීම සඳහා වූ නවීන මාර්ගගත (Online) පද්ධතිය 2025 වසරේදී සාර්ථකව ජනගත කරන ලදී. මෙමගින් පාරිභෝගිකයාට වඩාත් විනිවිදභාවයකින් සහ පහසුවකින් යුතුව සේවා ලබාගැනීමට අවස්ථාව සැලසී ඇති අතර, අතින් සිදුකළ (Manual) කාර්යයන් අවම කිරීම හරහා ආයතනික කාර්යක්ෂමතාව ඉහළ නැංවීමටද හැකි වී ඇත. මෙය රාජ්‍ය සේවාව ඩිජිටල්කරණය ඔස්සේ නවීකරණය කිරීමේ තැබූ තීරණාත්මක පියවරකි.












3. 2025 වර්ෂයේ තෙවන කාර්තුව තුළ යටිතල පහසුකම් නඩත්තු කිරීමේ ව්‍යාපෘතියක් ලෙස, කොළඹ 'නිල පියස' නිවාස සංකීර්ණයේ ස්ථාපිත කර ඇති ජල පීඩන පොම්ප පද්ධතිය (Water Pressure Pump System) ප්‍රතිසංස්කරණය කිරීමට පියවර ගන්නා ලදී. මෙම අලුත්වැඩියාව මඟින්, පදිංචිකරුවන්ට මුහුණ දීමට සිදු වූ ජල සැපයුම් ගැටලුවලට කඩිනම් විසඳුම් ලබා දෙමින් මුළු නිවාස සංකීර්ණය පුරාම විධිමත් හා කාර්යක්ෂම ජල සැපයුමක් ලබා දීමට හැකි විය.
4. මෙම අමාත්‍යාංශය යටතේ පවතින මාණ්ඩලික නොවන නිලධාරීන් සඳහා වෙන් කරනු ලබන 'ජයවඩනගම' නිවාස සංකීර්ණයේ නිවාස ඒකක රාජ්‍ය පරිපාලන අංශයේ සුදුසු නිලධාරීන් සඳහා ලබා දීමට 02/2024 අභ්‍යන්තර චක්‍රලේඛය හඳුන්වාදීම සහ සුදුසු නිවාසලාභීන් තෝරා නිලධාරීන් හට නිවාස වෙන් කර දීම.
5. ලොරිස් පටුමඟ නිවාස සංකීර්ණයේ පවතින අත්‍යාවශ්‍ය නඩත්තු කටයුතු හා ව්‍යුහාත්මක හානි අවම කිරීම සඳහා වාර්තාවක් හා එකී පිළියම් සඳහා ඇස්තමේන්තුවක් ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය මඟින් ලබා ගැනීමට කටයුතු කිරීම.

**2.6.1.1 සංචාරක නිකේතන ආදායම් වාර්තාව**




**2.6.1.2 නිවාඩු බංගලා ආදායම් වාර්තාව**




## 2.6.2 අපේක්ෂිත ඉලක්ක

1. මේ වන විට ඉඩම් පවරා ගැනීමේ කටයුතු අවසන්ව නොමැති සංචාරක බංගලා සහ නිවාඩු නිකේතනයන්හි ඉඩම් පවරා ගැනීමේ කටයුතු කඩිනමින් අවසන් කිරීම
2. මිහින්තලය, නුවරඑළිය නව B, දියතලාව A හා B, බණ්ඩාරවෙල 1 හා 2, යාපනය හා කතරගම යන සංචාරක බංගලා හා නිවාඩු නිකේතන නව සංචාරක ආකර්ෂණයක් ඇති වන පරිදි ප්‍රතිසංස්කරණය කිරීම
3. මේ වන විට තාවකාලිකව නවතා ඇති පොළොන්නරුව නිල පියස නිල නිවාස ව්‍යාපෘතිය නැවත ආරම්භ කර සියලු ඉදි කිරීම් නිම කිරීමට අනුමැතිය ලබා ගැනීම සඳහා රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමන් 2025.08.22 දිනැතිව ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2025.09.08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ලැබී ඇත. ඒ අනුව මෙම ව්‍යාපෘතිය නව කොන්ත්‍රාත්කරුවකු තෝරාගෙන නැවත ආරම්භ කිරීම.
4. ලෝරිස් නිවාස සංකීර්ණයේ සිදු කළ යුතු ව්‍යුහාත්මක අලුත්වැඩියා කටයුතු, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් ඉදිරිපත් කර ඇති වාර්තාවට අනුව සකස් කරන ලද ඇස්තමේන්තු පරිදි ප්‍රසම්පාදන ක්‍රියාවලිය

හරහා කොන්ත්‍රාත්කරුවකු තෝරාගෙන අදියර වශයෙන් සිදු කිරීම.

5. රජය සතු ඌණ උපයෝජිත බංගලා නිවාස ආර්ථිකමය වශයෙන් ඵලදායී උපයෝජනයන් ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගැනීමට අදාල 2025.01.05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ඉදිරි කටයුතු කිරීම.

6. මෙම අමාත්‍යාංශය යටතේ පවතින මාණ්ඩලික නොවන නිලධාරීන් සඳහා වෙන්කරනු ලබන ජයවඩනගම නිවාස සංකීර්ණයේ නිවාස ඒකක රාජ්‍ය පරිපාලන අංශයේ සුදුසු නිලධාරීන් සඳහා ලබා දීමට නව අභ්‍යන්තර චක්‍රලේඛයක් ක්‍රියාත්මක කිරීම සහ සුදුසු නිවාස ලාභීන් තෝරා නිලධාරීන් හට නිවාස වෙන් කර දීම.

7. වෙන් කිරීම් සිදු කරන ලද කාලයේදී වැඩිම ආදායමක් උපයන සංචාරක නිකේතනයක් වන යාපනය සංචාරක නිකේතනය අලුත්වැඩියා කර උපරිම ඵලදායී අයුරින් ප්‍රයෝජනයට ගතහැකි පරිදි එහි පරිපාලන කළමණාකාරීත්ව කටයුතු සිදු කිරීම.

## 2.7 විශ්‍රාම වැටුප් අංශය

විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය පරිපාලන ලේකම් වෙත බලතල පැවරී ඇති කාර්යයන් ඉටු කිරීම, විශ්‍රාම වැටුප් සම්බන්ධ ප්‍රතිපත්තිමය කරුණු සම්පාදනය කිරීම, විශ්‍රාමිකයන්ගේ හා විශ්‍රාමික සංගම්වලින් ඉදිරිපත් කෙරෙන ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම හා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ආයතන කටයුතු සම්බන්ධීකරණය කිරීම විශ්‍රාම වැටුප් අංශය මඟින් සිදු කෙරේ.

මෙම අංශය අතිරේක ලේකම් (රාජ්‍ය පරිපාලන)ගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන අතර ආසන්නතම අධීක්ෂණ නිලධාරීන් ලෙස ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (විශ්‍රාම වැටුප්) සහ සහකාර ලේකම් (විශ්‍රාම වැටුප්) කටයුතු කරයි.

**අංශය මඟින් සිදුකරන ප්‍රධාන කාර්යයන්**

1. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය, වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් පනත සහ විශ්‍රාම වැටුප් සම්බන්ධ වෙනත් අණ පනත්වල ඇති ව්‍යවස්ථානුකූල විධි විධාන ක්‍රියාවට නැංවීම.
2. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ පරිපාලන හා සංවර්ධන ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම.
3. විශ්‍රාමිකයන් හා ඔවුන්ගේ සංගම් විසින් ඉදිරිපත් කරනු ලබන දුක්ගැනවිලි හා පැමිණිලි විමර්ශනය කිරීම හා අවශ්‍ය පරිදි අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණය වී කටයුතු කිරීම.
4. හිඟ විශ්‍රාම වැටුප්, විශ්‍රාම වැටුප් පැවරීම, විශ්‍රාම වැටුප් හිමිකම් ඉල්ලීම ආදී විශ්‍රාම වැටුප් සම්බන්ධ ගැටලුවලට පිළිතුරු යැවීම.
5. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 හා 15 වගන්ති යටතේ විශ්‍රාම යවනු ලැබූ රාජ්‍ය නිලධාරීන් හට විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධයෙන් ලේකම්තුමාගේ තීරණ අදාළ ආයතන වෙත දැනුම් දීම.
6. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය මඟින් රාජ්‍ය පරිපාලන ලේකම් වෙත පවරා ඇති වෙනත් කාර්යයන් ඉටු කිරීම.
7. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය හා විශ්‍රාම වැටුප් හා සම්බන්ධ නොයෙකුත් අණ පනත් සංශෝධනය කිරීමට අදාළ කටයුතු සිදු කිරීම.
8. විශ්‍රාම වැටුප් සම්බන්ධ කටයුතුවල දී අදාළ වන සියලු ආයතන හා නිලධාරීන් සමඟ සම්බන්ධීකරණය කරමින් කටයුතු කිරීම.

**විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් අදාළ විධි විධාන**

1. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය හා එහි සංශෝධන
2. 1989 අංක 01 දරන වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් පනත හා එහි සංශෝධන
3. 1983 අංක 24 දරන වැන්දඹු පුරුෂ අනත්දරු පනත හා එහි සංශෝධන
4. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහය
5. ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයේ 33 හා 36 වගන්ති
6. අදාළ සියලුම විශ්‍රාම වැටුප් චක්‍රලේඛ
7. විශ්‍රාම වැටුප් සම්බන්ධ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ
8. 1970 අංක 18 දරන සන්නද්ධ හමුදා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් පනත

### 2.7.1 සපුරාගෙන ඇති ඉලක්ක

#### 2.7.1.1_විශ්‍රාමිකයන් හා විශ්‍රාමික සංගම්වලින් යොමු කළ ලිපි සංඛ්‍යාව

| මාසය | ලැබුණු ලිපි සංඛ්‍යාව | ගොනු කරන ලද ලිපි සංඛ්‍යාව | කටයුතු කළ ලිපි සංඛ්‍යාව |
|---|---|---|---|
| ජනවාරි | 259 | 65 | 194 |
| පෙබරවාරි | 229 | 47 | 182 |
| මාර්තු | 302 | 73 | 229 |
| අප්‍රේල් | 217 | 51 | 166 |
| මැයි | 197 | 32 | 165 |
| ජූනි | 302 | 53 | 249 |
| ජූලි | 296 | 52 | 244 |
| අගෝස්තු | 211 | 36 | 175 |
| සැප්තැම්බර් | 313 | 51 | 262 |
| ඔක්තෝබර් | 296 | 31 | 265 |
| නොවැම්බර් | 197 | 28 | 169 |
| දෙසැම්බර් | 210 | 33 | 168 |

**දෙසැම්බර් මාසයෙහි ලිපි 09ක් සම්බන්ධයෙන් තවදුරටත් කටයුතු කෙරෙමින් පවතී.

#### 2.7.1.2 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 හා 15 වගන්ති යටතේ විශ්‍රාම ගැන්වූ නිලධාරීන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන විනය කමිටුව වෙත ඉදිරිපත් කරන ලද ගොනු සංඛ්‍යාව

| මාසය | කමිටුව වෙත ඉදිරිපත් කළ විනය ගොනු සංඛ්‍යාව |
|---|---|
| ජනවාරි | 11 |
| පෙබරවාරි | 11 |
| මාර්තු | 05 |
| අප්‍රේල් | 06 |
| මැයි | 11 |
| ජූනි | 10 |
| ජූලි | 09 |
| අගෝස්තු | 11 |
| සැප්තැම්බර් | 08 |
| ඔක්තෝබර් | 10 |
| නොවැම්බර් | 14 |
| දෙසැම්බර් | 10 |

#### 2.7.1.3 විශ්‍රාම වැටුප් අංශය මඟින් නිකුත් කර ඇති චක්‍රලේඛ

1. **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2025 (2025.01.20)**
   රාජ්‍ය නිලධරයන් වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයෙහි ලියාපදිංචි කිරීම සහ ඔවුන්ගේ ප්‍රතිලාභීන්ගේ තොරතුරු සත්‍යාපනය නව මාර්ගගත පද්ධතියක් යටතේ සිදු කිරීම
2. **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/2025 (2025.07.01)**
   2025 අයවැය යෝජනා අනුව 2018.01.01, 2019.01.01 හා 2020.01.01 දිනට හිමිගැන්විය යුතු වැටුප මත විශ්‍රාම වැටුප ප්‍රතිශෝධනය කිරීම
3. **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/2025 (I) (2025.11.14)**
   2025 අයවැය යෝජනා අනුව 2018.01.01, 2019.01.01 හා 2020.01.01 දිනට හිමිගැන්විය යුතු වැටුප මත විශ්‍රාම වැටුප ප්‍රතිශෝධනය කිරීම
4. **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2025 (I) (2025.11.17)**
   රාජ්‍ය නිලධරයන් වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයෙහි ලියාපදිංචි කිරීම සහ ඔවුන්ගේ ප්‍රතිලාභීන්ගේ තොරතුරු සත්‍යාපනය නව මාර්ගගත පද්ධතියක් යටතේ සිදු කිරීම

#### 2.7.1.4 විශ්‍රාම වැටුප් අංශය මඟින් නිකුත් කර ඇති චක්‍රලේඛ ලිපි

1. **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි 01/2025 (2025.03.06)**
   රාජකාරියේ යෙදී සිටියදී ආබාධිත වූ හා මියගිය ත්‍රිවිධ හමුදා, පොලිස් හෝ විශේෂ කාර්ය බලකා සාමාජිකයින් සඳහා ගෙවන ලද දීමනා විශ්‍රාම යාමෙන් පසුව ද ලබා දීම

#### 2.7.1.5 විශ්‍රාම වැටුප් අංශය මඟින් ඉදිරිපත් කර ඇති අමාත්‍ය මණ්ඩල සංදේශ

1. **සංදේශ අංකය: PA/Pns/01/08/2025**
   රාජකාරියේ යෙදී සිටියදී ආබාධිත වූ හා මියගිය ත්‍රිවිධ හමුදා, පොලිස් හෝ විශේෂ කාර්ය බලකා සාමාජිකයින් සඳහා ගෙවන ලද දීමනා විශ්‍රාම යාමෙන් පසුව ද ලබා දීම

2. **සංදේශ අංකය: PA/Pns-02/49/2025**
   2025 අයවැය යෝජනා අනුව 2018.01.01, 2019.01.01 හා 2020.01.01 දිනට හිමිගැන්විය යුතු වැටුප මත විශ්‍රාම වැටුප ප්‍රතිශෝධනය කිරීම

**2.7.1.6 විශ්‍රාම වැටුප් අංශය මඟින් ඉදිරිපත් කර ඇති අමාත්‍ය මණ්ඩල සටහන්**

1. **සටහන් අංකය: Pns/P5/08/19 - II වෙළුම**
   2013 අංක 01 දරන සමෘද්ධි පනතේ 44 (ඉ) ii වගන්තිය යටතේ මනාපය පළ කරමින් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහණය වූ නිලධාරීන්ගෙන් රජයට අයවිය යුතු මුදල් ආපසු අය කර ගැනීම.
2. **සටහන් අංකය: Pns/P6/23**
   2025 අයවැය යෝජනා අනුව වැටුප් සංශෝධනයට අදාළව විශ්‍රාම වැටුප් ගැලපීම

## 2.8 රාජ්‍ය සේවා ප්‍රතිසංස්කරණ අංශය

<u>2.8.1 සපුරාගෙන ඇති ඉලක්ක</u>

- **රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මඟින් රාජ්‍ය සේවයේ මානව සම්පත් ක්‍රියාවලීන් කළමනාකරණය කිරීම උදෙසා මානව සම්පත් තොරතුරු කළමනාකරණ පද්ධතිය(GovHR)ක් ස්ථාපිත කිරීම.**

1. රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය යටතේ පරිපාලනය වන රාජ්‍ය සේවකයින් සඳහා මානව සම්පත් කළමනාකරණ (HRMIS)/ ලේඛන කළමනාකරණ (DMS) යන තොරතුරු පද්ධතියක් හඳුන්වා දීමට අදාලව සිදු කරන ලද ප්‍රසම්පාදන ක්‍රියාවලියෙහි ඇගයීම් කටයුතු සිදු කිරීමෙන් අනතුරුව උපදේශන ආයතන දෙකක් තෝරාගන්නා ලද අතර පහත පියවර ඔස්සේ පද්ධතියෙහි සංවර්ධන කටයුතු ආරම්භ කරන ලදි.
2. ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළින් තෝරාගන්නා ලද ආයතන සමග 2025.01.27 වන දින ගිවිසුම් ගතවීමත් සමඟ කළමනාකරණ තොරතුරු පද්ධතියේ සංවර්ධන කටයුතු ආරම්භ කරන ලදි.
3. මෙහි ප්‍රථම අදියර ලෙස රාජ්‍ය සේවාවේ දීප ව්‍යාප්ත සේවා 06 ක් සහ ඒකාබද්ධ සේවා 03 ක් ආවරණය වන පරිදි එම සේවාවන් වලට අදාළ නිලධාරීන්ගේ රාජ්‍ය සේවයේ බඳවා ගැනීමේ සිට විශ්‍රාම ගැන්වීම දක්වා වන මානව සම්පත් ක්‍රියාවලීන් ඩිජිටල්කරණය කිරීම, රාජ්‍ය සේවාවේ අනුමත කාර්යමණ්ඩල තොරතුරු කළමනාකරණය කිරීම හා රාජ්‍ය අංශයේ මානව සම්පත් කළමනාකරණයට අදාළ ආයතන සමග මාර්ගගත සබඳතාවක් පවත්වා ගැනීම යන මානව සම්පත් කළමනාකරණයට අදාළ මූලික කාර්යයන් සහ ක්‍රියාවලීන් ඩිජිටල්කරණය කිරීමේ කටයුතු ආරම්භ කරන ලදි.
   - ශ්‍රී ලංකා පරිපාලන සේවය
   - ශ්‍රී ලංකා වාස්තු විද්‍යාත්මක සේවය
   - ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය
   - ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවය
   - ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය
   - ශ්‍රී ලංකා තොරතුරු සහ තාක්ෂණ සේවය
   - ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය

   - රජයේ භාෂා පරිවර්තක සේවය
   - ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය
4. ක්‍රියාවලි ප්‍රතිනිර්මාණය කිරීමේ (BPR) වැඩසටහන මගින් "As – Is" අධ්‍යයනයෙන් අනතුරුව "To-be process" ලේඛනය සකස් කර එය පාදක කරගනිමින් පද්ධතියෙහි වැඩ පියවර (Workflows) නිර්මාණය කිරීම 2025 පෙබරවාරි මස සිට ජුනි මස දක්වා කාලය තුළ සේවා සැපයුම් ආයතන දෙක විසින් සිදු කළ අතර හඳුනාගත් ක්‍රියාවලීන් 19 ක් සඳහා System Requirement Specifications (SRS) ලේඛන පිළියෙල කර ඇත. මෙම ක්‍රියාවලීන් 19 ට අදාලව පද්ධතියේ Prototype නිර්මාණය කරන ලදි.
5. ඒ අනුව, මෙම ක්‍රියාවලීන් අතුරින් User Management හා Employee Profile Management යන මොඩියුලයන්හි User Acceptance Testing (UAT) හා Go Live සම්පූර්ණ කර ඇති අතර ඉදිරි මොඩියුල වල User Acceptance Testing (UAT) හා Go Live සංශෝධිත ව්‍යාපෘති සැලැස්මට අනුව කටයුතු සිදුකරමින් පවතී.
6. තොරතුරු කළමනාකරණ පද්ධතියට අවශ්‍ය වන Cloud පහසුකම ලබා ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළින් තෝරාගන්නා ලද ආයතනය ප්‍රදානය ලබා ගන්නා ලද අතර එහි කටයුතු පද්ධතියේ සංවර්ධන කටයුතු සඳහා තෝරාගන්නා ලද ආයතන සමඟ ඒකාබද්ධ වෙමින් සිදු කරමින් පවතී.
7. සංශෝධිත ව්‍යාපෘති සැලැස්ම අනුව පද්ධතියෙහි ප්‍රථම අදියරෙහි සම්පූර්ණ සංවර්ධන කටයුතු

2026.05.30 වන දින වන විට නිම කිරීමට අපේක්ෂා කරයි.

- **රාජ්‍ය සේවයේ කාර්යසාධනය ඉහළ නැංවීමට අත්‍යාවශ්‍ය රාජ්‍ය නිලධාරී කුසලතා හඳුනාගැනීමේ සමීක්ෂණයක් සිදු කිරීම.**

"පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශයට අදාලව රාජ්‍ය සේවයේ කාර්යක්ෂමතාවය සහ නිරවද්‍යභාවය ඉහළ නැංවීම උදෙසා රාජ්‍ය නිලධාරීන්ගේ කුසලතා හඳුනා ගැනීමේ සමීක්ෂණයක් පැවැත්වීම සඳහා යෝජනා වී ඇති අතර ඊට අදාල සමීක්ෂණ යෝජනාව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කැබිනට් අනුමැතිය ලබා ගැනීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු සංයුතිය ද අතුළත් වන පරිදි කැබිනට් පත්‍රිකාව සකසා ඇති අතර එය අනුමැතිය සඳහා යොමු කිරීමට කටයුතු සිදු කරමින් පවතී.

## 2.9 මූල්‍ය අංශය

මූල්‍ය අංශය අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු හා ආයතන වල මූල්‍ය කළමණාකරනය හා පාලන කටයුතු සම්බන්ධයෙන් වගකීම උසුලන අතර මෙම අංශය ප්‍රසම්පාදන, මූල්‍ය වාර්තාකරණ, ගෙවීම් හා මානව සම්පත් ගෙවීම් යන ශාඛා 04කින් සමන්විත වේ.




### 2.9.1 සපුරාගෙන ඇති ඉලක්ක

රාජ්‍ය පරිපාලන අංශයේ පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් සඳහා 2025 වර්ෂය වෙනුවෙන් පිළිවෙලින් රු. මිලියන 2,666.2 සහ 1,143.65 ක මුදලක් වෙන් කර ඇති අතර, 2025.12.31 දිනට දරන ලද පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් පිළිවෙලින් රු. මිලියන 1,605.56 හා රු. මිලියන 323.62 කි.

වර්ෂය සඳහා සමස්ත ප්‍රාග්ධන ප්‍රතිපාදනයෙන් 28% ක්ද, පුනරාවර්තන ප්‍රතිපාදනයෙන් 60%ක්ද වියදම් කර ඇත.

| වියදම | රාජ්‍ය පරිපාලන අංශය | | |
|---|---|---|---|
| | වෙන්කිරීම (රු.මි.) | වියදම (රු.මි.) | % |
| පුනරාවර්තන | 2,666.2 | 1,605.56 | 62% |
| ප්‍රාග්ධන | 1,143.65 | 323.62 | 42% |
| එකතුව | 3809.85 | 1,929.18 | 56.5% |

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙහි රාජ්‍ය අංශය වන ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරිවරුන්ගේ සංගමය (APFASL) ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ මූල්‍ය වාර්තාකරණයේ විශිෂ්ටත්වය අගයමින් 9 වන හොඳම වාර්ෂික වාර්තා සහ ගිණුම් සම්මාන තරඟයේ 2024 වර්ෂය සඳහා වන රන් පදක්කම ලබාගැනීමට සමත්විය.




## 2.10 තොරතුරු තාක්ෂණ අංශය

### 2.10.1 සපුරාගෙන ඇති ඉලක්ක

1. **අමාත්‍යාංශයීය නිල වෙබ් අඩවියේ ආරක්ෂාව පවත්වාගෙන යාම සහ වෙබ් අඩවියේ නව යාවත්කාලීන කිරීම් සිදු කිරීම.**

අමාත්‍යාංශයීය නිල වෙබ් අඩවියේ ආරක්ෂාව තහවුරු කිරීම සහ අනෙකුත් ප්‍රමිතීන් පවත්වාගෙන යාම සඳහා වෙබ් අඩවිය සංවර්ධනය කරන ලද ආයතනය සමඟ එළඹි සේවා ගිවිසුම හා SSL සහතිකය ස්ථාපනය කිරීම මෙම වසරේදී ද සිදු කරන ලදි. මෙමගින් අමාත්‍යාංශයීය වෙබ් අඩවියේ ආරක්ෂණ

දෝෂ නිවරදි කර ගනිමින් ආරක්ෂාව තහවුරු කිරිම සිදු කරනු ලබයි.

තවදුරටත් පරිශීලකයන් සඳහා මිත්‍රශීලී සේවයක් සැපයීමට බලාපොරොත්තු වන අතර, වෙබ් අඩවිය දැනට නිර්මාණය කර ඇති ජූම්ලා මෘදුකාංගය වෙනුවට නව මෘදුකාංගයක් යොදා ගනිමින් යාවත්කාලීන කිරීම හරහා භාවිතය පහසු වන ලෙස අමාත්‍යාංශයීය වෙබ් අඩවිය නිර්මාණය කිරීමට අපේක්ෂිතය.

**2. මානව සම්පත් කළමණාකරණ තොරතුරු පද්ධතිය (HRMIS) සහ ලේඛණ කළමණාකරණ පද්ධතිය (DMS) නිර්මාණය කිරීමේ ව්‍යාපෘතියට සහය ලබාදීම.**

වර්තමාන ඩිජිටල්කරණ සන්දර්භය තුළ කඩිනමින් රාජ්‍ය ආයතන හරහා ලාභදායී හා සතුටුදායක සේවා සැපයීම සඳහා ඉතා නිවැරදි මානව සම්පත් කළමණාකරණ තොරතුරු පද්ධතියක් නිර්මාණය කිරීමට අමාත්‍යාංශය මඟින් තීරණය කරන ලදි. සියලුම රාජ්‍ය ආයතන එක් ඩිජිටල්කරණය වූ වේදිකාවකට සම්බන්ධ කිරීම සඳහා, ඒකාබද්ධ විස්තීරණ මානව සම්පත් කළමණාකරණ තොරතුරු පද්ධතියක් පිහිටුවීම අරමුණු කර ගනිමින් අමාත්‍යාංශ විෂය පථය යටතේ ඇති රාජ්‍ය නිලධාරීන්ගේ දත්ත ඇතුළත් මානව සම්පත් කළමණාකරණ තොරතුරු පද්ධතියක් නිර්මාණය කිරීමේ මූලික පියවරක් ලෙස ආරම්භ කරන ලද GovHR (HRMIS) ව්‍යාපෘතියට අමාත්‍යාංශ පාර්ශවයෙන් අවශ්‍ය උපදේශනය සහ තාක්ෂණික සහය ලබා දීම සිදු කරන ලදි.

ඒ යටතේ මෙම GovHR (HRMIS) ව්‍යාපෘතිය ආරම්භයේ සිට සැළසුම් සකස් කිරීම (Planning), අවශ්‍යතා ඒකරාශි කිරීම (Requirement Gathering), ප්‍රසම්පාදනය(Procurement), මෘදුකාංග අවශ්‍යතා පිරිවිතර සකස් කිරීම හා පරීක්ෂා කිරීම(Preparing specifications and testing), පද්ධති ආකෘතිකරණය (System Designing), පරිශීලක පිළිගැනීමේ පරීක්ෂණ (User Acceptance Testing) යන ව්‍යාපෘතියේ විවිධ අදියර සඳහා අවශ්‍ය කටයුතු අදාළ බාහිර ආයතන සමඟ එක්ව සිදු කරන ලද අතර, ඉදිරියේදී ද මෙම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය සහය ලබාදීමට නියමිතය.

ඒ අනුව සැප්තැම්බර් මස අවසානය වනවිට GovHR පද්ධතියේ User Management සහ Employ Management මොඩියුල දෙක එළිදැක්වීමට කටයුතු කරන ලදි. එසේම Employ Management මොඩියුලයට අයත් නිලධාරීන් ඇතුළත් කිරීම සඳහා දත්ත තහවුරු කිරීම(verify) මෙන්ම රාජ්‍ය ආයතන සඳහා තාක්ෂණික කේත ක්‍රමයක් (Unicode) නිර්මාණය කිරීමට කටයුතු කරන ලදි.

**3. නිවාඩු නිකේතන හා නිවාඩු බංගලා මාර්ගගතව වෙන් කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම.**

මෙම අමාත්‍යාංශයේ නිවාස හා සංවර්ධන අංශය යටතේ සහ ස්වදේශ කටයුතු අංශය යටතේ පාලනය වන නිවාඩු නිකේතන හා නිවාඩු බංගලා වෙන් කිරීම මාර්ගගත ක්‍රමවේදය යටතේ රාජ්‍ය නිලධාරීන් සහ අර්ධ රාජ්‍ය නිලධාරීන් යන සියලුදෙනා වෙනුවෙන් නිවාඩු නිකේතන හා නිවාඩු බංගලා වෙන් කිරීමට අවශ්‍ය මාර්ගගත පද්ධතියක් සංවර්ධනය කිරීම සඳහා තාක්ෂණික සහය ලබා දීම සිදු කරනු ලදි. 2025 වසර අවසානය වනවිට මාර්ගගත පද්ධතිය මඟින් සේවය සැපයීමටත්, වෙබ් අඩවිය තුළ එය ස්ථාපනය කිරීමටත් කටයුතු කරන ලදි. ඒ අනුව 2025.12.24 වන දින මෙම පද්ධතිය නිල වශයෙන් එළිදක්වන ලදි.

**4. රජයේ නිවාස හා ගොඩනැගිලි කුළී ආදායම් මෘදුකාංගය සංවර්ධනය කිරීම.**
**(Ministerial Rental Information System)**

රජයේ නිවාස හා ගොඩනැගිලි කුළී ආදායම් ගණනය කිරීම සඳහා මෙම මෘදුකාංගය සංවර්ධනය කිරීම සිදු කරන ලද අතර, මූල්‍ය අංශය විසින් ඉදිරිපත් කරනු ලබන අවශ්‍යතාවයන්ට අනුව ඉදිරියටත් මෙම පද්ධතිය සංවර්ධනය කිරීමට නියමිතය.

**5. Internal Awareness System මෘදුකාංගය වැඩි දියුණු කිරීම.**

අමාත්‍යාංශය වෙත ලැබෙන ලිපි කළමණාකරණය සිදු කිරීම සඳහා තැපැල් කළමණාකරණ පද්ධතිය සංවර්ධනය සිදුකර අමාත්‍යාංශයේ විවිධ අංශ වෙත ලබාදීමට කටයුතු කරන ලදි. ඒ අනුව විද්‍යාත්මක සේවා අංශය, අභ්‍යන්තර පාලය අංශය, ගණකාධිකාරී සේවා අංශය, ඉංජිනේරු සේවා අංශය සහ ආයතන අංශය යන අංශවල මෙම තැපැල් කළමණාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලදි.

**6. පරිගණක පද්ධති මෙහෙයුම් මැදිරිය නඩත්තු කිරීම.**

අමාත්‍යාංශයේ ජාලකරණ පද්ධතිය (Network System) නඩත්තු කිරීමක් ලෙස Layer 3 Switch මිලදී ගැනීමට මෙම වසරේ දී කටයුතු කරන ලදි. ඒ අනුව අමාත්‍යාංශයේ එක් එක් මහළ සඳහා වෙන වෙනම ජාලකරණ පද්ධති (V lan) ස්ථාපනය

කිරීමට කටයුතු කරන ලදි. එමඟින් ජාලකරණ පද්ධතියේ සිදුවන හදිසි බිඳවැටීම් වළක්වා ගනිමින්, නිසි ක්‍රියාකාරීත්වයකින් යුක්තව ජාලකරණ සබඳතාවයන් කළමනාකරණය කිරීමට බලාපොරොත්තු වේ.

එසේම අමාත්‍යාංශය තුළ දැනට පවතින ජාලකරණ පද්ධතිය පැරණි සහ වසර ගණනාවක් භාවිතා කර ඇති බැවින්, එහි ක්‍රියාකාරීත්වය අවම මට්ටමක පවතී. එසේම බොහෝ උපකරණ යල් පැනයාම හේතුවෙන් නිසි ක්‍රියාකාරීත්වයේ නොපවතී. ඒ හේතුවෙන් අමාත්‍යාංශයීය ජාලකරණ පද්ධතියේ කාර්යක්ෂමතාවය පහළ යාම සිදුවන අතර, අන්තර්ජාලට පිවිසීමේ වේගවත්භාවය අඩුවීම, මුද්‍රණ කටයුතු සිදු කිරීමේ දී බාධා ඇතිවීම, දත්ත හුවමාරු කිරීමේ වේගය පහළයාම වැනි දුෂ්කරතාවයන් ඇති වී තිබේ. ඒ අනුව ප්‍රශස්ත ක්‍රියාකාරීත්වයකින් යුක්තව ජාලකරණ පද්ධතිය පවත්වා ගෙන යාම සඳහා නව ජාලකරණ පද්ධතියක් ස්ථාපනය කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කරමින් පවතින අතර, ඒ සඳහා නව ජාලකරණ සැළැස්මක් සකස් කිරීමට කටයුතු කරන ලදි. 2026 වසරේදී අමාත්‍යාංශය සඳහා නව ජාලකරණ පද්ධතියක් ස්ථාපනය කිරීමට බලාපොරොත්තු වේ.

## 7. තොරතුරු තාක්ෂණ පුහුණු වැඩසටහන් පැවැත්වීම.

අමාත්‍යාංශයීය කාර්ය මණ්ඩල සඳහා තොරතුරු තාක්ෂණ පුහුණු වැඩසටහන්වලට පහසුකම් සැපයීම පෙර වර්ෂවලදී මෙන්ම මෙම වර්ෂයේ ද තොරතුරු තාක්ෂණ අංශය විසින් සිදු කරන ලදි. තොරතුරු තාක්ෂණ දැනුම වැඩිදියුණු කිරීම අරමුණු කර ගනිමින් අමාත්‍යාංශයේ සේවයේ නියුතු නිලධාරීන් සඳහා තොරතුරු තාක්ෂණය ප්‍රායෝගික භාවිතය, මයික්‍රොසොෆ්ට් පතුරුම්පත් සැකසීම (Microsoft excel), මයික්‍රොසොෆ්ට් දත්ත සමුදාය (Microsoft access), අන්තර්ජාල භාවිතය, තොරතුරු පද්ධති කළමණාකරණය, දත්ත හා තොරතුරු ඵලදායීව ඉදිරිපත් කිරීම වැනි මාතෘකා යටතේ පුහුණු වැඩසටහන් සිදු කරනු ලබයි. තොරතුරු තාක්ෂණයට අදාළ විවිධ ක්ෂේත්‍ර පිළිබඳ ප්‍රායෝගිකව දැනුම ලබාදීම මඟින් නිලධාරීන්ගේ කාර්යක්ෂමතාව සහ අමාත්‍යාංශයීය කාර්යක්ෂමතාව ඉහළ නැංවීම මෙම වැඩසටහන්වල අරමුණ වී තිබේ.

අමාත්‍යාංශයීය අභ්‍යන්තර නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීමට අමතරව, අමාත්‍යාංශයෙන් බැහැර බාහිර ආයතනයන්හි සේවය කරන නිලධාරීන් වෙත තොරතුරු තාක්ෂණ දැනුම සම්ප්‍රේෂණය කිරීමට මාර්ගගත පුහුණු වැඩසටහන් සඳහා සම්පත්දායකයන් වශයෙන් සහය ලබා දෙන ලදි. ඊට අමතරව අමාත්‍යාංශයේ විවිධ අංශයන්ට අදාළව පුහුණු සැසි සහ රැස්වීම් පැවැත්වීම සඳහා අවශ්‍ය තොරතුරු තාක්ෂණ පහසුකම් ලබා දීම සහ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීමට සහය දක්වන ලද අතර ඉදිරියේදී ද තාක්ෂණික දැනුම සම්ප්‍රේෂණයට අවශ්‍ය සහය ලබාදීමට නියමිතය.

## 8. අමාත්‍යාංශය සඳහා තාක්ෂණික උපකරණ මිලදී ගැනීම.

අමාත්‍යාංශය තුළ දැඩි හිඟයක්ව පැවති පරිගණක, මොනිටර්, පරිගණක මුද්‍රණ යන්ත්‍ර, ඡායාපිටපත් යන්ත්‍ර මිලදී ගැනීමට අවශ්‍ය පිරිවිතර සකස් කිරීම මෙන්ම එම උපකරණ මිලදී ගැනීමෙන් පසු ස්ථාපනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලදි. මෙම වසරේ දී මානව සම්පත් කළමණාකරණ තොරතුරු පද්ධති (HRMIS) ව්‍යාපෘතිය හා සමගාමීව අමාත්‍යාංශය සඳහා පරිගණක යන්ත්‍ර 91ක් ද, ලැප්ටොප් පරිගණක යන්ත්‍ර 45ක් ද, බහු කාර්ය ඡායාපිටපත් යන්ත්‍ර 13ක් ද UPS යන්ත්‍ර 91 ද ස්ථාපනය කිරීමට කටයුතු කරන ලදි.

## 9. අමාත්‍යාංශයේ දෛනික රාජකාරී කටයුතු සඳහා සහය දැක්වීම.

- පරිගණක මෘදුකාංග හා දෘඩාංග කළමනාකරණය කිරීම.
- ආයතනය තුළ අභ්‍යන්තර පරිගණක හා ජාල පද්ධතිය කළමනාකරණය කිරීම.
- අමාත්‍යාංශයේ වෙබ් අඩවිය පවත්වාගෙන යාම සහ යවත්කාලීන කිරීම.(වාර්ෂිකව අමාත්‍යාංශ වෙබ් අඩවියේ පළ කිරීම් (Publish) 1000කට අධික ප්‍රමාණයක් සිදු කරනු ලබයි)
- අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණික මෙවළම් මිලදී ගැනීමේ කටයුතුවලට අදාළ තාක්ෂණික පිරිවිතර සකස් කිරීම මෙන්ම එම මිලදී ගැනීම්වලට අදාළ ප්‍රසම්පාදනයේ තාක්ෂණික ලිපි ලේඛණ සකස් කිරීම.
- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ දත්ත පද්ධතිය පවත්වාගෙන යාම සහ යාවත්කාලීන කිරීම.
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රසම්පාදනය කටයුතුවලට සහය දැක්වීම.
- ලංකා රාජ්‍ය ජාලයේ (LGN) කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- අමාත්‍යාංශය තුළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් කළමණාකරණය කිරීම.

- අමාත්‍යාංශයේ අනෙකුත් අංශවල ඇති වන තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ ගැටලු (පරිගණක මුද්‍රණ යන්ත්‍ර සහ ඒ ආශ්‍රිත උපාංග සම්බන්ධ ගැටලු, විද්‍යුත් තැපැල සබැඳි ගැටලු වැනි විවිධ ගැටලු) සඳහා සේවා සැපයීම දෛනිකව සිදු කරනු ලබයි. 2025 වර්ෂය තුළ දී පමණක් දෛනිකව මතුවන විවිධ ගැටලු 1200කට අධික ප්‍රමාණයක් සඳහා සහය ලබා දීමට කටයුතු කරන ලදි.

## 2.11 මානව සම්පත් සංවර්ධන අංශය

ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්ෂේත්‍රය තුළ වගකිව යුතු කාර්යභාරයක් ඉටුකරනු ලබන රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය තුළින් මහජනතාව වෙත ලබාදෙනු ලබන සේවයේ ඵලදායිතාව හා කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම පිණිස නිපුණතාවයෙන් පිරිපුන් මානව සම්පතක් ඇතිකිරීම මානව සම්පත් සංවර්ධන අංශය වශයෙන් අප අංශයේ මෙහෙවරයි. ඒ අනුව රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ පුහුණු අවස්ථා සාධාරණ ලෙස බෙදා හැරීමට කටයුතු කිරීම අංශයේ ප්‍රධාන අරමුණ වේ. එවැනි කටයුතුවලදී රජයේ අරමුදල් ඵලදායී ලෙස භාවිතා කරමින් ලබාදෙනු ලබන සේවයේ කාර්යක්ෂමතාව හා ඵලදායිතාව වර්ධනය සඳහා කාර්ය මණ්ඩලය අභිප්‍රේරණය කිරීම ද මෙම අංශයේ අරමුණු අතර වේ.

ඒ සඳහා අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතා හඳුනාගැනීම, පුහුණු වැඩසටහන් පැවැත්වීම හා පහසුකම් සැපයීම සිදු කරන අතර මෙම අමාත්‍යාංශයේ සේවය නියුතු දීපව්‍යාප්ත සේවාවන්හි නිලධාරීන්ගේ ශක්තිමත් ධාරිතා සංවර්ධනයක් ඇති කිරීම සඳහා දේශීය හා විදේශීය පුහුණු අවස්ථා සාධාරණ ලෙස බෙදා හැරීම ද සිදු කරයි.

### 2.11.1 සපුරාගෙන ඇති ඉලක්ක

#### 2.11.1.1 දේශීය පුහුණු

2025.01.01 දින සිට 2025.12.31 දින දක්වා අමාත්‍යාංශයේ මාණ්ඩලික සහ මාණ්ඩලික නොවන නිලධාරීන් වෙත ලබාදුන් පුහුණු අවස්ථා සඳහා සහභාගී වූ නිලධාරී සංඛ්‍යාව

| පුහුණු වැඩමුළුව | සහභාගී වූ සංඛ්‍යාව | |
|---|---|---|
| | මාණ්ඩලික | මාණ්ඩලික නොවන |
| සහතික පත්‍ර පාඨමාලා | _ | 101 |
| ඩිප්ලෝමා/පශ්චාත් ඩිප්ලෝමා පාඨමාලා | 08 | - |
| පශ්චාත් උපාධි පාඨමාලා | 05 | - |
| සේවාරම්භක පුහුණු | - | 1,270 |
| සේවාස්ථ පුහුණු | 418 | 6,797 |
| **මුළු එකතුව** | **431** | **8,168** |

**දේශීය පුහුණු වැඩසටහන් (කෙටි කාලීන)**

| සේවා ගණය | පුහුණු වැඩසටහනේ නම |
|---|---|
| කළමනාකරණ | 1. JICA තාක්ෂණික ආධාර ව්‍යාපෘතිය - ධාරිතා සංවර්ධනය |
| | 2. ධාරිතා සංවර්ධනය - NCGG India |
| | 3. ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයට අයත් නිලධාරීන් සේවය කරනු ලබන ආයතන තුළ විද්‍යාත්මක පර්යේෂණ සංස්කෘතියක් පෝෂණය කිරීම සඳහා වූ පුහුණු වැඩමුළුව - (දිනය 04/ දිනය 05/ දිනය 06) |
| | 4. දැනුම හුවමාරු කරගැනීමේ වැඩසටහන - NASC |
| | 5. නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - (පළමු කොටස / දෙවන කොටස) |
| | 6. ප්‍රසම්පාදනය - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය |
| | 7. අමාත්‍යාංශයීය ප්‍රතිඵල රාමු සකස් කිරීමේ වැඩමුළුව - අදියර 1 |
| | 8. කාර්යසාධන ඇගයීම් ක්‍රියාවලි පිළිබඳ අත්දැකීම් හුවමාරුකරගැනීම |
| | 9. රාජ්‍ය සේවයේ උපාය මාර්ගික කළමනාකරණය |
| | 10. නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - SLIDA (දින 05) - පළමු වැඩසටහන |
| | 11. ගැටුම් හා දුක්ගැනවිලි කළමණාකරණය |
| | 12. සාමාජීය බලපෑම් කණ්ඩායම් කළමනාකරණය |
| | 13. නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - SLIDA (දින 05) - දෙවන වැඩසටහන |
| | 14. ශ්‍රී ලංකාවේ නව නීති හා පනත් පිළිබඳ දැනුම්වත් කිරීම |

| | |
|---|---|
| | 15. රාජ්‍ය සේවය ඩිජිටල්කරණය හා නවීන තාක්ෂණ භාවිතය (Cyber Security) |
| | 16. තිරසාර සංවර්ධන අරමුණු |
| | 17. චිත්තවේගාත්මක බුද්ධිය |
| | 18. බඳු ප්‍රත්පත්තිය යටතේ ඒ සේවාව සඳහා දත්ත ඇතුළත් කිරීම පිළිබඳ දැනුවත් කිරීම |
| කළමනාකරණ නොවන | 1. කළමනාකරණ සේවා නිලධාරී - III ශ්‍රේණිය - සීමිත 2023 (2024) සඳහා සේවාරම්භක පුහුණුව - සිංහල මාධ්‍යය (දින 05) - කොළඹ දිස්ත්‍රික්කය |
| | 2. කළමනාකරණ සේවා නිලධාරී - III ශ්‍රේණිය - සීමිත 2023 (2024) සඳහා සේවාරම්භක පුහුණුව - සිංහල මාධ්‍යය (දින 05) - කුරුණෑගල දිස්ත්‍රික්කය |
| | 3. කළමනාකරණ සේවා නිලධාරී - III ශ්‍රේණිය - සීමිත 2023 (2024) සඳහා සේවාරම්භක පුහුණුව - සිංහල මාධ්‍යය (දින 05) - මහනුවර දිස්ත්‍රික්කය |
| | 4. කළමනාකරණ සේවා නිලධාරී - III ශ්‍රේණිය - සීමිත 2023 (2024) සඳහා සේවාරම්භක පුහුණුව - සිංහල මාධ්‍යය (දින 05) - පුත්තලම දිස්ත්‍රික්කය |
| | 5. කළමනාකරණ සේවා නිලධාරී - III ශ්‍රේණිය - සීමිත 2023 (2024) සඳහා සේවාරම්භක පුහුණුව - සිංහල මාධ්‍යය (දින 05) - පොළොන්නරුව දිස්ත්‍රික්කය |
| | 6. කළමනාකරණ සේවා නිලධාරී - III ශ්‍රේණිය - සීමිත 2023 (2024) සඳහා සේවාරම්භක පුහුණුව - සිංහල මාධ්‍යය (දින 05) - යාපනය දිස්ත්‍රික්කය |
| | 7. කළමනාකරණ සේවා නිලධාරී - III ශ්‍රේණිය - සීමිත 2023 (2024) සඳහා සේවාරම්භක පුහුණුව - සිංහල මාධ්‍යය (දින 05) - කළුතර දිස්ත්‍රික්කය |
| | 8. කළමනාකරණ සේවා නිලධාරී - III ශ්‍රේණිය - සීමිත 2023 (2024) සඳහා සේවාරම්භක පුහුණුව - සිංහල මාධ්‍යය (දින 05) - අම්පාර දිස්ත්‍රික්කය |
| | 9. කළමනාකරණ සේවා නිලධාරී - III ශ්‍රේණිය - සීමිත 2023 (2024) සඳහා සේවාරම්භක පුහුණුව - සිංහල මාධ්‍යය (දින 05) - අනුරාධපුර දිස්ත්‍රික්කය |
| | 10. කළමනාකරණ සේවා නිලධාරී - III ශ්‍රේණිය - සීමිත 2023 (2024) සඳහා සේවාරම්භක පුහුණුව - සිංහල මාධ්‍යය (දින 05) - නුවරඑළිය දිස්ත්‍රික්කය |
| | 11. කළමනාකරණ සේවා නිලධාරී - III ශ්‍රේණිය - සීමිත 2023 (2024) සඳහා සේවාරම්භක පුහුණුව - සිංහල මාධ්යය (දින 05) - බදුල්ල දිස්ත්‍රික්කය |
| | 12. කළමනාකරණ සේවා නිලධාරී - III ශ්‍රේණිය - සීමිත 2023 (2024) සඳහා සේවාරම්භක පුහුණුව - සිංහල මාධ්‍යය (දින 05) - හම්බන්තොට දිස්ත්‍රික්කය |
| | 13. කළමනාකරණ සේවා නිලධාරී - III ශ්‍රේණිය - සීමිත 2023 (2024) සඳහා සේවාරම්භක පුහුණුව - සිංහල මාධ්‍යය (දින 05) - මඩකලපුව දිස්ත්‍රික්කය |
| | 14. කළමනාකරණ සේවා නිලධාරී - III ශ්‍රේණිය - සීමිත 2023 (2024) සඳහා සේවාරම්භක පුහුණුව - සිංහල මාධ්‍යය (දින 05) - මාතර දිස්ත්‍රික්කය |
| | 15. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා නිලධාරී - III වන පන්තියේ III ශ්‍රේණිය - 2024 සඳහා සේවාරම්භක පුහුණුව - සිංහල මාධ්‍යය (දින 10) - I කොටස |
| | 16. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා නිලධාරී - III වන පන්තියේ III ශ්‍රේණිය - 2024 සඳහා සේවාරම්භක පුහුණුව - සිංහල මාධ්‍යය (දින 10) - II කොටස |
| | 17. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා නිලධාරී - III වන පන්තියේ III ශ්‍රේණිය - 2024 සඳහා සේවාරම්භක පුහුණුව - සිංහල මාධ්‍යය (දින 10) – III කොටස |
| | 18. දෙමළ භාෂා පුහුණු වැඩසටහන - පැය 150 |
| | 19. රාජ්‍ය අංශයේ මානව සම්පතෙහි දැනුම වර්ධනය කිරීම උදෙසා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ දිස්ත්‍රික් මට්ටමින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන - අදියර 01 ( සිංහල මාධ්‍ය) - කොළඹ/ගම්පහ/කළුතර/ පුත්තලම/ කුරුණෑගල දිස්ත්‍රික්ක |
| | 20. රාජ්‍ය අංශයේ මානව සම්පතෙහි දැනුම වර්ධනය කිරීම උදෙසා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ දිස්ත්‍රික් මට්ටමින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන - අදියර 02 ( සිංහල මාධ්‍ය) - රත්නපුර, කෑගල්ල, බදුල්ල, මොණරාගල, ගාල්ල, මාතර, හම්බන්තොට දිස්ත්‍රික්ක |
| | 21. රාජ්‍ය අංශයේ මානව සම්පතෙහි දැනුම වර්ධනය කිරීම උදෙසා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ දිස්ත්‍රික් මට්ටමින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන - අදියර 03 ( දෙමළ මාධ්‍ය) |
| | 22. මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ දිස්ත්‍රික් මට්ටමින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන - අදියර 04 |
| | 23. ශ්‍රී ලංකා පුස්තකාලාධිපති සේවයේ නිලධාරීන් සඳහා සේවාස්ථ පුහුණුව - 2025 |

| | |
|---|---|
| | 24. " Advanced Excel " පුහුණු වැඩසටහන |
| | 25. කළමනාකරණ සේවා නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම සඳහා නිර්දේශිත දින 10 පුහුණු පාඨමාලාව - හම්බන්තොට |
| | 26. කළමනාකරණ සේවා නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම සඳහා නිර්දේශිත දින 10 පුහුණු පාඨමාලාව - කොළඹ |
| | 27. කළමනාකරණ සේවා නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම සඳහා නිර්දේශිත දින 10 පුහුණු පාඨමාලාව - යාපනය |
| | 28. කළමනාකරණ සේවා නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම සඳහා නිර්දේශිත දින 10 පුහුණු පාඨමාලාව - මහනුවර |
| | 29. කළමනාකරණ සේවා නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම සඳහා නිර්දේශිත දින 10 පුහුණු පාඨමාලාව - ගම්පහ |
| | 30. කළමනාකරණ සේවා නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම සඳහා නිර්දේශිත දින 10 පුහුණු පාඨමාලාව - කළුතර |
| | 31. සංස්කෘතික හුවමාරු වැඩසටහන (තෛපොංගල් උත්සවය) |
| | 32. නිලධාරින්ගේ ක්‍රීඩා කුසලතා සංවර්ධනය කිරීමේ වැඩසටහන - ක්‍රිකට් තරඟාවලිය |
| | 33. ඵලදායීතා වැඩසටහන |
| | 34. වෙසක් බැති ගී සරණිය |
| | 35. ජගත් පරිසර දිනයට සමගාමීව පරිසරය සුරැකීම හා පරිසරය සංරක්ෂණය කිරීම පිළිබඳ වැඩසටහන |
| | 36. අල්ලස් හෝ දූෂණ වැලැක්වීම (2023 අංක 9 දරණ දූෂණ විරෝධී පනත) |
| | 37. විශ්‍රාම වැටුප් සම්බන්ධ පොදු කරුණු |
| | 38. “ක්ලීන් ශ්‍රී ලංකා” සංකල්පය දැනුම්වත් කිරීම - අදියර I |
| | 39. “ක්ලීන් ශ්‍රී ලංකා” සංකල්පය දැනුම්වත් කිරීම - අදියර II |
| | 40. බදු ගෙවන්නන් ලියාපදිංචි වීම හා මාර්ගගත ක්‍රමය යටතේ වාර්තා ඉදිරිපත් කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන |
| | 41. ගිනි නිවීම පිළිබඳ මූලික දැනුම |
| | 42. රාජ්‍ය නිලධාරින්ගේ යහපත් ආකල්ප සංවර්ධනය |
| | 43. රාජ්‍ය සේවය තුළ භාෂා භාවිතය |
| | 44. මූලික විමර්ෂණ ක්‍රියාවලිය (I කොටස/ II කොටස) |
| | 45. නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - SLIDA (දින 05) - පළමු වැඩසටහන |
| | 46. ක්‍රියාකාරී සැලැස්ම සහ අමාත්‍යාංශයීය ප්‍රථිඵල රාමු වාර්තා සකස් කිරීම |
| | 47. මුදල් රෙගුලාසි හා රාජ්‍ය මූල්‍ය කළමනාකරණය |
| | 48. තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත” පිළිබඳ දැනුම්වත් කිරීම |
| | 49. අමාත්‍ය මණ්ඩල සංදේශ හා නිරීක්ෂණ සකස් කිරීම |
| | 50. රාජ්‍ය සේවයේ පාරිභෝගික සම්බන්ධතා ඉහළ නැංවීම |
| | 51. රැස්වීම් වාර්තා හා වාර්තා ලිවීම |
| | 52. රාජ්‍ය සේවකයින්ගේ නිවාඩු ගණනය කිරීම හා නිවාඩු භාර නිලධාරියාගේ වගකීම පිළිබඳ දැනුම ලබාදීම |
| | 53. ඉදිකිරීම් ඇස්තමේන්තු සකස් කිරීම හා ව්‍යාපෘති කළමනාකරණය (T/O & T/A of Home Affairs) |
| | 54. පෝෂණය පිළිබඳ වැඩසටහන |
| | 55. කාන්තා දිනයට සමගාමීව පැවැත්වූ පුහුණු වැඩසටහන - (මා.ස.සං . මෙහෙවර සහරාව) |
| | 56. ජාතික ඵලදායිතා වැඩසටහන |
| | 57. තොරතුරු තාක්ෂණ දෙදින පුහුණු වැඩඩසටහන - DLC |
| | 58. ආතති කළමනාකරණය හා කාර්යය ජීවන සමතුලිතතාවය |
| | 59. නවක කළමනාකරණ සේවා නිලධාරින් වෙනුවෙන් දෙදින පුහුණු වැඩසටහන |
| | 60. ජාතික තොරතුරු තාක්ෂණ සමුළුව - දෙදින පුහුණු වැඩසටහන |
| | 61. දෙමාපිය වගකීම් හා ළමා මානසිකත්වය හඳුනාගැනීම (Parental Skills) (ළමා දිනය) |
| | 62. කාර්යාල ක්‍රම හා ගොනු නඩත්තුව |
| | 63. විනය කාර්ය පටිපාටිය |
| | 64. කාර්යාල ක්‍රම (රාජකාරි ලිපි) |

| | |
|---|---|
| | 65. නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - SLIDA (දින 05) - දෙවන වැඩසටහන |
| | 66. කළමනාකරණ සේවා නිලධාරී - III ශ්‍රේණිය - විවෘත 2019 (2025) සඳහා සේවාරම්භක පුහුණුව - සිංහල මාධ්‍යය (දින 10) - ගාල්ල දිස්ත්‍රික්කය |
| | 67. කළමනාකරණ සේවා නිලධාරී - III ශ්‍රේණිය - විවෘත 2019 (2025) සඳහා සේවාරම්භක පුහුණුව - සිංහල මාධ්‍යය (දින 10) - මොණරාගල දිස්ත්‍රික්කය |
| | 68. කළමනාකරණ සේවා නිලධාරී - III ශ්‍රේණිය - විවෘත 2019 (2025) සඳහා සේවාරම්භක පුහුණුව - සිංහල මාධ්‍යය (දින 10) - පොළොනන්රුව දිස්ත්‍රික්කය |
| | 69. කළමනාකරණ සේවා නිලධාරී - III ශ්‍රේණිය - විවෘත 2019 (2025) සඳහා සේවාරම්භක පුහුණුව - සිංහල මාධ්‍යය (දින 10) - රත්නපුර දිස්ත්‍රික්කය |
| | 70. කළමනාකරණ සේවා නිලධාරී - III ශ්‍රේණිය - විවෘත 2019 (2025) සඳහා සේවාරම්භක පුහුණුව - සිංහල මාධ්‍යය (දින 10) - කළුතර දිස්ත්‍රික්කය |
| | 71. රාජ්‍ය සේවයේ මානව සම්පත් සංවර්ධනය උදෙසා පුහුණු උපදේශනය (Skill Up Gov - youtube channel) |
| | 72. ආයතන අංශයේ නිලධාරින්ගේ ධාරිතා සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩමුළුව |
| ප්‍රාථමික | 1. රාජ්‍ය අංශයේ මානව සම්පතෙහි දැනුම වර්ධනය කිරීම උදෙසා PL කාණ්ඩයේ නිලධාරීන් සඳහා දිස්ත්‍රික් මට්ටමින් පවත්වනු ලබන දෙදින පුහුණු වැඩසටහන - පුත්තලම දිස්ත්‍රික්කය |
| | 2. රාජ්‍ය අංශයේ මානව සම්පතෙහි දැනුම වර්ධනය කිරීම උදෙසා PL කාණ්ඩයේ නිලධාරීන් සඳහා දිස්ත්‍රික් මට්ටමින් පවත්වනු ලබන දෙදින පුහුණු වැඩසටහන - කුරුණෑගල දිස්ත්‍රික්කය |
| | 3. රාජ්‍ය අංශයේ මානව සම්පතෙහි දැනුම වර්ධනය කිරීම උදෙසා PL කාණ්ඩයේ නිලධාරීන් සඳහා දිස්ත්‍රික් මට්ටමින් පවත්වනු ලබන දෙදින පුහුණු වැඩසටහන - ගම්පහ දිස්ත්‍රික්කය |
| | 4. රාජ්‍ය අංශයේ මානව සම්පතෙහි දැනුම වර්ධනය කිරීම උදෙසා PL කාණ්ඩයේ නිලධාරීන් සඳහා දිස්ත්‍රික් මට්ටමින් පවත්වනු ලබන දෙදින පුහුණු වැඩසටහන - කළුතර දිස්ත්‍රික්කය |
| | 5. රාජ්‍ය අංශයේ මානව සම්පතෙහි දැනුම වර්ධනය කිරීම උදෙසා PL කාණ්ඩයේ නිලධාරීන් සඳහා දිස්ත්‍රික් මට්ටමින් පවත්වනු ලබන දෙදින පුහුණු වැඩසටහන - අනුරාධපුර දිස්ත්‍රික්කය |
| | 6. රාජ්‍ය අංශයේ මානව සම්පතෙහි දැනුම වර්ධනය කිරීම උදෙසා PL කාණ්ඩයේ නිලධාරීන් සඳහා දිස්ත්‍රික් මට්ටමින් පවත්වනු ලබන දෙදින පුහුණු වැඩසටහන - පොළොන්නරුව දිස්ත්‍රික්කය |
| | 7. රාජ්‍ය අංශයේ මානව සම්පතෙහි දැනුම වර්ධනය කිරීම උදෙසා PL කාණ්ඩයේ නිලධාරීන් සඳහා දිස්ත්‍රික් මට්ටමින් පවත්වනු ලබන දෙදින පුහුණු වැඩසටහන - මාතලේ දිස්ත්‍රික්කය |
| | 8. රාජ්‍ය අංශයේ මානව සම්පතෙහි දැනුම වර්ධනය කිරීම උදෙසා PL කාණ්ඩයේ නිලධාරීන් සඳහා දිස්ත්‍රික් මට්ටමින් පවත්වනු ලබන දෙදින පුහුණු වැඩසටහන - නුවර දිස්ත්‍රික්කය |
| | 9. රාජ්‍ය අංශයේ මානව සම්පතෙහි දැනුම වර්ධනය කිරීම උදෙසා PL කාණ්ඩයේ නිලධාරීන් සඳහා දිස්ත්‍රික් මට්ටමින් පවත්වනු ලබන දෙදින පුහුණු වැඩසටහන - නුවරඑළිය දිස්ත්‍රික්කය |
| | 10. රාජ්‍ය අංශයේ මානව සම්පතෙහි දැනුම වර්ධනය කිරීම උදෙසා PL කාණ්ඩයේ නිලධාරීන් සඳහා දිස්ත්‍රික් මට්ටමින් පවත්වනු ලබන දෙදින පුහුණු වැඩසටහන - කෑගල්ල දිස්ත්‍රික්කය |
| | 11. රාජ්‍ය අංශයේ මානව සම්පතෙහි දැනුම වර්ධනය කිරීම උදෙසා PL කාණ්ඩයේ නිලධාරීන් සඳහා දිස්ත්‍රික් මට්ටමින් පවත්වනු ලබන දෙදින පුහුණු වැඩසටහන - රත්නපුර දිස්ත්‍රික්කය |
| 127 | කාර්යාල කළමනාකරණය - රූපිකා පතිරණ මිය Diploma | 1 | දෙසැම්බර් 10 | 100,000.00 | _ | දේශීය | |
| 128 | නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - SLIDA (5 Days) | 22 | නොවැම්බර් 24/ දෙසැම්බර් 15 | 253,500.00 | _ | දේශීය | |
| 129 | විධායක නිලධාරින් සඳහා වන නීති ඩිප්ලෝමා පාඨමාලාව - පී.ඒ.ටී.එන්. පොන්නම්පෙරුම මිය | 1 | දෙසැම්බර් 19 | 67,000.00 | _ | දේශීය | |
| 130 | විධායක නිලධාරින් සඳහා වන නීති ඩිප්ලෝමා පාඨමාලාව - පී.සී.විදාණපතිරණ මිය | 1 | දෙසැම්බර් 19 | 67,000.00 | _ | දේශීය | |
| 131 | විධායක නිලධාරින් සඳහා වන නීති ඩිප්ලෝමා පාඨමාලාව -සජීවනී අතපත්තු මිය | 1 | දෙසැම්බර් 19 | 67,000.00 | _ | දේශීය | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 132 | විධායක නිලධාරීන් සඳහා වන නීති ඩිප්ලෝමා පාඨමාලාව - එච්. ඒ. ඩී.සී. ජයසේකර මිය | 1 | දෙසැම්බර් 19 | 67,000.00 | _ | දේශීය | |
| 133 | විධායක නිලධාරීන් සඳහා වන නීති ඩිප්ලෝමා පාඨමාලාව - ජී. අයි. ඩී.සී. විජේසිංහ මිය | 1 | දෙසැම්බර් 19 | 67,000.00 | _ | දේශීය | |
| 134 | කළමනාකරණ සේවා නිලධාරී - III ශ්‍රේණිය - විවෘත 2019 (2025) සඳහා සේවාරම්භක පුහුණුව - සිංහල මාධ්‍යය (දින 10) - ගාල්ල දිස්ත්‍රික්කය | 97 | දෙසැම්බර් | 368,427.00 | _ | දේශීය | |
| 135 | කළමනාකරණ සේවා නිලධාරී - III ශ්‍රේණිය - විවෘත 2019 (2025) සඳහා සේවාරම්භක පුහුණුව - සිංහල මාධ්‍යය (දින 10) - මොණරාගල දිස්ත්‍රික්කය | 46 | දෙසැම්බර් | 220,150.00 | _ | දේශීය | |
| 136 | කළමනාකරණ සේවා නිලධාරී - III ශ්‍රේණිය - විවෘත 2019 (2025) සඳහා සේවාරම්භක පුහුණුව - සිංහල මාධ්‍යය (දින 10) - පොළොන්නරුව දිස්ත්‍රික්කය | 35 | දෙසැම්බර් | 179,888.00 | _ | දේශීය | දැනුම, කුසලතා, ආකල්ප වර්ධනය වීම |
| 137 | කළමනාකරණ සේවා නිලධාරී - III ශ්‍රේණිය - විවෘත 2019 (2025) සඳහා සේවාරම්භක පුහුණුව - සිංහල මාධ්‍යය (දින 10) - රත්නපුර දිස්ත්‍රික්කය | 105 | දෙසැම්බර් | 308,459.50 | _ | දේශීය | |
| 138 | කළමනාකරණ සේවා නිලධාරී - III ශ්‍රේණිය - විවෘත 2019 (2025) සඳහා සේවාරම්භක පුහුණුව - සිංහල මාධ්‍යය (දින 10) - කළුතර දිස්ත්‍රික්කය | 117 | දෙසැම්බර් | 335,055.00 | _ | දේශීය | |
| 139 | ආයතන අංශයේ නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩමුළුව | 53 | දෙසැම්බර් 16 | 25,497.00 | _ | දේශීය | |
| 140 | රාජ්‍ය සේවයේ මානව සම්පත් සංවර්ධනය උදෙසා පුහුණු උපදේශනය (Skill Up Gov - youtube channel) | 12 | දෙසැම්බර් 23 | 2,540.00 | _ | දේශීය | |
| | | **8609** | | **13,862,211.67** | **1,940,677.97** | | |

# 07. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ අවශ්‍යතා | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනනුකූලතාවන් සඳහා කෙටි පැහැදිලි කිරීම | අනාගතයේදී අනනුකූලතාවන් වැලැක්වීමට යෝජිත නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1. | **පහත මූල්‍ය ප්‍රකාශන/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කර ඇත** | | | |
| 1.1. | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන | අනුකූල වේ. | | |
| 1.2. | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ. | | |
| 1.3. | ව්‍යාපාර සහ නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාල නොවේ. | | |
| 1.4. | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාල නොවේ. | | |
| 1.5. | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාල නොවේ. | | |
| 1.6. | වෙනත් | අදාල නොවේ. | | |
| 2. | **පොත් සහ ලේඛන නඩත්තුකිරීම (FR445)** | | | |
| 2.1. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.2. | පුද්ගලික පඩිනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කිරීම පවත්වා ගැනීම | අනුකූල වේ. | | |
| 2.3. | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.4. | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.5. | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ. | | |
| 2.6. | චෙක් පත් සහ මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙනයාම | අනුකූල වේ. | | |
| 2.7. | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙනයාම | අනුකූල වේ. | | |

| අංකය | අදාළ අවශ්‍යතා | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනනුකූලතා වන් සඳහා කෙටි පැහැදිලි කිරීම | අනාගතයේදී අනනුකූලතාව න් වැලැක්වීමට යෝජිත නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 2.8. | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙනයාම | අනුකූල වේ. | | |
| 2.9. | හානිපාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙනයාම | අනුකූල වේ. | | |
| 2.10. | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙනයාම | අනුකූල වේ. | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20)යාවත්කාලීන කර පවත්වාගෙනයාම | අනුකූල වේ. | | |
| **03.** | **මූල්‍ය පාලනය ආශ්‍රිත ක්‍රියාකාරීත්වය පැවරීම (FR 135)** | | | |
| 3.1. | මූල්‍ය බලතල ආයතනය තුළ පවරාදී තිබීම | අනුකූල වේ. | | |
| 3.2. | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ. | | |
| 3.3. | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම. | අනුකූල වේ. | | |
| 3.4. | 2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රාජ්‍ය පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ. | | |
| 4. | **වාර්ෂික සැලසුම් සැකසීම** | | | |
| 4.1. | වාර්ෂික ක්‍රියාකාරී සැලසුම සකසා ඇත | අනුකූල වේ. | | |
| 4.2. | වාර්ෂික ප්‍රසම්පාදන සැලසුම සකසා ඇත | අනුකූල වේ. | | |
| 4.3. | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ. | | |
| 4.4. | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කර ජාතික අයවැය දෙපාර්තමේන්තුවට නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ. | | |

| අංකය | අදාළ අවශ්‍යතා | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනනුකූලතා වන් සඳහා කෙටි පැහැදිලි කිරීම | අනාගතයේදී අනනුකූලතාවන් වැලැක්වීමට යෝජිත නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| 5. | **විගණන විමසුම්** | | | |
| 5.1. | විගණකාධිපතිවරයා විසින් නියම කර ඇති දිනට සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබාදී තිබීම | අනුකූල වේ. | | |
| 6. | **අභ්‍යන්තර විගණන** | | | |
| 6.1. | මුදල් රෙගුලාසි 134(2) DMA/1-2019 අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස්කිරීම | අනුකූල වේ. | | |
| 6.2. | සෑම අභ්‍යන්තර විගණන වාර්තාකටම මාසයක කාලයක් තුලදී පිළිතුරු සපයා තිබීම. | අනුකූල වේ. | | |
| 6.3. | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| 6.4. | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| 7. | **විගණන සහ කළමනාකරණ කමිටුව** | | | |
| 7.1. | DMA චක්‍රලේඛ 1-2019 අනුව අවම වශයෙන් විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් අදාල වර්ෂය තුල පවත්වාගෙන තිබීම | අනුකූල වේ. | | |
| 8. | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1. | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයෙහි 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදී ගැනීම් සහ අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |

| අංකය | අදාළ අවශ්‍යතා | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනනුකූලතා වන් සඳහා කෙටි පැහැදිලි කිරීම | අනාගතයේදී අනනුකූලතාව න් වැලැක්වීමට යෝජිත නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොන්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම. | අනුකූල වේ. | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ. | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු/රෙ/ 772 අනුව සිදු කිරීම | අනුකූල වේ. | | |
| 9 | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ. | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම. | අනුකූල වේ. | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ. | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරාව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ. | | |

| අංකය | අදාළ අවශ්‍යතා | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනනුකූලතා වන් සඳහා කෙටි පැහැදිලි කිරීම | අනාගතයේදී අනනුකූලතාව න් වැලැක්වීමට යෝජිත නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම | අනුකූල වේ. | | |
| 10 | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ. | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ. | | |
| 11 | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ. | | |
| 11.2 | මු.රෙ 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ. | | |
| 12 | **රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | අනුකූල වේ. | | |
| 12.1 | සීමාවන්ට අනුකූල වීම | අනුකූල වේ. | | |
| 12.2 | හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම. | අනුකූල වේ. | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම. | අනුකූල වේ. | | |
| 13 | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මුරෙ 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ. | | |

| අංකය | අදාළ අවශ්‍යතා | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනනුකූලතා වන් සඳහා කෙටි පැහැදිලි කිරීම | අනාගතයේදී අනනුකූලතාව න් වැළැක්වීමට යෝජිත නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 14 | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ. | | |
| 14.2 | මු.රෙ 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්ය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ. | | |
| 14.3 | මු.රෙ 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කායී අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ. | | |
| 14.4 | අග්රිම ගිණුමේ ශේෂය,භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ. | | |
| 15 | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අනුකූල වේ. | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ. | | |
| 15.3 | මුරෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයින් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම | අනුකූල වේ. | | |

| අංකය | අදාළ අවශ්‍යතා | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනනුකූලතා වන් සඳහා කෙටි පැහැදිලි කිරීම | අනාගතයේදී අනනුකූලතාව න් වැලැක්වීමට යෝජිත නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 16.3 | 2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| 17 | **මහජනයා වෙත තොරතුරු ලබාදීම** | | | |
| 17.1 | තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා හෝ ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ. | | |
| 17.3 | තොරතුරු දැන ගැනීම පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| 18 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018 (1) දරන රාජ්‍ය පරිපලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ. | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ. | | |
| 19 | **මානව සම්පත් සැලස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව | අනුකූල වේ. | | |

| අංකය | අදාළ අවශ්‍යතා | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනනුකූලතා වන් සඳහා කෙටි පැහැදිලි කිරීම | අනාගතයේදී අනනුකූලතාව න් වැලැක්වීමට යෝජිත නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| | සම්පත් සැලස්මක් සකස් කොට තිබීම | | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ. | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල නොවේ. | වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම අවලංගු කරමින් රා.ප.ච. 02/2018 (1) චක්‍රලේඛය නිකුත් කර ඇත. | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම | අනුකූල වේ. | | |
| 20 | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂය සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ් විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ. | | |

# ස්වදේශ
# කටයුතු
# අංශය

## පරිච්ඡේද


**1. පරිච්ඡේදය - ආයතන පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය ........................................................... 1**

1.1. හැඳින්වීම ........................................................................................................................ 1
1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණ ................................................................................. 2
1.3. ප්‍රධාන කාර්යයන් ............................................................................................................. 3
1.3.1. පාලන අංශය .................................................................................................................. 3
1.3.2. ස්වදේශ කටයුතු අංශය .................................................................................................. 4
1.3.2.1 දිස්ත්‍රික් පාලන අංශය .................................................................................................. 4
1.3.2.2 ප්‍රාදේශීය පාලන අංශය ................................................................................................ 4
1.3.2.3 ග්‍රාම නිලධාරී පාලන අංශය ........................................................................................... 4
1.3.3. සංවර්ධන අංශය ............................................................................................................ 5
1.3.4. මූල්‍ය අංශය .................................................................................................................... 6
1.3.5. විමර්ශන අංශය ............................................................................................................... 6
1.3.6. අභ්‍යන්තර විගණන අංශය ............................................................................................... 7
1.3.7. ඉංජිනේරු අංශය ............................................................................................................ 7
1.3.8. ක්‍රමසම්පාදන අංශය ....................................................................................................... 8
1.3.9. ප්‍රාදේශීය පරිපාලන ප්‍රතිසංස්කරණ අංශය ........................................................................ 8
1.4. සංවිධාන සටහන ............................................................................................................... 9
1.6. අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු / ආයතන ....................................................... 11
1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු ......................................................................... 11

**2. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම, විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක ........................... 12**

2.1. ප්‍රගතිය හා ඉදිරි දැක්ම, ......................................................................................................... 12

2.2. විශේෂ ජයග්‍රහණ ................................................................................................................. 13

2.3. අභියෝග .............................................................................................................................. 13

2.4. ඉදිරි ඉලක්ක........................................................................................................................15

**4. පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක ........................................................................................ 18**

**5. පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය .....................................22**

5.1. හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු ............................................................... 22
5.2. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග ............................................. 28
5.2.1. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ ........................................................... 28
5.2.2. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ අභියෝග ............................................................. 28

**6. මානව සම්පත් පැතිකඩ ......................................................................................................... 29**

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය ............................................................................................... 30
6.2. ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාරය..............30
6.2.1. ස්වදේශ කටයුතු අංශයේ 2025.12.31 දිනට අනුමත කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු .................. 32
6.3. මානව සම්පත් සංවර්ධනය - දේශීය පුහුණු සහ විදේශීය පුහුණු ……………………………………...37

**7. අනුකූලතා වාර්තාව ............................................................................................................. 37**

# 01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

## 1.1. හැඳින්වීම

සිවිල් පරිපාලනය, පහසුකම් සැපයීම සහ සම්බන්ධීකරණ කටයුතු වල කේන්ද්‍රස්ථානය වශයෙන් ඊට අදාළ සේවා සහ ඒවායේ ප්‍රධාන අංශ වන දිස්ත්‍රික් පරිපාලනය, සිවිල් ලියාපදිංචි කටයුතු සහ සේවක සුභ සාධනය යන කටයුතු ස්වදේශ කටයුතු අංශය මඟින් ඉටු කෙරේ. රජයේ ජාතික ප්‍රමුඛතාවයන් හා සමගාමීව සමාජ හා ආර්ථික සංවර්ධනය ඉලක්ක කර ගනිමින් සංවිධානමය කාර්ය සාධනය සුවිශිෂ්ටත්වය උදෙසා වන රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, මානව සම්පත් කළමනාකරණය, ආයතනික සංවර්ධනය, විද්‍යුත් තාක්ෂණික ක්‍රම භාවිතය හරහා විශිෂ්ඨ සේවයක් සැපයීම මඟින් සෞභාග්‍යමත් දේශයක් විනයානුකූල සමාජයක් සහ සතුටුදායක පවුලක් තුළ වෙසෙන ඵලදායී පුරවැසියන් බිහි කිරීමට සහයෝගය සහ දායකත්වය සැලසීම ප්‍රමුඛ කාර්යයන් වේ. ප්‍රධාන අභ්‍යන්තර අංශ නවයකින් සමන්විත මෙම අමාත්‍යාංශයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 ක, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 341 ක හා ග්‍රාම නිලධාරී වසම් 14,022 ක සමස්ත කාර්යභාරය මෙහෙයවීම, සම්බන්ධීකරණය සහ වඩා කාර්යක්ෂම හා ඵලදායී මහජන සේවා සැපයීම උදෙසා අවශ්‍ය මානව හා භෞතික සම්පත් මෙන්ම අනෙකුත් පහසුකම් සැපයීම ද සිදුකරනු ලබයි

**ප්‍රධාන අභ්‍යන්තර අංශ**

- පාලන අංශය
- සංවර්ධන අංශය
- මූල්‍ය අංශය
- විමර්ශන අංශය
- ස්වදේශ කටයුතු අංශය
- අභ්‍යන්තර විගණන අංශය
- ඉංජිනේරු අංශය
- ක්‍රමසම්පාදන අංශය
- ප්‍රාදේශීය පරිපාලන ප්‍රතිසංස්කරණ අංශය

**ස්වදේශ කටයුතු අංශය යටතේ ඇති ආයතන හා දෙපාර්තමේන්තු**

- **සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල**
- **සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල**
- **රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

## 1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

| දැක්ම | මෙහෙවර | අරමුණු |
|---|---|---|
|  |  |  |
| "ජාතියේ උන්නතිය උදෙසා වන සුවිශේෂී සේවාවක් සැපයීම" | "භෞමික අඛණ්ඩතාවයෙන් යුත් සුරක්ෂිත, ස්වෛරී රටක් තහවුරු කිරීම උදෙසා උපායමාර්ගික සැලසුම් හා ප්‍රතිපත්ති සකස් කිරීම සහ ක්‍රියාවට නැංවීම. " | • රට තුළ වඩාත් සංවේදී සහ ජනතා හිතවාදී රාජ්‍ය සේවයක් ස්ථාපිත කිරීමට කැපවීම සහ කටයුතු කිරීම.<br>• ආයතනවල මානව සහ භෞතික සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීම තුළින් ඵලදායීතාවය ඉහළ නැංවීම.<br>• උප ජාතික මට්ටමේ දී රේඛීය අමාත්‍යාංශවල ක්‍රියාදාමය සඳහා ශක්තිමත් දායකත්වයක් ලබාදීම. ( දිස්ත්‍රික්ක /ප්‍රාදේශීය /ග්‍රාමීය මට්ටම).<br>• ප්‍රාදේශීයව ඇති සමාජ ආර්ථික යටිතල පහසුකම්වල අසමානතා අවම කිරීම. |

## 1.3. ප්‍රධාන කාර්යයන්

### 1.3.1. පාලන අංශය

1. මානව සම්පත් කළමනාකරණය
2. කාර්යාල කළමනාකරණය
3. ඵලදායිතා කළමනාකරණ ප්‍රවේශයන් ඔස්සේ කාර්යාල ක්‍රමවේද ඉහළ නැංවීම.
4. කළමනාකරණ කටයුතුවලට අදාළ වන උපාංග නඩත්තු කිරීම හා පාලනය කිරීම.
5. පහසුවෙන් වැඩකළ හැකි වැඩ පරිසරයක් ඇති කිරීම උදෙසා ගුණාත්මක සහ ඵලදායි ලෙස නවීන තොරතුරු තාක්ෂණික ක්‍රම ක්‍රියාත්මක කිරීම.
6. මනා සම්බන්ධීකරණය තුලින් ආයතන අතර මිත්‍රශීලී සම්බන්ධතාවයක් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.
7. කාර්යක්ෂම හා ඵලදායිතාවයෙන් පිරිපුන් කාර්ය මණ්ඩලයක් ඇති කිරීම සඳහා නිලධාරින් වෙත දේශීය හා විදේශීය පුහුණු අවස්ථා ලබාදීම.
8. ස්වදේශ කටයුතු අංශයේ සේවයේ නියුතු නිලධාරීන්ගේ පෞද්ගලික ලිපි ගොනු යාවත්කාලීනව පවත්වාගෙන යාම.
9. නිලධාරීන්ගේ කාර්යසාධනය ඇගයීමට පියවර ගැනීම, වැටුප් වර්ධක සහ උසස්වීම් ප්‍රමාදයකින් තොරව ලබා දීම.
10. නිලධාරීන්ගේ පත්වීම් ස්ථිර කිරීමට අදාළ කටයුතු සිදුකිරීම.
11. නිලධාරීන්ගේ ස්ථානමාරු හා අභ්‍යන්තර අනුයුක්ත කිරීම සම්බන්ධ කටයුතු සිදුකිරීම.
12. නිලධාරීන්ගේ අන්තර්ග්‍රහන කටයුතු , විශ්‍රාම ගැන්වීම හා අනෙකුත් ආයතන කටයුතු සිදුකිරීම.
13. දෙපාර්තමේන්තුගත නිලධාරීන්ගේ ලිපිගොනු යාවත්කාලීනව පවත්වාගෙන යාම
14. එම නිලධාරීන්ගේ බඳවා ගැනීමේ පරිපාටි සකස් කිරීම, එම බඳවා ගැනීම් පටිපාටි අනුමත කිරීමේ කටයුතු සිදු කිරීම
15. නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් පැවැත්වීම හා සේවය ස්ථිර කිරීම, විනය කටයුතු, අභ්‍යන්තර පරීක්ෂණ සම්බන්ධව කටයුතු සිදු කිරීම.
16. දෙපාර්තමේන්තුගත නිලධාරීන් විශ්‍රාම ගැන්වීම හා අනෙකුත් ආයතන කටයුතු
17. ස්වදේශ කටයුතු අංශය ඇතුළු දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමත කරගනු ලබන ප්‍රාථමික තනතුරුවලට අදාළ බඳවා ගැනීමේ කටයුතු
18. අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩල තොරතුරු යාවත්කාලීන කිරීම සම්බන්ධ කටයුතු
19. විදේශ නිවාඩු හා දේශීය නිවාඩු සම්බන්ධව පසු විපරම් කටයුතු සිදු කිරීම
20. තොරතුරු පනත යටතේ මහජනතාව වෙතින් ලැබෙන ඉල්ලීම් සඳහා වඩාත් පහසු ලෙස තොරතුරු ලබා ගැනීමට අවශ්‍ය ක්‍රමවේදයන් පවත්වාගෙන යාම.
21. ස්වදේශ කටයුතු අංශයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම මඟින් ලබා දෙන ණය විෂයන්ට අදාළ කටයුතු (උත්සව අත්තිකාරම්/ආපදා ණය/දේපළ)
22. අමාත්‍යාංශයේ නිලධාරීන් සඳහා අග්‍රහාර රක්ෂණ , දුම්රිය වාර ප්‍රවේශ පත්‍ර සහ දුම්රිය බලපත්‍ර ප්‍රමාදයකින් තොරව ලබා දීමට කටයුතු කිරීම.
23. සහනදායී පදනම මත මෝටර් රථ ආනයන බලපත්‍ර ලබා දීම
24. අමාත්‍යාංශය වෙත ලැබෙන මහජන පැමිණිලිවලට කඩිනමින් විසඳුම් ලබාදීම සඳහා ක්‍රමවේදයක් පවත්වාගෙන යාම.
25. අමාත්‍යාංශයට අයත් සංචාරක බංගලා සම්බන්ධ කටයුතු අධීක්ෂණය කිරීම, සේවාලාභීන්ට ගැටලුවකින් තොරව මාර්ගගත ක්‍රමය ඔස්සේ සංචාරක බංගලා වෙන්කර ගැනීමට හැකිවන පරිදි කටයුතු සම්පාදනය කිරීම.
26. අමාත්‍යාංශයේ කටයුතු සඳහා ප්‍රවාහන සංචිතයක් පවත්වාගෙන යාම.
27. අමාත්‍යාංශයේ සියලුම අංශ සඳහා සහ අමාත්‍යාංශය යටතේ පාලනය වන දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා අවශ්‍ය අවස්ථාවන්හීදී නීතිමය කාර්යයන් ඉටුකර දීමට හැකියාව ඇති නීති ඒකකයක් පවත්වාගෙන යාම
28. පාලන අංශයට අදාළව ප්‍රතිපත්තිමය තීරණ ගත යුතු අවස්ථාවන්හිදී අමාත්‍ය මණ්ඩල සංදේශ කෙටුම්පත් කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කිරීම.
29. ස්වදේශ කටයුතු අංශයේ අනිකුත් අංශ වෙතින් ලැබෙන අමාත්‍ය මණ්ඩල සංදේශ, අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත යොමු කිරීම.
30. අමාත්‍ය මණ්ඩලය වෙතින් ලැබෙන අමාත්‍ය මණ්ඩල තීරණ සඳහා අදාළ ක්‍රියා මාර්ග ගැනීමට අදාළ අංශ වෙත යොමු කිරීම

31. පාලන අංශයට අදාළ පාර්ලිමේන්තු ප්‍රශ්නවලට පිළිතුරු සකස් කිරීම හා එම පිළිතුරු වාර්තා ත්‍රෛභාෂාවෙන් සකස් කර පාර්ලිමේන්තුව වෙත ලබා දීම
32. අනෙකුත් අංශයන්ට අදාළ පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු පාර්ලිමේන්තුව වෙත යොමු කිරීම
33. මහජන පෙත්සම් කාරක සභා, උපදේශක කාරක සභා, ආංශික අධීක්ෂණ කාරක සභා රැස්වීම් සම්බන්ධ කටයුතු කිරීම
34. අමාත්‍යාංශය යටතේ පාලනය වන දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල හා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව වෙතින් ලැබෙන දේශීය හා විදේශීය නිවාඩු සම්බන්ධව කටයුතු සිදු කිරීම.
35. අමාත්‍යාංශයේ තැපැල් ඒකකයට සම්බන්ධ කටයුතු මෙහෙයවීම හා අධීක්ෂණය
36. මැතිවරණ සම්බන්ධ අමාත්‍යාංශයේ සම්බන්ධීකරණ කටයුතු
37. රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ආයතනික කටයුතු සම්බන්ධයෙන් අමාත්‍යාංශය මඟින් සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

### 1.3.2. ස්වදේශ කටයුතු අංශ

#### 1.3.2.1. දිස්ත්‍රික් පාලන අංශය

1. ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අනුයුක්ත සංවර්ධන නිලධාරීන්ගේ සියළුම ආයතන කටයුතු
2. දිස්ත්‍රික් පරිපාලන කටයුතු වලට අදාළව උපදෙස් / චක්‍රලේඛ නිකුත් කිරීම.
3. දිස්ත්‍රික් පරිපාලන කටයුතු සම්බන්ධයෙන් ලැබෙන පොදු ලිපි සම්බන්ධයෙන් කටයුතු කිරීම.
4. දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල සේවය කරන නිලධාරීන්ගේ දේශීය පුහුණු අවශ්‍යතා සම්බන්ධයෙන් කටයුතු කිරීම.
5. දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ මාසික සමුළු පැවැත්වීම.
6. රාජ්‍ය උත්සව සංවිධාන කටයුතු සිදු කිරීම.
7. වන්දනා ගමන් ආඥා පනතට අදාළ කටයුතු
8. 1971 අංක 29 දරණ නිවාඩු පනත අනුව පොහොය දින, රජයේ සහ බැංකු නිවාඩු සම්බන්ධව කටයුතු
9. සමාජ තැගි තරග වලට අදාල සියළුම කටයුතු සහ ඊට සම්බන්ධ සියළු ලිපි හා ලේඛණ යාවත්කාලීනව පවත්වාගෙන යාම.
10. උත්සව භාණ්ඩ නිකුත් කිරීම සම්බන්ධ කටයුතු
11. ග්‍රාම නාම වෙනස් කිරීම.
12. ජනරජ ප්‍රමුඛතා ලේඛනය යාවත්කාලීන කිරීම.
13. පාර්ලිමේන්තු ප්‍රශ්න සම්බන්ධ කටයුතු (අදාල විෂය ලිපිකරුගෙන් පිළිතුරු ලබා ගෙන අවසාන පිළිතුරු යැවීම සහ ඒ සම්බන්ධව පොදු ගොනුවක් පවත්වා ගැනීම)
14. පුපුරන ද්‍රව්‍ය බලපත්‍ර පොත් නිකුත් කිරීම සම්බන්ධ කටයුතු
15. ශාඛාවට ලැබෙන පොදු ලිපි සම්බන්ධයෙන් කටයුතු
16. දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල කාර්ය මණ්ඩල පුරප්පාඩු , සමාලෝචන වාර්තා සම්බන්ධ කටයුතු

#### 1.3.2.2. ප්‍රාදේශීය පාලන අංශය

1. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මානව සම්පත් කළමනාකරණය සහ අධීක්ෂණය
2. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල භෞතික සම්පත් කළමනාකරණය
3. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ගැටලු කළමනාකරණය
4. ප්‍රාදේශීය පරිපාලනයට අදාළ වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සම්බන්ධීකරණය

#### 1.3.2.3. ග්‍රාම නිලධාරී පාලන අංශය

1. ග්‍රාම නිලධාරීන් හා පරිපාලන ග්‍රාම නිලධාරීන් බඳවා ගැනීම, ස්ථිර කිරීම, උසස් කිරීම, කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම, ස්ථාන මාරු, විනය පාලනය, විශ්‍රාම ගැන්වීම

හා ග්‍රාම නිලධාරී හරහා සිදුවන මහජන සේවාවලට අදාළ ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට සහාය වීම.

2. ග්‍රාම නිලධාරීන්ගේ සේවා පහසුකම් වැඩිදියුණු කරමින් ග්‍රාම නිලධාරීන් මඟින් ලබා දෙන මහජන සේවය ප්‍රශස්ථ මට්ටමක පවත්වා ගැනීමට කටයුතු කිරීම.

### 1.3.3. සංවර්ධන අංශය

1. මුදලට සරිලන වටිනාකම, විනිවිදභාවය ඇතුළු ප්‍රසම්පාදන මූල ධර්ම අනුගමනය කිරීම සහ රාජ්‍ය ප්‍රසම්පාදන පටිපාටිවලට අනුගතව කටයුතු කිරීම සහතික කරමින් මුළු පිරිවැය ඇස්තමේන්තුව රුපියල් මිලියන 400 ඉක්මවන ඉදිකිරීම්වලට අදාළ කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම.
2. අමාත්‍යාංශ වැය ශීර්ෂයට අදාළ ඉදිකිරීම් හා සම්බන්ධ ප්‍රාග්ධන වියදම් වැය විෂයට අදාළව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සහ එම සැලැස්ම අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා අරමුදල් වෙන් කර දීමට අවශ්‍ය කටයුතු කිරීම.
3. දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ පවත්වන සම්බන්ධීකරණ කමිටු සඳහා සභාපතිවරු පත් කිරීම.
4. දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවල ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපදෙස් ඇතුලත් කර මාර්ගෝපදේශ සකස් කිරීම.
5. දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවල ගනු ලබන තීරණ පිළිබඳව ප්‍රගතිය අධීක්ෂණය කිරීම.
6. දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ ඉදිකිරීම් වැය විෂය යටතේ අරමුදල් වෙන් කෙරෙන ව්‍යාපෘතීන්හි භෞතික හා මූල්‍ය ප්‍රගතිය අධීක්ෂණය කිරීම සහ (අවශ්‍ය අවස්ථාවන්හිදී අවශ්‍ය මග පෙන්වීම් සිදු කරමින්) මෙම ව්‍යාපෘතිවල ප්‍රගතිය පිළිබඳ පසු විපරම් සිදු කිරීම.
7. දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම වැය විෂය සඳහා වෙන් කර දී ඇති ප්‍රතිපාදනයට අදාළව එක් එක් ක්‍රියාකාරකම වෙනුවෙන් වෙන් කර ඇති අරමුදල් උපරිම හා කාර්යක්ෂම අන්දමින් උපයෝගී වන බව සහතික කිරීම සඳහා එම ක්‍රියාකාරකම්වල ප්‍රගතිය අධීක්ෂණය කිරීම.
8. සංවර්ධන අංශය මෙන්ම දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ඍජුව ක්‍රියාවට නංවනු ලබන හෝ මෙහෙයවනු ලබන ඉදිකිරීම් හා සම්බන්ධ ප්‍රගති වාර්තා සහ වෙනත් තොරතුරු භාණ්ඩාගාරය, ජනාධිපති ලේකම් කාර්යාලය හා අගමැති කාර්යාලය වැනි අදාළ නියෝජිතායතන වෙත එම ආයතනවලින් කරන ඉල්ලීම පරිදි යොමු කිරීම.
9. රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන ලේකම්තුමා නියෝජනය කරනු ලබන ආහාර සුරක්ෂිතතා හා ආහාර ප්‍රතිපත්ති කමිටුවට අදාළ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
10. දිස්ත්‍රික් ලේකම් කාර්යාල/ ප්‍රාදේශීය ලේකම් කාර්යාල/නිල නිවාස/නිල සෙවණ/ ග්‍රාම නිලධාරි කාර්යාල/ සේවා පියස ගොඩනැගිලි ඉදිකිරීම් සිදු කර ඇති ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු
11. ස්වදේශ කටයුතු අංශයට අයත් සංචාරක බංගලාවන් ස්ථාපිතව ඇති ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු
12. නිල සෙවණ කාර්යාල ගොඩනැගිලි ඉදිකිරීම් ක්‍රියාවට නැංවීම සහ එහි ප්‍රගතිය සමාලෝචනය කිරීම.
13. "පිබිදෙමු පොලොන්නරුව" වැඩසටහනට අදාල ව්‍යාපෘතීන්වල අතැති බිල්පත් පියවීමට

අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම හා එහි ප්‍රගතිය අධීක්ෂණය කිරීම

14. රජයේ නිවාස සම්බන්ධව කටයුතු කිරීම, පොදු සේවා නිවාස හා උපලේඛනගත නිවාස පැවරීම, කාලය දීර්ඝ කිරීම, අලුත්වැඩියා කිරීම ආදී කටයුතු
15. දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අයත්වන රජයේ නිවාසවල ආර්ථික කුලිය අය කිරීම සම්බන්ධ කටයුතු සිදු කිරීම.
16. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිල නිවාස වෙනත් රජයේ කාර්යයන් සඳහා යොදා ගැනීමට අදාළව අනුමැතීන් ලබා දීමට කටයුතු කිරීම.

### 1.3.4. මූල්‍ය අංශය

1. රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය යටතේ උප අංශයක් ලෙස කටයුතු කරමින් ස්වදේශ කටයුතු අංශය යටතේ පාලනය වන ආයතනවල රාජ්‍ය මූල්‍ය කළමනාකරණය.
2. ප්‍රසම්පාදන කළමනාකරණය.
3. මූල්‍ය කළමනාකරණය
4. වත්කම් කළමනාකරණය.
5. මූල්‍ය කළමනාකරණය පිළිබඳ පුහුණුව හා සංවර්ධනය සම්බන්ධ කටයුතු
6. විගණන කටයුතු සම්බන්ධීකරණය
7. රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට අදාළ ක්‍රියාකාරකම් අධීක්ෂණය හා පසු විපරම් කිරීම

### 1.3.5. විමර්ශන අංශය

1. 2016 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා විමර්ශන අංශයට විවිධ ආකාරයට රාජ්‍ය සේවා කොමිෂන් සභාව, ජනාධිපති කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, රාජ්‍ය ගිණුම් කාරක සභාව ආදි ආයතන වලින් ලැබෙන පැමිණිලි සහ දෛනික පුවත්පත්, රූපවාහිනී, 1905 මහජන පැමිණිලි ඒකකය මෙන්ම අන්තර්ජාලය ඔස්සේ ලද පැමිණිලි පරීක්ෂා කර බලා එම පැමිණිලි වලට අදාල ගැටළු පැන නැගී ඇති අංශ 07 ක් (ඉඩම් ගැටලු, රාජ්‍ය නිලධාරීන්ගේ අකටයුතුකම්, රාජ්‍ය දේපළ අවභාවිතා කිරීම, මූල්‍ය වංචා, නීති විරෝධී ව්‍යාපාර, යටිතල පහසුකම් අක්‍රමිකතා, මානව හිමිකම් කඩවීම්) හඳුනාගෙන ඇති අතර එම ගැටළු ඇති වීමට හේතු සහ එකී අඩුපාඩු මග හැරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග හඳුනාගන ඇත.
2. මෙම අඩුපාඩු මගහරවා ගැනීමේ පියවරක් ලෙස මෙම අංශය මගින් ප්‍රාදේශීය පරිපාලනයට සම්බන්ධව අධීක්ෂණ කටයුතු සිදුකරන දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල අතිරේක දිස්ත්‍රික් ලේකම්වරුන් සඳහා විනය කාර්ය කළමනාකරණය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහනක් UNDP මූල්‍ය අනුග්‍රහය යටතේ පවත්වා ඇත.
3. ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ග්‍රාම නිලධාරී කාර්යාලවල හදිසි කාර්යාල පරීක්ෂණ පැවැත්වීම.

   ඒඅනුව කොළඹ දිස්ත්‍රික්කයේ මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කාර්යාල පරීක්ෂණයක් හා අනුරාධපුර දිස්ත්‍රික්කයේ මධ්‍යම නුවරගම්පළාත තුල ඉඩම් කාර්යාල පරීක්ෂණයක් පවත්වා ඇත.

4. අමාත්‍යාංශයේ විෂය පථයට අයත් සියලුම ආයතනවල මූලික විමර්ශන කටයුතු සිදු කිරීම හා මූලික විමර්ශනයෙන් අනාවරණය වන කරුණු අනුව චෝදනාපත්‍ර කෙටුම්පත් අදාළ විනය බලධාරීන් වෙත යොමු කිරීම. (මූලික විමර්ශන 66 ක් සඳහා බලය පවරා ඇත)
5. විධිමත් විනය පරීක්ෂණවලදී සාක්ෂි ලබා දීම.
6. විධිමත් විනය පරීක්ෂණවලදී පැමිණිල්ල මෙහෙයවීම. (පැමිණිල්ල මෙහෙයවීමේ කටයුතු 25 ක් සිදුකර ඇත)

7. මූලික විමර්ශන සිදු නොකරන පැමිණිලි සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම්/අදාළ පාර්ශව වෙතින් වාර්තා කැඳවා එමඟින් විසඳුම් ලබාදීමට කටයුතු කිරීම. (කාරණා ගොනු නඩත්තු කිරීම).
8. පැමිණිලි පාර්ශවය හා පැමිණිල්ලේ සඳහන් කාරණාවලට අදාල රාජ්‍ය නිලධාරීන් විමර්ශන අංශය වෙත කැඳවා කඩිනමින් එම ගැටළු විසඳීමට කටයුතු කිරීම.
9. වෙනත් අමාත්‍යාංශවල ඉල්ලීම මත එම අමාත්‍යාංශවල පැවැත්වෙන විමර්ශන හා පැමිණිල්ල මෙහෙයවීමේ කටයුතු සඳහා විමර්ශන නිලධාරීන් යොමු කිරීම( බාහිර ආයතනයන්හී මූලික විමර්ශන 65 ක් සඳහා නිළධාරීන් නම් කර යවා ඇත)
10. UNDP අනුග්‍රහය යටතේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල හඳුනාගත් විශය ක්ෂේත්‍ර කිපයක වැඩ අත්පොත් 08 හා ග්‍රාමනිලධාරී අත්පොත් සකස්කිරීමට කටයුතු ආරම්භ කිරීම

### 1.3.6. අභ්‍යන්තර විගණන අංශය

1. වාර්ෂික විගණන සැලැස්ම පරිදි අභ්‍යන්තර විගණන සිදු කර අනාවරණය කරගත් අඩුපාඩු හා නිර්දේශ සාකච්ඡා කිරීමේ යාන්ත්‍රණයක් ලෙස කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/01/2025 ඡේද අංක 2.2 හි උපදෙස් පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04ක් පැවැත්වීම.
2. කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/01/2025 ඡේද අංක 2.2 හි උපදෙස් පරිදි දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 තුල හා රෙජිස්ට්‍රාර් ජනාරල් දෙපාර්තමේන්තුවේ කාර්තුගතව පැවැත්වෙන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 104 කට අමාත්‍යාංශ නියෝජිත ලෙස සහභාගී වීම.
3. රෙජිස්ට්‍රාර් ජනාරල් දෙපාර්තමේන්තුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා අමාත්‍යාංශයේ එක් එක් අංශ වලට අදාල වන ලෙස මූල්‍ය විගණනය, කාර්යසාධන විගණනය, මුදලට අගය විගණනය, පද්ධති විගණනය ලෙස අභ්‍යන්තර විගණනයන් සිදු කිරීම මඟින් විගණන විමසුම් නිකුත් කිරීම.
4. දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 හි ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන්ගේ විගණන වාර්තා පසුවිපරම් සිදු කිරීම තුලින් අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය තහවුරු කිරීම.
5. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන්ගේ කාර්තු වාර්තා පදනම්ව කාර්තුගතව අමාත්‍යාංශ ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ වාර්තාව සකස්කර මහා මහා භාණ්ඩාගාරය වෙත යොමු කිරීම

මහා භාණ්ඩාගාරය වෙත යොමු කිරීම.

### 1.3.7. ඉංජිනේරු අංශය

1. ඉංජිනේරු හා නඩත්තු අංශයේ නිලධාරීන්ගේ රාජකාරී කටයුතු අධීක්ෂණය හා පාලනය
2. ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ඉදිකිරීම් ව්‍යාපෘති අධීක්ෂණය හා උපදේශනය ලබාදීමට උපදේශන ආයතනයන් සම්බන්ධීකරණය කිරීම
3. ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් ප්‍රතිපාදන වෙන් කරනු ලබන මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.මිලියන 400 ඉක්මවන ඉදිකිරීම් ව්‍යාපෘතිවලට අදාල සැලසුම් ඇස්තමේන්තු හා විචල්‍යතා වාර්තා නිර්දේශ කිරීම
4. ඉදිකිරීම් සම්බන්ධ ව්‍යාපෘතිවල ප්‍රගතිය විමසීම
5. කවර හෝ ප්‍රතිපාදන ප්‍රභවයක් යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ක්‍රියාත්මක කරනු ලබන යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති වලට අදාල තාක්ෂණ සහාය ලබාදීම

6. දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා ඒ යටතේ ඇති අනෙකුත් කාර්යාලවල ඉදිකිරීම් හා අලුත්වැඩියා කාර්යයන් සම්බන්ධව කොන්ත්‍රාත් පරිපාලනයට අදාළ සියලු කටයුතු
7. දිස්ත්‍රික් ඉංජිනේරු, තාක්ෂණික නිලධාරී, සහ තාක්ෂණ සහායක නිලධාරීන්ගේ වෘත්තීමය කාර්යභාරය අධීක්ෂණය
8. අමාත්‍යාංශ/ දිස්ත්‍රික් ඉංජිනේරුවරුන්ගේ උසස්වීම් හා වරලත් සුදුසුකම් තත්ව ලබා ගැනීමේ කටයුතු සඳහා පහසුකම් සැපයීම සහ තාක්ෂණික කාර්යය මණ්ඩලවල පුහුණු අවශ්‍යතා සපුරාලීමට කටයුතු කිරීම
9. ඉදිකිරීම් බේරුම්කරණ ක්‍රියාවලිය සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාට අවශ්‍ය ඉංජිනේරුමය උපදෙස් ලබා දීම
10. අවස්ථානුකූලව විමධ්‍යගත අයවැය සම්බන්ධ ව්‍යාපෘති, වෙනත් අමාත්‍යාංශ සහ රාජ්‍ය නොවන සංවිධාන විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති සම්බන්ධ තාක්ෂණික සහ ඉංජිනේරුමය උපදේශන කටයුතු සිදු කිරීම
11. ස්වදේශ කටයුතු අංශය යටතේ පවතින සංචාරක නිවාස අලුත්වැඩියා කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කිරීම, අලුත්වැඩියා කිරීම, තාක්ෂණික උපදේශනය ලබා දීම සහ ඊට අදාළ කොන්ත්‍රාත් පරිපාලනයට අදාළ සියලුම කටයුතු
12. "නිල මැදුර" පරිපාලන සංකීර්ණයේ නඩත්තු කටයුතු පරිපාලනය හා තාක්ෂණික උපදේශනය හා ක්‍රියාත්මක කිරීම
13. නිදහස් මන්දිරය අලුත්වැඩියා කිරීම කටයුතු සඳහා පහසුකම් සැපයීම හා එහි අධික්ෂණ කටයුතු කිරීම

### 1.3.8.ක්‍රමසම්පාදන අංශය

1. අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම හා ප්‍රගති පාලනය
2. අමාත්‍යාංශයීය වාර්ෂික කාර්යසාධන වාර්තාව සැකසීම සහ පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.
3. වාර්ෂික අයවැය කියවීමට අදාල ප්‍රගති වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම
4. ජාතික මට්ටමේ සම්පත් පැතිකඩ සකස් කිරීම හා ඩිජිටල්කරණය කිරීමට අදාල කටයුතු
5. ජාතික ප්‍රතිපත්ති රාමුවට අදාල අමාත්‍යාංශයීය වාර්ෂික හා උපායමාර්ගික සැලැස්ම සැකසීම හා ප්‍රගති වාර්තාකරණය - **Ministry Performance Monitoring System (MPMS)** මාර්ගගත පද්ධතිය වෙත තොරතුරු ඇතුලත් කිරීම.
6. අමාත්‍යාංශයේ සහ අනුබද්ධ ආයතන මඟින් ඉදිරිපත් කරන ව්‍යාපෘතීන් වෙත ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ (NPD) අනුමැතිය ලබාගැනීමට අදාල කටයුතු.
7. තිරසාර සංවර්ධන අරමුණු (SDG) , ආපදා කළමණාකරන හා අනෙකුත් අංශ සමඟ අමාත්‍යාංශයීය සම්බන්ධීකරණයට අදාල කටයුතු

### 1.3.9. ප්‍රාදේශීය පරිපාලන ප්‍රතිසංස්කරණ අංශ

1. 'ඉ-ග්‍රාම නිලධාරි' ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.
2. රජයේ සංවර්ධන ප්‍රතිපත්තිමය අවශ්‍යතාවන්ට සරිලන පරිදි රාජ්‍ය සේවයට අදාළව පවත්නා නීති–රීති හා රෙගුලාසි සමාලෝචනයට ලක් කර සරල කිරීම
3. රාජකාරි කටයුතු පහසු සහ කාර්යක්ෂම කිරීම සඳහා 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත (ETA) පරිදි ස්වදේශ කටයුතු අංශය සඳහා Digital Signature හඳුන්වා දීම.
4. "නඩු නීති සංග්‍රහය" සකස් කිරීම සඳහා වූ ව්‍යාපෘතිය

## 1.4. සංවිධාන සටහන


ගරු අමාත්‍යතුමා
ලේකම්
අතිරේක ලේකම් (පාලන)
අතිරේක ලේකම් (ස්වදේශ කටයුතු)
අතිරේක ලේකම් (සංවර්ධන)
අතිරේක ලේකම් (විමර්ශන)
අතිරේක ලේකම් (ප්‍රා.පා.ප්‍රති)
අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණ)
අධ්‍යක්ෂ ජනරාල් (ක්‍රමසම්පාදන)
ප්‍රධාන මූල්‍ය නිලධාරී
ප්‍රධාන අභ්‍යන්තර විගණක
ජ්‍යෙ.ස.ලේ (පාලන)
ජ්‍යෙ.ස.ලේ (දිස්ත්‍රික් පාලන)
ජ්‍යෙ.ස.ලේ (ප්‍රාදේශීය පාලන)
ජ්‍යෙ.ස.ලේ (ග්‍රා.නි.පා)
ජ්‍යෙ.ස.ලේ (සංවර්ධන)
ජ්‍යෙ.ස.ලේ (විමර්ශන)
ජ්‍යෙ.ස.ලේ (ප්‍රා.පා.ප්‍රති)
අධ්‍යක්ෂ (තො.තා)
ප්‍රධාන ඉංජිනේරු
අධ්‍යක්ෂ (ක්‍ර.ස)
ප්‍රධාන ගණකාධිකාරී
අභ්‍යන්තර විගණක
සහකාර ලේකම් (පාලන)
සහකාර ලේකම් (පුහුණු)
සහකාර ලේකම් (තො.තා)
නීති නිලධාරී
සහකාර ලේකම්
නියෝ.අධ්‍ය/සහකාර.අධ්‍ය (ක්‍රමසම්පාදන)
ඉංජි නේරු
පරිගු. කළම
වාස්තුවි/ ගෘහ.නි ර්.ශි
ගණකාධි කාරී
පරිපාලන නිලධාරී
පරිවර්තක (සිං -දෙම) (සිං - ඉංග්‍රී)
තොර. තා.නි
මාධ්‍ය .නිල
සං.නි
විමර්ශන නිලධාරී
සහකා පරිගු. කළම
තා .නි
තා .ස
කෙටුම්පත් .කළ
කළ. සේ.නි
ජායා. ශිල්පී
විඩියෝ කැමරාකරු
රියදුරු
බංගලා.භාර
සහ.ජායා . ශිල්පී
කා සේ සේ
ස.බංගලා භාරකරු
කා.සේ. සේ

## 1.6. අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු / ආයතන

ස්වදේශ කටයුතු අංශය

- සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල
- සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල
- රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

## 1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

අ) **ව්‍යාපෘතියේ නම** : Enhancing Institutional Development and Citizen Awareness for Improved Service Delivery at Divisional Secretariats .

ආ) **දායක නියෝජිතායතනය** : එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP)

ඇ) **ඇස්තමේන්තුගත වියදම**: රු. මි. 9,806,320.00

ඇ) **ව්‍යාපෘති කාල සීමාව**: - 2025.04.01 සිට 2025.12.31 දක්වා

# 02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම, විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක

## 2.1. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

1. ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ පත් කිරීම්/උසස් කිරීම්/ස්ථානමාරු සඳහා නිර්දේශ ලබාදීම.
2. සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ පත් කිරීම්/උසස් කිරීම්/ස්ථානමාරු සඳහා නිර්දේශ ලබාදීම හා පත් කිරීම.
3. ක්‍රමසම්පාදන සේවයේ නිලධාරීන්ගේ පත් කිරීම්/උසස් කිරීම්/ස්ථානමාරු සඳහා නිර්දේශ ලබාදීම හා පත් කිරීම.
4. ගණකාධිකාරී සේවයේ නිලධාරීන්ගේ පත් කිරීම්/උසස් කිරීම්/ස්ථාන මාරු සඳහා නිර්දේශ ලබාදීම හා පත් කිරීම.
5. පරිපාලන නිලධාරීන්ගේ පත් කිරීම්/උසස් කිරීම්/ස්ථාන මාරු සඳහා නිර්දේශ ලබාදීම හා පත් කිරීම.
6. භාෂා පරිවර්තක නිලධාරීන්ගේ පත්කිරීම්/උසස් කිරීම්/ස්ථාන මාරු සඳහා නිර්දේශ ලබාදීම හා පත් කිරීම.
7. කළමනාකරණ සේවා නිලධාරීන්ගේ පත් කිරීම්/උසස් කිරීම්/ ස්ථාන මාරු සඳහා නිර්දේශ ලබාදීම හා පත් කිරීම.
8. රියදුරු, කාර්යාල කාර්යය සහයක, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර නිලධාරීන්ගේ පත් කිරීම්/උසස් කිරීම්/ස්ථානමාරු සඳහා නිර්දේශ ලබාදීම හා පත් කිරීම.
9. මාණ්ඩලික නිලධාරීන්ගේ දේශීය පශ්චාත් උපාධි පාඨමාලාවන් සඳහා ප්‍රතිපාදන අනුමත කිරීම.
10. විදේශ නිවාඩු ඉල්ලීම් නිර්දේශ කිරීම හා විදේශ පුහුණු නිර්දේශ කිරීම.
11. විශ්‍රාම ගැන්වීම් නිර්දේශ කිරීම හා විශ්‍රාමික ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ වාහන බලපත්‍ර නිකුත් කිරීම.
12. ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා අවශ්‍ය පරිදි කාර්යය මණ්ඩල අනුමැතිය ලබාදීම.
13. අමාත්‍යාංශයට යොමුවන මහජන ගැටලු සම්බන්ධයෙන් අදාළ වාර්තා කැඳවීම හා විසඳුම් ලබාදීමට කටයුතු කිරීම.
14. ප්‍රාදේශීය පරිපාලනයට අදාළ වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු අතර සම්බන්ධීකරණය කිරීම.
15. ග්‍රාම නිලධාරීන්ට අනන්‍ය වූ වැටුප් ව්‍යුහයක් සහිතව ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරී සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය ගැසට් මඟින් ප්‍රකාශයට පත් කිරීම හා 2025.10.15 දින සිට එය බලාත්මත කිරීම.
16. ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඩිජිටල්කරණ ව්‍යාපෘතිය ආරම්භ කිරීම මඟින් තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 25ක් ඩිජිටල්කරණය කිරීම සඳහා භෞතික සම්පත් සම්පාදනය කිරීම තුළින් වඩාත් කාර්යක්ෂම මහජන සේවාවක් ලබාදීමට සහයවීමට හැකිවීම.
17. පැරණි විමර්ශනවල තොරතුරු සහ වර්තමාන විමර්ශනවල තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් සකස් කර පවත්වාගෙන යාම.
18. මූලික විමර්ශන නිලධාරී හා පැමිණිල්ල මෙහෙයවන නිලධාරී සංචිතය සකස්කිරීමට අදාලව මූලික කටයුතු සංවිධානය කිරීම
19. ඵලදායීතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මඟින් වැඩකටයුතු පහසුකර ගැනීමට කටයුතු කිරීම.
20. ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල නව තෙමහල් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අවසන් කර 2025.10.01 දින කාර්යාල කටයුතු සඳහා යොදා ගැනීම.
21. බිබිල ප්‍රාදේශීය ලේකම් කාර්යාල නව තෙමහල් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අවසන් කර 2025.12.11 දින කාර්යාල කටයුතු සඳහා යොදා ගැනීම.
22. තණමල්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාල නව තෙමහල් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අවසන් කර 2025.12.11 දින කාර්යාල කටයුතු සඳහා යොදා ගැනීම.
23. ගබඩා කළමණාකරණය සඳහා පරිගණක වැඩසටහනක් හඳුන්වා දීම.
24. නිදහස් මන්දිරය අලුත්වැඩියා කිරීම කටයුතු සඳහා පහසුකම් සැපයීම හා එහි අධීක්ෂණ කටයුතු කිරීම
25. ස්වදේශ කටයුතු අංශය යටතේ පවතින සංචාරක නිවාස අලුත්වැඩියා කිරීම සඳහා තාක්ෂණික මාර්ගෝපසංග්‍රහයක් ලබා දීම
26. ඉදිකිරීම් ව්‍යාපෘතීන් කිහිපයක් මෙම වසර තුළ නිම කිරීමට අවශ්‍ය තාක්ෂණික උපදේශන ලබාදීම
27. “නිල මැදුර” ගොඩනැගිල්ලේ මෙහෙයුම්,නඩත්තු හා අලුත්වැඩියාවන් සම්බන්ධව ක්‍රියාකාරීත්වය විධිමත් කිරීමට

හැකි වීම තුළින් සියලු අංශවල නඩත්තු කාර්යයන් ක්‍රමවත් පරිදි සිදු කිරීමට හැකි වීම.

28. ඉ-ග්‍රාම නිලධාරී ව්‍යාපෘතියේ කාලීනව සිදුවන ලද යම් යම් වෙනස්කම් මත, තීරණ මත හා තාක්ෂණික කරුණු මත ව්‍යාපෘති කටයුතුවල වෙනස්කම් සිදුවිය යුතු බවට ද හඳුනාගෙන ව්‍යාපෘතිය නව වපසරියක් යටතේ ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලදී. ඒ අනුව, මෙතෙක් පුරවැසියන් වෙතින් දත්ත එකතු කිරීම සඳහා භාවිත කරන ලද දත්ත පත්‍රිකාව භාවිතය අවසන් කරන ලදී. මේ දක්වා එකතු කරන දත්ත සඳහා අදාළ දත්ත එකතු කිරීමේ නිලධාරීන් සඳහා ගෙවීම් කටයුතු සිදු කරන ලදී.
29. රජයේ සංවර්ධන ප්‍රතිපත්තිමය අවශ්‍යතාවන්ට සරිලන පරිදි රාජ්‍ය සේවයට අදාළව පවත්නා නීති–රීති හා රෙගුලාසි සමාලෝචනයට ලක් කර සරල කිරීම ව්‍යාපෘතිය යටතේ අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද මෙම අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් යුත් නිලධාරීන් 8 දෙනෙකුගෙන් සමන්විත ප්‍රධාන කමිටුවේ මෙහෙයවීමෙන් තාක්ෂණික කමිටු 13ක් විසින් ක්ෂේත්‍ර 13ක් ඔස්සේ දිස්ත්‍රික් පරිපාලනයට අදාළ සරල කළ යුතු නීති අවශ්‍යතාව හඳුනාගන්නා ලදී. ඒ අනුව, දැනට රාජ්‍ය සේවයේ නියුතු රාජ්‍ය නිලධාරීන්, විශ්‍රාමික රාජ්‍ය නිලධාරීන්, ස්වේච්ඡාවෙන් සහභාගී වූ නිලධාරීන්, රාජ්‍ය නොවන විද්වතුන් සහ මහජනතාවගෙන් අදහස් හා යෝජනා අනුව අමාතය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා වාර්තාවක් සකස් කරන ලදී.
30. රාජකාරී කටයුතු පහසු සහ කාර්යක්ෂම කිරීම සඳහා 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොන්ක ගනුදෙනු පනත (ETA) පරිදි ස්වදේශ කටයුතු අංශයට හා එම අංශය යටතේ වන දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන් 100 දෙනෙකු සඳහා ඩිජිටල් අත්සන හඳුන්වා දෙන ලදී.
31. රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සම්බන්ධයෙන් ප්‍රාදේශීය පරිපාලනයට අදාළ නිලධාරීන් ගත් තීරණ අභියෝග කරමින් ඉහළ අධිකරණය ලබා ගත් නඩු නීති රාශියක් ඇත. එම නඩු නීති එකතු කර ‘‘නඩු නීති සංග්‍රහයක්’’ සකස් කිරීම මගින් රාජ්‍ය සේවය තුළ තීරණ ගැනීම හා මහජන සේවය කාර්යක්ෂම කිරීම මෙන්ම අත්තනෝමතික ලෙස ක්‍රියා කිරීම වැලැක්වීම සඳහා මෙම ව්‍යාපෘතිය වැදගත් වේ. ඒ අනුව මෙම ව්‍යාපෘතියේ සමාරම්භක සැසිය සඳහා ප්‍රදේශීය ලේකම්වරු ලියාපදිංචි කර ගැනීමේ කටයුතු සිදු කර ඇත.
32. අමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කොට අනුමැතිය ලබා ගෙන ඇත. සිව්වන කාර්තුව දක්වා ප්‍රගති සමාලෝචන වාර්තාව නිමකොට අවසන්ය.
33. 2024 අමාත්‍යාංශයීය වාර්ෂික කාර්යසාධන වාර්තාව නියමිත දිනට නියමිත ප්‍රමාණයෙන් පාර්ලිමේන්තුවට ඉදිරිපත්කර ඇත.
34. 2026 වර්ෂය සඳහා අයවැය කියවීමට අදාල ප්‍රගති වාර්තාව සකස් කර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

## 2.2.විශේෂ ජයග්‍රහණ

1. මාර්ගගත ක්‍රමය ඔස්සේ සංචාරක බංගලා වෙනකරගැනීම සඳහා පද්ධතියක් හඳුන්වාදීම මඟින් වඩාත් කාර්යක්ෂමව හා පහසුවෙන් නිවාඩු නිකේතන වෙන්කර ගැනීමේ අවස්ථාව රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන්ට ලැබීම.
2. ගබඩා කළමණාකරණය සඳහා පරිගණක වැඩසටහනක් හඳුන්වා දීම.

## 2.3. අභියෝග

1. ජාතික අයවැය චක්‍රලේඛ 05/2019 හි පරිදි නව ව්‍යාපෘති ආරම්භ කිරීමට නොහැකි වීම නිසා නව ඉදිකිරීම් සිදු කිරීමට නොහැකි වීම.
2. රාජකාරි කටයුතු ඉටු කිරීමේදී ,කාර්ය මණ්ඩලය සීමිත වුවද රාජකාරි කටයුතු නියමිත පරිදි අප්‍රමාදීව ඉටු කිරීමේ අභියෝගයක් පැවති අතර අංශයට අනුයුක්ත කාර්ය මණ්ඩලයේ කාර්යාක්ෂමතාව මත අදාළ රාජකාරි කටයුතු නිසි පරිදි ඉටු කරන ලදී.
3. අදාල අංශවලින් සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලින් නියමිත පරිදි තොරතුරු එක්රැස් කිරීමේ දී සිදුවන ප්‍රමාදයන්.
4. ප්‍රසම්පාදන ක්‍රියාවලිය හා බැඳුනු ඇගයීම් ක්‍රියාවලියේ අනපේක්ෂිත ප්‍රමාදයන්.(තාක්ෂණික ඇගයීම් කමිටු නියෝජිතයන්ගේ රැස්වීම් සහ නිර්දේශ ලබාගැනීමේදී ප්‍රමාදයන් සිදුවීම.)

5. අමාත්‍යාංශය සහ අමාත්‍යාංශය සතු සංචාරක බංගලා 34 ක භාණ්ඩ සමීක්ෂණ කටයුතු ඉටුකිරීම.
6. කාර්යාල කටයුතු නිසි පරිදි අඛණ්ඩව පවත්වාගෙන යාම හා නිලධාරීන් පුහුණු කටයුතු වලට බැහැරට යොමු කිරීම
7. වෙනත් රාජ්‍ය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු විසින් ඔවුන්ගේ මූලික විමර්ශන කටයුතු සඳහා නිලධාරීන් නම් කර එවන ලෙස මෙම අංශයෙන් ඉල්ලීම් සිදුකරයි. නමුත් විමර්ශන අංශයේ විමර්ශන නිලධාරීන්ගේ හිඟතාවයක් පවතින බැවින් එම සියලු ඉල්ලීම් සඳහා නිලධාරීන් නම් කිරීමට අපහසුවීම.
8. සිංහල, දෙමළ ද්වි භාෂා නිලධාරී හිඟයක් පැවතීම.
9. විමර්ශන කටයුතු සිදුකිරීමේදී නිලධාරීන්ගේ පෞද්ගලික ආරක්ෂාවට අභියෝග එල්ලවීම.
10. ඇතැම් රාජ්‍ය ආයතනයන්ගෙන් තොරතුරු ලබා ගැනීමේදී ඇතිවන බාධා.
11. දෙමළ මාධ්‍ය පැමිණිලි සම්බන්ධව සහ ඉංග්‍රීසි මාධ්‍ය පැමිණිලි සම්බන්ධව කටයුතු කිරීමේදී භාෂා පරිවර්තනයෙහි ගැටලු පැන නැගීම.
12. දේශීය හා විදේශීය පුහුණු වැඩමුළු ලබාදීමේ අවශ්‍යතාව
13. ලිපි හා ලේඛණ හුවමාරු කිරීමේදී සිදුවන ප්‍රමාදයන් හේතුවෙන් කටයුතු අකාර්යක්ෂම වීම
14. නිසි තොරතුරු කලට වේලාවට සම්ප්‍රේෂණය නොවීම හේතුවෙන් කටයුතු අකාර්යක්ෂම වීම
15. ඉංජිනේරු අංශයේ නිලධාරීන්ට වරලත් සුදුසුකම සපුරාලීමට මෙම ආයතනයේදී අවස්ථාවක් නොතිබීම
16. ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා සුදුසුකම් සහිත තරඟකාරී උපදේශන ආයතන තෝරා නොගැනීම (මේ හේතුවෙන් අනුමත ප්‍රතිපාදන සීමාව ඉක්මවා වියදම් දැරීම හා ලබැදියාවන් ක්‍රියාත්මක වන බවට ඇති විනිවිධබාවයෙන් තොරවීම)
17. කොන්ත්‍රාත් කාලසීමාව ඉක්මවා ව්‍යාපෘති ඉදිකිරීම් කටයුතු කරගෙන යාම - ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී අනවශ්‍ය ලෙස කාලය දීර්ඝ කිරීම් අනුමත මිල ඉක්මවායාම අදියර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම් ආදිය නිරීක්ෂණය විය
18. ඉදිකිරීම් කළමනාකරණය හා කොන්ත්‍රාත් පරිපාලනය විෂයයන් පිළිබඳ ප්‍රවීණයන් නොවන නිලධාරීන් (තාක්ෂණික නොවන අංශ) ව්‍යාපෘති පාලනය කිරීම හේතුවෙන් තම අභිමතය පරිදි සිදු කරන බොහෝ ඉදිකිරීම් නිසා ගැටලු ඇතිවීම
19. ඉදිකිරීම් ව්‍යාපෘති පිළිබඳ සේවාදායකයාගේ මූලික අවශ්‍යතා නිසි පරිදි හඳුනා නොගැනීම - Conceptualization and feasibility (මූල්‍ය පිරිවැය අවශ්‍යතා, Cost Benefit Analysis, Return on Investment, Payback Period ආදිය සැලකිය යුතුය.)
20. දිස්ත්‍රික් ලේකම් කාර්යාල වල පළමු ශ්‍රේණියේ ඉංජිනේරුවරුන් නොමැතිවීම හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සුදුසුකම් සහිත තාක්ෂණ නිලධාරීන්ගේ හිඟය හේතුවෙන් ප්‍රමාණ පත්‍ර පරික්ෂා කිරීම, නිර්දේශ කිරීම හා අනුමත කිරීම සඳහා තාක්ෂණ නිලධාරීන් නොමැති වීම හා තාක්ෂණ නිලධාරි පුරප්පාඩු පිරවීම අත්‍යාවශ්‍ය ලෙස නොසලකා තිබීම.
21. ඉදිකිරීම් ව්‍යාපෘති සම්බන්ධ කටයුතු සඳහා තාක්ෂණ විමර්ෂන හා තාක්ෂණ අභ්‍යන්තර විගණන කණ්ඩායම් යොදා නොගැනීම
22. නිසි අධ්‍යයනයකින් තොරව දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් වසරක් තුළ ව්‍යාපෘති විශාල ප්‍රමාණයක් සිදු කරන බැවින් බොහොමයක් ව්‍යාපෘති අවශ්‍යතා සහ ශක්‍යතා අධ්‍යයනයකින් තොරව ආරම්භ කිරීම
23. තාක්ෂණික කාර්ය මණ්ඩලයේ සීමිත සංඛ්‍යාව හේතුවෙන් එකවර ව්‍යාපෘති රැසක් අධීක්ෂණය කිරීමේ අපහසුතා.
24. දුරස්ථ ප්‍රදේශවල ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය තාක්ෂණික සම්පත් හා පහසුකම් හිඟවීම.

<u>ඉ-ග්‍රාම නිලධාරි (eGN) ව්‍යාපෘතිය යටතේ</u>

25. ඉ-ග්‍රාම නිලධාරි (eGN) ව්‍යාපෘතිය යටතේ මෙතෙක් ක්‍රියාත්මක ක්‍රමවේදය වෙනස් කිරීමේ දී පැවැති තාක්ෂණික ගැටලු හේතුවෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම මන්දගාමී වීම.
26. රජයේ සංවර්ධන ප්‍රතිපත්තිමය අවශ්‍යතාවන්ට සරිලන පරිදි රාජ්‍ය සේවයට අදාළව පවත්නා නීති–රීති හා රෙගුලාසි සමාලෝචනයට ලක් කර සරල කිරීම ව්‍යාපෘතිය යටතේ:-

- දත්ත රැස් කිරීමට ක්ෂේත්‍ර තෝරාගැනීමේ දී වඩාත් වැදගත් ක්ෂේත්‍ර තේරීමේ දුෂ්කර වීම.
- රාජ්‍ය නිලධාරීන්ට සිය රාජකාරී කටයුතු අතර මේ සඳහා දායකත්වය ලබා දීමේ දී කාලය වෙන් කිරීමේ දුෂ්කරතා මතු වීම.
- රැස් කරන ලද දත්තයන්හි වඩා වැදගත් හා අත්‍යවශ්‍ය දත්ත මොනවාද යන්න තීරණය සංකීරණ වීම.

27. ඩිජිටල් අත්සන හඳුන්වාදීමේ ව්‍යාපෘතිය යටතේ:-
    - යම් ලිපි ලියවිලි සඳහා ඩිජිටල් අත්සන් යෙදීමේ ප්‍රායෝගික ගැටලු.
    - මෙතෙක් පැවැති ක්‍රමවේදය වෙනස් කිරීමේ දී පැවැති ප්‍රායෝගික ගැටලු.
28. බාහිර ආයතන ඉතා කෙටි කලකින් ඉල්ලා සිටින වාර්තා කඩිනමින් පිළියෙල කර ඉදිරිපත් කිරීම.
29. ජාතික සම්පත් පැතිකඩ ඩිජිටල්කරණය කිරීමේ දී සංශෝධන පැවති අතර, ජනාධිපති ලේකම් කාර්යාලය හා සම්බන්ධීකරණය සහ නව පද්ධති සංවර්ධන ක්‍රියාකාරියෙකු (System Developer) සොයා ගැනීම.

## 2.4. ඉදිරි ඉලක්ක

1. අමාත්‍යාංශ ප්‍රසම්පාදන සීමාව යටතේ සිදු කරන ලද ඉදිකිරීම්වල ඉදිකිරීම් වැඩ නිසි පරිදි අවසන් කිරීම.
2. පහත ඉදිකිරීම් කටයුතු 2026 වර්ෂයේදී ආරම්භ කිරීම සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට හා ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපාදන ඒ ඒ දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත වෙන් කර ගැනීමට යොමු කර ඇති අතර, එමඟින් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් අනුමත කරනු ලබන ව්‍යාපෘති සඳහා අදාළ ප්‍රසම්පාදන කටයුතු නියමිත කාල සීමාව තුළ සිදු කිරීම.

i. රු.මි.410.00 ක වියදමින් මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා නව සිව් මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම
ii. වාවකච්චේරි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව පස් මහල් ගොඩනැගිල්ල රු.මි.411.94 ක වියදමින් ඉදිකිරීම
iii. සමන්තුරේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා.රු.මි.460.18 ක වියදමින් නව පස් මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම
iv. දමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා රු.මි.553.37 ක වියදමින් නව පස් මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම
v. දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා රු.මි.703.55 ක නව පස් මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම
vi. ඇලපාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා රු.මි.440.00 ක වියදමින් නව පස් මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම
vii. රත්ගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා රු.මි 456.00 ක වියදමින් නව සිව් මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම
viii. බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා රු.මි 709.00ක වියදමින් නව සිව් මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම
ix. කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා රු.මි1,135.50 ක වියදමින් නව වියදමින් ගොඩනැගිල්ලක් ඉදිකිරීම - අදියර 2
x. වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා රු.මි1,559.50 ක වියදමින් නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම
xi. වලිකාමම් දකුණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා රු.මි162.25ක වියදමින් නව දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම
xii. මාදම්පාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා රු.මි 296.00 ක වියදමින් නව සිව් මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම
xiii. ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා රු.මි 225.19 ක වියදමින් පස් මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම
xiv. රිදීගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා රු.මි 193.65 ක බිම් මහල සමඟ සිව් මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම
xv. මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා රු.මි214.34 ක වියදමින් බිම් මහල සමඟ සිව් මල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම
xvi. ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා රු.මි 350.00 ක වියදමින් නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම

xvii. අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා රු.මි 2,434.93 ක වියදමින් පස් මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම
xviii. කන්දකැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා නව රු.මි 540.52 ක වියදමින් සිව් මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම
xix. කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා රු.මි 121.98 ක වියදමින් නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම
xx. රත්මලාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා රු.මි 153.22 ක වියදමින් නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම
xxi. ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා රු.මි 190.46 ක වියදමින් නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම

3. 78 වන නිදහස් දින සමරු උළෙල අති උත්කර්ෂවත් අන්දමින් පැවැත්වීමට කටයුතු සංවිධානය කිරීම.
4. ඒකාබද්ධ ප්‍රවේශයක් සහ ජනතාවට වඩා සමීප වූ රාජ්‍ය සේවාවක් ස්ථාපිත කිරීම සහ පවත්වාගෙන යාම.
5. නවීන තොරතුරු තාක්ෂණික සම්බන්ධතාවය ශක්තිමත් කරමින් දිස්ත්‍රික් පරිපාලනය ශක්තිමත් කිරීම.
6. අස්වැසුම වැඩසටහනෙහි සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
7. ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඩිජිටල්කරණය කිරීමේ වැඩසටහන.
8. ජාතික/ දිස්ත්‍රික් /ප්‍රාදේශීය මට්ටමින් මහජන ගැටලු සඳහා කඩිනමින් විසඳුම් ලබාදීමේ වැඩසටහන
9. ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඩිජිටල්කරණ ව්‍යාපෘතිය II යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 115 ක් ඩිජිටල්කරණය කිරීමට කටයුතු කිරීම.
10. ප්‍රාදේශීය පරිපාලනය හා සම්බන්ධ රාජ්‍ය යාන්ත්‍රණය ඩිජිටල්කරණය කිරීමට අදාළ ව්‍යාපෘති දියත් කිරීම (SYSCGAA - මාර්ගගත කාර්යාල කලමනාකරණ පද්ධතිය)
11. පවතින ග්‍රාම නිලධාරී පුරප්පාඩු සඳහා 2025.10.24 ප්‍රසිද්ධ කරන ලද අංක 2460 ගැසට් නිවේදනයට අදාළව නවක ග්‍රාම නිලධාරීන් 1,658 ක් ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරී සේවයට කඩිනමින් බඳවා ගැනීම තුළින් කාර්යක්ෂම මහජන සේවාවක් සහතික කිරීම.
12. තවදුරටත් පවතින ග්‍රාම නිලධාරී පුරප්පාඩු සම්පූර්ණ කර ග්‍රාම නිලධාරීන් මඟින් කාර්යක්ෂම මහජන සේවාවක් සහතික කිරීම.
13. ග්‍රාම නිලධාරී සේවා පහසුකම් වැඩි දියුණු කිරීම.
27. තෝරාගත් පළාත් පාලන ආයතනවල අපද්‍රව්‍ය ප්‍රවාහන කටයුතු විධිමත් කිරීම සඳහා කම්පැක්ටර් රථ බෙදා දීම.
28. තෝරාගත් පළාත් පාලන ආයතනවල මළ අපජල පිරිපහදු කටයුතු වැඩිදියුණු කිරීම සඳහා කටයුතු කිරීම.
29. KOICA ආධාර යටතේ වව්නියාව සහ බදුල්ල දිස්ත්‍රික්ක කේන්ද්‍ර කරගනිමින් ක්‍රියාත්මක කිරීමට නියමිත ඒකාබද්ධ කසළ කළමනාකරණ ව්‍යාපෘතියෙහි ඉදිරි කටයුතු සිදු කිරීම.
30. JICA ආධාර යටතේ පළාත් පාලන ආයතන මඟින් සිදු කරනු ලබන මළ අපජල කළමනාකරණයේ කටයුතු සඳහා උපදෙස් මාලාවක් සකස් කිරීම සහ මළ අපජල පිරිපහදු පද්ධති මඟින් ඉවත් කරන පාංශු මඟින් කෘෂිකාර්මික වැදගත්කමක් ඇති පොහොර නිෂ්පාදනය සඳහා වූ ව්‍යාපෘතියෙහි ඉදිරි කටයුතු සිදු කිරීම.
31. යුරෝපා සංගමයේ ආධාර යටතේ වැඩිදියුණු කළ ජෛව විවිධත්වය සහ තිරසාර අපද්‍රව්‍ය කළමනාකරණය තුළින් තිරසාර ආර්ථික ප්‍රකෘතියක් ඇති කිරීම ව්‍යාපෘතියෙහි ඉදිරි කටයුතු සිදු කිරීම.
32. KEITI ආයතනය මඟින් KOICA රජයේ ආධාර යටතේ UNDP සහයෝගීතාවය මඟින් ශ්‍රී ලංකාවේ අඩු කාබන් නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සහ සම්පත් ප්‍රතිසාධනය පුළුල් කිරීම සහ පවත්වාගෙන යාම ව්‍යාපෘතියෙහි ඉදිරි කටයුතු සිදු කිරීම.
33. UNDP සහ කොකා කෝලා පදනම එක්ව ආසියාව සහ පැසිෆික් කලාපයේ ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ UNDP වැඩසටහන සහ ප්ලාස්ටික් සඳහා චක්‍රීය මැදිහත්වීම් ව්‍යාපෘතියෙහි ඉදිරි කටයුතු සිදු කිරීම.
34. පවතින කසල කඳු පුනරුත්ථාපනය කිරීම සහ නව කසල කඳු ඇතිවීම වළක්වා ගැනීම පිණිස ක්‍රියාමාර්ග ගැනීමට පළාත් පාලන ආයතන යොමු කිරීම.
35. පළාත් පාලන ආයතනවල කසල කළමනාකරණ කටයුතුවල යෙදෙන පුද්ගලයින්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන් සම්පාදනය කිරීම.
36. පළාත් පාලන ආයතනවල නිෂ්පාදනය කරනු ලබන කොම්පෝස්ට් පොහොර සඳහා වෙළඳපොළක් නිර්මාණය කිරීමට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
37. JICA ආධාර යටතේ සකස් කරන ලද බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ලබා ගැනීම.
38. අපද්‍රව්‍ය කළමනාකරණ සම්බන්ධ සෙසු පාර්ශවකාර ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
39. අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය විමසීම.
40. සංචාරකයින්ගේ දැඩි ආකර්ෂණයට ලක්ව ඇති ප්‍රදේශයක කණ්ඩලම සංචාරක බංගලාව පිහිටා ඇති නිසා එය සංවර්ධනය කොට අමාත්‍යාංශයට ආදායම් උත්පාදන මාර්ගයක් ලබා කර දීම.
41. නිලධාරීන්ගේ මූලික පුහුණු අවශ්‍යතා හඳුනාගෙන ඒවා වැඩි දියුණු වන පරිදි පුහුණු වැඩසටහන් පැවැත්වීම හරහා නිලධාරීන්ගේ නිපුණතා සංවර්ධනය කිරීම තුළින් මානව සම්පතින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම.

42. ප්‍රසම්පාදන සැලසුම්වලට යටත්ව පිරිවැය අවම වන පරිදි වාහන ඇතුළු අනෙකුත් නඩත්තු කටයුතු සඵලදායීව හා කාර්යක්ෂමව ඉටුකිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය.
43. තොරතුරු තාක්ෂණය භාවිතා කිරීම තුළින් (IT සහකාර අධ්‍යක්ෂ තනතුර ද,තොරතුරු තාක්ෂණ නිලධාරී තනතුර ද සම්පූර්ණ කර ඇති බැවින් ) වඩා කාර්යක්ෂමව හා අතහුරු ක්‍රමයට එහා ගිය ඵලදායී සේවාවක් අත්කර ගැනීම.
44. නීතිරීති / රෙගුලාසි වලට අනුකූලව අංශයේ මූල්‍යමය වියදම් අඩු කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
45. රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ පරිදි පළාත් පාලන සහ පළාත් සභා විෂයට අදාළ නව නීති සම්පාදනය සහ පවත්නා නීති සංශෝධනය කිරීම.
46. අවශ්‍යතාවය පරිදි පළාත් සභා සහ පළාත් පාලන අවශ්‍යතා වල රීති රෙගුලාසි අතුරු ව්‍යවස්ථා යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය සහාය සැලසීම.
47. පළාත් පාලන ආයතනවල ස්වයං උත්පාදනය වැඩි කිරීම සහ රජයේ Clean Sri Lanka වැඩසටහනට අනුගත වන පරිදි පළාත් පාලන ආයතන ගොඩනැගීම අරමුණු කොට ගෙන මහා නගර සභා ආඥා පනත, නගර සභා ආඥා පනත සහ ප්‍රාදේශීය සභා පනත සංශෝධනය කිරීම.
48. නැගෙනහිර පළාතේ හඳුනාගත් පළාත් පාලන ආයතන තුනක් ‘මානව හිමිකම් නගර’ ලෙස ප්‍රකාශයට පත් කිරීම සඳහා අවශ්‍ය නෛතිකමය පසුබිම සංවර්ධනය කිරීම.
49. පළාත් සභා සහ පළාත් පාලන ආයතනවලින් ඉදිරිපත් වන නෛතික ගැටළු සඳහා අවශ්‍ය පිළිතුරු / විසඳුම් ලබා දීම.
50. රජයේ අවශ්‍යතාවය පරිදි නව පළාත් පාලන ආයතන සංස්ථාපන හා උත්ශ්‍රේණිගත කිරීම.
51. පළාත් පාලන ආයතන සංස්ථාපන ගැසට් නිවේදන ඇතුළු මධ්‍යම රජයේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් නිකුත් කළ යුතු අනු නීති සම්බන්ධ කටයුතු.
52. Empowering Local Government - A Comprehensive Digitalization Project for Local Government ව්‍යාපෘතියේ ජංගම යෙදුමක් ද ඇතුළුව ඉදිරි මෘදුකාංග සංවර්ධන කටයුතු සිදු කිරීම.
53. 2026 වන විට සියළුම පළාත් පාලන 341 ආවරණය වන පරිදි LGPMS (Local Government Payment Management System) පුළුල් කිරීම.
54. LGPMS පරිශීලකයින් සඳහා පාරිභෝගික සහාය මධ්‍යස්ථානයක් පිහිටුවීම.
55. අප LGPMS මෘදුකාංග ක්‍රියාත්මක වන සියළුම පළාත් පාලන ආයතන සඳහා Payment Gateway ලබා දීම.
56. දෘඩාංග සහ මෘදුකාංග ගැටළු ඇතුළු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආශ්‍රිත කරුණු සඳහා සහාය වීම.
57. අමාත්‍යාංශයේ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම.
58. අමාත්‍යාංශයේ ෆේස්බුක් පිටුව යාවත්කාලීන කිරීම.
59. අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ දැනුම වැඩිදියුණු කිරීම සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.
60. Zoom රැස්වීම් සඳහා සබැඳි සකස් කර අවශ්‍ය පරිදි තාක්ෂණික සහාය ලබා දීම.
61. අමාත්‍යාංශය තුළ කඩදාසි භාවිතයෙන් තොර පරිසරයක් පවත්වා ගැනීම සඳහා මෘදුකාංග පද්ධති සංවර්ධනය කිරීම.
62. විද්‍යුත් බැංකුකරණය ඔස්සේ ගෙවීම් පද්ධතිය ක්‍රියාත්මක කිරීම තුළින් අනවශ්‍ය ප්‍රමාදයන් වැළැක්වීම.
63. Slip ක්‍රමය මඟින් තෝරාගත් ගෙවීම් සිදු කිරීම.
64. ප්‍රසම්පාදන කටයුතු වඩාත් කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමටත්, සමීපව අධීක්ෂණය කිරීමටත් පහසු වන ලෙස ගූගල් පැතුරුම්පත් සකස් කිරීම හා යාවත්කාලීන කිරීම.
65. 2026 වර්ෂය තුළදී ද මධ්‍යම රජය විසින් දෙනු ලබන ප්‍රදානයන් හා පළාත් සභා ආදායම් ඇස්තමේන්තුගත වියදම් සීමාවන්ට යටත්ව එම ආයතන විසින් වියදම් කරනු ලබන ආකාරය පිළිබඳව අඛණ්ඩ ඇගයීමක් කරගෙන යාමට අපේක්ෂිතය.
66. පළාත් සභා හා පළාත් පාලන ආයතනවල සේවක සංඛ්‍යා සම්බන්ධයෙන් පවත්වා ගෙන යනු ලබන දත්ත පදනම 2026 වර්ෂය සඳහා යාවත්කාලීන කිරීමට අපේක්ෂිතය.
67. පළාත් පාලන ආයතනයන්හි ආදායම් හා වියදම් පිළිබඳ තොරතුරු ඇතුළත් දත්ත පදනම මෙම වර්ෂයේ දී 2025 වර්ෂයට අදාළව යාවත්කාලීන කරන ලද අතර, එම තොරතුරු විශ්ලේෂණය කිරීමෙන් 2025 වර්ෂයේ පළාත් පාලන ආයතනවල වාර්ෂික මූල්‍ය කාර්යසාධන වාර්තාව සකස්

කිරීමට 2026 වර්ෂයේ දී සැළසුම් කර ඇත. එලෙසම පළාත් පාලන ආයතනවල 2026 වර්ෂය සඳහා අර්ධ වාර්ෂික මූල්‍ය කාර්යසාධන වාර්තාව සකස් කිරීමට නියමිතය.

68. මෙම අමාත්‍යාංශයේ මෙහෙයවීම යටතේ ක්‍රියාත්මක වන විදේශාධාර ව්‍යාපෘතීන්හි මූල්‍ය කාර්ය සාධනය හා සම්බන්ධ තොරතුරු මාසිකව ලබා ගෙන එම තොරතුරු පළාත් සභා මූල්‍ය කාර්යසාධන වාර්තාවට ඇතුළත් කිරීමට කටයුතු කර ඇති අතර, මෙම කාර්යය 2026 වසරේදී ද අඛණ්ඩව කරගෙන යාමට සැලසුම් කර ඇත.
69. අදාළ පාර්ශව සම්බන්ධීකරණය කරමින් පළාත් සභා මූල්‍ය කටයුතුවලදී ඇතිවන ගැටළු සහ අඩුපාඩු සාකච්ඡා කර ඒ සඳහා විසඳුම් යෝජනා ගැනීමේ අරමුණින්, පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්) රැස්වීම 2026 වසර සඳහාත් පැවැත්වීම.
70. පළාත් සභාවන්හි මූල්‍ය කටයුතු විමංසනය කිරීමේ අරමුණින් විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම, විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම, බැංකු සැසඳුම් පිළියෙළ කිරීම, අත්තිකාරම් ගිණුම් සැසඳීම, අග්‍රිම ගිණුම් සැසඳීම යනා දී කටයුතු සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් විශේෂයෙන් සකසා යවනු ලැබූ ආකෘති පත්‍ර මඟින් වර්ෂයේ දී කාර්තුමය වශයෙන් තොරතුරු පළාත් සභා වෙතින් ගෙන්වා ගනු ලැබේ. එම තොරතුරු උපයෝගී කර ගනිමින් අදාළ කාර්යයන්හි ප්‍රගතිය විමසා බලන අතර, එම කටයුතු සම්බන්ධයෙන් පවත්නා ප්‍රමාදයන් හෝ ගැටළු සහගත තත්ත්වයන් පළාත් මූල්‍ය කළමනාකරණයේ අවධානයට යොමු කර ඇත. 2026 වර්ෂයේ දී ද මෙම කාර්යය අඛණ්ඩව කරගෙන යාමට සැලසුම් කර ඇත.
71. පළාත් පාලන ආයතනවල මූල්‍ය හා භෞතික තොරතුරු දත්ත විශ්ලේෂණ හා දෘශ්‍යකරණ ඒකකය හා සම්බන්ධ වී කළමනාකරණ තොරතුරු පද්ධතියක් (logomis.lk) මඟින් ලබා ගැනීම හා එම කටයුතු පළාත් මට්ටමින් අධීක්ෂණය කිරීම.
72. පළාත් පාලන ආයතනවල 2026 වර්ෂයේ අයවැය ලේඛන සහ 2025 වර්ෂයේ අවසන් ගිණුම් වාර්තා දත්ත ඇතුළත් දත්ත පදනමක් පවත්වාගෙන යාම.
73. පළාත් සභාවල 2026 වර්ෂයේ අයවැය ලේඛන සහ 2025 වර්ෂයේ අවසන් ගිණුම් වාර්තා දත්ත ඇතුළත් දත්ත පදනමක් පවත්වා ගෙන යාම.
74. අමාත්‍යාංශය විසින් පළාත් පාලන ආයතන වෙත ලබා දී ඇති වාහන පැවරීම සහ වාහන අනතුරු හා ඒ සම්බන්ධිත කාර්යයන් ඉටු කිරීම සම්බන්ධීකරණය කිරීම.
75. විවිධ රාජ්‍ය ආයතන, ව්‍යවස්ථාපිත ආයතන හා බාහිර ආයතන හා පාර්ශවයන් විසින් පළාත් සභා හා පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් ඉල්ලුම් කරන දත්ත හා තොරතුරු ලබා දීම.
76. විගණන සැලැස්ම අනුව විගණන අවදානම් ක්ෂේත්‍ර සැලකිල්ලට ගෙන විගණන කටයුතු සිදු කිරීම.
77. කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 1/2025 හා 2025.04.28 දිනැති චක්‍රලේඛය පරිදි මූලික වාර්තාව ඉදිරිපත් කිරීම.
78. අභ්‍යන්තර විගණන අංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම හා ඒ අනුව ප්‍රගතිය වාර්තා කිරීම.
79. කළමනාකරණ විගණන කමිටු රැස්වීම් පැවැත්වීම.
80. ව්‍යාපෘති අභ්‍යන්තර විගණන සමාලෝචන කමිටු රැස්වීම් පැවැත්වීම.
81. අමාත්‍යාංශයේ සහ විදේශීය ව්‍යාපෘති සම්බන්ධයෙන් කාර්තු වාර්තා ඉදිරිපත් කිරීම.
82. අමාත්‍යාංශය යටතේ පවත්නා විදේශාධාර ව්‍යාපෘතිවලට අදාළව විගණන කටයුතු සිදු කිරීම.
83. දේශීය ව්‍යාපෘතිවලට අදාළව විගණන කටයුතු සිදු කිරීම.
84. ඉදිරි වර්ෂය (2027) සඳහා විගණන සැලැස්ම පිළියෙල කිරීම.
85. රාජ්‍ය ගිණුම් කාරක සභාව කැඳවීම් කරන අවස්ථාවලදී ඒ සඳහා සහභාගීවීම.
86. අමාත්‍යාංශ ලේකම් විසින් පවරනු ලබන විශේෂ විමර්ශන සිදු කිරීම.
87. 2026 වර්ෂයට අදාළ අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්ම යාවත්කාලීනව පවත්වාගෙන යාම.
88. 2025 වර්ෂයට අදාළ අමාත්‍යාංශයේ කාර්යසාධන වාර්තාව සකස් කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම.
89. අමාත්‍යාංශය සඳහා ආයතනික ප්‍රතිඵල රාමුව සකස් කිරීම හා යාවත්කාලීන කිරීම.
90. අමාත්‍යාංශයේ 2026 ප්‍රගතිය හා 2027 ඉදිරි සැලසුම් ඇතුළත් වාර්තාව අය-වැය කාරක සභා අවස්ථාවට ඉදිරිපත් කිරීම සඳහා සකස් කිරීම.
91. 2026 වසරට අදාළ කාර්තුපාදක ඒකාබද්ධ ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

92. ශ්‍රී ලංකාවේ සියළු පළාත් පාලන ආයතන සම්බන්ධ කරගනිමින් ස්ථාපිත කර තිබෙන තොරතුරු කළමනාකරණ පද්ධතියට (LogoMIS) හා සම්බන්ධ සියළු කටයුතු සම්බන්ධීකරණය කිරීම හා ක්‍රියාත්මක කිරීම.
93. අවශ්‍යතා තක්සේරු සිදුකිරීම මඟින් නව ව්‍යාපෘති හඳුනා ගැනීම හා ව්‍යාපෘති යෝජනා සකස් කර ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම.
94. අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති, වැඩසටහන්වල ප්‍රතිඵල ඇගයීම සඳහා ඇගයීම් යෝජනා සකස් කර ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.
95. විවිධ ආයතන විසින් ඉල්ලා සිටින තොරතුරු සැපයීම සඳහා අවශ්‍ය ප්‍රගති වාර්තා සකස් කිරීම හා අදාළ ආයතන වෙත ඒවා ඉදිරිපත් කිරීම.
96. අවශ්‍ය පරිදි ප්‍රගති සමාලෝචන රැස්වීම් සංවිධානය කිරීම හා පැවැත්වීම.
97. දේශීය හා විදේශීය ආධාර ව්‍යාපෘති හා වැඩසටහන්වලට අදාළ ප්‍රාරම්භක කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය සහාය අදාළ අංශ වෙත ලබාදීම.
98. මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක සියලුම විදේශාධාර ව්‍යාපෘති, ව්‍යාපෘති අරමුණු කරා සම්බන්ධීකරණය කිරීම.
99. විදේශාධාර ව්‍යාපෘතිවල ප්‍රගති සමාලෝචනය සඳහා රැස්වීම් 25 ක් පැවැත්වීම, වාර්තා පිළියෙළ කිරීම හා ඒවායේ ගැටළු හා දුර්වලතා සම්බන්ධයෙන් මැදිහත් වී කටයුතු කිරීම.
100. ඒ ඒ ව්‍යාපෘතින්ට අදාළව ජාතික මෙහෙයුම් කමිටු (NSC) රැස්වීම් 13 ක් පැවැත්වීම හා ඒ තුළින් පැනනගින ගැටළු නිරාකරණය කිරීම.
101. මාසික ප්‍රගති වාර්තා සකස් කිරීම හා අනෙකුත් රජයේ ආයතන මඟින් වරින්වර ඉල්ලුම් කරන වාර්තා සකස් කිරීම.
102. වැඩනිමවූ හා ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති සම්බන්ධයෙන් පැනනගින නෛතික ගැටළු නිරාකරණය සඳහා සේවා යෝජකයා වශයෙන් අදාළ ආයතන සමඟ සම්බන්ධව කටයුතු කිරීම.
103. මෙම වසරේ නිම කළ යුතු ව්‍යාපෘති නිසි පරිදි නිම කිරීමට අදාළ කාර්යයන් සහ ලේඛන සැකසීම සම්බන්ධීකරණයන් සිදු කිරීම.
104. විස්ට්වයික් පීඩන නලය එළීමේ කටයුතු සහ තිඹිරිගස්යාය, මාළිගාවත්ත හා විස්ට්වයික් යන පොම්පාගාර සම්පූර්ණයෙන්ම සාදා නිම කර, ඒවායේ ක්‍රියාකාරීත්වය සහ මෙහෙයුම් කටයුතු කොළඹ මහා නගර සභාවේ පාලනය යටතේ පවත්වාගෙන යාමට කටයුතු කිරීමත් සමඟ, මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතියේ වැඩ කටයුතු සාර්ථකව අවසන් කිරීම සහ ඉතිරිව ඇති බිල්පත් ගෙවීම.
105. "කිරුළපන ප්‍රදේශය සඳහා නව ගුරුත්ව මලාපවහන, පීඩන නල සහ පොම්පාගාර ඉදිකිරීම" කොන්ත්‍රාත්තුවේ ශේෂව පවතින ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කිරීම සහ පවත්වාගෙන යාම. මේ අනුව, 2026 වසරේ දී කොන්ත්‍රාත්තුවේ ඉදිකිරීම් කටයුතු වලින් 40% ක් නිම කිරීමට සැලසුම් කර ඇත.
106. "කිරුළ-නාරාහේන්පිට මලාපවහන ජාල සංවර්ධනය" කොන්ත්‍රාත්තුවේ ඉදිකිරීම් කටයුතුවල ප්‍රගතිය පවත්වාගෙන යාම. මේ අනුව, 2026 වසරේ දී කොන්ත්‍රාත්තුවේ ඉදිකිරීම් කටයුතු වලින් 25% ක් නිම කිරීමට සැලසුම් කර ඇත.
107. "දකුණු පෝෂක ප්‍රදේශයේ මලාපවහන පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීමේ කොන්ත්‍රාත්තුව" ප්‍රදානය කර ඉදිකිරීම් කටයුතු කර ගෙන යාමට සැලසුම් කර ඇත. මේ අනුව, 2026 වසරේ දී කොන්ත්‍රාත්තුවේ ඉදිකිරීම් කටයුතු වලින් 25% ක් නිම කිරීමට සැලසුම් කර ඇත.
108. නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතියේ (RIDEP) - අතරමග වැඩ අත්හිටුවා වැඩබිම්වලින් ඉවත් වී සිටි කොන්ත්‍රාත්කරුවන් සමඟ සාකච්ඡා කර ඔවුන් නැවත වැඩබිම්වල සේවයේ යෙදවීමට නියමිත අතර, අර්ධ වශයෙන් නිමවී ඇති වැඩවලින් 60% ක ප්‍රමාණයක් එම කොන්ත්‍රාත්කරුවන් ලවා 2026 වර්ෂයේ දී නිම කිරීමට සැලසුම් කර ඇත.
109. දේශීය ණය සහ සංවර්ධන අරමුදල (LLDF) මඟින් 2026 වර්ෂයේ දී පළාත් පාලන ආයතන වෙත භාණ්ඩාගාරයෙන් කිසිඳු මුදලක් ලබා නොගෙන ණය ලබාදීම සඳහා රු.මිලියන 800 ක් ඇස්තමේන්තු කිරීම.
110. ණය ලබාදීම සඳහා පමණක් සීමා නොවී ඉන් ඔබ්බට තාක්ෂණික සහාය ලබාදෙමින් කටයුතු කිරීමට හැකි ආයතනයක් බවට පත්කිරීම.

111. ණය ලබාදීමේ ක්‍රියාවලිය විධිමත් සහ කාර්යක්ෂම කිරීම සඳහා යහපත් පරිගණක ගත කරන ලද යාන්ත්‍රණයක් සැකසීම.
112. 2024 වර්ෂයේ ගිණුම් සඳහා තත්වාගණනය කළ විගණන මතයක් ලබාගත් අතර, එය ඉදිරියේදී යහපත් විගණන මතයක් පවත්වාගෙන යාම සඳහා කටයුතු කිරීම.
113. මෙහෙයුම් සහ මූල්‍ය ක්‍රියාවලිය කාර්යක්ෂමව සහ විනිවිද භාවයකින් පවත්වාගැනීම සඳහා විධිමත් ඒකාබද්ධ පරිගණක පද්ධතියක් සකස් කර හඳුන්වාදීම.
114. පළාත් පාලන ආයතන අතර සහසම්බන්ධතාවය වර්ධනය සඳහා ඩිජිටල් තාක්ෂණය භාවිතා කිරීම.
115. අරමුදලේ මූල්‍ය ශක්තිය වර්ධනය කරගැනීම සඳහා මූල්‍ය ශක්තිය වැඩිකිරීමට විදේශීය ආයතන සමඟ කටයුතු කිරීම.
116. ණය ලබාදෙන ක්ෂේත්‍රයන් ජාතික සංවර්ධන අවශ්‍යතාවයනට අනුව විවිධාංගීකරණය කිරීම.
117. මහජනතාව හා පළාත් පාලන ආයතන අතර අරමුදල සම්බන්ධ යහපත් මතයක් ඇති කිරීම සඳහා පළාත් මට්ටමින් දැනුවත් කිරීමේ වැඩසටහන් කිරීම.
118. වැඩි සේවයක් ලැබෙන පරිදි හා වර්තමානයට ගැලපෙන පරිදි අරමුදල පරිවර්තනය කිරීම සඳහා ආඥාපනත සංශෝධනය කිරීම.
119. චක්‍රීය අරමුදල ශක්තිමත් කිරීම.
120. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය (SLILG) මගින් පළාත් පාලනය, භෞතික සැලසුම් හා පරිසර, ඉංජිනේරු, නීති හා පොදු කළමනාකරණය, තොරතුරු තාක්ෂණ හා මූල්‍ය කළමනාකරණය, පර්යේෂණ හා සංවර්ධන යන ක්ෂේත්‍රවල ධාරිතා සංවර්ධන වැඩසටහන් පළාත් පාලන හා පළාත් සභා නිලධාරීන් සඳහා පැවැත්වීම.
121. පළාත් පාලන හා පළාත් සභා ක්ෂේත්‍රවලට අදාළ පර්යේෂණ අධ්‍යයන සිදු කිරීම.

## 2.6. දේශීය අරමුදල් මත ක්‍රියාත්මකවන වැඩසටහන් හා ව්‍යාපෘතිවල කාර්යසාධනය

### 2.6.1. සංවර්ධන අංශය

#### 2.6.1.1. අරමුණ

පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල ජීවත් වන ප්‍රජාවන්ට එම ආයතනවලින් ප්‍රතිලාභ සැලසෙන පරිදි යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා දේශීය අරමුදල් යෙදවීම තුළින් මහජන සේවා සම්පාදනය කාර්යක්ෂම හා ඵලදායී කිරීම සහ ඒ මඟින් අන්තර් පළාත් විෂමතා අවම කිරීමට දායකත්වය ලබා දීම.

#### 2.6.1.2. ප්‍රධාන කාර්යයන්

1. අඩු ආදායම් ලබන පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමට අදාළව ආදායම් ඉහළ දැමීම සඳහා ව්‍යාපෘතීන් හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම.
2. මහජනතාවට පොදුවේ හඳුනාගත් ව්‍යාපෘති සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ උපදෙස් මත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ ව්‍යාපෘති අධීක්ෂණය සම්බන්ධයෙන් ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි කටයුතු කිරීම.
3. අයවැය යෝජනා ලෙස වෙන් කරනු ලැබූ ප්‍රතිපාදන අදාළ කාර්යයන්හි නිවැරදිව යොදවමින් ඉහළ ප්‍රතිලාභයක් ලැබෙන පරිදි ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම.
4. ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් ප්‍රතිපාදන ලබා දෙන ව්‍යාපෘතීන් හඳුනා ගෙන ක්‍රියාත්මක කිරීම.

**<u>ක්‍රියාත්මක කරනු ලැබූ ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘතීන් සහ වැඩසටහන්</u>**

1. පළාත් පාලන බල ප්‍රදේශවල සංචාරක යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන
2. පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන (ප්‍රාග්ධන)
3. ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන යටතේ නාගරික ප්‍රදේශවල පොදු මහජනතාව සහ සංචාරකයින් සඳහා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමේ වැඩසටහන

**<u>අංශය මඟින් ඉටු කරනු ලබන අනෙකුත් කාර්යයන්</u>**

1. පළාත් පාලන ආයතනවල පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කිරීම.
2. පළාත් පාලන ආයතනවලට අදාළ වන පරිදි සංශෝධිත පුරවැසි ප්‍රඥප්තිය හඳුන්වා දීම.
3. පළාත් පාලන ආයතනයන් මඟින් සිදු කරන කාර්යයන් 30 කට අදාළව සකස් කරන ලද කාර්ය පටිපාටි සංග්‍රහය මුද්‍රණය කර බෙදා හැරීමට කටයුතු කිරීම.

#### 2.6.1.3. 2025.01.01 දින සිට 2025.12.31 දින දක්වා කාර්ය සාධනය

| අ.අ. | වැඩසටහන | 2025 වර්ෂය සඳහා වෙන් වූ ප්‍රතිපාදනය (රු.) | 2025.12.31 දිනට වියදම(රු.) | මූල්‍ය ප්‍රගතිය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| 1 | පළාත් පාලන බල ප්‍රදේශවල සංචාරක යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන | 350,000,000.00 | 145, 057.072.04 | 41% | 86% |
| 2 | පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන(ප්‍රාග්ධන) | 160,000,000.00 | 146,084,503.59 | 91% | 100% |
| 3 | ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන යටතේ නාගරික ප්‍රදේශවල පොදු මහජනතාව සහ සංචාරකයින් සඳහා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමේ වැඩසටහන | 327,087,023.14 | 49,649,325.97 | 15% | 54% |
| | **එකතුව** | **837,087,023.14** | **340,790,901.60** | **41%** | **80%** |

එක් එක් ප්‍රධාන සංවර්ධන වැඩසටහන් යටතේ 2025.12.31 දින වන විට ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

## 1. පළාත් පාලන බල ප්‍රදේශවල සංචාරක යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන

මෙම වැඩසටහන මඟින් දේශීය හා විදේශීය සංචාරකයින් සඳහා සනීපාරක්ෂක පහසුකම්, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය, ප්‍රවේශ මාර්ග, ආරක්ෂාව සහ ප්‍රථමාධාර පහසුකම් ආදි අත්‍යවශ්‍ය මූලික පහසුකම් හා රජයේ අපේක්ෂිත සංචාරක සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා දිවයිනේ සියළු පළාත් ආවරණය වන පරිදි සංචාරක ආකර්ශනය සහිත ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා පළාත් පාලන ආයතන මඟින් ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබයි.

මේ යටතේ ප්‍රධාන වශයෙන් පහත ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

- ✓ සංචාරක සේවා මධ්‍යස්ථාන, සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම, විවේක ස්ථාන සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
- ✓ සංචාරක නිකේතන අලුත්වැඩියා කිරීම.
- ✓ නගර, උද්‍යාන සහ ආහාර වෙළඳසැල් නවීකරණය කිරීම.
- ✓ රථගාල් සහ ප්‍රවේශ මාර්ග සංවර්ධනය කිරීම.
- ✓ බෝට්ටු සේවා වැඩිදියුණු කිරීම.
- ✓ සංචාරක ප්‍රදේශ ආශ්‍රිත මාර්ගවල සූර්ය බල වීදි ලාම්පු සවි කිරීම.

2025 වර්ෂය සඳහා වෙන්වූ රු.මි.350 ක ප්‍රතිපාදනය පහත පරිදි යොදවා ගැනීමට කටයුතු කර ඇත.

| විස්තරය | ව්‍යාපෘති ගණන | වටිනාකම (රු.) |
|---|---|---|
| වෙන් වූ මුළු ප්‍රතිපාදනය | | 350,000,000.00 |
| 2024 වර්ෂයේ ව්‍යාපෘති සඳහා ගෙවූ බිල්පත් වටිනාකම | 11 | 57,886,493.79 |
| 2024 වර්ෂයේ අවිච්ඡේද කළ ව්‍යාපෘති සඳහා නිදහස් කරනු ලැබූ ප්‍රතිපාදන ප්‍රමාණය | 2 | 45,520,937.39 |
| 2025 වර්ෂයේ ක්‍රියාත්මක කිරීම සඳහා අනුමත කරනු ලැබූ ව්‍යාපෘති සඳහා ගෙවූ බිල්පත් වටිනාකම | 20 (අවසන් බිල්පත් 2/ කොටස් බිල්පත් 18) | 41,649,640.86 |

## 2. පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන (ප්‍රාග්ධන)

මෙම වැඩසටහන මඟින් නාගරීකරණය සමඟ වෙනස් වන මහජන අවශ්‍යතා සපුරාලීමත්, පළාත් පාලන අයතනවල ස්වයං උත්පාදන ආදායම් මට්ටම් ප්‍රවර්ධනය කිරීමත් එම ආයතන මඟින් සැපයෙන මහජන සේවාවන්හි ගුණාත්මකභාවය හා ඵලදායීතාව ඉහළ නැංවීමත් අරමුණු කරගෙන පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල අත්‍යවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා එම පළාත් පාලන ආයතනයන්ට අවශ්‍ය සහාය ලබා දේ.

මේ යටතේ ප්‍රධාන වශයෙන් පහත ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

- ✓ ප්‍රජා ජල ව්‍යාපෘති ඉදිකිරීම.
- ✓ වෙළෙඳපොළ පහසුකම් සංවර්ධනය කිරීම.
- ✓ සංචාරක ආකර්ෂණය සහිත ස්ථානවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
- ✓ පොදු වැසිකිළි පහසුකම් සංවර්ධනය කිරීම.
- ✓ ආදාහනාගාර ඉදි කිරීම.
- ✓ පොදු මාර්ග සංවර්ධනය කිරීම.
- ✓ බොජුන්හල් හා සුවපහසු මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම.

2025 වර්ෂය සඳහා වෙන්වූ රු.මි.160 ක ප්‍රතිපාදනය පහත පරිදි යොදවා ගැනීමට කටයුතු කර ඇත.

| විස්තරය | ව්‍යාපෘති ගණන | වටිනාකම (රු.) |
|---|---|---|
| වෙන් වූ මුළු ප්‍රතිපාදනය | | 160,000,000.00 |
| 2024 වර්ෂයේ ව්‍යාපෘති සඳහා ගෙවූ බිල්පත් වටිනාකම | 34 | 107,796,383.00 |
| 2024 වර්ෂයේ ක්‍රියාත්මක කරනු ලැබූ ව්‍යාපෘති අතරින් 2025 වර්ෂය සඳහා අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලැබූ ව්‍යාපෘති සඳහා ගෙවූ බිල්පත් වටිනාකම | 5 | 20,004,280.56 |
| 2025 වර්ෂයේ ක්‍රියාත්මක කිරීම සඳහා අනුමත කරනු ලැබූ ව්‍යාපෘති සඳහා ගෙවූ බිල්පත් වටිනාකම | 3 | 18,283,840.03 |

**3. ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන යටතේ නාගරික ප්‍රදේශවල පොදු මහජනතාව සහ සංචාරකයින් සඳහා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමේ වැඩසටහන**

මහජන සනීපාරක්ෂක පහසුකම් බොහෝමයක් මේ වන විට හොඳ තත්ත්වයේ නොපවතින අතර, ඒවා සෞඛ්‍ය ආරක්ෂිත නොවන සහ යල්පැන ගිය ඉදිකිරීම් වන අතර විශේෂයෙන් කාන්තාවන්, ළමුන්, වැඩිහිටියන් සහ ආබාධ සහිත පුද්ගලයින් යනාදී සෑම දෙනාටම ප්‍රවේශ වීමට අපහසු තත්ත්වයක පවතී. ජනාධිපති ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන යටතේ රු. මිලියන 300 ක මුදලක් මෙම කාර්යයට අදාළව වෙන් කර දී ඇති අතර මෙම ගැටළුවට විසඳුම් සෙවීමේ වැදගත්කම හඳුනාගනිමින්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින් මහජනතාව බහුල වශයෙන් ගැවසෙන සහ සංචාරක ප්‍රදේශ කේන්ද්‍ර කර ගනිමින් පොදු වැසිකිළි ක්‍රමවත් ලෙස නවීකරණය කිරීම සහ නඩත්තු කිරීම සඳහා පළාත් පාලන ආයතන වෙත අවශ්‍ය සහාය ලබා දීමට පියවර ගෙන ඇත.

මෙම ව්‍යාපෘතිය මඟින් පොදු වැසිකිළි නවීන සනීපාරක්ෂක පහසුකම්වලින් යුක්ත ප්‍රමිතිගත ආකාරයෙන් වැඩිදියුණු කිරීම අරමුණු කරන අතරම එමඟින් සංචාරක කර්මාන්තය සඳහා සහාය වීමත්, තිරසර නාගරික සංවර්ධනය වැඩිදියුණු කිරීමත් අරමුණු කෙරෙයි .

ඒ අනුව, මෙම වැඩසටහන යටතේ වෙන්වූ ප්‍රතිපාදනය වියදම් දැරීම පහත පරිදි වේ.

| විස්තරය | ව්‍යාපෘති ගණන | වටිනාකම (රු.) |
|---|---|---|
| වෙන් වූ මුළු ප්‍රතිපාදනය | | 327,087,023.14 |
| 2025 වර්ෂයේ ක්‍රියාත්මක කිරීම සඳහා අනුමත කරනු ලැබූ ව්‍යාපෘති සඳහා ගෙවූ බිල්පත් වටිනාකම | 3<br>(අවසන් බිල්පත් 1/ කොටස් බිල්පත් 20) | 49,649,325.97 |

### 2.6.2. පළාත් සභා අංශය

#### 2.6.2.1. අරමුණ

පළාත් සභාවල ක්‍රියාකාරිත්වයට පහසුකම් සැලසීම, මධ්‍යම රජය හා පළාත් සභා අතර සම්බන්ධීකරණය හා පළාත් සභාවල මානව සම්පත් සංවර්ධනය මඟින් ඵලදායී හා කාර්යක්ෂම පළාත් සභා ක්‍රමයක් ඇති කිරීම.

#### 2.6.2.2. ප්‍රධාන කාර්යයන්

1. මධ්‍යම රජය හා පළාත් සභා අතර විධිමත් සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් ගොඩනැඟීම සඳහා පළාත් ප්‍රධාන ලේකම්වරුන් හා මධ්‍යම රජයේ ආයතන සම්බන්ධ කර ගනිමින් අන්තර් පළාත් විෂය සම්බන්ධීකරණ සමුළුව කාර්තුවකට එක බැඟින් පැවැත්වීම.
2. පළාත් සභා හා පළාත් පාලන ආයතන සඳහා ඉඩම් අත්පත් කරගැනීම.
3. පළාත් සභා සඳහා අවශ්‍ය වන අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කිරීම.
4. පළාත් රාජ්‍ය සේවයේ වයස අවුරුදු 45 ඉක්මවා පත්වීම් ලබා දී ඇති නිලධාරීන් සඳහා විශ්‍රාම වැටුප් හිමිකම ලබා දීම සඳහා කටයුතු කිරීම.
5. කළමනාකරණ සේවා චක්‍රලේඛ 03/2014 අනුව පළාත් රාජ්‍ය සේවයේ නව තනතුරු ඇති කිරීම.
6. සංශෝධිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99 යටතේ පළාත් සභාවල විශ්‍රාමික නිලධාරීන් වෙත වාහන බලපත්‍ර නිකුත් කිරීම.
7. පළාත් පාලන ආයතනවල අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීම සඳහා කටයුතු කිරීම.
8. පළාත් සභාවල කටයුතුවලට අදාළව ලැබෙන පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු සකස් කර පාර්ලිමේන්තුවට යොමු කිරීම.
9. පළාත් සභාවල කටයුතුවලට අදාළව උපදේශක කාරක සභා වෙතින් ලැබෙන ලිපි සඳහා පිළිතුරු යොමු කිරීම.
10. පළාත් සභාවල කටයුතුවලට අදාළව මහජන පෙත්සම් කාරක සභාව වෙතින් ලැබෙන ලිපි සඳහා පිළිතුරු සකස් කර පාර්ලිමේන්තුවට යොමු කිරීම.
11. පළාත් සභා නියෝජනය කරමින් පාර්ලිමේන්තු කටයුතුවලට සහභාගි වීම.
12. පළාත් සභා සඳහා වාහන මිලදී ගැනීම සම්බන්ධව කටයුතු කිරීම.
13. පළාත් සභා නිලධාරීන් සඳහා විදේශ පුහුණු අවස්ථා ලබා දීමේ දී පළාත් සභා නිලධාරීන්ගේ නාමයන් නිර්දේශ කිරීම.
14. පළාත් සභාවන්වල කටයුතුවලට අදාළව ජනාධිපති කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, අනෙකුත් අමාත්‍යාංශ, ආයතන සහ මහජනතාව විසින් යොමු කරනු ලැබූ පැමිණිලි සම්බන්ධව කටයුතු කිරීම.
15. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ අධීක්ෂණ හා මෙහෙයුම් කටයුතු සිදු කිරීම සඳහා සහාය වීම.
16. කාර්ය මණ්ඩල සමාලෝචන කටයුතුවල දී පළාත් සභා නියෝජනය කරමින් සහභාගිවීම.
17. තොරතුරු දැනගැනීමේ පනත යටතේ ඉල්ලුම් කරනු ලබන තොරතුරු ලබා දීම.
18. පළාත් සභා ධූරධාරීන් හා නිලධාරීන් සම්බන්ධ කරගත හැකි තොරතුරු කාර්තුමය වශයෙන් යාවත්කාලීන කිරීම.

#### 2.6.2.3. 2025.01.01 සිට 2025.12.31 දක්වා කාර්යසාධනය

1. ගරු රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් සහ ගරු පළාත් සභා සහ පළාත් පාලන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ සහභාගීත්වයෙන් පළාත් ප්‍රධාන ලේකම්වරුන් සමඟ සාකච්ඡා වාරයක් පවත්වා ඇත.
2. ගරු රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා, ගරු පළාත් සභා සහ පළාත් පාලන නියෝජ්‍ය අමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්තුමාගේ සහභාගීත්වයෙන් පවත්වනු ලබන පළාත් සභාවල කටයුතු සමාලෝචන වැඩසටහන් දකුණ, ඌව, උතුරු මැද, නැගෙනහිර, මධ්‍යම සහ උතුර යන පළාත්වල පවත්වා ඇත.
3. ඉඩම් අත්කර ගැනීමට අදාළව සියළුම පළාත් වෙතින් ඉල්ලීම් 44 ක් මෙම අමාත්‍යාංශය වෙත පළාත් ප්‍රධාන ලේකම්වරුන්ගේ නිර්දේශය සහිතව යොමු කර ඇති අතර, නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 29 ක් ඉදිරි කටයුතු සඳහා ඉඩම් අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. අඩුපාඩු සහිතව යොමු කර ඇති අයදුම්පත් 15 ක් අඩුපාඩු සකස් කර නැවත යොමු කරන ලෙස පළාත් ප්‍රධාන ලේකම්වරුන් වෙත දැනුම් දී ඇත.

38(අ) වගන්තියේ අතුරු විධානය යටතේ ඉඩම් අත්කර ගැනීමට අදාළව ඉඩම් අමාත්‍යාංශයට නිර්දේශ 08 ක් ඉදිරිපත් කිරීම ද, 39(අ) වගන්තිය අනුව ඉඩම් නිරවුල් කිරීම සඳහා ඉඩම් අමාත්‍යාංශයට නිර්දේශ 01 ක් ඉදිරිපත් කිරීම ද, 50(1) වගන්තිය අනුව ඉඩම් නිරවුල් කිරීම සඳහා ඉඩම් අමාත්‍යාංශයට නිර්දේශ 06 ක් ඉදිරිපත් කිරීම ද, 04 වන වගන්තිය ප්‍රකාරව විරෝධතා පරීක්ෂණ පැවැත්වීම සඳහා පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශ සහිතව නිලධාරීන් 04 දෙනෙකු පත් කිරීම ද, විරෝධතා විමර්ශන වාර්තා පිළිබඳ නිර්දේශ 11 ක් ඉඩම් අමාත්‍යාංශය වෙත යොමු කිරීම ද සිදුකර ඇත.

4. පළාත් සභා සඳහා අවශ්‍ය වන අමාත්‍ය මණ්ඩල සංදේශ 03 ක් සකස් කර අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.

i. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ අධ්‍යක්ෂ ලෙස විශ්ව විද්‍යාල කථිකාචාර්යවරයකු පත් කිරීමට අනුමැතිය ලබා ගැනීම සඳහා වූ අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කළ අතර, ඒ සඳහා අනුමැතිය ලැබී ඇත.

ii. "රජයට අයත් වාණිජමය නොවන ආයතනය පිළිබඳ සමාලෝචන වාර්තාවේ නිර්දේශ සම්බන්ධයෙන් වූ අමාත්‍ය මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීම - පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය" යන මැයෙන් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඇති අතර, ඒ සඳහා ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශයක් මඟින් ග්‍රාමීය සංවර්ධන සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබල ගැන්වීමේ අමාත්‍යතුමා හා රාජ්‍ය පරිපාලන පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා මඟින් නිරීක්ෂණ ඉදිරිපත් කරන ලෙස අමාත්‍ය මණ්ඩල තීරණය ලැබී ඇත.

iii. පළාත් රාජ්‍ය සේවයේ වයස අවුරුදු හතලිස් පහෙන් (45) පසුව ස්ථිර පත්වීම් ලද සේවකයන් වෙත විශ්‍රාම වැටුප් හිමිකම ලබා දීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කළ අතර, ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

5. පළාත් පාලන ආයතනවල සේවය කරන 2023.08.29 දිනට දින 180 ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් සහ සහන පදනම මත බඳවාගෙන ඇති සේවකයින් ස්ථිර කිරීම යටතේ දරන්නාට පෞද්ගලික වන සේ තනතුරු 359 ක් ඇති කිරීමට (දකුණු පළාතේ 254 හා උතුරු මැද පළාතේ 105 වශයෙන්) පළාත්වලින් ලද අයදුම්පත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

තවද, පළාත්වල ඉල්ලීම් අනුව නව තනතුරු 62 ක් ඇති කිරීම සඳහා අයදුම්පත් හා සාධාරණිකරණ වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් පළාත්වල නව තනතුරු 78 ක් අනුමත කිරීමට අනුමැතිය ලබා දී ඇත.

6. රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය නියෝජනය කරමින් නැගෙනහිර, සබරගමුව, ඌව සහ උතුරු මැද පළාත් කාර්යය මණ්ඩල සමාලෝචනයේ කටයුතු සඳහා සහභාගී වීම.

7. සංශෝධිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99 යටතේ පළාත් සභාවල විශ්‍රාමික නිලධාරීන් වෙත වාහන බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධව පළාත්වලින් ලද අයදුම්පත් 171 අතරින් අඩුපාඩු සහිත අයදුම්පත් 55 ක් නැවත පළාත් වෙත යොමු කළ අතර නිවැරදි ලෙස යොමු කර ඇති අයදුම්පත් 116 ක් නිර්දේශ කර වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

8. අභ්‍යන්තර විගණන ඒකක පිහිටුවීම සම්බන්ධයෙන් පළාත්වලින් ගෙන්වන ලද නිර්දේශ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. කාර්ය මණ්ඩල සමාලෝචනයේදී මේ පිළිබඳව තීරණයක් ගැනීමට නියමිතය.

9. පාර්ලිමේන්තුවෙන් යොමු කර ඇති පාර්ලිමේන්තු ප්‍රශ්න 05 ක් සඳහා පළාත් ප්‍රධාන ලේකම්වරුන්ගෙන් තොරතුරු ලබා ගෙන පිළිතුරු පාර්ලිමේන්තුව වෙත යොමු කර ඇත.

10. උපදේශක කාරක සභා වෙත ඉදිරිපත් කර ඇති යෝජනා 09 ක් සම්බන්ධව පළාත් ප්‍රධාන ලේකම්වරුන්ගෙන් තොරතුරු ලබා ගෙන පිළිතුරු උපදේශක කාරක සභාව වෙත යොමු කර ඇත.

11. මහජන පෙත්සම් කාරක සභාව විසින් එවා ඇති මහජන පෙත්සම් 17 කට මෙම අමාත්‍යාංශයේ නිර්දේශය මහජන පෙත්සම් කාරක සභාව වෙත යොමු කර ඇත.

12. මහජන පෙත්සම් කාරක සභා 04 ක්, උපදේශක කාරක සභා 05 ක් සහ උතුරු

මැද සහ සබරගමුව යන පළාත් සඳහා පවත්වන ලද ගිණුම් කාරක සභා රැස්වීම් සඳහා සහ විගණන කමිටු රැස්වීම් 03 ක් සඳහා සහභාගී වී ඇත.

13. පළාත් සභා සඳහා අවශ්‍ය වාහන ලබා ගැනීම සම්බන්ධව පළාත් වෙතින් ඉදිරිපත් කළ ඉල්ලීම් අනුව වාහන 57 ක් පළාත් සභා වෙත ලබා ගැනීම සඳහා අයදුම්පත් නිර්දේශ කර කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත අනුමැතිය සඳහා යොමු කර ඇත.
14. පළාත් සභාවන්වල කටයුතුවලට අදාළව ජනාධිපති කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, අනෙකුත් අමාත්‍යාංශ, ආයතන සහ මහජනතාව විසින් යොමු කරනු ලැබූ පැමිණිලි හා අභියාචනා 147 ක් සම්බන්ධව අදාළ පාර්ශව දැනුවත් කිරීමට කටයුතු කර ඇත.
15. පළාත් සභා නිලධාරීන් සඳහා විදේශ පුහුණු අවස්ථා ලබා දීමේ දී පළාත් සභාවල නිලධාරීන් 179 ක, නම් නිර්දේශ කර විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.
16. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ පාලක සභාව වෙත සාමාජිකයින් හත් (07) දෙනකු හා පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයට අධ්‍යක්ෂකවරයකු පත් කිරීමට පියවර ගෙන ඇත.
17. තොරතුරු දැන ගැනීමේ පනත යටතේ යොමු කල ඉල්ලීම් 13 ක් සම්බන්ධව තොරතුරු අදාළ පාර්ශව වෙත ලබා දීම සිදුකර ඇත.
18. පළාත් සභා ධූරධාරීන් හා නිලධාරීන් සම්බන්ධ කරගත හැකි තොරතුරු කාර්තුමය වශයෙන් යාවත්කාලීන කිරීම සිදු කර ඇත.

### 2.6.3. පළාත් පාලන අංශය

#### 2.6.3.1. අරමුණ

ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන පද්ධතියේ කාර්යසාධනය කළමනාකරණය කිරීම හා එහි කටයුතු නව තාක්ෂණයත් සමඟ එක් කිරීම මඟින් සීඝ්‍ර සංවර්ධන දිශානතියකට යොමු කර වඩාත් මහජන හිතකාමී කාර්යක්ෂම පළාත් පාලන ආයතනයක් බිහිකිරීමට කටයුතු කිරීම.

#### 2.6.3.2. ප්‍රධාන කාර්යයන්

1. පළාත් පාලන ආයතන පද්ධතියෙහි අවශ්‍යතා හඳුනා ගැනීම සහ ප්‍රතිපත්ති සම්පාදනය.
2. නව පළාත් පාලන ආයතන සංස්ථාපනය, සීමා මායිම් නිර්ණය කිරීම සහ ව්‍යුහය තීරණය කිරීමට අදාළ කටයුතු.
3. සහෝදර නගර/ මිතුරු නගර සංකල්පය යටතේ විදේශ රාජ්‍ය සමඟ ගිවිසුම්වලට එළඹීමේ දී අවශ්‍ය සහාය ලබා දීම හා මාර්ගෝපදේශකත්වය ලබා දීම.
4. රාජ්‍ය ගිණුම්කාරක සහා කටයුතු සඳහා පළාත් පාලන ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම හා සහභාගීත්වය.
5. පාර්ලිමේන්තු ප්‍රශ්න, මහජන පෙත්සම් කාරක සභාව හා උපදේශකකාරක සභාවලින් ඉදිරිපත් වන ගැටළු සඳහා පිළිතුරු ලබා දීම.
6. පළාත් පාලන ආයතන සඳහා තොරතුරු තාක්ෂණ විසඳුම් ලබා දීම.
7. පළාත් පාලන ආයතන සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පිළිබඳව ප්‍රසම්පාදන කොමිෂන් සභාව වෙත කෙටුම්පත් ඉදිරිපත් කිරීම.
8. පළාත් පාලන ආයතන සඳහා කාර්යසාධන මෙවලම හඳුන්වා දී ඒ අනුව පළාත් පාලන ආයතන ඇගයීමට ලක් කර ස්වර්ණපුරවර සම්මාන උළෙල පැවැත්වීම.
9. පළාත් පාලන ආයතනවලට කාර්යසාධනය මත පදනම් වූ ප්‍රාග්ධන ප්‍රදාන ලබා දීම.
10. රේඛීය අමාත්‍යාංශය ලෙස අවශ්‍ය අවස්ථාවල දී පළාත් පාලන කොමසාරිස්වරුන් හා සහකාර පළාත් පාලන කොමසාරිස්වරුන් සම්බන්ධීකරණය කිරීම.
11. පළාත් පාලන ක්ෂේත්‍රයට අදාළ කටයුතු හා සම්බන්ධ අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීම.
12. පළාත් පාලන ආයතනවල කාර්යය හා කටයුතු ඒකීය ක්‍රමයකට පවත්වා ගැනීම උදෙසා අවශ්‍ය මඟ පෙන්වීම.
13. පළාත් පාලන ආයතන මධ්‍යම රජයේ ආයතන සමඟ සිදු කරන කටයුතුවල දී මැදිහත් වීම සහ සම්බන්ධීකරණය.
14. පළාත් පාලන ආයතන සම්බන්ධව ඉදිරිපත්වන අධිභාර අභියාචනා කමිටු පැවැත්වීම.
15. පළාත් පාලන ආයතන සඳහා පොදු මානව සම්පත් සංවර්ධන උපාය මාර්ග ක්‍රමයක් හඳුන්වා දීම.
16. පළාත් පාලන ආයතන ස්වයං මූලනය කිරීම සඳහා ක්‍රමෝපාය හඳුන්වා දීම.
17. මහජන පැමිණිලි සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ලබා දීම සඳහා අවස්ථාවෝචිත පරිදි අදාළ පළාත් ප්‍රධාන ලේකම්/ පළාත් පාලන කොමසාරිස්/ පළාත් පාලන ආයතන ප්‍රධානීන් වෙත යොමු කිරීම.

#### 2.6.3.3. 2025.01.01 සිට 2025.12.31 දක්වා කාර්යසාධනය

**1. රාජ්‍ය ගිණුම්කාරක සහා කටයුතු සඳහා පළාත් පාලන ආයතන සම්බන්ධීකරණය කිරීම.**

පළාත් පාලන ආයතනවල විගණන කටයුතු සම්බන්ධයෙන් නිසි මඟපෙන්වීමක් සිදු කරනු ලබයි.

**ප්‍රගතිය :**

2021 වර්ෂයේ පැවති ගිණුම්කාරක සහා රැස්වීම් නියෝග පරිදි, ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභා මාර්ගෝපදේශ අනුව සියළුම පළාත් පාලන ආයතන සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ කෙටුම්පතක් ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලද අතර, ඒ අනුව යෝජිත සංශෝධනය අනුව කෙටුම්පත නැවත සකස් කරමින් පවතී.

**2. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හා මහජනතාව විසින් පාර්ලිමේන්තුව වෙත යොමු කරනු ලබන ගැටළු**

**i. පාර්ලිමේන්තු ප්‍රශ්න**

පළාත් සභා සහ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමන් වෙතින් පිළිතුරු අපේක්ෂාවෙන් යොමු කරනු ලබන ගැටළු අදාළ පළාතේ ප්‍රධාන ලේකම් වෙත යොමු කර පළාත්වලින් ලබා ගන්නා නිරීක්ෂණ මත අදාළ පිළිතුරු පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

**ප්‍රගතිය :**

2025 වර්ෂය සඳහා ඉදිරිපත් වූ පාර්ලිමේන්තු ප්‍රශ්න ගණන අතරින් වාචික පිළිතුරු අපේක්ෂා

කරන ප්‍රශ්න 18 ක් , වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න 01 ක් , ස්ථාවර නියෝග 04 ක් සඳහා පිළිතුරු මේ වන විට පාර්ලිමේන්තුව වෙත යොමු කර ඇත.

**ii. මහජන පෙත්සම් කාරක සභාව/ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

පළාත් පාලන ආයතන වෙතින් තම අවශ්‍යතා ඉටු කර ගැනීමට නොහැකි වන ඇතැම් පුද්ගලයන් හා කණ්ඩායම් විසින් මහජන පෙත්සම් කාරක සභාව සහ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව මඟින් ඉදිරිපත් කරනු ලබන පෙත්සම් සඳහා අදාළ පළාත් වෙතින් තොරතුරු ලබා ගෙන එම පුද්ගලයන්ට සහන සැලසිය හැකි පරිදි මැදිහත්කරුවෙකු ලෙස කටයුතු කරනු ලබයි.

**ප්‍රගතිය :**

2025 වර්ෂය සඳහා මහජන පෙත්සම් කාරක සභාව වෙතින් පෙත්සම් 04 ක් පළාත් සභා සහ පළාත් පාලන අංශය වෙත යොමු කර ඇති අතර එක් පෙත්සමකට අදාළ වාර්තාව මහජන පෙත්සම් කාරක සභාව වෙත මේ වන විට යොමු කර ඇත. ඉතිරි පෙත්සම සඳහා අදාළ වාර්තාව ලබා ගැනීමට දකුණු පළාත් ප්‍රධාන ලේකම් වෙත අදාළ ලිපිය යොමු කර ඇත.

**3. මහජන පැමිණිලි විමර්ශනය කිරීම.**

මහ නගර සභා 29, නගර සභා 36 හා ප්‍රාදේශීය සභා 276 ක් ලෙස පිහිටුවා ඇති පළාත් පාලන ආයතනවලින් මහජනතාව හා විවිධ ආයතන වෙත සපයන සේවා සම්බන්ධයෙන් අතෘප්තියට පත් වුවහොත් එවැනි අවස්ථාවක ඒ සම්බන්ධව මෙම අමාත්‍යාංශය වෙත මහජනතාව හා විවිධ ආයතන විසින් පැමිණිලි යොමු කරනු ලැබේ. එලෙස යොමු කරනු ලබන පැමිණිලි සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ලබා දීම සඳහා අවස්ථාවෝචිත පරිදි අදාළ පළාත් ප්‍රධාන ලේකම්/ පළාත් පාලන කොමසාරිස්/ පළාත් පාලන ආයතන ප්‍රධානීන් වෙත යොමු කරනු ලැබේ.

| පළාත | ලැබූ පැමිණිලි සංඛ්‍යාව | ගත් ක්‍රියා මාර්ගය |
|---|---|---|
| බස්නාහිර | 246 | පළාත් පාලන කොමසාරිස් හා අදාළ ආයතන වෙත යොමු කිරීම |
| මධ්‍යම | 153 | |
| දකුණ | 165 | |
| උතුරු මැද | 23 | |
| වයඹ | 35 | |
| ඌව | 42 | |
| උතුර | 21 | |
| නැගෙනහිර | 16 | |
| සබරගමුව | 38 | |
| **එකතුව** | **739** | |

## 4. අධිභාර සම්බන්ධ කටයුතු

පළාත් පාලන ආයතනවල ගිණුම් විගණනය කිරීමේ දී නීතියට පටහැනි සෑම ගිණුම් විෂයක්ම විගණකාධිපතිවරයා විසින් ප්‍රතික්ෂේප කර එම කරුණු සම්බන්ධයෙන් බලය දෙන තැනැත්තන් විෂයෙහි අධිභාර පැනවීම සිදු කරනු ලැබේ.

එසේ අධිභාර කරනු ලබන අධිභාරකරුවන්ට 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 172 වගන්ති ප්‍රකාරව දින 30 ක් ඇතුළත රේඛීය අමාත්‍යාංශයේ ලේකම් වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැක. තවද, නගර සභා ආඥා පනතේ 255 අධිකාරය ප්‍රකාරව දින 30 ක් ඇතුළත හා මහ නගර සභා ආඥා පනතේ 252 අධිකාරය ප්‍රකාරව දින 14 ක් ඇතුළත රේඛීය විෂය භාර අමාත්‍යවරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කළ යුතුය .

**ප්‍රගතිය :**

පළාත් සභා සහ පළාත් පාලන අංශය වෙත ලැබී ඇති අභියාචනා පළාත් වෙත යොමු කරන අතර පළාත් කමිටු විසින් වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබේ. එලෙස මෙම අමාත්‍යාංශය වෙත ලද සියළුම වාර්තා සඳහා මේ වන විට තීරණ ලබා දී ඇත.

## 5. ගිනි නිවීම් සම්බන්ධ කටයුතු

පළාත් පාලන ආයතනයන්හි ස්ථාපිතව ඇති ගිනි නිවීම් ඒකකවල ධාරිතා සංවර්ධනය සහ ගිනි නිවන ඒකක සඳහා පහසුකම් සැපයීම පළාත් පාලන ආයතන සතු වගකීමකි.

**ප්‍රගතිය :**

පළාත් පාලන ආයතනයන්හි ස්ථාපිතව ඇති ගිනි නිවීම් ඒකකවල ගැටළු නිරාකරණය කිරීමේ අරමුණින් ගිනි නිවීම් ඒකකවල පවතින ගැටළු හඳුනාගෙන, එම ගැටළු නිරාකරණය සඳහා ක්‍රමවේද සකස් කර ගැනීමට හා ගිනි නිවීම් ඒකකවල ධාරිතාවය සංවර්ධනය කිරීමට ක්‍රමවේදයක් සකස් කරමින් පවතී.




ගිනි නිවීම් භටයන් සඳහා වැල්ලවත්ත ගිනි නිවීම් භටයන් පුහුණු කිරීමේ ආයතනය මඟින් පැවැත්වූ පුහුණු වැඩමුළුව

- **පළාත් පාලන ආයතන සඳහා දත්ත පද්ධතියක් හඳුන්වා දීම**

| | | | | |
|---|---|---|---|---|
| **1.** | සමස්ත ආයෝජනය (රු.මි.) | වර්ෂය | ප්‍රතිපාදනය | වියදම |
| | | 2024 | 30 | 16 |
| | | 2025 | 50 | 35.5 |
| **2.** | ණය ආධාර සපයන ආයතන සහ මුදල් ප්‍රමාණයන් (රු.මි.) | - | | |
| **3.** | ව්‍යාපෘති කාල සීමාව (අවුරුදු) | අවුරුදු 3 | | |
| | ආරම්භක වසර / අවසන් වසර | 2024-2027 | | |
| **4.** | ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ප්‍රදේශ | පළාත් පාලන ආයතන | | |

### 5. ව්‍යාපෘතියේ අරමුණු

වරිපනම් බදු කළමනාකරණය, මිශ්‍ර ආදායම් අධීක්ෂණය කිරීම, මාර්ගගත ගෙවීම් සැකසීම, වෙන් කරවා ගැනීම් සේවා, ආදායම් කළමනාකරණය, බලපත්‍ර සහතික සහ වෙනත් යෙදුම් ඇතුළත් මෘදුකාංග පද්ධතියක් හඳුන්වා දීම තුළින් ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන පද්ධතියේ කාර්ය සාධනය කළමනාකරණය කිරීම හා එහි කටයුතු නව තාක්ෂණයත් සමඟ සිදු කිරීම මඟින් සීඝ්‍ර සංවර්ධන දිශානතියකට යොමු කර වඩාත් මහජන හිතකාමී කාර්යක්ෂම පළාත් පාලන ආයතනයක් බිහි කිරීමට කටයුතු කිරීම.

### 6. මූල්‍ය ප්‍රගතිය (රු. මිලියන)

| A | B | B/A | C | D | D/C | B+D | (B+D)/A |
|---|---|---|---|---|---|---|---|
| **සමස්ත ආයෝජන මුදල** | **2024.12.31 දක්වා සමස්ත මූල්‍ය ප්‍රගතිය** | **ප්‍රතිශතය (%)** | **2025 වර්ෂය සඳහා වෙන් කිරීම** | **2025.01.01 සිට 2025.12.31 දක්වා ප්‍රගතිය** | **ප්‍රතිශතය (%)** | **සමුච්චිත ප්‍රගතිය** | **ප්‍රතිශතය (%)** |
| - | - | - | 50 | 35.5 | 67% | - | - |

## 7. 2025.12.31 දිනට භෞතික ප්‍රගතිය

### 7.1. 2025.12.31 දිනට සමුච්චිත ප්‍රගතිය (A)

පළාත් පාලන ආයතනවල මහජන සේවාවන් හා ගෙවීම් මාර්ගගතව පවත්වා ගෙන යාමට හා පළාත් පාලන ආයතන තුළ ආදායම් රැස් කිරීමට අදාළ ගිණුම් කටයුතු සඳහා නිර්මාණය කරන ලද මෘදුකාංග පද්ධතිය හඳුන්වා දීම සඳහා පුහුණු වැඩසටහන් පළාත් පාලන ආයතන 199 ක (මධ්‍යම, සබරගමුව, නැගෙනහිර, දකුණ, ඌව සහ බස්නාහිර) පැවැත්වූ අතර 2025.12.31 වන විට මෙම පද්ධතිය පළාත් පාලන ආයතන 121 ක භාවිතා කිරීම සිදු විය.

### 7.2. වර්ෂය තුළ ප්‍රගතිය (2025.01.01 සිට 2025.12.31 දක්වා) (B)

පළාත් පාලන ආයතන සපයන සේවා සඳහා හා ආදායම් රැස් කිරීමට අදාළව නිර්මාණය කර ඇති මෘදුකාංග පද්ධතිය පළාත් 6 ක පළාත් පාලන ආයතන 121 ක මේ වන විට සාර්ථකව ක්‍රියාත්මක වේ. මෘදුකාංග පද්ධතිය සඳහා පුහුණු වැඩමුළු පවත්වා මේ වන විට හඳුන්වා දී ඇති හා ඒ අතුරින් දැනට භාවිතා කරන සංඛ්‍යා පහත පරිදි වේ.

| අ.අ. | පළාත | පුහුණු කළ පළාත් පාලන ආයතන ගණන | දැනට භාවිතා කරන පළාත් පාලන ආයතන ගණන | දැනට භාවිතා නොකරන පළාත් පාලන ආයතන ගණන |
|---|---|---|---|---|
| 1 | මධ්‍යම | 40 | 40 | 0 |
| 2 | සබරගමුව | 28 | 28 | 0 |
| 3 | නැගෙනහිර | 19 | 19 | 0 |
| 4 | බස්නාහිර | 49 | 3 | 46 |
| 5 | දකුණ | 49 | 29 | 20 |
| 6 | ඌව | 14 | 2 | 12 |
| | **එකතුව** | **199** | **121** | **78** |

තවද, මෙම මෘදුකාංග පද්ධතිය ක්‍රියාත්මක කරන අඩු ආදායම්ලාභී පළාත් පාලන ආයතන සඳහා අවශ්‍ය උපකරණ ලබා දීමට ද කටයුතු සිදු කර ඇත. එලෙස ක්ෂේත්‍රයේ ගොස් ආදායම් රැස් කිරීම සඳහා ආදායම් පරීක්ෂක නිලධාරීන් හට ලබාදීමට අතේ ගෙන යා හැකි Point of Sales Machine (POS) ලබා දී ඇත. ඒ අනුව, මේ වන විට පරිගණක කට්ටල 51 ක්, UPS 49 ක්, මුද්‍රණ යන්ත්‍ර 42 ක් සහ Point of Sales Machine (POS) 110 ක් ලබා දී ඇත. තවත් පරිගණක කට්ටල 61 ක්, මුද්‍රණ යන්ත්‍ර 61 ක් සහ Uninterrupted power supply (UPS) 61 ක් ලබා දීමට නියමිතව ඇත.

**<u>වරිපනම් අය කිරීම සම්බන්ධ මෘදුකාංග ප්‍රගතිය</u>**

- සභාව තුළ වරිපනම් අයකිරීමට අදාළ මෘදුකාංග කොටස අවසන් කර ඇත.
- වරිපනම් දත්ත ඇතුළත් කිරීම, පැහැදිලි කිරීම සඳහා වීඩියෝ සකස් කර සියළුම වට්ස්ඇප් සමූහ වෙත මුදා හැර ඇත.

මේ වන විට වරිපනම් දත්ත ඇතුළත් කර ඇති පළාත් පාලන ආයතන සංඛ්‍යාව

| පළාත | පළාත් පාලන ආයතන ගණන |
|---|---|
| මධ්‍යම | 11 |
| බස්නාහිර | 02 |
| දකුණ | 14 |
| **එකතුව** | **27** |

## Internet Payment Gateway සම්බන්ධ කිරීම

පළාත් 4 ක පළාත් පාලන ආයතන මාර්ගගත ගෙවීම් සිදු කිරීම සඳහා අන්තර්ජාල ගෙවීම් කටයුතු මහජන බැංකුව හා ලංකා බැංකුව හරහා elgservices.lk මාර්ගගත ගෙවීම් පද්ධතියට සම්බන්ධ වී ඇත.

| පළාත | පුහුණු කළ පළාත් පාලන දෙපාර්තමේන්තු නිලධාරීන් ගණන |
|---|---|
| මධ්‍යම | 40 |
| සබරගමුව | 16 |
| දකුණ | 16 |
| ඌව | 01 |
| **එකතුව** | **73** |



මෘදුකාංග පද්ධතිය හඳුන්වා දීම සඳහා පුහුණු වැඩමුළු පැවැත්වූ අවස්ථාවක්



පරිගණක කට්ටල 44 ක්, මුද්‍රණ යන්ත්‍ර 42 ක් සහ Point of Sales Machine (POS) 110 ක් පළාත් පාලන ආයතනවලට බෙදා දීමේ අවස්ථාව

- **පළාත් පාලන ආයතනවල කාර්යසාධනය ඇගයීම හා ස්වර්ණපුරවර සම්මාන උළෙල**

| | | |
|---|---|---|
| 1. | සමස්ත ආයෝජනය (රු.මි.) | 2025 වර්ෂයේ ප්‍රතිපාදනය - 10 |
| 2. | ණය ආධාර සපයන ආයතන සහ මුදල් ප්‍රමාණයන් (රු.මි.) | ණය ආධාර ලබා ගෙන නොමැත |
| 3. | ව්‍යාපෘති කාල සීමාව (අවුරුදු) | ආරම්භක වසර - 2009 |
| | ආරම්භක වසර / අවසන් වසර | අඛණ්ඩව කාර්යසාධනය ඇගයීම සිදු වේ. |
| 4. | ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ප්‍රදේශ | පළාත් පාලන ආයතන 341 |

**5. ව්‍යාපෘතියේ අරමුණු**

පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ ජනතාවට කාර්යක්ෂම හා ගුණාත්මක සේවාවක් ලබාදීම.

**6. මූල්‍ය ප්‍රගතිය (රු. මිලියන)**

| A | B | B/A | C | D | D/C | B+D | (B+D)/A |
|---|---|---|---|---|---|---|---|
| සමස්ත ආයෝජන මුදල | 2024.12.31 දක්වා සමස්ත මූල්‍ය ප්‍රගතිය | ප්‍රතිශතය (%) | 2025 වර්ෂය සඳහා වෙන් කිරීම | 2025.01.01 සිට 2025.12.31 දක්වා ප්‍රගතිය | ප්‍රතිශතය (%) | සමුච්චිත ප්‍රගතිය | ප්‍රතිශතය (%) |
| - | - | - | 10 | - | - | - | - |

**7. 2025.12.31 දිනට භෞතික ප්‍රගතිය**

සියලුම පළාත් පාලන ආයතනවල ඉහළ කාර්යසාධනයක් පෙන්වූ වැඩි ම පළාත් පාලන ආයතනවල පළාත් පාලන දෙපාර්තමේන්තු ඇගයීම, පළාත් ඇගයීම සිදු කර අවසන් වී ඇත. තවද, ජාතික මට්ටමේ ඇගයීම් කටයුතු සඳහා තේරී පත් වූ පළාත් පාලන ආයතන 86 න් පළාත් පාලන ආයතන 65 ක ජාතික මට්ටමේ ඇගයීම් කටයුතු අවසන් කර ඇත.



උතුරු මැද පළාත් ජාතික විනිශ්චය ඇගයීමට අදාළ කටයුතු පැවැත්වීම (කැකිරාව ප්‍රාදේශීය සභාව)




උතුරු පළාත් ජාතික මට්ටමේ ඇගයීමට අදාළ කටයුතු පැවැත්වීම (වැලිවැටිතුරෙයි නගර සභාව)



මධ්‍යම පළාත් ජාතික මට්ටමේ ඇගයීමට අදාළ කටයුතු පැවැත්වීම (මහනුවර මහ නගර සභාව)

- **පළාත් පාලන ආයතනවල ආදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා කාර්යසාධනය මත පදනම් වූ ප්‍රාග්ධන ප්‍රදාන ලබා දීම**

| | | |
|---|---|---|
| **1.** | සමස්ත ආයෝජනය (රු.මි.) | 3,475 |
| **2.** | ණය ආධාර සපයන ආයතන සහ මුදල් ප්‍රමාණයන් (රු.මි.) | ණය ආධාර ලබා ගෙන නොමැත. |
| **3.** | ව්‍යාපෘති කාල සීමාව (අවුරුදු) | 2025/ 2027 |
| | ආරම්භක වසර / අවසන් වසර | අඛණ්ඩව කාර්යසාධනය ඇගයීම සිදු වේ. |
| **4.** | ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ප්‍රදේශ | පළාත් පාලන ආයතන 276 |

**5. ව්‍යාපෘතියේ අරමුණු**

සමස්ත පළාත් පාලන ආයතන 341 හි ම ක්‍රියාකාරීත්වය පවත්වා ගැනීමත්, ඒ සඳහා අවශ්‍ය අරමුදල් යොදවා මහජන උපයෝගීතා සේවා පවත්වා ගැනීමටත් අවශ්‍ය ප්‍රතිපාදන මහ නගර සභා ආඥා පනත සහ නගර සභා ආඥා පනත ප්‍රකාරව සංස්ථාපනය වී තිබේ. නමුත් වර්තමානයේ දී පළාත් පාලන ආයතන සතු ආදායම් ප්‍රභව සඳහා විවිධ බාධාවන් මතු වීම නිසා පළාත් පාලන ආයතනවල ආදායම් උත්පාදනය සැළකිය යුතු ලෙස පහළ ගොස් තිබේ. එබැවින් පළාත් පාලන ආයතනවල ස්වයං උත්පාදන ආදායම ඉහළ නැංවීමේ ක්‍රමවත්

වැඩපිළිවෙලක අවශ්‍යතාවයක් පවතී. ඒ අනුව, ප්‍රාදේශීය සභා කාර්යසාධන ඇගයීමේ දී හඳුනාගත් ශක්තීන් හා දුර්වලතා අනුසාරයෙන් මධ්‍යකාලීන තිරසර වැඩපිළිවෙලක් ලෙස ප්‍රාදේශීය සභා 276 ක් සඳහා 2025, 2026 සහ 2027 වර්ෂ සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම සිදු කරනු ලැබේ.

**6. මූල්‍ය ප්‍රගතිය (රු. මිලියන)**

| A | B | B/A | C | D | D/C | B+D | (B+D)/A |
|---|---|---|---|---|---|---|---|
| සමස්ත ආයෝජන මුදල | 2024.12.31 දක්වා සමස්ත මූල්‍ය ප්‍රගතිය | ප්‍රතිශතය (%) | 2025 වර්ෂය සඳහා වෙන් කිරීම | 2025.01.01 සිට 2025.12.31 දක්වා ප්‍රගතිය | ප්‍රතිශතය (%) | සමුච්චිත ප්‍රගතිය | ප්‍රතිශතය (%) |
| - | - | - | 675 | 27 | - | 27 | - |

**7. 2025.12.31 දිනට භෞතික ප්‍රගතිය**

මේ වන විට කමිටුවට ඉදිරිපත් කර ඇති යෝජනා ඇගයීම් කර ප්‍රාදේශීය සභා 42 ක ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා දී තිබේ.



මැදදුම්බර මිහිඳන් උයන ව්‍යාපෘතියට අදාළ ඉදිකිරීම් කටයුතු



ශ්‍රී ඇල්බට් එෆ්. පීරිස් ක්‍රීඩාංගනයේ වාහන උද්‍යානය, යෝග්‍යතා සහ ක්‍රීඩා ගබඩාව ව්‍යාපෘතියට අදාළ ඉදිකිරීම් කටයුතු

- **කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා (KOICA) ආධාර යටතේ කොළඹ මහ නගර සභාව සඳහා පූර්ණ ස්වයංක්‍රීය ආදායම් උත්පාදන පද්ධතියක් නිර්මාණය කිරීම.**

| | | | | |
|---|---|---|---|---|
| **1.** | සමස්ත ආයෝජනය (රු.මි.) | වර්ෂය | ප්‍රතිපාදනය | ප්‍රතිපාදනය |
| | | 2024 | - | - |
| | | 2025 | 162 | - |
| **2.** | ණය ආධාර සපයන ආයතන සහ මුදල් ප්‍රමාණයන් (රු.මි.) | කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය (KOICA) ඇමරිකානු ඩොලර් මිලියන 8.5 | | |
| **3.** | ව්‍යාපෘති කාල සීමාව (අවුරුදු) | අවු. 05 | | |
| | ආරම්භක වසර / අවසන් වසර | 2024 - 2028 | | |
| **4.** | ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ප්‍රදේශ | කොළඹ මහ නගර සභාව | | |

**5. ව්‍යාපෘතියේ අරමුණු**

කොළඹ මහ නගර සභාවේ ප්‍රධානතම ආදායම් ප්‍රභව 76 අතරින් ඉහළම ආදායමක් උත්පාදනය කරනු ලබන ආදායම් ප්‍රභව වන වරිපනම් බදු (Property Tax), බලපත්‍ර ගාස්තු (License Tax), වෙළඳ බදු (Trade Tax) සහ මුද්දර ගාස්තු (Stamp Duty) යන ආදායම් ප්‍රභව හතර ස්වයංක්‍රීයකරණය කිරීම සඳහා ආදායම් උත්පාදනය පද්ධතියක් නිර්මාණය කිරීම.

**6. මූල්‍ය ප්‍රගතිය (රු.මිලියන)**

| A | B | B/A | C | D | D/C | B+D | (B+D)/A |
|---|---|---|---|---|---|---|---|
| සමස්ත ආයෝජන මුදල | 2024.12.31 දක්වා සමස්ත මූල්‍ය ප්‍රගතිය | ප්‍රතිශතය (%) | 2025 වර්ෂය සඳහා වෙන් කිරීම | 2025.01.01 සිට 2025.12.31 දක්වා ප්‍රගතිය | ප්‍රතිශතය (%) | සමුච්චිත ප්‍රගතිය | ප්‍රතිශතය (%) |
| - | - | - | 162 | - | - | - | - |

**7. 2025.12.31 දිනට භෞතික ප්‍රගතිය**

කොළඹ මහනගර සභාව සඳහා හඳුන්වා දීමට නියමිත ස්වයංක්‍රීය ආදායම් උත්පාදන පද්ධතිය සම්බන්ධව සකස් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට 2025.07.01 දිනැතිව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණි. ඒ අනුව 2025.07.03 වන දින ඒ සඳහා වන එකඟතාවය පිළිබඳ සම්මුතිය{Record of Discussion (ROD)} සඳහා මෙම අමාත්‍යාංශය, කොළඹ මහනගර සභාව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සහ කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා සංවිධානය සමඟ ගිවිසුම්ගත වෙන ලදී.






### 2.6.4. ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සහායක මධ්‍යස්ථානය

#### 2.6.4.1. අරමුණ

පළාත් පාලන ආයතනයන්හි අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම ඵලදායී ලෙස ඉටුකර ගැනීම සඳහා සහාය වන තාක්ෂණික හස්තය වශයෙන් ක්‍රියාත්මක වෙමින් සාර්ථක ක්‍රම පිළිබඳව තොරතුරු විසුරුවා හැරීමත්, විශේෂිත ස්ථාන සඳහා සුදුසු කසළ කළමනාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ මග පෙන්වීම.

#### 2.6.4.2. ප්‍රධාන කාර්යයන්

1. අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය අනුව ඉදිරි සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් පාලන ආයතන යොමු කිරීම.
2. පළාත් පාලන ආයතන සඳහා නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට අදාළ වන සුදුසු ව්‍යාපෘති හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම.
3. වැඩ අවසන් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිවල බිල්පත් නිරවුල් කිරීම සහ පසුවිපරම් කිරීම.
4. අපද්‍රව්‍ය කළමනාකරණ දත්ත පද්ධතියක් ස්ථාපනය කර යාවත්කාලීන කිරීම.
5. සියළුම පළාත් පාලන ආයතනවල 3R ක්‍රමවේදය ස්ථාපිත කිරීමට අවශ්‍ය උපදෙස් මගපෙන්වීම් ලබාදීම.
6. පළාත් පාලන ආයතනවල පවත්වාගෙන යන කොම්පෝස්ට් අංගනවල නිෂ්පාදන ධාරිතාවය සහ කොම්පෝස්ට් අලෙවිය ඉහළ නැංවීම සඳහා කටයුතු කිරීම.
7. පළාත් පාලන ආයතනවල ප්‍රතිචක්‍රීකරණය කළ හැකි කසළ කළමනාකරණය විධිමත් කිරීම තුළින් චක්‍රීය ආර්ථිකයක් කරා පළාත් පාලන ආයතන මෙහෙයවීම.
8. පළාත් පාලන ආයතනවල මළ අපජල පිරිපහදු පද්ධති ඉදිකිරීම තුළින් ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සහ පළාත් පාලන ආයතනවලින් පවත්වාගෙන යන පිරිපහදු පද්ධතිවල ධාරිතාව ඉහළ නැංවීම.
9. පළාත් මට්ටමේ අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රධාන සැලැස්ම සකස්කිරීම සඳහා මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කිරීම සහ තෝරාගත් පළාත් දෙකක අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රධාන සැලසුම් සකස් කිරීම.
10. පළාත් පාලන ආයතනවල ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු සාර්ථක කරගැනීම සඳහා දේශීය, විදේශීය රාජ්‍ය නොවන සංවිධාන සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.
11. අපද්‍රව්‍ය කළමනාකරණයට සම්බන්ධ සෙසු පාර්ශවකාර ආයතන විසින් සංවිධානය කරනු ලබන වැඩමුළු, සාකච්ඡා සඳහා සක්‍රීය දායකත්වය දැක්වීම.
12. පළාත් පාලන ආයතනවල ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ක්ෂේත්‍රයේ සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය සඳහා පුහුණු අවස්ථා ලබාදීම.
13. වෙරළ ආශ්‍රිතව ජනනය වන කසළ බැහැර කිරීම පිණිස ක්‍රමවේද හඳුනා ගැනීම.
14. පවතින කසළ කඳු පුනරුත්ථාපනය කිරීම සහ නව කසළ කඳු ඇතිවීම වළක්වා ගැනීම පිණිස ක්‍රියාමාර්ග ගැනීමට පළාත් පාලන ආයතන යොමුකිරීම.
15. පළාත් පාලන ආයතනවල ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු විධිමත් කිරීම සඳහා ''Clean Sri Lanka'' වැඩසටහනට සමගාමීව ක්‍රියාත්මක කළ යුතු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

**2.6.4.3. 2025.01.01 සිට 2025.12.31 දක්වා කාර්යසාධනය**

2025 වර්ෂය සඳහා ජාතික ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ සහායක මධ්‍යස්ථානය වෙත ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන් වෙනුවෙන් පහත වැය විෂයන් යටතේ ප්‍රතිපාදන වෙන් කර ඇත.

| අ.අ. | ව්‍යාපෘතියේ නම | 2025 ප්‍රතිපාදන (රු.) | 2025.12.31 දිනට වියදම (රු.) | භෞතික ප්‍රගතිය (%) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| 1 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය (130-2-21-016-2504) | රු.750,000,000 සටහන I | රු. 139,740,534.89 | 67 % | 19% |
| 2 | ගාල්ල හීන්පැන්දල කොම්පෝස්ට් නිම කිරීමේ අංගනය ඉදිකිරීම (130-2-21-029-2504) | රු.105,000,000 සටහන II | - | 33% | - |
| 3 | ශ්‍රී ලංකාවේ ඌව සහ උතුරු පළාත්වල තිරසාර ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සහ චක්‍රීය ආර්ථිකයක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය- KOICA (130-2-21-032-2504) | රු.138,000,000 | - | 15% | - |
| | **එකතුව** | **රු. 993,000,000** | **රු. 139,740,534.89** | **38%** | **14%** |

**සටහන I :**

මෙම 130-2-21-016-2504 ප්‍රතිපාදනය යටතේ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති සඳහා රු. 250,000,000 ලෙසත්, තෝරාගත් පළාත් පාලන ආයතනවල ද්‍රව්‍ය ප්‍රතිසාධන මධ්‍යස්ථාන (MRF) ඉදිකිරීම සඳහා රු. 500,000,000 ලෙසත් වෙන්කරනු ලැබිය. මෙම ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති සඳහා පළාත් පාලන ආයතන මඟින් ව්‍යාපෘති යෝජනා යොමුකරන ලද අතර ඒවා අතරින් තෝරාගත් අත්‍යවශ්‍ය ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු කැඳවා ශක්‍යතා අධ්‍යයන කටයුතු සිදුකර ක්‍රියාත්මක කරන ලදී.

තවද, ද්‍රව්‍ය ප්‍රතිසාධන මධ්‍යස්ථාන (MRF) ඉදිකිරීම සඳහා 2025 වර්ෂය වෙනුවෙන්

පහත සඳහන් පළාත් පාලන ආයතන තෝරා ගන්නා ලදී. ඒවායේ ස්ථානීය පරීක්ෂණ හා ශක්‍යතා අධ්‍යයන කටයුතු සිදුකර ක්‍රියාත්මක කරන ලදී.

| අ.අ. | පළාත | දිස්ත්‍රික්කය | පළාත් පාලන ආයතනය |
|---|---|---|---|
| 1 | උතුරු මැද | අනුරාධපුර | කැකිරාව ප්‍රාදේශීය සභාව |
| 2 | | පොළොන්නරුව | හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව |
| 3 | දකුණු | ගාල්ල | හබරාදූව ප්‍රාදේශීය සභාව |
| 4 | | ගාල්ල | මොන්රෝවියාවත්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය |
| 5 | | හම්බන්තොට | සූරියවැව ප්‍රාදේශීය සභාව |
| 6 | | හම්බන්තොට | තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව |
| 7 | බස්නාහිර | කොළඹ | කොලොන්නාව නගර සභාව |
| 8 | | ගම්පහ | වත්තල මාබෝල නගර සභාව |
| 9 | | කළුතර | පානදුර නගර සභාව |
| 10 | වයඹ | පුත්තලම | පුත්තලම මහ නගර සභාව |
| 11 | | පුත්තලම | හලාවත ප්‍රාදේශීය සභාව |
| 12 | | කුරුණෑගල | අලව්ව ප්‍රාදේශීය සභාව |
| 13 | ඌව | බදුල්ල | බදුල්ල ප්‍රාදේශීය සභාව |
| 14 | | මොණරාගල | වැල්ලවාය ප්‍රාදේශීය සභාව |
| 15 | | මොණරාගල | මොණරාගල ප්‍රාදේශීය සභාව |
| 16 | | මොණරාගල | කතරගම ප්‍රාදේශීය සභාව |

සණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති (130-2-21-016-2504) වෙනුවෙන් 2025 වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදන ලැබීම සිදුවූයේ 2025 අප්‍රේල් මාසයේදීය. එබැවින් ව්‍යාපෘති සැලසුම් කිරීම, ඇස්තමේන්තු සකස් කිරීම සහ ශක්‍යතා අධ්‍යයනය අවසන් කිරීමෙන් පසු බොහෝ ව්‍යාපෘති අනුමත කරනු ලැබුවේ තුන්වන කාර්තුවේ දීය. මේ හේතුවෙන් ප්‍රසම්පාදන හා ඉදිකිරීම් කටයුතු සඳහා ගතවන කාලය සමඟ සියළුම ව්‍යාපෘති සම්පූර්ණ කිරීමට ප්‍රමාණවත් කාලයක් නොමැති විය. එමෙන්ම, වර්ෂ අවසානයේදී දිවයිනටම බලපෑ දිට්වා සුළි කුණාටුවද ඉදිකිරීම් කටයුතු ප්‍රමාදවීමට බලපාන ලදී. ඒ අනුව, මෙම ව්‍යාපෘතිවල වැඩ අවසන් නොකළ ව්‍යාපෘති 2026 වර්ෂය සඳහා අවිච්ඡේද කර වැඩ අවසන් කිරීමට ලේකම්තුමාගේ අනුමැතිය ලබාගැනීම සඳහා යොමු කිරීමට කටයුතු කරමින් පවතී.

**සටහන II :**

මෙම 130-2-21-029-2504 වැය විෂය යටතේ සඳහන් ගාල්ල හීන්පැන්දල කොම්පෝස්ට් අංගනයේ කොම්පෝස්ට් නිමවුම් අංගනය ඉදිකිරීම ව්‍යාපෘතියෙහි අදාළ භූමිය සම්බන්ධයෙන් පැවති නඩු කටයුත්ත අවසන් වන තෙක් එහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට ප්‍රමාද විය. ඉන් අනතරුව, 2025.09.23 දිනැතිව ලංසු කැඳවන ලද නමුත්, තාක්ෂණික ඇගයුම් කමිටු වාර්තාවට අනුව ලංසු ඉදිරිපත් කරන ලද ලංසුකරුවන් දෙදෙනාම අදාළ අවශ්‍යතා සපුරා නොමැති වීම හේතුවෙන් ඉදිරිපත් කර ඇති ලංසු දෙකම ප්‍රතික්ෂේප කිරීමට ගාල්ල මහ නගර සභාව 2025.12.11 දින පැවති මහා සභා රැස්වීමේදී තීරණය කර ඇත. 2026 වර්ෂයේ දී මෙම ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන වෙන් වී ඇති අතර, එකී ඉදිකිරීම 2026 වර්ෂය තුළ නිම කිරීමට අපේක්ෂා කෙරේ.

එමෙන්ම, 2025 වර්ෂය සඳහා ජාතික සණ අපද්‍රව්‍ය කළමනාකරණ සහායක මධ්‍යස්ථානය වෙත පළාත් පාලන ආයතනවල සන අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු විධිමත් කිරීම සඳහා ‘‘Clean Sri Lanka’’ වැඩසටහන යටතේ පහත පරිදි ප්‍රතිපාදන වෙන් කරන ලදී. මෙම ව්‍යාපෘතිවල වැඩ අවසන් නොකළ ව්‍යාපෘති 2026 වර්ෂය සඳහා අවිච්ඡේද කර වැඩ අවසන් කිරීමට ලේකම්තුමාගේ අනුමැතිය ලබාගැනීම සඳහා යොමු කිරීමට කටයුතු කරමින් පවතී.

| අ.අ. | වැඩසටහන | වෙන් වු ප්‍රතිපාදනය | | වියදම (රු.) | භෞතික ප්‍රගතිය | මුල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|
| | | **2025** | **2026** | | | |
| 01 | තෝරාගත් පළාත් පාලන ආයතනවල ද්‍රව්‍ය ප්‍රතිසාධන මධ්‍යස්ථාන (MRF) ඉදිකිරීම සඳහා | රු. 158,400,000 | - | රු. 12,409,966.64 | 52% | 7.83% |
| 02 | තෝරාගත් පළාත් පාලන ආයතනවල සන අපද්‍රව්‍ය එකතු කිරීම, ප්‍රවාහනය හා බෙදා හැරීම සඳහා සම්පීඩක (Purchasing of Compactors) යන්ත්‍ර මිලදී ගැනීම සඳහා | රු.150,000,000 | රු.350,000,000 | රු.139,476,000.00 | 40% | 93% |
| 03 | තෝරාගත් පළාත් පාලන ආයතනවල යාන්ත්‍රික මළජල පිරිපහදු මධ්‍යස්ථාන ඉදි කිරීම. | රු. 137,000,000 | - | රු.1,042,400.00 | 38% | 0.76% |
| **එකතුව** | | **රු. 445,400,000** | **රු.350,000,000** | **රු.152,928,366.64** | **43%** | **34.33%** |

මීට අමතරව ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සහායක මධ්‍යස්ථානය විසින් පහත වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් පවතී.

| අ.අ. | වැඩසටහන/ව්‍යාපෘතිය | වර්තමාන තත්ත්වය |
|---|---|---|
| I. | JICA ආධාර යටතේ ක්‍රියාත්මක වන මළ අපජල පිරිපහදු පද්ධති මඟින් ඉවත් කරන පාංශු කළමනාකරණය කිරීමේ ව්‍යාපෘතියට අදාළ කටයුතු | 2025.07.24 දින ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන ඇත.<br>මෙම ව්‍යාපෘතියට අදාළව 2024 වර්ෂයේදී ද්වි පාර්ශ්වික සාකච්ඡා සටහන (ROD) අත්සන් කර ඇත.<br>ව්‍යාපෘතියේ උපදේශකවරුන් විසින් තෝරාගත් ස්ථානවල ක්ෂේත්‍ර පරීක්ෂා සිදු කර නියමු ව්‍යාපෘති සිදු කිරීමට සුදුසු ස්ථාන හඳුනාගෙන ඇත.<br>පළමු Joint Coordinating Committee රැස්වීම සහ Working Group රැස්වීම පවත්වා ඇත.<br>ව්‍යාපෘතියෙහි එක් ක්‍රියාකාරකමක් වන ජෛව ඝන ද්‍රව්‍යවල (bio solid) ශ්‍රී ලංකා ප්‍රමිති සකස් කිරීමට අදාළ මූලික සාකච්ඡා අවසන් කරන ලදී. |
| II. | අපද්‍රව්‍ය කළමනාකරණ දත්ත පද්ධතිය සකස් කිරීම. | පළාත් පාලන ආයතන 328 ක අදාළ දත්ත රැස්කර ඇත. |
| III. | එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) සහ කොකා-කෝලා පදනම (TCCF) විදේශ ආධාර මඟින් ක්‍රියාත්මක කරනු ලබන දකුණු, අග්නිදිග ආසියාව සහ පැසිෆික් - ශ්‍රී ලංකා කලාපයේ ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ UNDP වැඩසටහන සහ ප්ලාස්ටික් සඳහා චක්‍රලේඛ මැදිහත්වීම් ව්‍යාපෘතිය සම්බන්ධ කටයුතු සිදු කිරීම. | 2025.03.27 දින ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන ඇත. ව්‍යාපෘතියට අදාළ Inception Workshop පවත්වා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරෙන පළාත් පාලන ආයතන හඳුනාගෙන ඇති අතර ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. |
| IV. | යුරෝපානු සංගමයේ විදේශ ආධාර මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැඩිදියුණු කළ ජෛව විවිධත්වය සහ තිරසාර අපද්‍රව්‍ය කළමනාකරණය තුළින් තිරසාර ආර්ථික ප්‍රකෘතියක් ඇති කිරීමට ව්‍යාපෘතිය අදාළ සම්බන්ධ කටයුතු සිදු කිරීම. | 2025.01.24 දින ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන ඇත.<br>2025.09.04 දින මූල්‍ය ප්‍රදාන ගිවිසුම අත්සන් තැබීම සඳහා කැබිනට් අනුමැතිය ලබා ගෙන ඇත<br>2025.09.23 මූල්‍ය ගිවිසුම අත්සන් කරන ලදී.<br>2026 වර්ෂයේ ව්‍යාපෘතියේ ආරම්භ කිරීමේ මූලික කටයුතු සිදු කිරීමට නියමිතය. |
| V. | KOICA ආධාර යටතේ බදුල්ල, වවුනියාව යන දිස්ත්‍රික්ක සඳහා ඒකාබද්ධ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති ස්ථාපිත කිරීම සඳහා වූ ව්‍යාපෘතියේ ද්විපාර්ශ්වික ගිවිසුම අත්සන් කිරීම. | 2022.09.23 දින ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන ඇත.<br>2024.11.07 දින කැබිනට් අනුමැතිය ලබා ගෙන ඇත.<br>කොරියානු විශේෂඥ කණ්ඩායම් කිහිපයක් විසින් ශක්‍යතා අධ්‍යයනය, සමීක්ෂණ කිහිපයක් පවත්වා ඇත.<br>ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට KOICA ආයතනය විසින් ව්‍යාපෘති කළමනාකරණ උපදේශන (PMC) ආයතනයක් තෝරාගෙන ඇත |



නාඋල ප්‍රාදේශීය සභාවේ සේරුදණ්ඩාපොල කසළ වර්ගීකරණ හා ගබඩා කිරීමේ මධ්‍යස්ථානයක් ඉදි කිරීම ව්‍යාපෘතිය




බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ තිබ්බොට්ටාව කසළ කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා පොහොර හලන යන්ත්‍රයක් මිල දී ගැනීම



කාත්තන්කුඩි නගර සභාවේ ද්‍රව්‍ය ප්‍රතිසාධන මධ්‍යස්ථානය ඉදි කිරීම ව්‍යාපෘතිය

## 2.6.5. පාලන හා පුහුණු අංශය

### 2.6.5.1 පාලන හා පුහුණු අංශය

#### 2.6.5.1.1. අරමුණ

මානව සම්පත් කළමනාකරණය හා ධාරිතාවන් සංවර්ධන කිරීමට කුසලතාවයන් සපිරි නිලධාරී පිරිසක් බිහි කිරීම සහ පවත්නා භෞතික සම්පත් උපරිම ඵලදායිතාවයෙන් යොදා ගනිමින් පළාත් සභා හා පළාත් පාලන අංශයේ අපේක්ෂිත ඉලක්ක ලඟා කර ගැනීමට සම්පත් මෙහෙයවීම.

#### 2.6.5.1.2 ප්‍රධාන කාර්යයන්

**1. මානව සම්පත් කළමනාකරණය**

i. අනුමත කාර්යය මණ්ඩලය යාවත්කාලීන කිරීම.
ii. අවශ්‍යතාවය අනුව නව තනතුරු ඇති කිරීම.
iii. පෞද්ගලික ලිපිගොනු යාවත්කාලීන කිරීම, නිලධාරීන් විශ්‍රාම ගැන්වීමේ කටයුතු, ස්ථාන මාරුවලට අදාළ කටයුතු.
iv. ගරු අමාත්‍යතුමන්ලාගේ තාවකාලික කාර්යය මණ්ඩලය පත්කිරීමට අදාළ කටයුතු.

**2. *මානව සම්පත් සංවර්ධනය***

i. දේශීය හා විදේශීය පුහුණු කටයුතු සම්බන්ධීකරණය කිරීම.

**3. සාමාන්‍ය පරිපාලන කටයුතු**

i. උපයෝගී සේවාවන් සපයා ගැනීමට (ආරක්ෂක සේවා, සනීපාරක්ෂක සේවා) අදාළ කටයුතු.
ii. අමාත්‍යාංශයේ සියළුම වාහනවල ලියාපදිංචි කිරීම්, අනුයුක්ත කිරීම්, රක්ෂණය, නඩත්තුව, ඉන්ධන සම්බන්ධ කටයුතු හා සංචිත වාහන සැපයීමට අදාළ කටයුතු.
iii. තැපැල විධිමත්ව පවත්වාගෙන යාම.
iv. යන්ත්‍රෝපකරණ නඩත්තුව.
v. භාෂා පරිවර්තනයට අදාළ කටයුතු
vi. අමාත්‍යාංශයේ විෂය පථයට අයත් අංශ හා ආයතන කටයුතුවලට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ අමාත්‍ය මණ්ඩල ලේකම් වෙත යොමු කිරීම සහ අමාත්‍ය මණ්ඩල සංදේශ සම්බන්ධ නිරීක්ෂණ සැපයීම.
vii. රජයේ නිලධරයන් ආණ්ඩුවට අමතර සේවා ඉටුකිරීම වෙනුවෙන් වන දීමනා සම්බන්ධ කටයුතු , අතිකාල දීමනා, නිවාඩු දින වැටුප් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/93 අනුව හදිසි අනතුරු වන්දි සම්බන්ධයෙන් වන කටයුතු, නිල ඇඳුම් හා විවිධ ගෙවීම් වලට අදාළ කටයුතු.
viii. නිවාඩු, ගමන් වියදම්, දුම්රිය අනුග්‍රහ වාර ප්‍රවේශ පත්‍ර, ගිවිසුම් හා බැඳුම්කර, රාජ්‍ය සේවක ණය යෝජනා ක්‍රම, අග්‍රහාර රක්ෂණ ප්‍රතිලාභ ආදී පරිපාලන කටයුතු.
ix. රාජ්‍ය සේවයෙන් පරිබාහිර තනතුරු සඳහා මුදා හැරීමට අදාළ කටයුතු.
x. ජ්‍යෙෂ්ඨත්වයට හා විශ්‍රාම වැටුපට හානියක් නොවන පරිදි රාජ්‍ය නිලධරයන්ට දේශීය/විදේශීය වැටුප් රහිත නිවාඩු ලබාදීමට අදාළ කටයුතු
xi. මාණ්ඩලික නිලධාරී රැස්වීම් පැවැත්වීම හා ශ්‍රවණාගාරය වෙන්කිරීම් වලට අදාළ කටයුතු.
xii. ලේඛනාගාරය පවත්වා ගැනීමට අදාළ කටයුතු.
xiii. අමාත්‍යාංශ විමසීම් කවුළුව සහ දුරකථන හුවමාරුව විධිමත්ව පවත්වාගෙන යාම.

❖ **කාර්යය මණ්ඩලය**

2025.12.31 දිනට යාවත්කාලීන කරන ලද කාර්යය මණ්ඩල තොරතුරු පහත පරිදි වේ.

| අ.අ. | තනතුර | විශේෂීකරණය | පන්තිය /ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | සිටින සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|
| **ජ්‍යෙෂ්ඨ මට්ටම** | | | | | | |
| 1 | අතිරේක ලේකම් | පාලන හා පුහුණු | විශේෂ | 1 | 1 | 0 |
| 2 | අතිරේක ලේකම් | සංවර්ධන | විශේෂ | 1 | 1 | 0 |
| 3 | අතිරේක ලේකම් | පළාත් සභා හා පළාත් පාලන | විශේෂ | 1 | 1 | 0 |
| 4 | අධ්‍යක්ෂ ජනරාල් | ක්‍රමසම්පාදන | විශේෂ | 1 | 1 | 0 |
| 5 | ප්‍රධාන මූල්‍ය නිලධාරි | - | විශේෂ | 1 | 1 | 0 |
| 6 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | පාලන හා පුහුණු | 1 | 1 | 1 | 0 |
| 7 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | පළාත් පාලන | 1 | 1 | 1 | 0 |
| 8 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | පළාත් සභා | 1 | 1 | 1 | 0 |
| 9 | ප්‍රධාන ගණකාධිකාරි | - | 1 | 1 | 1 | 0 |
| 10 | ප්‍රධාන ගණකාධිකාරි | වියදම් විමංසන | 1 | 1 | 1 | 0 |
| 11 | ප්‍රධාන අභ්‍යන්තර විගණක | - | 1 | 1 | 1 | 0 |
| 12 | අධ්‍යක්ෂ | ඉංජිනේරු/ සංවර්ධන | 1 | 1 | 0 | 1 |
| 13 | අධ්‍යක්ෂ | ඉංජිනේරු/ ජා.ස.අ.ක.ස.ම | 1 | 1 | 1 | 0 |
| 14 | අධ්‍යක්ෂ | ක්‍රමසම්පාදන | 1 | 1 | 1 | 0 |
| 15 | ප්‍රධාන නීති නිලධාරි | - | 1 | 1 | 1 | 0 |
| 16 | සහකාර ලේකම් | පාලන හා පුහුණු | 111/11 | 1 | 1 | 0 |
| 17 | සහකාර ලේකම් | පළාත් සභා | 111/11 | 1 | 0 | 1 |
| 18 | සහකාර ලේකම් | පළාත් පාලන | 111/11 | 1 | 0 | 1 |
| 19 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ | ජා.ස.අ.ක.ස.ම | 111/11 | 1 | 1 | 0 |
| 20 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ | ව්‍යාපෘති | 111/11 | 1 | 0 | 1 |
| 21 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ | - | 111/11 | 2 | 3 | 0 |
| 22 | අභ්‍යන්තර විගණක | - | 111/11 | 2 | 1 | 1 |
| 23 | ගණකාධිකාරි | ගෙවීම් | 111/11 | 1 | 1 | 0 |
| 24 | ගණකාධිකාරි | සැපයුම් | 111/11 | 1 | 1 | 0 |
| 25 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ | ජා.ස.අ.ක.ස.ම | 111/11 | 1 | 1 | 0 |

| අ.අ. | තනතුර | විශේෂීකරණය | පන්තිය /ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | සිටින සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|
| 26 | ඉංජිනේරු | සංවර්ධන | 111/11 | 1 | 1 | 0 |
| 27 | නීති නිලධාරි | - | 111/11 | 1 | 0 | 1 |
| 28 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | 111/11 | 1 | 1 | 0 |
| තෘතීය මට්ටම | | | | | | |
| 29 | පරිපාලන නිලධාරි | - | අධිශ්‍රේණි | 1 | 0 | 1 |
| 30 | භාෂා පරිවර්තක | - | 1/ විශේෂ | 2 | 1 | 1 |
| 31 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි | - | 11/1 | 1 | 1 | 0 |
| ද්විතීය මට්ටම | | | | | | |
| 32 | සංවර්ධන නිලධාරි | - | 111/11/1 | 82 | 70 | 12 |
| 33 | තාක්ෂණ නිලධාරි | - | 111/11/1 | 1 | 1 | 0 |
| 34 | කළමනාකරණ සේවා නිලධාරී | - | 111/11/1 | 40 | 38 | 2 |
| 35 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | - | 111/11/1 | 2 | 2 | 0 |
| 36 | නිශ්චල ඡායාරූප ශිල්පී | - | 111/11/1 විශේෂ | 1 | 1 | 0 |
| 37 | කැමරා ශිල්පී | | 111/11/1 විශේෂ | 1 | 1 | 0 |
| ප්‍රාථමික මට්ටම | | | | | | |
| 38 | විදුලි කාර්මික | - | 111/11/1/විශේෂ | 1 | 1 | 0 |
| 39 | රියදුරු | - | 111/11/1/විශේෂ | 18 | 14 | 4 |
| 40 | සංචාරක බංගලා භාරකරු/ ප්‍රධාන සූපවේදී | - | 111/11/1/විශේෂ | 2 | 2 | 0 |
| 41 | කාර්යාල කාර්ය සහායක | - | 111/11/1/විශේෂ | 21 | 17 | 4 |
| 42 | අත් උදවුකරු | | 111/11/1/විශේෂ | 1 | 1 | 0 |
| 43 | සංචාරක බංගලා සහායක කණ්ඩලම සංචාරක බංගලාව | - | 111/11/1 | 1 | 1 | 0 |
| එකතුව | | | | **205** | **176** | **30** |

❖ **ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ කාර්යය මණ්ඩලය**

| අ.අ. | තනතුර | විශේෂීකරණය | පන්තිය /ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | සිටින සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|
| 1 | අතිරේක ලේකම් | ශ්‍රී.ලං.ප.සේ. | විශේෂ | 1 | 1 | 0 |
| 2 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප.සේ. | 1 | 1 | 1 | 0 |
| 3 | උපදේශක ඉංජිනේරු | කොන්ත්‍රාත් | - | 1 | 0 | 1 |
| 4 | ප්‍රසම්පාදන විශේෂඥ | කොන්ත්‍රාත් | - | 1 | 0 | 1 |
| 5 | සංවර්ධන නිලධාරි | - | 111/11/1 | 7 | 7 | 0 |
| 6 | කළමනාකරණ සේවා නිලධාරී | - | 111/11/1 | 2 | 2 | 0 |
| 7 | රියදුරු | - | 111/11/1/විශේෂ | 1 | 1 | 0 |
| 8 | කාර්යාල කාර්ය සහායක | - | 111/11/1/විශේෂ | 1 | 1 | 0 |
| **එකතුව** | | | | **15** | **13** | **2** |

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 (1) යටතේ දෙපාර්තමේන්තුගත පත්වීම් ලෙස බඳවාගෙන ඇතත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් කර නොමැති නිලධාරීන්

| | |
|---|---|
| කළමනාකරණ සහකාර | 18 |
| රියදුරු | 08 |
| කාර්යාල කාර්ය සේවක | 10 |
| **එකතුව** | **36** |

### 2.6.5.1.3 2025.01.01 සිට 2025.12.31 දක්වා කාර්යසාධනය

**<u>31.12.2025 දිනට වියදම් වාර්තාව</u>**

| අ.අ. | වියදම් වර්ගය | වැය විෂය | වැය ශීර්ෂය | ප්‍රතිපාදන (රු.) | මුළු වියදම (රු.) | ඉතිරිය (රු.) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|---|---|
| 01 | පුනරාවර්තන වියදම් | 130-1-19-000-1301-000 | වාහන අලුත්වැඩියාව | 23,500,000.00 | 23,495,200.90 | 4,799.10 | 99.97 |
| 02 | | 130-1-19-000-1302-000 | යන්ත්‍රෝපකරණ නඩත්තුව | 3,500,000.00 | 2,734,774.65 | 765,225.35 | 78.13 |
| 03 | | 130-1-19-000-1303-000 | ගොඩනැගිලි නඩත්තුව | 5,000,000.00 | 3,204,127.40 | 1,795,872.60 | 64.08 |
| 04 | | 130-1-19-000-1402-000 | තැපැල් සන්නිවේදන සේවාව | 4,500,000.00 | 4,461,378.15 | 38,621.85 | 99.14 |
| 05 | | 130-1-19-000-1403-000 | විදුලි සහ ජල සේවය | 14,000,000.00 | 12,751,216.54 | 1,248,783.46 | 91.08 |
| 06 | | 130-1-19-000-1405-000 | පවිත්‍රතා සේවය | 12,000,000.00 | 10,462,394.67 | 1,537,605.33 | 87.18 |
| 07 | | 130-1-19-000-1407-000 | ආරක්ෂක සේවය | 5,400,000.00 | 4,164,247.80 | 1,235,752.20 | 77.11 |

| අ.අ. | වියදම් වර්ගය | වැය විෂය | වැය ශීර්ෂය | ප්‍රතිපාදන (රු.) | මුළු වියදම (රු.) | ඉතිරිය (රු.) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|---|---|
| 08 | ප්‍රාග්ධන වියදම් | 130-1-19-000-2001-000 | ගොඩනැගිලි | 41,000,000.00 | 5,800,312.16 | 35,199,687.84 | 14.14 |
| 09 | | 130-1-19-000-2002-000 | යන්ත්‍රෝපකරණ නඩත්තුව | 2,000,000.00 | 116,820.00 | 1,883,180.00 | 5.84 |
| 10 | | 130-1-19-000-2003-000 | වාහන | 10,000,000.00 | 10,000,000.00 | - | 100 |
| 11 | | 130-1-19-000-2401-000 | කාර්යය මණ්ඩල පුහුණුව | 2,000,000.00 | 1,959,046.81 | 40,953.19 | 97.95 |
| 12 | | 130-1-19-000-1102-000 | විදේශීය පුහුණු | 2,500,000.00 | 2,333,334.51 | 166,665.49 | 93.33 |
| | **එකතුව** | | | **125,400,000.00** | **81,482,853.59** | **43,917,146.41** | |

### 2.6.5.2. නීති අංශය

#### 2.6.5.2.1 අරමුණ

රටේ සමස්ත ජනතාවගේ පොදු අපේක්ෂාවන් මුදුන්පත්වන ආකාරයට ඵලදායී වූද, කාර්යක්ෂම වූද ජනතාවාදී ප්‍රාදේශීය ආණ්ඩුකරණයක් ශ්‍රී ලංකාව තුළ පවත්වාගෙන යාම සහතික කරලීම සඳහාත්, සමානාත්මතාවයෙන් යුතු තිරසර මානව සංවර්ධනයක් ලඟා කර ගැනීම සඳහාත්, නෛතිකමය මඟපෙන්වීම සහ උපදෙස් ලබා දීම පිණිස අමාත්‍යාංශයේ නීති අංශය ස්ථාපිත කර ඇත.

#### 2.6.5.2.2. ප්‍රධාන කාර්යයන්

1. පළාත් පාලනය සහ පළාත් සභාවලට අදාළ ජාතික මට්ටමේ නීති සම්පාදන කාර්යය.
2. ප්‍රතිපත්ති සම්පාදන කාර්යයේදී අවශ්‍ය නෛතික උපදෙස් ලබාදීම.
3. පළාත් පාලන ආයතන/ පළාත් සභාවලට අදාළ අනු නීති සම්පාදන කටයුතුවල දී අවශ්‍යතාවය මත මාර්ගෝපදේශ සැපයීම් සහ සම්පත් දායකත්වය.
4. පළාත් පාලන ආයතන සංස්ථාපන ගැසට් නිවේදන ඇතුළු මධ්‍යම රජයේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් නිකුත් කළ යුතු නියෝග සම්බන්ධ කටයුතු.
5. අමාත්‍යාංශයට අදාළ ගිවිසුම් පරීක්ෂා කිරීම හා අදාළ නෛතික ගැටළුවලට උපදෙස් ලබාදීම.
6. පාර්ලිමේන්තු තේරීම් කාරක සභා/ උපදේශක කාරක සභා ආංශික අධීක්ෂණ කමිටුවලදී අමාත්‍යාංශය නියෝජනය කිරීම.
7. අමාත්‍යාංශය හා සම්බන්ධ නඩු කටයුතු සම්බන්ධව නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය/ පහළ අධිකරණ කටයුතු සම්බන්ධව අමාත්‍යාංශය වෙනුවෙන් පෙනී සිටීම. (මානව හිමිකම්/ ඔම්බුඩ්ස්මන් පැමිණිලි ඇතුළුව)
8. අමාත්‍යාංශයට අදාළ ගිවිසුම් පරීක්ෂා කිරීම හා අදාළ නෛතික ගැටළුවලට උපදෙස් ලබාදීම.

#### 2.6.5.2.3. 2025.01.01 සිට 2025.12.31 දක්වා කාර්ය සාධනය

**1.රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණවලට අනුව පළාත් පාලන ආයතන මැතිවරණ ආඥා පනත සංශෝධන.**

2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ දී ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය සහ ඡන්ද අපේක්ෂකත්වය ලැබීමේ අයිතිය අහිමි වී ඇති ඡන්ද දායකයින්ගේ මූලික ඡන්ද අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා රජයේ ප්‍රතිපත්තිමය මඟපෙන්වීම මත නාමයෝජනා නැවත කැඳවීමට අවශ්‍ය විධිවිධාන සලසාලීම සඳහා නීති කෙටුම්පත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදී. අදාළ පනත් කෙටුම්පත මේ වන විට පාර්ලිමේන්තුවේ සම්මත කර ඇත.

**2.රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණවලට අනුව පළාත් සභා මැතිවරණ පනතට සංශෝධන**

පළාත් සභා මැතිවරණය 2017 අංක 17 දරන පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත පැනවීමට පෙර ක්‍රියාත්මක වූ ''සමානුපාතික නියෝජන ක්‍රමය'' යටතේ පැවැත්වීමට හැකියාව සැලසෙන පරිදි නීති කෙටුම්පත් කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙත උපදෙස් ලබා දීම පිණිස ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා 2025.01.06 දින අමාත්‍ය මණ්ඩල සංදේශයක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.

**3.පළාත් පාලන ආයතන වල ස්වයං උත්පාදන ආදායමෙන් වැඩි ප්‍රතිශතයක් ආවරණය කරන උසාවි දඩ මුදල්, මුද්දර ගාස්තු සෘජුවම පළාත් පාලන ආයතනයේ ගිණුමට යොමුවන පරිදි පළාත් සභා පනතේ ඉදිරි සංශෝධන කටයුතු අවසන් කිරීම.**

මේ සම්බන්ධව අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලද අතර මෙම කරුණ තවදුරටත් සලකා බැලීම සඳහා කමිටුවක් පත් කරන ලෙස උපදෙස් දී ඇත. ඒ අනුව පත් කරන ලද කමිටුවේ කටයුතු මේ වන විට අවසන් කර ඇති අතර, එහිදී උසාවි දඩ මුදල් නියමිත කාලසීමාව තුළ දී පළාත් පාලන ආයතනවල ගිණුමට බැර නොවීමට හේතු වී ඇති ප්‍රායෝගික ගැටළු, මුද්දර ගාස්තු නියමිත කාලසීමාව තුළ දී පළාත් පාලන ආයතන අරමුදල වෙත නොලැබීයාමට බලපා ඇති හේතු හා එම දුෂ්කරතා මඟහරවා ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳව ද සකස් කරන ලද වාර්තාව ඉදිරියේදී අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට නියමිතය.

**4.ජලභීතිකා ආඥා පනතේ සංශෝධන කටයුතු අවසන් කිරීම.**

අමාත්‍ය මණ්ඩලයේ උපදෙස් පරිදි නීතිපතිවරයාගේ උපදෙස් ලබාගත් අතර, එකී උපදෙස් ඇතුළත් කර අවසන් පනත් කෙටුම්පත සකස් කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙත ඉදිරිපත් කරන ලදී.

**5.පළාත් පාලන ආයතන සඳහා හඳුන්වා දී ඇති නව ගිණුම් ක්‍රමයට අදාල රීති සකස් කිරීමේ වැඩසටහන**

අමාත්‍යාංශ ලේකම් විසින් පත්කරන ලද විද්වත් කමිටුවක නිර්දේශ පරිදි සකස් කරන ලද පළාත් පාලන ආයතන සඳහා වූ මූල්‍ය හා පරිපාලන රීති සහ නියෝග සංග්‍රහයේ මෘදු පිටපත අවශ්‍ය නම් ඒ ඒ පළාතේ අවශ්‍යතාවය පරිදි සකස් කරගෙන 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනත සමඟ කියවිය යුතු මහා නගර සභා ආඥා පනතේ 289, නගර සභා ආඥා පනතේ 193 සහ 194, ප්‍රාදේශීය සභා පනතේ 171 සහ 184 වගන්තිවල ප්‍රතිපාදන ප්‍රකාර එක් එක් පළාතේ ක්‍රියාත්මක විය යුතු අනු නීති ලෙස ගැසට් නිවේදනයක් මඟින් ප්‍රකාශ කිරීමට අවශ්‍ය පියවර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරවරුන් සහ ප්‍රධාන ලේකම්වරුන් වෙත යොමුකර ඇත.

**6.මහා නගර සභා ආඥා පනත, නගර සභා ආඥා පනත සහ ප්‍රාදේශීය සභා පනත සංශෝධන කෙටුම්පත් සකස් කිරීම.**

මහා නගර සභා ආඥා පනත, නගර සභා ආඥා පනත සහ ප්‍රාදේශීය සභා පනත සංශෝධනය කිරීම සඳහා මෙම අමාත්‍යාංශය ඉදිරිපත් කරන ලද සංශෝධන යෝජනාවලිය පදනම් කරගෙන නීති කෙටුම්පත් සම්පාදක විසින් මේ වන විට සකස් කර ඇති පනත් කෙටුම්පත්වල අන්තර්ගතය සමාලෝචනය කර, වත්මන් රජයේ ප්‍රතිපත්ති සමඟ අනුගත වන්නේද සොයා බැලීමට සහ තවදුරටත් සංශෝධනය වියයුතු තැන් වේනම් ඒවා හඳුනාගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද කමිටුවෙහි කටයුතු අවසන් කරන ලදී. එම කමිටුවේ නිර්දේශ මත සකස් කරන ලද අවසන් වාර්තාව අමාත්‍ය මණ්ඩලයේ උපදෙස් පරිදි ඉදිරි කටයුතු සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර ඇත.



පළාත් පාලන ආයතන ප්‍රධාන අණපනත් සංශෝධන කෙටුම්පත් සමාලෝචනය කර නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පත් කරන ලද කමිටුවේ වාර්තාව රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්තුමා වෙත භාර දීම

### 2.6.5.3. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයට අදාළ තොරතුරු

#### 2.6.5.3.1. අරමුණ

පළාත් පාලන ආයතනවලින් සපයන මහජන සේවාවන් මාර්ගගත ක්‍රමය ඔස්සේ සපයමින් මහජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමට කටයුතු කිරීම හා තොරතුරු තාක්ෂණය භාවිතයෙන් අමාත්‍යාංශයේ රාජකාරී කටයුතු පහසු කිරීමට සහාය වෙමින් කඩදාසිවලින් තොර පරිසරයක් පවත්වාගෙන යාමට කටයුතු කිරීම.

#### 2.6.5.3.2. ප්‍රධාන කාර්යයන්

1. වෙබ් අඩවි කළමනාකරණය: පරිශීලකයින්ට අදාළ තොරතුරු සැපයීම සඳහා අමාත්‍යාංශයේ වෙබ් අඩවිය නිතිපතා යාවත්කාලීන කිරීම.
2. දත්ත සමුදාය සකස් කිරීම: අත්‍යවශ්‍ය දත්ත රැස් කිරීම සඳහා දත්ත සමුදායන් සංවර්ධනය කිරීම සහ කළමනාකරණය කිරීම.
3. ජාල පද්ධති නඩත්තුව: අමාත්‍යාංශයේ ජාල පද්ධතිය ප්‍රතිස්ථාපනය කිරීම සහ නඩත්තු කිරීම, අධීක්ෂණය කිරීම.
4. තොරතුරු තාක්ෂණ සහාය: අමාත්‍යාංශයේ අනෙකුත් විවිධ අංශ සඳහා තොරතුරු තාක්ෂණ සහාය ලබා දීම.
5. LGN 2.0 ව්‍යාපෘති අධීක්ෂණය: පළාත් පාලන ආයතන සඳහා ඩිජිටල් පාලනය වැඩිදියුණු කිරීම අරමුණු කරගත් පළාත් පාලන ජාල 2.0 (LGN 2.0) ව්‍යාපෘතිය අධීක්ෂණය සහ සම්බන්ධීකරණය කිරීම.
6. කඩදාසි භාවිතයෙන් තොර පරිසරය: අමාත්‍යාංශය තුළ කඩදාසි රහිත පරිසරයක් ප්‍රවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම.
7. පුහුණු වැඩසටහන්: තොරතුරු තාක්ෂණය පිළිබඳ අමාත්‍යාංශයේ සියළුම කාර්ය මණ්ඩලයේ දැනුම වැඩිදියුණු කිරීම සඳහා තොරතුරු තාක්ෂණ පුහුණු සැසි පැවැත්වීම.
8. මෘදුකාංග සංවර්ධනය: ක්‍රියාවලීන් විධිමත් කිරීම සහ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා විවිධ අංශ සඳහා අභිරුචි මෘදුකාංග විසඳුම් සංවර්ධනය කිරීම.

#### 2.6.5.3.3. 2025.01.01 සිට 2025.12.31 දක්වා කාර්යසාධනය

| කාර්යයන් | 2025.12.31 දක්වා ප්‍රගතිය |
|---|---|
| පළාත් පාලන ආයතන සපයන සේවා සඳහා තොරතුරු තාක්ෂණික විසඳුම් ලබාදීමට සකස් කරන ලද Empowering Local Government - A Comprehensive Digitalization Project for Local Government ව්‍යාපෘතිය | <br><br>මෙම ව්‍යාපෘතියට වෙබ් අඩවි දෙකකින් යුත් මෘදුකාංග පද්ධතියක් අයත්වේ. |

| Module | Main Category | Sub Category | Status | Task and final date to completes |
|---|---|---|---|---|
| Module 1 | System Administration | User Management | Completed | |
| | | Tax / Other Rate Management | | |
| | | Day End Process | | |
| | | Month End Process | | |
| | | Year End process | | |
| | | Migration Data | On going | |
| | Revenue Management | Assessment Tax | Payment process completed | |
| | | Mix Income | Completed | |
| | Online Payment | Online Payment | Completed | |
| Module 2 | Revenue Management | Shop Rentals | Compete | |
| | | Online Booking | Completed | |
| | | Trade Tax (Business Tax) | | 2026-12-31 |
| | | Industrial Tax | | |
| | | Watter Billing System | | |
| Module 3 | Certificates and Licenses | Business License | | |
| | | Environment License | | |
| | | Street Line certificate | | |
| | | BOP (block out of Plan) | | |
| | | Certificate of Completion | | |
| | | Budling Permit | | |
| Module 4 | Other Applications | Fixed Asset Management stores | | |
| | | Street Lamp Management | | |
| | | Parking Management | Software Completed. Need testing and adjustments | |
| | | Management of Grievances | Software Completed. Need testing and adjustments | |

මහජනතාවට elgservices.lk මඟින් පළාත් පාලන ආයතනවලට කරන ගෙවීම් (වරිපනම්, කඩකුලි ආදිය) හා වෙන්කරගැනීම් මාර්ගගත ක්‍රමය ඔස්සේ නිවසේ සිටම ඉටුකර ගතහැකි පරිදි සකස් කර ඇත.

apps.elgservices.lk පළාත් පාලන ආයතනවල සියළුම ගිණුම් කටයුතු සඳහා සකස් කර ඇති අතර මෙමගින් පාරිභෝගිකයින් සඳහා ලදුපත් නිකුත් කිරීමේ සිට අවසාන ගිණුමට අවශ්‍ය වාර්තා ලබා ගැනීම දක්වා කාර්යයන් සිදුකළ හැක.

දැනට පළාත් 6 ක ක්‍රියාත්මක වන මෙම පද්ධතිය මධ්‍යම පළාතේ පළාත් පාලන ආයතන 40 කත්, නැගෙනහිර පළාතේ පළාත් පාලන ආයතන 19 කත්, සබරගමුව පළාතේ පළාත් පාලන ආයතන 28 කත්, බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන 03 කත්, දකුණු පළාතේ පළාත් පාලන ආයතන 29 කත්, ඌව පළාතේ පළාත් පාලන ආයතන 02 කත් ක්‍රියාත්මක වේ. ඒ අනුව මුළු පළාත් පාලන ආයතන ගණන 121 ක් වේ.




තවද elgservices.lk වෙබ් අඩවිය මඟින් මාර්ගගත ගෙවීම් ලබා ගැනීම සඳහා ලංකා බැංකුවේ සහ මහජන බැංකුවේ Payment Gateway සම්බන්ධ කර ඇත.




තවද, මේ වන විට මධ්‍යම පළාතේ පළාත් පාලන ආයතන 40 කට හා සබරගමු පළාතේ පළාත් පාලන ආයතන 16 කට දකුණු පළාත් පාලන ආයතන 10 කට මාර්ගගත ගෙවීම් ලබා ගැනීම සඳහා Payment Gateway පහසුකම බැංකු සමඟ සම්බන්ධ වි ලබා දී ඇත.




සාමාන්‍යයෙන්, එක් පළාත් පාලන ආයතනයක් සඳහා මෙවැනි වෙනත් මෘදුකාංග ස්ථාපනයක් සඳහා ලක්ෂ 70 ක් වැය වේ. ඒ අනුව, ඉහත සඳහන් පළාත් පාලන ආයතන 121 විසින් දැනට රජයට ඉතිරි කර ඇති මුදල (ලක්ෂ 121 x 70) රුපියල් ලක්ෂ 8470 කි.

පළාත් පාලන ආයතන සපයන සේවා සඳහා තොරතුරු තාක්ෂණික විසඳුම් ලබාදීමට සකස් කරන ලද ව්‍යාපෘතියට අදාළව සිදුකරන ලද වැඩමුළු පහත පරිදි පවත්වා ඇත.

2025.04.01 සිට 2025.04.05 දක්වා මධ්‍යම පළාත් සභාවේ ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේදී
2025.01.23 දින ඌව පළාත් සභාවේදී
2024.12.25 සිට 2024.12.26 දක්වා දකුණු පළාත් සභාවේදී

එපමණක් නොව, මෙම මෘදුකාංගය භාවිතා කිරීම පිළිබඳ විවිධ විමසීම් සහ ගැටළු යොමු කිරීමට සහ විවිධ උපදෙස් සහ පිළිතුරු සැපයීම සඳහා WhatsApp කණ්ඩායම් 6 ක් නිර්මාණය කර ඇති අතර දැනට ගැටළු 2000 කට අධික සංඛ්‍යාවක් සඳහා පිළිතුරු ලබා දී ඇත.

<table>
<tr>
<td>රජයේ ඩිජිටල්කරණ ප්‍රතිපත්තියට සමගාමීව අමාත්‍යාංශයේ නිලධාරීන් සඳහා නිවාඩු ලබා ගැනීමට අදාළව නිවාඩු කළමනාකරණ මෘදුකාංග පද්ධතියක් භාවිතා කිරීම.</td>
<td>අමාත්‍යාංශයේ නිලධාරීන් සඳහා නිවාඩු ලබා ගැනීමට අදාළ දත්ත පද්ධතියක් තොරතුරු තාක්ෂණ අංශය මඟින් සකස් කර ඇත.



</td>
</tr>
<tr>
<td>දෘඪාංග සහ මෘදුකාංග ගැටළු ඇතුළු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආශ්‍රිත කරුණු සඳහා සහාය වීම.</td>
<td>දෘඪාංග සහ මෘදුකාංග ගැටළු සහිත නඩත්තුගත පරිගණක සංඛ්‍යාව හා නඩත්තුගත printers සංඛ්‍යාව = 162<br>එමඟින් රජයට ඉතිරි කර දුන් මුදල = රු. 1,292,000.00</td>
</tr>
<tr>
<td>අමාත්‍යාංශයේ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම.</td>
<td>තොරතුරු තාක්ෂණ අංශයට එවා ඇති සියලුම තොරතුරු දින පදනම මත යාවත්කාලීන කර ඇත.



</td>
</tr>
</table>

| | |
|---|---|
| අමාත්‍යාංශයේ ෆේස්බුක් පිටුව යාවත්කාලීන කිරීම. | තොරතුරු තාක්ෂණ අංශයට එවා ඇති සියලුම තොරතුරු දින පදනම මත යාවත්කාලීන කර ඇත. |
| අමාත්‍යාංශය සේවාදායකය (Server) නඩත්තු කිරීම. | සේවාදායකයට අදාළ ක්‍රියාකාරකම්, වසම් පාලකය, ක්‍රියාකාරී නාමාවලිය සහ ගොනු සේවාදායකය සැකසීම සහ වින්‍යාස කිරීම. |
| අමාත්‍යාංශය තුළ කඩදාසි භාවිතයෙන් තොර පරිසරයක් පවත්වා ගැනීම. | i. නිවාඩු කළමනාකරණ මෘදුකාංග පද්ධතිය සකස් කර ඉදිරි කටයුතු සඳහා පාලන අංශය වෙත භාර දී භාර දී ඇත.<br>ii. ලේඛණාගාරය සඳහා මෘදුකාංග පද්ධතිය<br>iii. තැපැල කළමනාකරණ මෘදුකාංග පද්ධතිය<br>iv. වාහන කළමනාකරණ මෘදුකාංග පද්ධතිය<br>v. ගැටලු කළමනාකරණ පද්ධතිය<br>vi. ලිපි ගොනු කළමනාකරණ පද්ධතිය<br>vii. අමාත්‍යාංශ රැස්වීම් කළමනාකරණ පද්ධතිය<br>viii. පුස්තකාල කළමනාකරණ පද්ධතිය සකස් කර ඉදිරි කටයුතු සඳහා පාලන අංශය වෙත භාර දීම. |
| Zoom රැස්වීම් සඳහා යොමු සකස් කිරීම හා තාක්ෂණික සහාය ලබා දීම. | සකස් කරන ලද zoom යොමු ගණන = 153<br>සහභාගී වූ zoom / භෞතික රැස්වීම් ගණන = 170 |
| අමාත්‍යාංශය නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම. | කාර්යාල කටයුතු කාර්යක්ෂම කිරීම සඳහා AI තාක්ෂණය භාවිතය පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම. |

## 2.6.6. මූල්‍ය අංශය

### 2.6.6.1.අරමුණ

පළාත් සභා සහ පළාත් පාලන අංශයේ දැක්ම හා මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය මූල්‍යමය පහසුකම් සපයා දීම හා දේශීය සහ විදේශීය අරමුදල් ඵලදායීව හා කාර්යක්ෂමව යොදා ගනිමින් මහජන මුදල් පිළිබඳව විනිවිදභාවයකින් යුතුව කටයුතු කිරීම.

### 2.6.6.2. ප්‍රධාන කාර්යයන්

1. විසර්ජන පනත මඟින් වෙන්කරනු ලැබූ මුදල් හා විදේශ ව්‍යාපෘති යටතේ වෙන්කරන ලද මුදල් එම වෙන්කරන ලද කාර්යයන් සඳහා ම යොදවා ගනිමින් ද එසේ වෙන්කරන ලද මුදලේ අතිරික්තයක් වේ නම් වෙනත් අවශ්‍ය කාර්යයක් සඳහා මාරුකිරීම තුළින් සියළුම මුදල් අරපිරිමැස්මෙන් වියදම් කර ඒ පිළිබඳ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු අවසාන ගිණුම (මූල්‍ය ප්‍රකාශන) නියමිත දිනට ඉදිරිපත් කිරීම.
2. පළාත් සභා සහ පළාත් පාලන අංශයේ අරමුණු හා ඉලක්ක සපුරාගැනීම පිණිස අවශ්‍ය භෞතික සම්පත් ප්‍රමාදයකින් තොරව ලබාදීම හා සියළුම වත්කම් නිසි පරිදි කළමනාකරණය කිරීම.
3. දේශීය සහ විදේශීය ව්‍යාපෘතිවල ගිණුම් වාර්තා, මාසිකව, කාර්තුමය සහ වාර්ෂික වශයෙන් භාණ්ඩාගාරයට නිසි වේලාවට ඉදිරිපත් කර කලට වේලාවට අරමුදල් ලබා ගැනීම.
4. අත්තිකාරම් බී ගිණුම යටතේ වෙන්වන ප්‍රතිපාදන මඟින් රජයේ නිලධාරීන්ට ප්‍රමාදයකින් තොරව අවශ්‍ය ණය හා අත්තිකාරම් මුදල් ලබාදීමට කටයුතු කිරීම සහ ඒ සඳහා වූ ගිණුම් නියමිත දිනට පෙර ඉදිරිපත් කිරීම.
5. පළාත් සභා සහ පළාත් පාලන අංශයට අවශ්‍ය වන භාණ්ඩ සහ උපකරණ මිලදී ගැනීමේදී මෙන්ම පළාත් පාලන බල ප්‍රදේශවල සංවර්ධන හා යටිතල පහසුකම් සැපයීමේ කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සහ යන්ත්‍රෝපකරණ මිලදී ගැනීමේදී ඒ සඳහා වූ ප්‍රසම්පාදන ක්‍රියාවලිය විනිවිද භාවයකින් හා කාර්යක්ෂමව ඉටු කිරීම.
6. විගණකාධිපතිගේ විගණන විමසුම්වලට සහ අභ්‍යන්තරික වශයෙන් පැන නැගුණ විගණන විමසුම්වලට අප්‍රමාදව ප්‍රතිචාර දැක්වීම හා අනාවරණය කෙරෙන අඩුපාඩු නිවැරදි කරගැනීමට අප්‍රමාදව කටයුතු කර තිබීම සහ රාජ්‍ය ගිණුම්කාරක සභා අවස්ථාවට අවශ්‍ය අවස්ථාවන්හි දි පෙනී සිටීම.
7. පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල ක්‍රියාත්මක වන විවිධ සංවර්ධන කටයුතු සහ සේවාවන් සඳහා අප්‍රමාදව මුදල් නිදහස් කිරීම.
8. සිවිල් කොන්ත්‍රාත්තු, උපදේශන සේවා ඇතුළු කාර්යයන් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවලට අවශ්‍ය මූල්‍ය උපදෙස් ලබාදීම.

### 2.6.6.3. 2025.01.01 සිට 2025.12.31 දක්වා කාර්යසාධනය

- **මූල්‍ය කාර්යසාධනය - 2025**

**(රු.මිලියන)**

| ප්‍රගතිය | 2025 සංශෝධිත ඇස්තමේන්තුව | මූල්‍ය ප්‍රගතිය | ශේෂය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| පළාත් සභා සහ පළාත් පාලන අංශය | 24,154 | 14,089 | 10,065 |
| % | | 58.33 | 41.67 |

- **වියදම් වර්ගය අනුව සැසඳුම් සාරාංශය - 2025.12.31**




**(රු.මිලියන)**

| විස්තරය | 2025 සංශෝධිත ඇස්තමේන්තුව | වියදම් වාර්තාව | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|
| පුනරාවර්තන | 375,000,000 | 334,376,812 | **89.17** |
| ප්‍රාග්ධන | 23,778,600,000 | 13,754,655,956 | **57.84** |
| | | | |
| **එකතුව** | **24,153,600,000.0** | **14,089,032,768.0** | **58.33** |



### 2.6.7. වියදම් විමංසන අංශය

#### 2.6.7.1. අරමුණ

පළාත් සභා හා පළාත් පාලන ආයතනවල මූල්‍ය කටයුතු සම්බන්ධීකරණය හා විමංසනය කිරීම.

#### 2.6.7.2. ප්‍රධාන කාර්යයන්

1. පළාත් සභා හා පළාත් පාලන ආයතන සම්බන්ධ ගැටළු විසඳීම සඳහා සම්බන්ධීකරණය.
2. පළාත් සභා වෙත මධ්‍යම රජය විසින් වාර්ෂිකව දෙනු ලබන ප්‍රදානයන් හා පළාත් සභා විසින් උපයනු ලබන ආදායම් එම ආයතන විසින් උපයෝගී කරගනු ලබන ආකාරය පිළිබඳ අඛණ්ඩ ඇගයීම් කිරීම හා වාර්තාකරණය
3. පළාත් පාලන ආයතන වෙත මධ්‍යම රජය විසින් වාර්ෂිකව දෙනු ලබන ප්‍රදානයන් හා පළාත් පාලන ආයතන විසින් උපයනු ලබන ආදායම් එම ආයතන විසින් උපයෝගී කරගනු ලබන ආකාරය පිළිබඳ අඛණ්ඩ ඇගයීම් කිරීම හා වාර්තාකරණය.
4. ආමාත්‍යාංශය විසින් පළාත් සභා හා පළාත් පාලන ආයතන වෙත ලබා දී ඇති වාහන පැවරීම/ අනතුරු ඒ හා සම්බන්ධිත කාර්යයන් ඉටු කිරීම/ සම්බන්ධීකරණය කිරීම.
5. විවිධ රාජ්‍ය ආයතන, ව්‍යවස්ථාපිත ආයතන හා බාහිර පාර්ශවයන් විසින් පළාත් සභා හා පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් ඉල්ලුම් කරන දත්ත හා තොරතුරු ලබා දීම.
6. පළාත් සභා මූල්‍ය කටයුතු සමාලෝචනය
7. පළාත් පාලන ආයතනවල මූල්‍ය හා භෞතික තොරතුරු සම්බන්ධ කළමනාකරණ තොරතුරු පද්ධතිය, දත්ත විශ්ලේෂණ හා දෘශ්‍යකරණ ඒකකය හා ඒකාබද්ධව විමංසනය කිරීම.

#### 2.6.7.3. 2025.01.01 දින සිට 2025.12.31 දින දක්වා කාර්ය සාධනය

1. 2024 අවසන් කාර්තුව සහ 2025 වර්ෂය තුළදී ද මධ්‍යම රජය විසින් දෙනු ලබන ප්‍රදානයන් හා පළාත් සභා ආදායම් ඇස්තමේන්තුගත වියදම් සීමාවන්ට යටත්ව එම ආයතන විසින් වියදම් කරනු ලබන ආකාරය පිළිබඳව අඛණ්ඩ ඇගයීමක් කරගෙන යනු ලබයි. 2024 වර්ෂයේ වාර්ෂික මූල්‍ය කාර්යසාධන වාර්තාව, 2025 පළමු හා දෙවන කාර්තු සඳහා පළාත් සභා මූල්‍ය කාර්යසාධන කාර්තු වාර්තා සකස් කර අවසන් අතර 2025 තෙවන කාර්තුව සඳහා පළාත් සභා මූල්‍ය කාර්ය සාධන කාර්තු වාර්තාව සකස් කරමින් පවතී.
2. පළාත් සභා හා පළාත් පාලන ආයතනවල සේවක සංඛ්‍යා සම්බන්ධයෙන් පවත්වා ගෙන යනු ලබන දත්ත පදනම 2025 වර්ෂය සඳහා යාවත්කාලීන කර ඇත.
3. පළාත් පාලන ආයතනයන්හි වර්ෂයේ ආදායම් හා වියදම් පිළිබඳ තොරතුරු ඇතුළත් දත්ත පදනම 2025 වර්ෂයට අදාළව වාර්ෂිකව යාවත්කාලීන කරන ලද අතර, එම තොරතුරු විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව පළාත් පාලන ආයතනවල මූල්‍ය කාර්යසාධනය සම්බන්ධ 2024 වාර්ෂික වාර්තාව සහ 2025 අර්ධ වාර්ෂික වාර්තාව සකස් කර සියළුම පළාත් පාලන කොමසාරිස්වරුන් වෙත යවා ඇත. පළාත් පාලන ආයතන වන මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභාවල පොදු පහසුකම් සහ වාහන පිළිබඳ තොරතුරු රැස්කර එම තොරතුරු අදාළ වාර්තාවට ඇතුළත් කිරීමට කටයුතු කර ඇත.
4. අමාත්‍යාංශයේ මෙහෙයවීම යටතේ ක්‍රියාත්මක වන විදේශාධාර ව්‍යාපෘතීන්හි මූල්‍ය කාර්ය සාධනය හා සම්බන්ධ තොරතුරු මාසිකව ලබා ගෙන එම තොරතුරු පළාත් සභා මූල්‍ය කාර්ය සාධන වාර්තාවට ඇතුළත් කිරීමට කටයුතු කර ඇත.
5. අදාළ පාර්ශව සම්බන්ධීකරණය කරමින් පළාත් සභා මූල්‍ය කටයුතුවල දී ඇතිවන ගැටළු සහ අඩුපාඩු සාකච්ඡා කර ඒ සඳහා විසඳුම් යෝජනා ගැනීමේ අරමුණින්, පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්) රැස්වීම පැවැත්වීමට කටයුතු කර ඇත.
6. පළාත් සභාවන්හි හා ඒ යටතේ ඇති ආයතනවල මූල්‍ය කටයුතු විමංසනය කිරීමේ අරමුණින් විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම, විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම, බැංකු සැසඳුම් පිළියෙළ කිරීම, අත්තිකාරම් ගිණුම් සැසඳීම, අග්‍රිම ගිණුම් සැසඳීම යනා දී කටයුතු සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් විශේෂයෙන් සකසා යවනු ලැබූ ආකෘති පත්‍ර මඟින් ගෙන්වා ගත් දත්ත සමාලෝචනය කර 2024 වර්ෂයේ අවසන් කාර්තුව සඳහා මූල්‍ය සමාලෝචන කාර්තු වාර්තා සකස් කර අදාළ පාර්ශව වෙත ඉදිරිපත් කර ඇත. එලෙසම 2025

වර්ෂයේ පළමු හා දෙවන කාර්තු වාර්තා සහ 2025 තුන්වන කාර්තුව සඳහා පළාත් බහුතරයකට අදාළව මූල්‍ය සමාලෝචන කාර්තු වාර්තා සකස් කර අදාළ පාර්ශව වෙත ඉදිරිපත් කර ඇත.

7. පළාත් පාලන ආයතනවල මූල්‍ය හා භෞතික තොරතුරු සම්බන්ධ කළමනාකරණ තොරතුරු පද්ධතිය, දත්ත විශ්ලේෂණ හා දෘශ්‍යකරණ ඒකකය හා ඒකාබද්ධව විමංසනය කර ඇත.
8. අමාත්‍යාංශය විසින් පළාත් පාලන ආයතන වෙත ලබා දී ඇති වාහන පැවරීමට කටයුතු කර ඇත.
9. ජාතික විගණන කාර්යාලය විසින් අමාත්‍යාංශය නමින් ලියාපදිංචි නමුත් අස්ථානගත බවට හඳුනාගත් වාහන 37 ක තොරතුරු දන්වා තිබිණි. ඉන් බහුතරයක් වාහන, භාරයේ පවතින පළාත් පාලන ආයතන හඳුනාගෙන පැවරීමට අදාළ කටයුතු කර ඇත.
10. පළාත් පාලන ආයතනවල 2025 වර්ෂයේ අයවැය ලේඛන සහ 2024 වර්ෂයේ අවසන් ගිණුම් වාර්තා දත්ත ඇතුළත් දත්ත පදනමක් පවත්වාගෙන යාමට කටයුතු කර ඇත.
11. පළාත් සභා හා පළාත් පාලන ආයතනවල මූල්‍ය තොරතුරු ඉල්ලා සිටි ආයතන හා පාර්ශවයන් වෙත ලබා දීමට කටයුතු කර ඇත.




පළාත් සභා හා පළාත් පාලන ආයතන මූල්‍ය කාර්යසාධන වාර්තා - 2025

### 2.6.8. අභ්‍යන්තර විගණන අංශය

#### 2.6.8.1. අරමුණ

අමාත්‍යාංශයේ අපේක්ෂිත අරමුණු ළඟා කර ගැනීමේදී භෞතික හා මානව සම්පත් කාර්යක්ෂම සහ ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා වන සාර්ථක අභ්‍යන්තර පාලන ක්‍රම පවතින්නේ ද යන්න ඇගයීම හා එම පාලන ක්‍රමයන්වල අගය එකතු කිරීම, වැඩිදියුණු කිරීම සඳහා වන මාර්ගෝපදේශ සැපයීම.

#### 2.6.8.2. ප්‍රධාන කාර්යයන්

1. විගණන සැලැස්ම අනුව විගණන අවදානම් ක්ෂේත්‍ර සැලකිල්ලට ගෙන විගණන කටයුතු සිදු කිරීම.
2. මූලික වාර්තාව ඉදිරිපත් කිරීම.
3. අභ්‍යන්තර විගණන අංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම හා ඒ අනුව මාසික ප්‍රගතිය වාර්තා කිරීම.
4. කළමනාකරණ විගණන කමිටු රැස්වීම් පැවැත්වීම.
5. ව්‍යාපෘති අභ්‍යන්තර විගණන සමාලෝචන කමිටු රැස්වීම් පැවැත්වීම.
6. අමාත්‍යාංශයේ සහ විදේශීය ව්‍යාපෘති සම්බන්ධයෙන් කාර්තු වාර්තා ඉදිරිපත් කිරීම.
7. අමාත්‍යාංශය යටතේ පවත්නා විදේශාධාර ව්‍යාපෘතිවලට අදාළව විගණන කටයුතු සිදු කිරීම.
8. දේශීය ව්‍යාපෘතිවලට අදාළව විගණන කටයුතු සිදු කිරීම.
9. රාජ්‍ය ගිණුම් කාරක සභාව කැඳවීම් කරන අවස්ථාවලදී ඒ සඳහා සහභාගීවීම.
10. අමාත්‍යාංශ ලේකම් විසින් පවරනු ලබන විශේෂ විමර්ශන සිදු කිරීම.
11. ඉදිරි වර්ෂය (2026) සඳහා විගණන සැලැස්ම පිළියෙල කිරීම.

#### 2.6.8.3. 2025.01.01 සිට 2025.12.31 දක්වා කාර්යසාධනය

1. මූලික වාර්තාව ඉදිරිපත් කිරීම.
2. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව 2025.12.31 දක්වා අත්කර ගත් ප්‍රගතිය වාර්තා කිරීම.
3. කළමනාකරණ විගණන කමිටු රැස්වීම් 04 ක් පැවැත්වීම.
4. ව්‍යාපෘති අභ්‍යන්තර විගණන සමාලෝචන කමිටු රැස්වීම් වාර 04 ක් පැවැත්වීම.
5. අමාත්‍යාංශයේ සහ විදේශීය ව්‍යාපෘති සම්බන්ධයෙන් කාර්තු වාර්තා ඉදිරිපත් කිරීම. (2024-IV, 2025-I, II, III වන කාර්තුවලට අදාළව)
6. අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව විගණනයන් සිදු කිරීම.

**වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව ප්‍රගතිය:-**

| අ.අ. | විගණන ක්ෂේත්‍රය | ප්‍රගතිය % |
|---|---|---|
| 01 | කණ්ඩලම සංචාරක නිවාසයේ කටයුතු සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 02 | වැටුප් ගෙවීම් කටයුතු සම්බන්ධ අභ්‍යන්තර විගණනය (2024 වර්ෂයේ මාණ්ඩලික හා සංවර්ධන නිලධාරීන්ගේ වැටුප් විස්තර හා අවකරණ) | 100 |
| 03 | ප්‍රසම්පාදන කටයුතු කළමනාකරණය සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 04 | ගොඩනැගිලි නඩත්තු සංවර්ධන ක්‍රියාකාරකම් සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 05 | අමාත්‍ය මණ්ඩල සංදේශ සම්බන්ධීකරණ කටයුතු සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 06 | මුදල් පොත හා වැය ලෙජරය නඩත්තු කිරීම සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 07 | පළාත් සභා හා පළාත් පාලන ආයතනවල මූල්‍ය කටයුතු සම්බන්ධීකරණය හා විමංසනය කිරීම සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 08 | ව්‍යාපෘති අධීක්ෂණ කටයුතු සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |

| අ.අ. | විගණන ක්ෂේත්‍රය | ප්‍රගතිය % |
|---|---|---|
| 09 | ආරක්ෂක සේවාව හා පිරිසිදු කිරීමේ සේවාව සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 10 | මුදල් කළමනාකරණය සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 11 | වැටුප් ගෙවීම් කටයුතු සම්බන්ධ අභ්‍යන්තර විගණනය (රා.ප.ච.ලේ. අංක 10/2025 අනුව වැටුප් පරිවර්තනය සිදු කිරීම) | 100 |
| 12 | වාහන පරිපාලනය සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 13 | ගෙවීම් වවුචර් කළමනාකරණය සම්බන්ධ අභ්‍යන්තර විගණනය (2024 ජනවාරි සිට ජූනි මස දක්වා ගෙවීම් වවුචර්) | 100 |
| 14 | නීති කටයුතු සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 15 | පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන (ප්‍රාග්ධන හා පුනරාවර්තන) සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 16 | ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය සම්බන්ධ අභ්‍යන්තර විගණනය (Rural Bridges Project) | 100 |
| 17 | සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය (GEM) සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 18 | ආදායම් හා වියදම් ඇස්තමේන්තු සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 19 | වැටුප් ගෙවීම් කටයුතු සම්බන්ධ අභ්‍යන්තර විගණනය (අත්තිකාරම් පුද්ගල ආදායම් බදු අඩු කිරීම) | 100 |
| 20 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම විෂය ක්‍රියාකාරකම් සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 21 | සණ අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 22 | පළාත් සභා පරිපාලනය සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 23 | සැලසුම් හා ක්‍රමසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 24 | පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 25 | ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය සම්බන්ධ අභ්‍යන්තර විගණනය (Rural Bridges Project | 100 |
| 26 | වැටුප් ගෙවීම් කටයුතු සම්බන්ධ අභ්‍යන්තර විගණනය | අනු අංක 02, 11, සහ 19 යටතේ වැටුප් විෂය සම්බන්ධ විගණනයන් මඟින් 4 වන කාර්තුවේ මෙම විගණන කටයුතු ද ආවරණය කර ඇත. |
| 27 | සේවක කළමනාකරණය සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 28 | ගෙවීම් වවුචර් කළමනාකරණය සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 29 | නිවාඩු සම්බන්ධ අභ්‍යන්තර විගණනය | අනු අංක 07, 08, 14, 22 සහ 23 යටතේ එක් එක් අංශ සම්බන්ධයෙන් සිදු කරන ලද විගණනයන් තුළින් නිවාඩු විෂය සම්බන්ධ විගණනය ආවරණය කර ඇත. |
| 30 | සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය (GEM) සම්බන්ධ අභ්‍යන්තර විගණනය | අනු අංක 17 යටතේ සිදු කරන ලද විගණනය මඟින් 3 වන කාර්තුවේ මෙම විගණන කටයුතු ද ආවරණය කර ඇත. |

| අ.අ. | විගණන ක්ෂේත්‍රය | ප්‍රගතිය % |
|---|---|---|
| 31 | පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීම සම්බන්ධ අභ්‍යන්තර විගණනය (ප්‍රාග්ධන හා පුනරාවර්තන) | 100 |
| 32 | පළාත් පාලන ආයතන කළමනාකරණය සම්බන්ධ අභ්‍යන්තර විගණනය | අනු අංක 15 සහ 31 යටතේ පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන සම්බන්ධයෙන් සිදු කරන ලද විගණනයන් මගින් 4 වන කාර්තුවේ මෙම විගණන කටයුතු ආවරණය කර ඇත. |
| 33 | ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 34 | නැඟී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය සම්බන්ධ අභ්‍යන්තර විගණනය | මෙම ව්‍යාපෘතියට අදාළව විගණනය කළ යුතු කාර්යයන් සම්බන්ධයෙන් ප්‍රමාණවත් තොරතුරු නොතිබීම හේතුවෙන් 2 සහ 3 වන කාර්තුවේ කළ යුතු විගණන කටයුතු ද ඇතුළත්ව 4 වන කාර්තුවේ මෙම විගණනය සිදු කරන ලදි. |
| 35 | නැඟී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 36 | දේශීය ණය සහ සංවර්ධන අරමුදල සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 37 | මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය සහ මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ ආයෝජන වැඩිදියුණු කිරීමේ වැඩසටහන සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |

## 2.6.9. ක්‍රමසම්පාදන අංශය

### 2.6.9.1. අරමුණ

අමාත්‍යාංශයේ අරමුණු සාක්ෂාත් කරගැනීමට අදාළ සැලසුම්, මාර්ගෝපදේශ හා ක්‍රමෝපායන් සකස් කිරීම, ඒවා ක්‍රියාත්මක කිරීම මෙන්ම සමාජ ආර්ථික සංවර්ධනයට ඉවහල් වන්නා වූ ප්‍රතිපත්ති/ උපායමාර්ග/ සැලසුම්/ වැඩසටහන්/ ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, මෙහෙයවීම හා ඇගයීම හා ඊට අදාළ සෙසු කාර්යයන් ඉටු කිරීම සඳහා අමාත්‍යාංශයේ සෙසු අංශවලට අවශ්‍ය සහයෝගය ලබා දීම.

### 2.6.9.2. ප්‍රධාන කාර්යයන්

1. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සැකසීම.
2. වාර්ෂික කාර්යසාධන වාර්තාව සැකසීම.
3. 2026 අයවැය කාරක සභා අවස්ථාවට ඉදිරිපත් කරනු ලබන ප්‍රගති වාර්තාව සැකසීම.
4. අමාත්‍යාංශයේ පස් අවුරුදු ප්‍රතිඵල රාමුව යාවත්කාලීන කිරීම.
5. ජනාධිපති ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, මුදල් අමාත්‍යාංශ, ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් ඉල්ලුම් කරනු ලබන ප්‍රගති වාර්තා හා තොරතුරු ආදිය සකස් කිරීම
6. සංවර්ධන අවශ්‍යතා (ගැටළු) හඳුනාගෙන ව්‍යාපෘති වාර්තා පිළියෙල කිරීම සහ ක්‍රියාත්මක කර අවසන් කරන ලද ව්‍යාපෘතිවලට ඇගයීම් කටයුතු සිදු කිරීම.
7. දිවයිනේ සියළුම පළාත් පාලන ආයතන සඳහා ගොඩනගන ලද LoGoMIS තොරතුරු කළමනාකරණ දත්ත පද්ධතිය පවත්වාගෙන යාම.
8. සෙමාවුල් පදනම විසින් දැනට ක්‍රියාත්මක ව්‍යාපෘති හා ව්‍යාපෘති සැලසුම් කිරීමට අදාළ කටයුතු.
9. තිරසර සංවර්ධන අභිමතාර්ථවලට අදාළ කටයුතු සම්බන්ධීකරණය කිරීම.
10. නව දේශීය හා විදේශීය ව්‍යාපෘතිවල ප්‍රාරම්භක කටයුතු සිදු කිරීම.
11. අමාත්‍යාංශයේ ප්‍රගති සමාලෝචන රැස්වීම් සංවිධානය කිරීම.

### 2.6.9.3. 2025.01.01. සිට 2025.12.31 දක්වා කාර්යසාධනය

1. පළාත් සභා සහ පළාත් පාලන අංශයේ 2025 වසරට අදාළ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර එය අවශ්‍ය පරිදි යාවත්කාලීන කර ඇත.

   i. ක්‍රියාකාරී සැලැස්මට අනුව ඒ ඒ අංශ හා ආයතනවල මූල්‍ය හා භෞතික ප්‍රගතිය කාර්තුමය වශයෙන් ලබා ගැනීම හා එම වාර්තා අදාළ ආයතනවලට ඉදිරිපත් කර ඇත.

   ii. පළාත් සභා සහ පළාත් පාලන අංශයේ 2026 වසරට අදාළ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම ආරම්භ කර ඇත.
2. අමාත්‍යාංශයේ 2024 වසරට අදාළ කාර්යසාධන වාර්තාව සකස් කර අදාළ ආයතනවලට ඉදිරිපත් කර ඇත.
3. අමාත්‍යාංශයේ 2026 වර්ෂයේ අයවැය කාරක සභා අවස්ථාවට ඉදිරිපත් කරනු ලබන 2025 වර්ෂයේ කාර්යසාධනය හා 2026 ඉදිරි සැලසුම් ඇතුළත් වාර්තාව සකස් කර අදාළ ආයතනවලට ඉදිරිපත් කර ඇත.
4. අමාත්‍යාංශයේ ආයතනික පස් අවුරුදු ප්‍රතිඵල රාමුව සකස්කර අවසන්ව ඇත. අමාත්‍ය මණ්ඩල අනුමැතීන් ලබා ගැනීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවට යොමු කර ඇත.
5. අමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව තිරසර සංවර්ධන අභිමතාර්ථ හඳුනාගෙන ඇති අතර අදාළ ආයතනවලට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇත.
6. පළාත් පාලන ආයතනවල කුඩා පාලම් වැඩිදියුණු කිරීමේ තිරසර ව්‍යාපෘති යෝජනාව සකස් කර ඒ සඳහා ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලබාගන්නා ලදී. එම ව්‍යාපෘති යෝජනාව 2026 වසරේ සිට ඉදිරියට වසර 04ක් ඇතුළත ක්‍රියාත්මක කිරීම සඳහා 2026-2030 රාජ්‍ය ආයෝජන වැඩසටහනට ඇතුළත් කර ඇත. එම ව්‍යාපෘතියට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කර

අනුමැතිය ලබාගෙන ඇත. ව්‍යාපෘතියට අදාළ වසරවලට අදාළ ක්‍රියාකාරි සැලැස්ම සකස් කර ලේකම්තුමාගේ අනුමැතිය ලබාගැනීම සිදු කර ඇත.

7. LoGoMIS දත්ත පද්ධතිය සඳහා දිස්ත්‍රික් වැඩමුළු 12 ක් පවත්වන ලදී. ඒ අනුව, LoGoMIS දත්ත පද්ධතිය සඳහා 2025 වසරට අදාළ තොරතුරු ඒ ඒ පළාත් පාලන ආයතන විසින් දත්ත පද්ධතියට ඇතුළත් කිරීම සිදු කරමින් පවතී. මෙම ප්‍රාරම්භක කටයුතු හඳුනාගෙන 2025 හා 2026 අමාත්‍යාංශය යටතේ සේවාදායක පරිගණක පහසුකම් (server facility) පවත්වා ගනිමින් දත්ත පද්ධතිය කළමනාකරණය කරනු ලැබේ. දත්ත පද්ධතියට අඛණ්ඩව විධිමත්ව දත්ත ඇතුළත් කිරීමට අදාළව පළාත් හා පළාත් පාලන මට්ටමට විධිමත් මාර්ගෝපදේශයක් සකස් කර සියළුම පළාත් හා පළාත් පාලන ආයතන වෙත යවා ඇත.

**මූල්‍ය හා භෞතික කාර්යසාධනය - 2025**

| අ:අ: | ව්‍යාපෘතිය | 2025 වර්ෂය සඳහා වෙන් වූ ප්‍රතිපාදනය (රු.මිලියන) | 2025.12.31 දිනට වියදම (රු.මිලියන) | මූල්‍ය ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| 1 | පළාත් පාලන ආයතන කළමනාකරණ පද්ධතිය පවත්වාගෙන යාම. (LogoMIS)<br>දිස්ත්‍රික් මට්ටමේ දත්ත ඇතුළත් කිරීම පිළිබඳ වැඩමුළු/ පුහුණු වැඩසටහන් පැවැත්වීම | 2 | 0.49 | 48.63% | 48% |

8. සෙමාවුල් පදනම විසින් කොරියානු ආධාර යටතේ ක්‍රියාත්මක කරනු ලබන ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති (සෙමාවුල් ව්‍යාපෘති) සම්බන්ධ ප්‍රගති සමාලෝචන රැස්වීම් දෙකක් ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන්, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් යුතුව පවත්වන ලද අතර, තවත් ප්‍රගති සමාලෝචන රැස්වීම් දෙකක් ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වා ඇත. සෙමාවුල් පදනම ආධාර යටතේ ඉදිරි වසරවල දී ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන ව්‍යාපෘති යෝජනාවලට අදාළ සංකල්ප වාර්තාවක් සකස් කිරීම සඳහා සහයෝගය ලබා දීම හා එම වාර්තාව සඳහා එකඟතාවය ලබා ගැනීමට ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත.
9. "ක්ලීන් ශ්‍රී ලංකා" ජාතික වැඩසටහන යටතේ දේශීය අරමුදල් මඟින් ක්‍රියාත්මක නාගරික හා සංචාරක ආකර්ෂණීය ස්ථානවල ජනතාවගේ පොදු සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියට අදාළ ව්‍යාපෘති යෝජනාවල ශක්‍යතාවය සොයා බැලීම හා ව්‍යාපෘති යෝජනා 50 ක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නිර්දේශ සංවර්ධන අංශයට ලබා දීම.
10. මෙම අමාත්‍යාංශය යටතේ දේශීය හා විදේශීය අරමුදල් මඟින් ක්‍රියාත්මක කර අවසන් කරන ලද පහත සඳහන් ව්‍යාපෘති ඇගයීම් කිරීම සඳහා ඇගයීම් යෝජනා සකස් කර ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවට 2025.03.31 දින යොමු කර ඇත.
    i. විද්‍යුත් පුස්තකාල ස්වයංක්‍රීයකරණය කිරීමේ ව්‍යාපෘතිය
    ii. ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය
11. අමාත්‍යාංශයේ පළමු කාර්තුවට අදාළ කාර්තුපාදක ඒකාබද්ධ ප්‍රගති සමාලෝචන රැස්වීම 2025.05.17 දින ද තෙවන කාර්තුවට අදාළ කාර්තුපාදක ප්‍රගති සමාලෝචන රැස්වීම 2025.10.17 දින ද පැවැත්වීමට අදාළ කටයුතු ඉටු කිරීම.
12. පළාත් සභා සහ පළාත් පාලන අංශයේ 2025 ක්‍රියාකාරි සැලැස්ම පාදක කරගත් කාර්තුමය ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වන ලදී.
13. මෙම අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘතිවල හා " ක්ලීන් ශ්‍රී ලංකා " වැඩසටහනට අදාළ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය ඇතුළත් වාර්තා සකස් කර ජනාධිපති ලේකම් කාර්යාලයට හා ව්‍යාපෘති අධීක්ෂණ හා කළමනාකරණ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම.
14. දේශීය/ විදේශීය අරමුදල් යටතේ ක්‍රියාත්මක කිරීමට ව්‍යාපෘති අධීක්ෂණ හා සංවර්ධන යන අංශවලින් ඉදිරිපත් වූ නව ව්‍යාපෘති යෝජනා 5 ක් ඇගයීමට ලක්කර ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා නිර්දේශ ලබාදීම.

15. කොළඹ මහා නගර සභාව විසින් යුරෝපා හවුලේ ආධාර යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත සූර්යබල විදුලි උත්පාදන ව්‍යාපෘති යෝජනාව ඇගයීමට ලක්කර නිර්දේශ කරන ලදී.
16. ආසියානු සංවර්ධන බැංකු අරමුදල් (ADB) යටතේ සිදු කිරිමට යෝජිත සංචාරක කලාපවල ආදායම් උත්පාදන ව්‍යාපෘති යෝජනාවක් සකස් කිරීමට අදාළ උපදේශන සහාය ලබා ගැනීම සඳහා වන ව්‍යාපෘති යෝජනාව ඇගයීමට ලක්කර නිර්දේශ කරන ලදී.




නුවරඑළිය ප්‍රාදේශීය සභාවට අයත් නානුඔය පොදු වැසිකිළි පද්ධතියේ ශක්‍යතා අධ්‍යයනය සිදු කිරීම



මස්කෙළිය ප්‍රාදේශීය සභාවට අයත් නල්ලතන්නිය පොදු වැසිකිළි පද්ධතියේ ශක්‍යතා අධ්‍යයනය සිදු කිරීම

### 2.6.10. ව්‍යාපෘති අධීක්ෂණ අංශය

#### 2.6.10.1. අරමුණ

විවිධ ජාත්‍යන්තර මූල්‍ය ආයතන මඟින් ලබාදෙන ණය හා ප්‍රදාන යටතේ ක්‍රියාත්මක විදේශාධාර ව්‍යාපෘති මනා අධීක්ෂණයකින් යුක්තවත් ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කරගැනීමට හැකිවන ලෙසත් මෙහෙයවීම සිදු කිරීම.

#### 2.6.10.2. ප්‍රධාන කාර්යයන්

1. විදේශාධාර ව්‍යාපෘති මෙහෙයවීමේ විධායක ආයතනය ලෙස විදේශාධාර ලබා දෙන ආයතන (Doner Coordination) සම්බන්ධීකරණය හා ව්‍යාපෘති යෝජනා සම්බන්ධයෙන් එම ආයතන සමඟ සාකච්ඡා කිරීම. (Doner Negotiation).
2. ව්‍යාපෘති ගිවිසුම් පරීක්ෂා කිරීම, එම ගිවිසුම් සඳහා අවශ්‍ය සංශෝධන සිදු කිරීම, අදාළ අනුමැතීන් ලබා ගැනීම හා ගිවිසුම්වලට එළඹීම සඳහා පහසුකම් සැපයීම.
3. ව්‍යාපෘති කාර්ය මණ්ඩලයේ පත්කිරීම්, සේවා කාලය දිගු කිරීම් සඳහා අනුමැතිය ලබා දීම ඇතුළු මානව සම්පත් කළමනාකරණ කටයුතු සිදු කිරීම.
4. විදේශාධාර ව්‍යාපෘතිවල ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් පහසුකම් සැපයීම.
5. ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම් පැවැත්වීම හා ඉන් හඳුනාගන්නා ගැටළු විසඳීම සඳහා මැදිහත්වීම.
6. ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම, වාර්තා පිළියෙල කිරීම හා ඉන් නිරීක්ෂණය කරන දුර්වලතා / ගැටළු සම්බන්ධයෙන් මැදිහත්වීම.
7. විවිධ ආයතන මඟින් ඉල්ලුම් කරන වාර්තා සකස් කිරීමට අදාළ විශ්ලේෂණයන් සිදු කිරීම හා එම වාර්තා සකස් කිරීම.
8. ව්‍යාපෘති සම්බන්ධයෙන් වූ අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කිරීම, අනුමැතිය ලබා ගැනීම හා තීරණ ක්‍රියාත්මක කිරීම.
9. දූත මණ්ඩල රැස්වීම් (Mission) හා අනෙකුත් රැස්වීම් (Kick off Meeting, Wrap up Meeting, etc...) සඳහා සම්බන්ධවීම.
10. විදේශ අරමුදල් සහිත ව්‍යාපෘතිවලට අදාළ විදේශ කාර්ය මණ්ඩලයට/ සේවකයන්ට සහ ඔවුන්ගේ යැපෙන්නන්ට වීසා නිකුත් කිරීමේ කටයුතුවලට අදාළ සම්බන්ධීකරණය සිදු කිරීම.
11. ව්‍යාපෘතිවලට අදාළව මුදල් අමාත්‍යාංශය ඇතුළු විවිධ ආයතන මඟින් කැඳවනු ලබන රැස්වීම්වලට අදාළ ලේඛන සකස් කර ඉදිරිපත් කිරීම හා සහභාගී වීම.
12. සේවා යෝජකයා වශයෙන් කටයුතු කළ කොන්ත්‍රාත්වලට අදාළ කොන්ත්‍රාත්කරුවන් සමඟ සාකච්ඡා පැවැත්වීම, ගැටළු සඳහා විසඳුම් ලබා දීම සහ විවිධ ගැටළු හේතුවෙන් පැන නැඟී ඇති ආරවුල් මණ්ඩල (Dispute Board), බේරුම්කරණ මණ්ඩල (Arbitration) හා නඩු කටයුතු සම්බන්ධයෙන් කටයුතු කිරීම.

#### 2.6.10.3. 2025.01.01 සිට 2025.12.31 දක්වා කාර්යසාධනය

1. 2025 වර්ෂයේ විදේශාධාර ව්‍යාපෘති සඳහා ආරම්භයේ දී වෙන් වූ රු.මිලියන 23,785 ක ප්‍රතිපාදන 2025 වසර අවසන් වන විට රු.මිලියන 22,209.99 ක් වශයෙන් සංශෝධනය වන ලදී. එම ප්‍රතිපාදන ඒ ඒ ව්‍යාපෘතියේ සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මෙහෙයවා ඇති අතර දෙසැම්බර් මස අවසානය වන විට රු.මිලියන 14,490.70 ක මුදලක් උපයෝජනය කර ඇත.
2. පහත සඳහන් සියළුම ව්‍යාපෘතිවලට අදාළව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සහ ව්‍යාපෘති අධීක්ෂණ කාර්යයන් සම්බන්ධීකරණය කිරීම සිදු කර ඇත.
   i. ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය- අදියර 5
   ii. a)මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය
   b)මහ කොළඹ ජල සහ අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීම ආයෝජන වැඩසටහන
   iii. නැඟී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය
   iv. සාමාන්‍ය අධ්‍යාපන නව්‍යකරණ ව්‍යාපෘතිය
   v. ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය (2025.03.31 දින අවසන්ව ඇත.)
3. මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක විදේශ ආධාර ව්‍යාපෘතිවලට අදාළ ප්‍රගතිය විශ්ලේෂණය හා පැන නැඟී ඇති ගැටළු විසඳීම ඉලක්ක කරගෙන ප්‍රගති සමාලෝචන රැස්වීම් 28 ක් හා ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම් 10 ක් මෙම වසර තුළ පවත්වා ඇත.
4. 2025 වසර අවසන්වන විට දූත මණ්ඩල රැස්වීම් 6 ක් සඳහා අනුමැතිය (Mission Clearance) ලබා දීමට කටයුතු කර ඇත.

5. මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය, නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය සහ මේ වන විට අවසන් වී ඇති ප්‍රවාහන සම්බන්ධතා හා වත්කම් කළමනාකරණ ව්‍යාපෘතියට අදාළව නඩු කටයුතු 9 ක්, බේරුම්කරණ (Arbitration) 4ක් හා ආරවුල් මණ්ඩල (Dispute Board) 4 ක් ක්‍රියාත්මක තත්ත්වයේ පැවතුණි. මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය හා සම්බන්ධ ආරවුලක්, ආරවුල් මණ්ඩල තීරණය හා පසු කාලීන සාකච්ඡාවලට අනුව සාමකාමීව විසඳා ගන්නා ලදී. නෛතික ලේඛන සැකසීම, අදාළ පරීක්ෂණ (hearings) සඳහා සහභාගී වීම, නීතිපති දෙපාර්තමේන්තුවේ සාකච්ඡා සඳහා සහභාගී වීම ආදි කටයුතු සිදු කරන ලදී.
6. විදේශාධාර ව්‍යාපෘතිවලට අදාළ කාර්ය මණ්ඩලයට/ සේවකයන්ට සහ ඔවුන්ගේ යැපෙන්නන් 429 ක් සඳහා වීසා පහසුකම් ලබා ගැනීමට අවශ්‍ය නිර්දේශ ලබා දී ඇත.
7. JICA ණය අරමුදල් අත්හිටුවීමේ ප්‍රතිඵලයක් ලෙස තාවකාලිකව නවතා දමා තිබූ නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ (RIDEP) කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය අනුව ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකක (PIUs) සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට අදාළ කටයුතු සිදු කර ඇත.
8. "මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය, මහ කොළඹ ජල සහ අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීම ආයෝජන වැඩසටහන, ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය - අදියර 5 හා නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය, ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කලමනාකරණ ව්‍යාපෘතිය, ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය, පළාත් පාලන ආයතන වැඩි දියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය (පුරනැගුම)" යන ව්‍යාපෘති සඳහා පහත සඳහන් අනුමැතීන් ලබාගැනීමට අමාත්‍ය මණ්ඩල සංදේශ 9 ක් ඉදිරිපත් කර ඇති අතර, එම අමාත්‍ය මණ්ඩල සංදේශ 9 සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

i. අමාත්‍ය මණ්ඩල අනුමැතිය

මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ ආයෝජන ප්‍රවර්ධන වැඩසටහන සඳහා යුරෝපා ආයෝජන බැංකු ණය අරමුදල් නොලැබීම මත ඒ යටතේ ක්‍රියාත්මක කිරුල - නාරාහේන්පිට මලාපවහන ජාල සංවර්ධනය පිළිබඳ කොන්ත්‍රාත්තුවේ කොන්ත්‍රාත්කරු වෙත ගෙවිය යුතු පළමු හා දෙවන බිල්පත සඳහා කොළඹ මහ නගර සභා අරමුදල් භාවිතා කරමින් ගෙවීම් කර යුරෝපා ආයෝජන බැංකු අරමුදල් ලද පසුව ප්‍රතිපූර්ණය කිරීම.

<u>ගත් ක්‍රියාමාර්ග</u>

හිග බිල්පත් ගෙවීම් කර යුරෝපීය ආයෝජන බැංකු අරමුදල් ලද පසු, එම මුදල් ප්‍රතිපූර්ණය කර ඇත.

ii. අමාත්‍ය මණ්ඩල අනුමැතිය

කිරුළපන ප්‍රදේශය සඳහා නව ගුරුත්ව මලාපවහන, පීඩන නල සහ පොම්පාගාර ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ ඉතිරි කාර්යයන් නැවත ආරම්භ කිරීමට අදාළව කොන්ත්‍රාත් සංශෝධනයක් සිදුකර කොන්ත්‍රාත්තුවේ ඉතිරි වැඩ නැවත ආරම්භ කිරීම සඳහා ඉහළ මට්ටමේ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව (SHLPC) මඟින් ලබාදුන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම

<u>ගත් ක්‍රියාමාර්ග</u>

2025.10.23 දින සංශෝධිත ගිවිසුම අත්සන් කර, කොන්ත්‍රාත්තුවේ ඉතිරි කටයුතු නැවත ආරම්භ කර ඇත.

iii. අමාත්‍ය මණ්ඩල අනුමැතිය

මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ අපජල පොම්පාගාර සැලසුම් කිරීම, ඉදිකිරීම, ස්ථාපනය කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුවට අදාළව වනාතමුල්ල, බම්බලපිටිය, තිඹිරිගස්යාය සහ විස්ට්වයික් අපජල පොම්පාගාර ඉදිකිරීම සම්බන්ධ ආරවුලට අදාළ ගෙවීම් 2025 වර්ෂය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන උපයෝගී කරගනිමින් ගෙවීම් කිරීම.

<u>ගත් ක්‍රියාමාර්ග</u>

ගෙවීම් නිරාකරණය සිදු කර ඇත.

iv. අමාත්‍ය මණ්ඩල අනුමැතිය

ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය – අදියර V හි ක්‍රියාත්මක කාලය සහ ණය ගිවිසුම දීර්ඝ කිරීම සඳහා.

<u>ගත් ක්‍රියාමාර්ග</u>

ව්‍යාපෘතියේ කාලය සහ ණය ගිවිසුමේ කාලය දීර්ඝ කර ඇත.

v. අමාත්‍ය මණ්ඩල අනුමැතිය

ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය (JICA) මඟින් ණය සේවාකරණය අත්හිටුවීම මත අතරමග නවතා තිබූ නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියෙහි (RIDEP) කටයුතු නැවත ආරම්භ කිරීමේදී, එම

ව්‍යාපෘතිය යටතේ සේවය කළ උපදේශක සමාගම් දෙකෙහි සේවය තවදුරටත් ලබා ගැනීම සඳහා, අමාත්‍ය මණ්ඩල විසින් පත් කළ උපදේශක ප්‍රසම්පාදන කමිටුවේ තීරණ ක්‍රියාත්මක කිරීම.

ගත් ක්‍රියාමාර්ග

උපදේශක සමාගම් දෙක සමඟ සංශෝධිත ගිවිසුම් අත්සන් කර ඇති අතර, උපදේශක කටයුතු ආරම්භ කර ඇත.

vi. අමාත්‍ය මණ්ඩල අනුමැතිය

ලෝක බැංකු ණය අරමුදල් යටතේ ක්‍රියාත්මක වූ ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය (TCAMP) යටතේ නොගෙවූ බිල්පත් නිරවුල් කිරීමට අනුමැතිය ලබා ගැනීම.

ගත් ක්‍රියාමාර්ග

බිල්පත් නිරවුල් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත.

vii. අමාත්‍ය මණ්ඩල අනුමැතිය

ආසියානු සංවර්ධන බැංකුවේ ණය අරමුදල් මඟින් ක්‍රියාත්මක කරන ලද පළාත් පාලන වැඩිදියුණු කිරීමේ අංශීය ව්‍යාපෘතිය (අතිරේක මූල්‍ය) (පුරනැගුම) අවසන් කිරීමෙන් පසු ඉදිරිපත් කරන ලද බිල්පත් සඳහා ගෙවීම් පියවීම සඳහා දේශීය අරමුදල්වලින් මෙම අමාත්‍යාංශයට මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම.

ගත් ක්‍රියාමාර්ග

ඉතිරිව තිබූ බිල්පත් සඳහා ගෙවීම් සිදු කර ඇත.

viii. අමාත්‍ය මණ්ඩල අනුමැතිය

ලෝක බැංකුවේ ණය අරමුදල් මඟින් ක්‍රියාත්මක කරන ලද ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතියේ බිල්පත් ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලියේ ඇතිවූ ගැටළුවක් හේතුවෙන් නොගෙවූ බිල්පත් සඳහා පළාත් සභා අරමුදල් භාවිතා කිරීමෙන් පළාත් සභා මඟින් කරන ලද ගෙවීම් ප්‍රතිපූර්ණය කිරීම සඳහා අරමුදල් සැපයීම.

ගත් ක්‍රියාමාර්ග

අදාළ බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම සඳහා පියවර ගෙන ඇත.

ix. අමාත්‍ය මණ්ඩල අනුමැතිය

නැගෙනහිර පළාත සඳහා ඉන්දියානු බහු ආංශික ප්‍රදාන ආධාර ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කරනු ලබන උප ව්‍යාපෘති 33 ක් සඳහා මෙම අමාත්‍යාංශය සහ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය අතර අවබෝධතා ගිවිසුම් 33 ක් අත්සන් කිරීම.

ගත් ක්‍රියාමාර්ග

ව්‍යාපෘති 33 ක් සඳහා වෙන වෙනම අවබෝධතා ගිවිසුම් සකස් කිරීම සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සහාය ඒකකය (PISU) පිහිටුවීමට අදාළ මූලික කටයුතු සිදු කෙරෙමින් පවතී.

9. 2025.12.31 දිනට පෙර, සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය යටතේ පළාත් සංරචකවල භෞතික ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීම සඳහා සහාය ලබා දී ඇත.

10. ප්‍රසම්පාදන කටයුතු සඳහා පහත පරිදි දායකත්වය ලබා දී ඇත.

i. මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන යටතේ, කිරුළපන ප්‍රදේශය සඳහා නව ගුරුත්ව මලාපවහන, පීඩන නල හා පොම්පාගාර ඉදිකිරීම කොන්ත්‍රාත්තුවේ ඉතිරි කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව (TEC) සහභාගි වීම සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ ප්‍රසම්පාදන කමිටුව (CAPC) වෙත සහාය ලබා දීම සිදු කර ඇත.

ii. මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන "දකුණු ජල පෝෂක ප්‍රදේශයේ මලාපවහන පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීමේ කොන්ත්‍රාත්තුව" සඳහා කොන්ත්‍රාත්කරුවකු තෝරා ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් සහාය ලබා දී ඇත. ඒ අනුව, ලංසු ඇගයීම් ක්‍රියාවලිය මේ වන විට සිදු කරමින් පවතී.

11. සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය, ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය, නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය, ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය, ප්‍රාදේශීය සංවර්ධන සහාය ව්‍යාපෘතිය සහ පළාත් පාලන වැඩිදියුණු කිරීමේ අංශික ව්‍යාපෘතිය (අතිරේක මූල්‍යනය), මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන, මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය, ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධති ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය, නාගරික ව්‍යාපෘති සඳහා ප්‍රාරම්භක පහසුකම් සැලසීම යන ව්‍යාපෘති මෙන්ම ව්‍යාපෘති අධීක්ෂණ අංශයට අදාළ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ කෙටුම්පත් වාර්තා සහ කළමනාකරණ ලිපි, ජාතික විගණන අධිකාරී කාර්යාලය මඟින් නිකුත් කළ විමසුම් සහ අභ්‍යන්තර විගණන විමසුම් 41 කට ප්‍රතිචාර දක්වා ඇත.

12. 2025.03.31 දින අවසන් වූ දේශීය සංවර්ධන සහාය ව්‍යාපෘතිය සම්බන්ධයෙන්, මෙම අංශය විසින් පහත සඳහන් කාර්යයන් සිදු කර ඇත.

i. ව්‍යාපෘතියට අදාළ ගොනු සහ ව්‍යාපෘතිය විසින් භාවිතා කළ උපකරණ නිසි පරිදි අමාත්‍යාංශයට භාරගෙනඇත.
ii. උප ව්‍යාපෘති මෙහෙයුම් හා නඩත්තු කටයුතු පිළිබඳ මාර්ගෝපදේශ ලබා දී ඇත.

iii. ලෝක බැංකුව විසින් ගෙවීමට නොහැකි වූ බිල්පත් නිරවුල් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.

## 2.7. විදේශීය අරමුදල් මත ක්‍රියාත්මක වන වැඩසටහන් හා ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය (2025.01.01 සිට 2025.12.31 දක්වා)

### 2.7.1. ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය (අදියර V)

| | | |
|---|---|---|
| **1** | සමස්ත ආයෝජනය (රු.මි ) | 14,367 |
| **2** | ණය ආධාර සපයන ආයතන සහ මුදල් ප්‍රමාණයන් (රු.මි ) | නෙදර්ලන්තය - 14,367 |
| **3** | 3.1 ව්‍යාපෘති කාල සීමාව<br>3.2 ආරම්භක වසර/ අවසාන වසර | අවුරුදු 4 මාස 07<br>2021 ජුලි 27 සිට 2026 පෙබරවාරි 28 |
| **4** | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ප්‍රදේශ | දිවයින පුරා |

**5. ව්‍යාපෘතියේ අරමුණු**

1. ජාතික ආර්ථික වර්ධනය අරමුණු කර ගනිමින් ග්‍රාමීය ජනතාවගේ ගමනාගමන පහසුව සහ ජීවන තත්ත්වයේ ගුණාත්මකභාවය වර්ධනය කර ගැනීම.
2. ග්‍රාමීය ජනතාවගේ පොදු සුරක්ෂිත බව වර්ධනය කිරීම.
3. ග්‍රාමීය ප්‍රදේශවල මෙතෙක් භාවිතයට නොගත් සම්පත් උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීම.
4. පහසු ප්‍රවේශ සැපයීම තුළින් හුදෙකලා ප්‍රදේශවල සංවර්ධනය ඉහළ නැංවීම.

**6. මූල්‍ය ප්‍රගතිය (රු. මිලියන)**

| A | B | B/A | C | D | D/C | B+D | (B+D)/A |
|---|---|---|---|---|---|---|---|
| **සමස්ත ආයෝජන මුදල** | **2024.12.31 දක්වා සමස්ත මූල්‍ය ප්‍රගතිය** | **ප්‍රතිශතය (%)** | **2025 වර්ෂය සඳහා වෙන් කිරීම** | **2025.01.01 සිට 2025.12.31 දක්වා ප්‍රගතිය** | **ප්‍රතිශතය (%)** | **සමුච්චිත ප්‍රගතිය** | **ප්‍රතිශතය (%)** |
| 14,367 | 14,403.76 | 100% | 3,231 | 3,230.33 | 100% | 17,634.09 | 123% |

**7. 2025.12.31 දිනට භෞතික ප්‍රගතිය**

7.1. 2024.12.31 දිනට සමුච්චිත භෞතික ප්‍රගතිය (A)

තනි මංතීරු පාලම් 88 ක සහ ද්විත්ව මංතීරු පාලම් 18 ක ඉදිකිරීම් කටයුතු නිමකර ඇත. තනි මංතීරු පාලම් 27 ක සහ ද්විත්ව මංතීරු පාලම් 19 ක ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පැවතුනි.

7.2. වර්ෂය තුළ ප්‍රගතිය (2025.01.01 සිට 2025.12.31 දක්වා) (B)

තනි මංතීරු පාලම් 28 ක සහ ද්විත්ව මංතීරු පාලම් 27 ක ඉදිකිරීම් කටයුතු නිමකර ඇත. තනි මංතීරු පාලමක ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතී.

7.3. 2025.12.31 දිනට සමුච්චිත ප්‍රගතිය (A+B)

තනි මංතීරු පාලම් 116 ක සහ ද්විත්ව මංතීරු පාලම් 45 ක ඉදිකිරීම් කටයුතු නිමකර ඇත. තනි මංතීරු පාලමක ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතී.



පාලම් අංක 5086,  මාතර ඉහළ මලිදූව - බෝලියද්ද පාලම



පාලම් අංක 5172, කළුතර මෙනේරිගම පාලම



පාලම් අංක 5125 + 5126, කුරුණෑගල දොඩංගස්ලන්ද කටුපිලගොල්ල පාලම



පාලම් අංක 5187, රත්නපුර හත්තැල්ල ගල්කන්ද

## 2.7.2. මහකොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය ( GCWMP)

- මෙම ව්‍යාපෘතිය ආසියානු සංවර්ධන බැංකු ණය අරමුදල් යටතේ 2010 ජූනි සිට 2023 ජූනි දක්වා ක්‍රියාත්මක වී ඇති අතර කොන්ත්‍රාත්තු 08 කින් කොන්ත්‍රාත්තු 07 ක් එම කාල සීමාව තුළ සම්පූර්ණ කර ඇත.
- 2024 වර්ෂයේ සිට දේශීය අරමුදල් මඟින් මෙහි ඉතිරි කොන්ත්‍රාත්තුව වන "අපජල පොම්පාගාර සැලසුම් කිරීම, ඉදිකිරීම, ප්‍රතිස්ථාපනය කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීමේ කොන්ත්‍රාත්තුවේ" (පොම්පාගාර 08 ක් ඉදිකිරීම) ශේෂ කටයුතු ක්‍රියාත්මක කරමින් පවතී.

| | | |
|---|---|---|
| 1 | සමස්ත ආයෝජනය (රු.මි.) | 6,200 |
| 2 | ණය ආධාර සපයන ආයතන සහ මුදල් ප්‍රමාණයන් (රු.මි.) | දේශීය අරමුදල් |
| 3 | 3.1 ව්‍යාපෘති කාල සීමාව (අවුරුදු) | අවුරුදු 2 |
| | 3.2 ආරම්භක වසර / අවසාන වසර | 2024 - 2025 |
| 4 | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ප්‍රදේශ (පළාත්/ දිස්ත්‍රික්ක/ පළාත් පාලන ආයතන/ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස/ ග්‍රාම නිලධාරී වසම්/ ගම්) | කොළඹ මහ නගර සභා බල ප්‍රදේශය |

**5. ව්‍යාපෘතියේ අරමුණු**

1. වැඩිදියුණු කළ අපජල කළමනාකරණ සේවාවක් හරහා, වඩා හොඳ නාගරික පරිසරයක් නිර්මාණය කරගැනීම.
2. මහජන සෞඛ්‍ය ඉහළ නැංවීම තුළින් කොළඹ සහ තදාසන්න ප්‍රදේශවල පදිංචිකරුවන්ගේ සෞඛ්‍ය ගැටළු නිරාකරණය කිරීම.
3. භූගත සහ මතුපිට ජල මූලාශ්‍රවල සහ සාගර/ වෙරළාසන්න ජලයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම.
4. සනීපාරක්ෂක තත්ත්වයන් වැඩිදියුණු කිරීම තුළින් කොළඹ නගරයේ සහ තදාසන්න ප්‍රදේශවල පදිංචිකරුවන්ගේ ජීවන තත්ත්වයන් උසස් කිරීම.

**6. මූල්‍ය ප්‍රගතිය (රු. මිලියන)**

| A | B | B/A | C | D | D/C | B+D | (B+D)/A |
|---|---|---|---|---|---|---|---|
| **සමස්ත ආයෝජන මුදල** | **2024.12.31 දක්වා සමස්ත මූල්‍ය ප්‍රගතිය** | **ප්‍රතිශතය (%)** | **2025 වර්ෂය සඳහා වෙන් කිරීම** | **2025.01.01 සිට 2025.12.31 දක්වා ප්‍රගතිය** | **ප්‍රතිශතය (%)** | **සමුච්චිත ප්‍රගතිය** | **ප්‍රතිශතය (%)** |
| 6,200 | 1,368 | 22% | 3,000 | 3,000 | 100% | 4,368 | 70% |

**මෙම කොන්ත්‍රාත්තුව සඳහා වෙන්කර ඇති රු.මි. 6,200 ක ආයෝජන මුදලින් රු.මි. 5,700 ක පමණ වියදම් කිරීමට අපේක්ෂා කෙරේ.*

**7. 2025.12.31 දිනට භෞතික ප්‍රගතිය**

7.1. 2024.12.31 දිනට සමුච්චිත භෞතික ප්‍රගතිය (A) – 62%.
7.2. වර්ෂය තුළ ප්‍රගතිය (2025.01.01 සිට 2025.12.31 දක්වා) (B) – 37.1%
7.3. 2025.12.31 දිනට සමුච්චිත ප්‍රගතිය (A+B) – 99.1%



විස්ට්වයික් පොම්පාගාරය



මාලිගාවත්ත පොම්පාගාරය



තිඹිරිගස්යාය පොම්පාගාරය



විස්ට්වයික් පීඩන නලය

## 2.7.3. මහකොළඹ ජල සහ අපද්‍රව්‍ය ජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන – (GCWWIIMP)

**i. ආසියානු සංවර්ධන බැංකු ණය අරමුදල/ දේශීය අරමුදල**

- මෙම ව්‍යාපෘතියේ ආසියානු සංවර්ධන බැංකු ණය අරමුදල් යටතේ 2016 ජනවාරි සිට 2022 ඔක්තෝබර් දක්වා ක්‍රියාත්මක වී ඇති අතර කොන්ත්‍රාත්තු 02 ක් ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබී ඇත. එයින් එක් කොන්ත්‍රාත්තුවක් අත්හිටුවා ඇත.
- ඉතිරි කොන්ත්‍රාත්තුව වන “කිරුලපන ප්‍රදේශය සඳහා නව ගුරුත්ව මලාපවහන , පීඩන නල සහ පොම්පාගාර ඉදිකිරීමේ” කොන්ත්‍රාත්තුවේ ශේෂ කටයුතු සඳහා 2027.12.31 දක්වා රුපියල් මිලියන 11,595 ක දේශීය අරමුදල් වෙන් කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. අත්හිටවූ කොන්ත්‍රාත්තුවේ ශේෂ කටයුතු, 2025.10.23 වන දින කොන්ත්‍රාත් සංශෝධනයට අත්සන් තැබීමෙන් පසු දේශීය අරමුදල් භාවිතයෙන් ක්‍රියාත්මක කරමින් පවතී.

| | | |
|---|---|---|
| 1 | සමස්ත ආයෝජනය (රු.මි ) | 11,595 |
| 2 | ණය ආධාර සපයන ආයතන සහ මුදල් ප්‍රමාණයන් (රු.මි ) | දේශීය අරමුදල් |
| 3 | 3.1 ව්‍යාපෘති කාල සීමාව (අවුරුදු)<br>3.2 ආරම්භක වසර/ අවසාන වසර | අවුරුදු 02<br>2025 - 2027 |
| 4 | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ප්‍රදේශ (පළාත්/ දිස්ත්‍රික්ක/ පළාත් පාලන ආයතන/ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස/ ග්‍රාම නිලධාරී වසම්/ ගම්) | කොළඹ මහ නගර සහා බල ප්‍රදේශය |

**ii. යුරෝපා ආයෝජන බැංකු ණය අරමුදල**

යුරෝපා ආයෝජන බැංකු ණය අරමුදල් සපයන මෙම ව්‍යාපෘතිය යටතේ කොන්ත්‍රාත්තු දෙකක් ක්‍රියාත්මක කිරීමට නියමිත වේ.

i. කිරුල නාරාහේන්පිට මලාපවහන පද්ධතිය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව

මෙම කොන්ත්‍රාත්තුව යටතේ පහත ක්‍රියාකාරකම් සිදුකිරීමට නියමිත වේ.

- කි.මී. 12 ක මලාපවහන නල එළීම.
- දාබරේ මාවත සහ නාවල පාර පොම්පාගාර 02 ක් ඉදිකිරීම.

ii. දකුණු පෝෂක ප්‍රදේශයේ මලාපවහන පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීමේ කොන්ත්‍රාත්තුව

ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ සුදුසු කොන්ත්‍රාත්කරුවකු තෝරාගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.

| | | |
|---|---|---|
| 1 | සමස්ත ආයෝජනය | රු.මි. 16,500.00 |
| 2 | ණය ආධාර සපයන ආයතන සහ මුදල් ප්‍රමාණයන් (රු.මි ) | යුරෝපා ආයෝජන බැංකුව<br>යුරෝ මිලියන 50 |
| 3 | 3.1 කාල සීමාව (අවුරුදු) | අවුරුදු 03 |
| | 3.2 ආරම්භක වසර / අවසාන වසර | 2024-2027 |
| 4 | ක්‍රියාත්මක කරන ප්‍රදේශ (පළාත් / දිස්ත්‍රික්ක / පළාත් පාලන ආයතන / ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස / ග්‍රාම නිලධාරී වසම් / ගම්) | කොළඹ මහ නගර සහා බල ප්‍රදේශය |

**5. ව්‍යාපෘතියේ අරමුණු**

1. වැඩිදියුණු කළ අපජල කළමනාකරණ සේවාවක් හරහා, වඩා හොඳ නාගරික පරිසරයක් නිර්මාණය කරගැනීම.
2. මහජන සෞඛ්‍ය ඉහළ නැංවීම තුළින් කොළඹ සහ තදාසන්න ප්‍රදේශවල පදිංචිකරුවන්ගේ සෞඛ්‍ය ගැටළු නිරාකරණය කිරීම.
3. භූගත සහ මතුපිට ජල මූලාශ්‍රවල සහ සාගර/ වෙරළාසන්න ජලයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම.
4. සනීපාරක්ෂක තත්ත්වයන් වැඩිදියුණු කිරීම තුළින් කොළඹ නගරයේ සහ තදාසන්න ප්‍රදේශවල පදිංචිකරුවන්ගේ ජීවන තත්ත්වයන් උසස් කිරීම.

**6.මූල්‍ය ප්‍රගතිය (රු. මිලියන)**

දේශීය අරමුදල් - කිරුළපන කොන්ත්‍රාත්තුව

| A | B | B/A | C | D | D/C | B+D | (B+D)/A |
|---|---|---|---|---|---|---|---|
| සමස්ත ආයෝජන මුදල | 2024.12.31 දක්වා සමස්ත මූල්‍ය ප්‍රගතිය | ප්‍රතිශතය (%) | 2025 වර්ෂය සඳහා වෙන් කිරීම | 2025.01.01 සිට 2025.12.31 දක්වා ප්‍රගතිය | ප්‍රතිශතය (%) | සමුච්චිත ප්‍රගතිය | ප්‍රතිශතය (%) |
| 11,595* | - | - | 3,000 | 1,892.00 | 63.06% | 1,892.00 | 16.32% |

*කිරුළපන කොන්ත්‍රාත්තුව සඳහා පමණි.

යුරෝපා ආයෝජන බැංකු අරමුදල් - කිරුළ-නාරාහේන්පිට කොන්ත්‍රාත්තුව

| A | B | B/A | C | D | D/C | B+D | (B+D)/A |
|---|---|---|---|---|---|---|---|
| සමස්ත ආයෝජන මුදල | 2024.12.31 දක්වා සමස්ත මූල්‍ය ප්‍රගතිය | ප්‍රතිශතය (%) | 2025 වර්ෂය සඳහා වෙන් කිරීම | 2025.01.01 සිට 2025.12.31 දක්වා ප්‍රගතිය | ප්‍රතිශතය (%) | සමුච්චිත ප්‍රගතිය | ප්‍රතිශතය (%) |
| 7,478.57* | - | 0.24% | 4,500 | 2,562.49 | 56.94% | 2,580.75 | 34.50% |

*කිරුළ-නාරාහේන්පිට කොන්ත්‍රාත්තුව සඳහා පමණි.

**7. 2025.12.31 දිනට භෞතික ප්‍රගතිය**

කිරුළපන කොන්ත්‍රාත්තුව

7.1.2024.12.31 දිනට සමුච්චිත භෞතික ප්‍රගතිය (A) - 60%
7.2. වර්ෂය තුළ ප්‍රගතිය (2025.01.01 සිට 2025.12.31 දක්වා) (B) - 5.5 % *
7.3. 2025.12.31 දිනට සමුච්චිත ප්‍රගතිය (A+B) - 65.5%**

* මෙම ප්‍රගතිය 2025.10.23 සිට 2025.12.31 දක්වා වූ කාලය තුළ සිදු වී ඇත.

** මෙතෙක් සිදු කර ඇති සම්පූර්ණ භෞතික ප්‍රගතියට 2022 වර්ෂයේ ආසියානු සංවර්ධන බැංකු ණය අරමුදල් නතර කරන අවස්ථාවේ තිබූ 60% ක භෞතික ප්‍රගතිය ද ඇතුළත් වේ.

කිරුළ-නාරාහේන්පිට කොන්ත්‍රාත්තුව:

7.1. 2024.12.31 දිනට සමුච්චිත භෞතික ප්‍රගතිය (A) - 1.8%
7.2. වර්ෂය තුළ ප්‍රගතිය (2025.01.01 සිට 2025.12.31 දක්වා) (B) - 5 %
7.3. 2025.12.31 දිනට සමුච්චිත ප්‍රගතිය (A+B) - 6.8 %



කාලිංග මාවත පොම්පාගාරය



තලකොටුව උද්‍යානය පොම්පාගාරය



කිරුළ පොම්පාගාරය




නාරාහේන්පිට පොම්පාගාරය

## 2.7.4. නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය (RIDEP)

| | | |
|---|---|---|
| 1 | සමස්ත ආයෝජනය (රු.මි ) | දේශීය = රු.මි. 3,474<br>විදේශීය = යෙන්.මි. 12,957<br>**එකතුව = රු.මි. 20,622**<br>(ණය ගිවිසුම අත්සන් කරන අවස්ථාවේ රු. 1= 0.706 යෙන් අනුව) |
| 2 | ණය ආධාර සපයන ආයතන සහ මුදල් ප්‍රමාණයන් | ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය - 12,957 JPY |
| 3 | 3.1 ව්‍යාපෘති කාල සීමාව (අවුරුදු)<br>3.2 ආරම්භක වසර/ අවසාන වසර | 11<br>2017-2028 |
| 4 | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ප්‍රදේශ (පළාත්/ දිස්ත්‍රික්ක/ පළාත් පාලන ආයතන/ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස/ ග්‍රාම නිලධාරී වසම්/ ගම්) | උතුරු පළාත,<br>නැගෙනහිර පළාත,<br>උතුරු මැද පළාත, ඌව පළාත |

**5. ව්‍යාපෘතියේ අරමුණු**

සෘජුවම දරිද්‍රතාව පිටු දැකීමේ අරමුණ හා ප්‍රාදේශීය වශයෙන් පවතින විෂමතා අවම කිරීම පාදක කර ගනිමින් ඊට අදාළ මූලික නිර්ණායක වන ග්‍රාමීය මාර්ග, කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ වාරිමාර්ග සංවර්ධනය කිරීම සහ පානීය ගෘහස්ත ජල සම්පාදනය වැඩිදියුණු කිරීම මඟින් එම ප්‍රදේශවල පදිංචි ජනතාවගේ මූලික ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම වෙනුවෙන් මෙම ව්‍යාපෘතිය නිර්මාණය කර ඇත.

**6. මූල්‍ය ප්‍රගතිය (රු. මිලියන)**

| A | B | B/A | C | D | D/C | B+D | (B+D)/A |
|---|---|---|---|---|---|---|---|
| **සමස්ත ආයෝජන මුදල** | **2024.12.31 දක්වා සමස්ත මූල්‍ය ප්‍රගතිය** | **ප්‍රතිශතය (%)** | **2025 වර්ෂය සඳහා වෙන් කිරීම** | **2025.01.01 සිට 2025.12.31 දක්වා ප්‍රගතිය** | **ප්‍රතිශතය (%)** | **සමුච්චිත ප්‍රගතිය** | **ප්‍රතිශතය (%)** |
| 20,622.00 | 7,303.93 | 35.42% | 4,598.55 | 210.73** | 4.58% | 7,514.66 | 36.4% |
| වාර්ෂික මූල්‍ය ප්‍රගතිය මුදල් පදනම මත වේ. | | | | | | | |

** තෙවන කාර්තුවේ සිට සිවිල් වැඩ කොන්ත්‍රාත් ආරම්භ කිරීමට අදහස් කළ ද ව්‍යාපෘති උපදේශකයන් නැවත බඳවා ගැනීම ප්‍රමාද වූ හෙයින් අපේක්ෂිත මූල්‍ය ප්‍රගතිය අත්පත් කර ගැනීමට නොහැකි විය.

**7. 2025.12.31 දිනට භෞතික ප්‍රගතිය**

7.1. 2024.12.31 දිනට සමුච්චිත භෞතික ප්‍රගතිය - (A) - 40%

7.2. වර්ෂය තුළ ප්‍රගතිය (2025.01.01 සිට 2025.12.31 දක්වා) (B) – 1.2%
ව්‍යාපෘති උපදේශකයන් නැවත බඳවා ගැනීම අවසාන කර ඇති අතර වැඩ අත්හිටුවා වැඩ බිම්වලින් අයින් වී සිටි කොන්ත්‍රාත්කරුවන් සමඟ සාකච්ඡා කර ඔවුන් නැවත වැඩබිම් තුළට බලමුලු ගැන්වීම පිණිස ඔවුන්ගේ සංශෝධිත ඇස්තමේන්තු පිළියෙල කරමින් පවතී.

7.3. 2025.12.31 දිනට සමුච්චිත ප්‍රගතිය (A+B) – 41.2%



ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ වැලිමඩ ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ පිහිටි, හීන්නාරංගොල්ල හන්දියේ සිට එළමල් අරාව මාර්ගය.



උතුරු මැද පළාතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ඇලහැර ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ පිහිටි, කෝන්දුරුවැව මාර්ගය (Track 32)



උතුරු මැද පළාතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ඇලහැර ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ පිහිටි, කෝන්දුරුවැව ජල සැපයුම් ව්‍යාපෘතියට අයත් අර්ධ වශයෙන් ඉදිකර ඇති කාර්යාල ගොඩනැගිල්ල සහ 20 $m^3$ පරිමාවේ උස් ජල ටැංකිය

### 2.7.5. සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ (GEM) ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන්නේ අධ්‍යාපන අමාත්‍යාංශය සහ පළාත් අධ්‍යාපන අධිකාරීන් (PEAs) විසිනි. රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින් මූල්‍ය කළමනාකරණය, ප්‍රසම්පාදන සහ පාරිසරික හා සමාජ ආරක්ෂණ ක්‍රියාකාරකම් සඳහා පළාත්වලට තාක්ෂණික සහාය ලබා දෙයි.

| | | |
|---|---|---|
| 1 | සමස්ත ආයෝජනය (රු.මිලියන) | ඇමරිකානු ඩොලර් මිලියන 100 |
| 2 | ණය ආධාර සපයන ආයතන සහ මුදල් ප්‍රමාණයන් (රු.මි.) | ලෝක බැංකුව<br>ඇමරිකානු ඩොලර් මිලියන 100 |
| 3 | 3.1 **ව්‍යාපෘති කාල සීමාව** (අවුරුදු)<br>3.2 **ආරම්භක වසර/ අවසාන වසර** | අවු. 8 මාස 6<br>2018 - 2027 |
| 4 | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ප්‍රදේශ<br>(පළාත්/ දිස්ත්‍රික්ක/ පළාත් පාලන ආයතන/ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස/ ග්‍රාම නිලධාරී වසම්/ ගම්) | සියළුම පළාත් |

**5. අරමුණ**

ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ භාරකාරත්වය ශක්තිමත් කිරීම.

**6. මූල්‍ය ප්‍රගතිය (රු. මිලියන)**

මෙම ව්‍යාපෘතිය අධ්‍යාපන බලධාරීන් විසින් ක්‍රියාත්මක කරන අතර පළාත් සභා සහ පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය මඟින් පළාත් අංශ සඳහා මූල්‍ය, ප්‍රසම්පාදන හා පාරිසරික කටයුතු වෙනුවෙන් තාක්ෂණික සහාය ලබාදෙයි. අප අමාත්‍යාංශය හරහා වසර 2020, 2021, 2022 ,2023, 2024 හා 2025 සඳහා පළාත් විසින් පිළිවෙලින් රු. මි. 400.92, 2,010.10, 2,672.32, 3,613.69, 4,998.86 හා 1586.25 ක ව්‍යාපෘති මුදලක් වැය කර ඇත.

| A | B | B/A | C | D | D/C | B+D | (B+D)/A |
|---|---|---|---|---|---|---|---|
| **සමස්ත ආයෝජන මුදල (රු.මි.)** | **2024.12.31 දක්වා සමස්ත මූල්‍ය ප්‍රගතිය (රු.මි.)** | **ප්‍රතිශතය (%)** | **2025 සඳහා වෙන් කිරීම (රු.මි.)** | **2025.01.01- 2025.12.31 දක්වා ප්‍රගතිය (රු.මි.)** | **ප්‍රතිශතය (%)** | **සමුච්චිත ප්‍රගතිය (රු.මි.)** | **ප්‍රතිශතය (%)** |
| 15,282.13 | 13,695.89 | 95% | 3,165.00 | 1,586.25 | 50.12% | 15,282.13 | 100% |

**7. 2025.12.31 දිනට භෞතික ප්‍රගතිය**

7.1. 2024.12.31 දිනට සමුච්චිත භෞතික ප්‍රගතිය

මෙම ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුමේ ආකාරව, 2024 වර්ෂය සඳහා පහත සඳහන් බෙදාහැරීම් හා සම්බන්ධිත දර්ශක (Disbursement Link Indicators – DLIs)/ කාර්යසාධනය පදනම් කරගත් කොන්දේසි (Performance Based Conditions – PBCs) සාක්ෂාත් කරන ලදී.

| | |
|---|---|
| ***DLI 4 -*** පාසල පදනම් කරගත් වෘත්තීය ගුරු සංවර්ධනය (School Based Professional Teacher Development - SBPTD) | කලාපවලින් අවම වශයෙන් 85% ක පාසල් SBPTD ප්‍රතිඵල ලබා ගැනීම. |

| | |
|---|---|
| ***DLI 5 -*** නව වෘත්තීය සුදුසුකම් ලත් ගුරුවරුන් සංඛ්‍යාව වැඩි කිරීම. | අමතර වෘත්තීය සුදුසුකම් ලත් ගුරුවරුන් 27,500 ක් ඇති කිරීම. (ඔවුන්ගෙන් අවම වශයෙන් 50%ක් කාන්තාවන් වීම) |
| ***DLI 6 -*** පාසල් තත්ත්ව සහතික ලබා දීම සඳහා ජාතික පද්ධතියක් ස්ථාපිත කිරීම. | අවම වශයෙන් පාසල් 3,500 ක පාසල් ප්‍රජාව පදනම් කරගත් තත්ත්ව සහතික ස්වයං සමාලෝචන සහ බාහිර සමාලෝචන සම්පූර්ණ කිරීම. |
| ***DLI 7*** - පාසල් වැඩිදියුණු කිරීම සඳහා, වැඩි දියුණු කරන ලද වැඩසටහන (Enhanced Program for School Improvement - EPSI) | කලාපවලින් අවම වශයෙන් 85% ක පාසල් EPSI ප්‍රතිඵල ලබා ගැනීම. |

7.2. වර්ෂය තුළ ප්‍රගතිය (2025.01.01 සිට 2025.12.31 දක්වා)

පළාත් අධ්‍යාපන අංශ විසින් 2025.12.31 දක්වා සමුච්චිත ප්‍රගතිය ලබා ගැනීමට ක්‍රියා කර ඇත.

****මෙම ව්‍යාපෘතිය 2026 වර්ෂයේදී ක්‍රියාත්මක වනුයේ රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ සහාය නොමැතිව අධ්‍යාපන අමාත්‍යාංශය යටතේය.***

## 2.8. දේශීය ණය සහ සංවර්ධන අරමුදල (LLDF)

### 2.8.1. අරමුණ

දිවයිනේ පළාත් පාලන ආයතනවල මහජන උපයෝගීතා සේවා සැපයීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය සහ ආදායම් උත්පාදක ව්‍යාපෘති සඳහා ආයෝජනය කිරීමට අවශ්‍ය අරමුදල් සහන ණය ක්‍රමයක් යටතේ සැපයීම සහ එම ණය මුදල් සහ ඊට අදාළ සහන පොළී ආපසු අයකර එමඟින් පළාත් පාලන ආයතනවල මූලධන ස්වරූපයේ සංවර්ධන ව්‍යාපෘතිවලට නැවත නැවතත් ණය මුදල් ලබාදීම මඟින් එම ආයතනවල ශක්තිමත් ශේෂ පත්‍රයක් ගොඩනැංවීමට මූල්‍ය ආයතනයක් වශයෙන් කටයුතු කිරීම අරමුදලේ මූලික අරමුණ වේ.

### 2.8.2. ප්‍රධාන කාර්යයන්

දැනට ශ්‍රී ලංකාව තුළ සංස්ථාපනය කර ඇති මහා නගර සභා 29, නගර සභා 36 සහ ප්‍රාදේශීය සභා 276 ද ඇතුළුව පළාත් පාලන ආයතන 341 සඳහා අවශ්‍ය දිගුකාලීන මූල්‍ය පහසුකම් සහනදායී පොළී අනුපාතයක් යටතේ සැපයීම අරමුදලේ මූලික කාර්ය භාරය වන අතර විදේශීය ආධාර මත පළාත් පාලන ආයතනවල ක්‍රියාත්මක කර ඇති ණය මුදල් ද ක්‍රමානුකූලව නැවත අයකර මහා භාණ්ඩාගාරය වෙත ආපසු ගෙවීමේ කාර්යභාරය ද මෙම ආයතනය විසින් ඉටුකරනු ලබයි.

**දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ ප්‍රධාන ක්‍රියාවලිය**




සටහන : 2009 වර්ෂයේ සිට ණය ලබාදීමට වැටුප් ගෙවීමට හෝ කිසිඳු පරිපාලන වියදමක් සඳහා හෝ භාණ්ඩාගාරයෙන් කිසිඳු මුදලක් ලබාගෙන නැත.

### 2.8.3. 2025.01.01 දින සිට 2025.12.31 දින දක්වා කාර්ය සාධනය

1.**2025 වර්ෂයේ සංවර්ධන වැඩසටහන්**

2025 වර්ෂයේ දේශීය ණය සහ සංවර්ධන අරමුදලෙන් පළාත් පාලන ආයතනවල යටිතල පහසුකම් සහ ආදායම් උත්පාදක ව්‍යාපෘති සඳහා සහනදායී පොළී අනුපාත යටතේ ණය ලබාදීමට කටයුතු කර ඇති අතර ඒ අනුව 2025.12.31 දිනට ණය ලබාදීමට කටයුතු කර ඇති ව්‍යාපෘති අතුරින් කොමසාරිස් මණ්ඩලය විසින් අනුමත කර ඇති ලැයිස්තුව පහත පරිදි වේ.

| | පළාත් පාලන ආයතනය | ව්‍යාපෘතිය | ණය මුදල |
|---|---|---|---|
| 01 | රාජාංගනය ප්‍රා.ස. | සූර්ය පැනල ව්‍යාපෘතිය | 4,400,000 |
| 02 | පැලියගොඩ නගර සභාව | අවමංගල උත්සව ශාලාවක් ඉදිකිරීම | 25,960,000 |
| 03 | වීරකැටිය ප්‍රා.ස. | ගලි බවුසරයක් මිලදී ගැනීම | 12,000,000 |
| 04 | අනුරාධපුර ම.න.ස. | අවමංගල උත්සව ශාලාවක් ඉදිකිරීම | 36,403,040 |
| 05 | කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රා.ස. | සූර්ය පැනල ව්‍යාපෘතිය | 10,000,000 |
| 06 | පූනකරී ප්‍රා.ස. | බැකෝ යන්ත්‍රයක් මිලදී ගැනීම | 20,768,000 |
| | **එකතුව** | | **109,531,040** |

2. **පසුගිය වසරවල ආරම්භ කර දැනට කරගෙන යන ව්‍යාපෘති සඳහා 2025.01.01 සිට 2025.12.31 දක්වා ණය නිකුත් කළ ප්‍රමාණය.**

| අනු අංකය | පළාත් පාලන ආයතනය | ව්‍යාපෘතිය | වටිනාකම (රු.) |
|---|---|---|---|
| 01 | වැලිකන්ද ප්‍රා.ස. | සූර්ය පැනල ව්‍යාපෘතිය | 3,299,280 |
| 02 | බෝපේ පෝද්දල ප්‍රා.ස. | සූර්ය පැනල ව්‍යාපෘතිය | 6,020,000 |
| 03 | බෝපේ පෝද්දල ප්‍රා.ස. | ආදාහනාගාරය | 10,900,000 |
| 04 | අකුරැස්ස ප්‍රා.ස. | සූර්ය පැනල ව්‍යාපෘතිය | 4,480,000 |
| 05 | මාලිම්බඩ ප්‍රා.ස . | සූර්ය පැනල ව්‍යාපෘතිය | 4,628,000 |
| 06 | කැස්බෑව න.ස. | වෙළඳ සංකීර්ණය | 200,000,000 |
| 07 | බලංගොඩ ප්‍රා.ස. | කඩකාමර ඉදිකිරීම | 279,800 |
| 08 | කඩුගන්නාව න.ස. | ආදාහනාගාරය | 18,929,474 |
| 09 | බලංගොඩ න.ස. | තානායම නවීකරණය | 6,693,000 |
| 10 | වීරකැටිය ප්‍රා.ස. | සූර්ය පැනල ව්‍යාපෘතිය | 4,800,000 |
| 11 | නුවර එළිය ම.න.ස. | වෙළඳ සංකීර්ණය | 9,140,000 |
| 12 | අනුරාධපුර ම.න.ස. | අවමංගල උත්සව ශාලාව | 22,238,388 |
| 13 | කොටපොල ප්‍රා.ස. | සතිපොල | 3,107,790 |
| 14 | නාඋල ප්‍රා.ස. | සූර්ය පැනල ව්‍යාපෘතිය | 2,000,000 |
| 15 | වාරියපොල ප්‍රා.ස. | සූර්ය පැනල ව්‍යාපෘතිය | 6,985,600 |
| 16 | රජ්ගම ප්‍රා.ස. | සූර්ය පැනල ව්‍යාපෘතිය | 2,400,000 |
| 17 | බෙන්තොට ප්‍රා.ස. | වෙළඳ සංකීර්ණය ඉදිකිරීම | 3,654,165 |
| 18 | ඇඹිලිපිටිය ප්‍රා.ස. | කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම | 11,947,260 |
| 19 | පිටබැද්දර ප්‍රා.ස. | සූර්ය පැනල ව්‍යාපෘතිය | 4,736,000 |
| 20 | නැගෙනහිර නුවරගම්පළාත ප්‍රා.ස. | සූර්ය පැනල ව්‍යාපෘතිය | 3,152,000 |
| 21 | ඉමදූව ප්‍රා.ස. | සූර්ය පැනල ව්‍යාපෘතිය | 3,221,590 |
| 22 | ගඟඉහලකෝරලේ ප්‍රා.ස. | වෙළඳ සංකීර්ණය ඉදිකිරීම | 6,000,000 |
| | **එකතුව** | | **338,612,347** |

3. **ණය නිකුත් කිරීමේ ප්‍රගතිය - පළාත් අනුව**

| **පළාත** | **මුදල (රු.)** | **ප්‍රතිශතය (%)** |
|---|---|---|
| බස්නාහිර | 200,000,000 | 59% |
| දකුණ | 47,947,545 | 14% |
| මධ්‍යම | 36,069,474 | 11% |
| උතුරු මැද | 28,689,668 | 08% |
| වයඹ | 6,985,600 | 02% |
| සබරගමුව | 18,920,060 | 06% |
| **එකතුව** | **338,612,347** | |




4. **2024 වර්ෂයේ ආරම්භ කළ සංවර්ධන වැඩසටහන් 2025 වර්ෂයේ ක්‍රියාත්මක කිරීම.**

2024 වර්ෂයේ දේශීය ණය සහ සංවර්ධන අරමුදලෙන් පළාත් පාලන ආයතනවල යටිතල පහසුකම් සහ ආදායම් උත්පාදක ව්‍යාපෘති සඳහා සහනදායී පොළී අනුපාත යටතේ ණය ලබාදීමට කටයුතු කර ඇති අතර මෙම ව්‍යාපෘති විශේෂයෙන්ම රටේ ජාතික ගැටළුවලට විසඳුම් වශයෙන් එම විෂය ක්ෂේත්‍රය කෙරෙහි ප්‍රමුඛතාවය ලබාදෙමින් ආරම්භ කර ඇත. ගරු අග්‍රාමාත්‍ය හා විෂයභාර අමාත්‍යතුමන්ගේ හා අමාත්‍යාංශ ලේකම්තුමන්ගේ පූර්ණ මගපෙන්වීම යටතේ පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදනය කරන ව්‍යාපෘති ආදාහනාගාර ඉදිකිරීමේ ව්‍යාපෘති සහ ඩිජිටල් පුස්තකාල ව්‍යාපෘති සඳහා වැඩි ප්‍රමුඛතාවයක් ලබාදී ඇත. ඒ අනුව කොමසාරිස් මණ්ඩලය විසින් අනුමත කර ඇති ලැයිස්තුව පහත පරිදි වේ. එම ව්‍යාපෘති සඳහා ද ණය නිකුත් කිරීම සිදුකරනු ලැබුවේ 2025 සහ 2026 වර්ෂය තුළදී වේ.

| අ.අ. | **පළාත් පාලන ආයතනය** | **ව්‍යාපෘතිය** | **ණය මුදල** |
|---|---|---|---|
| 01 | අඹගමුව ප්‍රා.ස. | සූර්ය පැනල ව්‍යාපෘතිය | 5,000,000 |
| 02 | නුවරඑළිය ප්‍රා.ස. | සූර්ය පැනල ව්‍යාපෘතිය | 4,480,000 |
| 03 | මස්කෙළිය ප්‍රා.ස. | සූර්ය පැනල ව්‍යාපෘතිය | 1,760,000 |
| 04 | අකුරණ ප්‍රා.ස. | සූර්ය පැනල ව්‍යාපෘතිය | 6,080,000 |
| 05 | මාතලේ ප්‍රා.ස. | සූර්ය පැනල ව්‍යාපෘතිය | 4,800,000 |
| 06 | නාඋල ප්‍රා.ස. | සූර්ය පැනල ව්‍යාපෘතිය | 2,000,000 |

| අ.අ. | පළාත් පාලන ආයතනය | ව්‍යාපෘතිය | ණය මුදල |
|---|---|---|---|
| 07 | නැගෙනහිර නුවරගම්පලාත ප්‍රා.ස. | සූර්ය පැනල ව්‍යාපෘතිය | 5,600,000 |
| 08 | මිහින්තලේ ප්‍රා.ස. | සූර්ය පැනල ව්‍යාපෘතිය | 1,800,000 |
| 09 | කහටගස්දිගිලිය ප්‍රා.ස. | සූර්ය පැනල ව්‍යාපෘතිය | 6,000,000 |
| 10 | ඇලහැර ප්‍රා.ස. | සූර්ය පැනල ව්‍යාපෘතිය | 4,800,000 |
| 11 | දිඹුලාගල ප්‍රා.ස. | සූර්ය පැනල ව්‍යාපෘතිය | 11,648,000 |
| 12 | වැලිකන්ද ප්‍රා.ස. | සූර්ය පැනල ව්‍යාපෘතිය | 3,299,280 |
| 13 | බෝපේ පෝද්දල ප්‍රා.ස. | සූර්ය පැනල ව්‍යාපෘතිය | 7,280,000 |
| 14 | හබරාදුව ප්‍රා.ස. | සූර්ය පැනල ව්‍යාපෘතිය | 3,600,000 |
| 15 | කරන්දෙණිය ප්‍රා.ස. | සූර්ය පැනල ව්‍යාපෘතිය | 2,400,000 |
| 16 | රජගම ප්‍රා.ස. | සූර්ය පැනල ව්‍යාපෘතිය | 2,400,000 |
| 17 | ඉමදූව ප්‍රා.ස. | සූර්ය පැනල ව්‍යාපෘතිය | 3,600,000 |
| 18 | අක්මීමන ප්‍රා.ස. | සූර්ය පැනල ව්‍යාපෘතිය | 2,880,000 |
| 19 | අම්බලන්ගොඩ ප්‍රා.ස. | සූර්ය පැනල ව්‍යාපෘතිය | 7,200,000 |
| 20 | අකුරැස්ස ප්‍රා.ස. | සූර්ය පැනල ව්‍යාපෘතිය | 5,600,000 |
| 21 | මාලිම්බඩ ප්‍රා.ස. | සූර්ය පැනල ව්‍යාපෘතිය | 4,800,000 |
| 22 | පිටබැද්දර ප්‍රා.ස. | සූර්ය පැනල ව්‍යාපෘතිය | 4,800,000 |
| 23 | තිහගොඩ ප්‍රා.ස. | සූර්ය පැනල ව්‍යාපෘතිය | 4,800,000 |
| 24 | වීරකැටිය ප්‍රා.ස. | සූර්ය පැනල ව්‍යාපෘතිය | 4,800,000 |
| 25 | බදුල්ල ම.න.ස. | සූර්ය පැනල ව්‍යාපෘතිය | 14,000,000 |
| 26 | පැලියගොඩ න.ස. | සූර්ය පැනල ව්‍යාපෘතිය | 2,400,000 |
| 27 | නාරම්මල ප්‍රා.ස. | සූර්ය පැනල ව්‍යාපෘතිය | 3,120,000 |
| 28 | වාරියපොල ප්‍රා.ස. | සූර්ය පැනල ව්‍යාපෘතිය | 8,800,000 |
| 29 | කලවාන ප්‍රා.ස | සූර්ය පැනල ව්‍යාපෘතිය | 7,200,000 |
| 30 | ගඟ ඉහළ කෝරලේ ප්‍රා.ස. | වෙළඳ සංකීර්ණය | 30,000,000 |
| 31 | කඩුගන්නාව න.ස. | ආදාහනාගාරය | 20,000,000 |
| 32 | අනුරාධපුර ම.න.ස. | අවමංගල ශාලාව | 28,800,000 |
| 33 | බෝපේ පෝද්දල ප්‍රා.ස. | ආදාහනාගාරය | 50,000,000 |
| 34 | කොටපොල ප්‍රා.ස. | සතිපොල | 10,000,000 |
| 35 | අකුරැස්ස ප්‍රා.ස. | මහජන පුස්තකාලය | 12,000,000 |
| 36 | අකුරැස්ස ප්‍රා.ස. | අවමංගල ශාලාව | 20,800,000 |
| 37 | දික්වැල්ල ප්‍රා.ස. | ආදාහනාගාරය | 20,000,000 |
| 38 | බදුල්ල ම.න.ස. | ක්‍රීඩා සංකීර්ණය | 49,800,000 |
| 39 | රිදීමාලියද්ද ප්‍රා.ස. | විදුලි සැපයීම් ව්‍යාපෘතිය | 1,250,000 |
| 40 | බිබිල ප්‍රා.ස. | සතිපොල | 9,000,000 |
| 41 | සීතාවක ප්‍රා.ස. | කාර්යාල ගොඩනැගිල්ල | 100,000,000 |
| 42 | කැස්බෑව න.ස. | වාණිජ ගොඩනැගිල්ල | 200,000,000 |
| 43 | පැල්මඩුල්ල ප්‍රා.ස. | හෙලබොජුන් හල | 22,640,000 |
| 44 | ඇඹිලිපිටිය ප්‍රා.ස. | කාර්යාල ගොඩනැගිල්ල | 48,000,000 |
| 45 | බලන්ගොඩ න.ස. | විශ්‍රාම ශාලාව | 16,000,000 |
| 46 | කහවත්ත ප්‍රා.ස. | ජල ව්‍යාපෘතිය | 21,280,000 |
| 47 | මීගමුව ම.න.ස. | පුස්තකාලය ඉදිකිරීම | 118,800,000 |
| 48 | කොලොන්න ප්‍රා.ස. | වෙළඳ සංකීර්ණය | 10,000,000 |
| 49 | වත්තේගම න.ස. | සූර්ය පැනල ව්‍යාපෘතිය | 5,400,000 |
| 50 | අඟුණකොළපැලැස්ස ප්‍රා.ස. | සූර්ය පැනල ව්‍යාපෘතිය | 4,800,000 |
| | **එකතුව** | | **945,517,000** |

5. **ආයතනයේ කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා 2023.07.27 සිට 2025.12.31 දක්වා කරන ලද වෙනත් කාර්යයන්**

1. ව්‍යාපාර සැළැස්මක් නොතිබු අතර 2024-2028 කාල පරිච්ඡේදයට අදාළව සියළුම පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් දේශීය ණය සහ සංවර්ධන අරමුදලට ව්‍යාපාර සැළැස්මක් සකස් කොට කොමසාරිස් මණ්ඩල අනුමැතිය ලබා ගෙන ක්‍රියාත්මක කරමින් පවතී.
2. සෑම වසරකම වාර්ෂික අයවැය ලේඛනය, මූල්‍ය බලතල පැවරීම (නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුව), ප්‍රසම්පාදන සැළැස්ම, පුහුණු සැළැස්ම සහ මානව සම්පත් සංවර්ධන සැළැස්ම සකස් කර අනුමැතිය ලබාගෙන ක්‍රියාත්මක කර ඇත.
3. 2022, 2023 සහ 2024 යන වාර්ෂික මූල්‍ය ප්‍රකාශන නියමිත දිනය වන වසරේ පෙබරවාරි 28 දිනට පෙර ඉදිරිපත් කර ඇත. 2022, 2023 වසරවල විගණන මතය වියාචනය කර තිබුණ ද 2024 තත්වාගණනය කළ මතයක් ලබාගෙන ඇත.
4. වාර්ෂික වාර්තා 2022/2023 වසර සඳහා සකස් කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති අතර 2024 වාර්ෂික වාර්තාව සකස් කර පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා අමාත්‍යමණ්ඩලයේ අනුමැතියට ඉදිරිපත් කර ඇති අතර මෙම වාර්තාව උසස් ආකෘතියක් හා උසස් නිමාවකින් මුද්‍රණය කර ඉදිරිපත් කර ඇත. 2024 වාර්තාව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය පවත්වන වාර්ෂික වාර්තා පිළිබඳ තරඟයට ඉදිරිපත් කර ඒ සඳහා පස්වන ස්ථානයට පත්ව ඇත.
5. 2023 ලාභය රු.මිලියන 59.7 වූ අතර ලාභය 2024 වසර සඳහා රු.මිලියන 99.9 ක් දක්වා වැඩි වී ඇත.
6. බඳවා ගැනිමේ පටිපාටියක් සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරවා ගෙන ඇත.
7. මූල්‍ය ගිණුම්කරණ සම්බන්ධ කාර්යපටිපාටි සංග්‍රහයක් සකස්කර ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබාගෙන පුහුණුවීම් වැඩසටහනක් ද නිමකර ඇත. මේ සඳහා ආයතනික පදනමේ සහාය ලබාගෙන ඇත.
8. ණය කළමනාකරණ හා ණය පෙර ඇගයීම් සඳහා කරුණු අන්තර්ගත කාර්යපටිපාටි සංග්‍රහයක් සකස්කර අනුමත කරගෙන නිලධාරීන්ට අවශ්‍ය පුහුණුවීම් ලබාදී ක්‍රියාත්මක කිරීමට ආරම්භ කර ඇත.
9. ණය කළමනාකරණය සඳහා නව මෘදුකාංග හඳුන්වාදීම සඳහා ප්‍රසම්පාදන කටයුතු අවසන් කර ඇති අතර අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් එය යලි ටෙන්ඩර් කිරීමට තීරණය කර ඇත.
10. ප්‍රධාන ලේකම්වරුන් පළාත් පාලන කොමසාරිස්වරුන් සහකාර පළාත් පාලන කොමසාරිස්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් කැඳවා පළාත් නවයේ දේශීය ණය සහ සංවර්ධන අරමුදල ගැන දැනුවත් කිරීමේ වැඩසටහන් 2024 වර්ෂයේ 09 ක් පවත්වා ඇති අතර 2025 වසරේ වැඩසටහන් 8 ක් කර ඇත. අභිනවයෙන් පත්වූ පළාත් පාලන ආයතන ප්‍රධානීන් දැනුවත්කර ඇත.
11. රුපියල් මිලියන 1300 ක වටිනාකම ඇති ව්‍යාපෘති සඳහා ණය මුදල් 2024 වර්ෂය තුළ ලබාදීම සඳහා ණය ප්‍රදාන ලිපි ලබාදීම මඟින් එක් වර්ෂයකදී වැඩිම ණය ප්‍රදාන ලබාදුන් වර්ෂය වශයෙන් නම් කළ හැක. 2025 වසර සඳහා ද ව්‍යාපෘති 50 ක් හඳුනාගෙන ඇත. එම මුදල රුපියල් මිලියන 1087 කි.
12. අවශ්‍ය ඇබෑර්තු සඳහා අවශ්‍ය අනුමැතින් ලබා ගෙන පුරප්පාඩු පුරවා ඇත.
13. වසර ගණනාවක් තිස්සේ නිලධාරින් සේවයේ ස්ථිර කර නොතිබූ අතර කොමසාරිස් මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන සුදුසුකම් ලැබූ නිලධාරින් සියළු දෙනාම සේවයේ ස්ථිර කරන ලදී.
14. නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩයිම් විභාග දීර්ඝ කාලයක් තිස්සේ නොපවත්වා තිබුණ අතර කාර්යක්ෂමතා කඩයිම් විභාග කඩිනමින් පවත්වා නිලධාරීන්ගේ උසස්වීම් ලබා දෙන ලදී.
15. මාස 6 කට පමණ වරක් පවත්වා තිබූ කොමසාරිස් මණ්ඩල රැස්වීම් 2023 ජුලි මස සිට මේ දක්වා මසකට එක බැගින් පවත්වා තීරණ ගැනිමේ ක්‍රියාවලිය ශක්තිමත් කර ඇත.
16. වසර ගණනාවකින් පවත්වා නොතිබූ දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන්ගේ මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් මාසිකව පවත්වා ඇත.
17. වසර ගණනාවක් ස්ථිර අධ්‍යක්ෂකවරයෙකු නොසිට ඇති අතර මේ වන විට ස්ථිර පූර්ණකාලීන අධ්‍යක්ෂකවරයෙකු/ ප්‍රධාන විධායක නිලධාරීවරයෙකු වශයෙන් කටයුතු කර ඇත.

18. අඛණ්ඩව කාර්ය මණ්ඩල රැස්වීම් පවත්වා නොතිබූ අතර වර්තමානයේ මාසිකව කාර්ය මණ්ඩල රැස්වීම් පවත්වා ඇත.
19. දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ ආඥා පනත සංශෝධනයට යෝජනා ලබාගැනීම සඳහා කමිටුවක් පත්කර එම කාර්යයට අදාළ කමිටු වාර්තාව ලබාගෙන ඇත.
20. ණය ආපසු ගෙවීම් පැහැර හැර ඇති පළාත් පාලන ආයතන ගෙන්වා පළාත් මට්ටමින් දැනුවත් කිරීමේ හා සාකච්ඡා කර දීර්ඝ කාලයක් අය නොවූ ණය අයකර ගැනීමට ආරම්භ කර ඇත. උදා. දඹුල්ල මහ නගර සභාව, කුරුණෑගල මහ නගර සභාව, වැලිගම නගර සභාව ආදි වෙතින් අයවිය යුතු රු.මිලියන 106 ක ණය මුදල අයකර ගැනීම ආරම්භ කර ඇත.
21. සියළුම නිලධාරීන්ට රාජකාරී ලැයිස්තු ලබාදී ඇත.
22. කාර්යාලයට අවශ්‍ය වායු සමීකරණ යන්ත්‍ර ආදිය අලුතින් මිලදීගෙන ඇති අතර අලුත්වැඩියා කළ හැකි දෑ අලුත්වැඩියාකර පාවිච්චි කරමින් සිටී.
23. ව්‍යාපාර සැළැස්ම අඛණ්ඩව විමර්ශනය සඳහා ක්‍රියාකාරී කමිටුවක් පත්කර ඒ සඳහා අදාළ කමිටු රැස්වීම් පවත්වා ඇත.
24. අභ්‍යන්තර විගණන කාර්යයන් 2023 ජූලි මස වනතුරු සිදු නොවූ අතර අභ්‍යන්තර විගණන නිලධාරී තනතුරක් ඇතිකර ඒ සඳහා බඳවාගැනීම් පටිපාටි සකස් කර අනුමත කරවාගෙන අභ්‍යන්තර විගණන නිලධාරීයෙකු බඳවාගෙන අභ්‍යන්තර විගණන ක්‍රියාවළි ස්ථාපිත කර ඇත.
25. ඒ අනුව ආයතනය විසින් විගණන හා කළමනාකරණ කමිටු හඳුන්වා අඛණ්ඩව අදාළ රැස්වීම් පවත්වා ඇත.
26. දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන් අඩුපාඩු දිස්ත්‍රික්කවලට නව දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන් පත්කර ඇත.
27. නව ණය යෝජනා ක්‍රම හඳුන්වාදී ඇත. එම ණය යෝජනා ක්‍රමවලින් වඩාත් ජනප්‍රිය ණය යෝජනා ක්‍රමය වන්නේ සූර්ය බලශක්තිය මඟින් විදුලිය නිපදවීමේ ව්‍යාපෘති වේ.
28. ණය ශේෂ නිවැරදි කිරීම සඳහා බාහිර පාර්ශවයකට පැවරුමක් ලබා දී 2018 සිට මේ දක්වා ශේෂ නිවැරදි කර ඇත.
29. නියමිත පරිදි තොග සමීක්ෂණ පවත්වා තීරණ ගෙන ඇත.
30. නඩත්තු ගිවිසුම් නොතිබූ අතර නඩත්තු ගිවිසුම් හඳුන්වාදී සියළුම නඩත්තු ගිවිසුම් යාවත්කාලීන කර ඇත.
31. කාර්යාල නියෝග 37 ක් මේ වනවිට නිකුත්කර ඇත.
32. ආයතනයේ රාජකාරී සඳහා අමාත්‍යාංශයෙන් ඉවත්කරන වාහනයක් ලබා ගෙන එය අලුත්වැඩියා කර සාර්ථකව රාජකාරීවල යොදවා ඇත.
33. ලබා දෙන ණය සඳහා වර්තමානයට ගැලපෙන පොළී ප්‍රතිශත තීරණය කිරීමට කමිටුවක් පත්කර පොළී ප්‍රතිශත සංශෝධනය කර ක්‍රියාත්මක කර ඇත.
34. සංවර්ධන සහකාර තනතුරු නාමය සංවර්ධන නිලධාරී යනුවෙන් භාවිතා කිරීමට අනුමැතිය ලබාගෙන ඇත.
35. ආයතනයේ කාර්යාලය කුලී පදනම මත ලබාගෙන ඇති බැවින් එය රජයේ ස්ථානයකට ගෙන යාමට අවශ්‍ය පියවර ගනිමින් සිටිය ද එය අවසන් කළ නොහැකි වී ඇත.
36. උතුරු නැගෙනහිර පළාත්වල පළාත් පාලන ආයතන සමඟ දේශීය ණය සහ සංවර්ධන අරමුදල ඍජු සම්බන්ධයක් ඇතිකර ගැනීමට කටයුතු කර ඇත.
37. ක්ෂේත්‍ර නිලධාරීන්ගේ ගමන් වියදම් හා සංයුක්ත දීමනාව පවත්නා නීතිවලට ගැලපෙන ආකාරයට සංශෝධනය කරන ලදී.
38. 2018 සිට 2024 දක්වා දිවයිනේ සියළුම පළාත් පාලන ආයතනවල ගිණුම් විශ්ලේෂණය කර ඇත.

## 2.9. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය (SLILG)

### 2.9.1. හැඳින්වීම

1. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය 1999අංක 31 දරන පාර්ලිමේන්තු පනත මඟින් ස්ථාපිත කර ඇත.
2. මෙම ආයතනයේ කටයුතු පරිපාලනය සහ කළමනාකරණය කිරීම සඳහා පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම් ඇතුළු නිල බලයෙන් පත්වන සාමාජිකයන් 8 දෙනෙකු සහ අමාත්‍යාංශයේ ගරු ඇමතිතුමා විසින් පත්කරනු ලබන සාමාජිකයන් 5 දෙනෙකු ඇතුළත් අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කර තිබේ.
3. මෙම ආයතනයේ පරිපාලන කටයුතු ප්‍රධාන විධායක නිලධාරියා වන අධ්‍යක්ෂකවරයා විසින් සිදුකරනු ලැබේ.

### 2.9.2. අරමුණ

1. පළාත් සභා හා පළාත් පාලන ආයතන මඟින් පාලනයෙහි ආයතනික ශක්තිමත් කිරීම, වැඩිදියුණු කිරීම පිණිස කාර්යසාධනය දියුණු කිරීම සඳහා පළාත් කළමනාකරණ සංවර්ධන පුහුණු ඒකකවල හවුල්කාරිත්වය ඇතිව වැඩසටහන් සකස් කිරීම.
2. පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල කාර්යසාධනය දියුණු කිරීම සඳහා පුහුණු වැඩසටහන් සකස් කොට මෙහෙයවීම උදෙසා පළාත් කළමනාකරණ සංවර්ධන පුහුණු ඒකකවලට සහාය දෙමින් ධාරිතා වර්ධනය කිරීම.
3. පළාත් පාලනයෙහි පාර්ශවකරුවන්ට තාක්ෂණික හා අනෙකුත් තොරතුරු ලබා දෙමින් පළාත් සභා සහ පළාත් පාලන ආයතන වෙනුවෙන් සම්පත් මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කිරිම.
4. අදාළ ජාතික හා ජාත්‍යන්තර ආයතන සමඟ සහයෝගීතාවයන් ඇති කිරීම උදෙසා පළාත් සභා හා පළාත් පාලනය වෙනුවෙන් මධ්‍යම ආයතනය ලෙස ක්‍රියා කිරිම.
5. මානව සම්පත් සංවර්ධනයේදී, කළමනාකරණ පද්ධති වැඩි දියුණු කිරීමේදී හා උප ජාතික පාලන ආයතනවල සංවිධානමය වෙනස්කම් වෙනුවෙන් පහසුකම් සැලසීමේදී විශේෂඥ සහායක සේවා ලබා දීම.
6. පළාත් සභා සහ පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීම සඳහා කාර්යක්ෂම හා ඵලදායක පුහුණු උපදේශන හා පර්යේෂණ සේවා සැපයීමට හැකියාව ලබා දීම පිණිස පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයෙහි කාර්යසාධනය වැඩිදියුණු කිරිම.

### 2.9.3. ප්‍රධාන කාර්යයන්

1. ආයතනය විසින් පවත්වනු ලබන පුහුණු පාඨමාලා සාර්ථකව අවසන් කරනු ලබන තැනැත්තන් සඳහා සහතික පත්‍ර ප්‍රදානය කිරීම.
2. යහපත් රාජ්‍ය පාලනයක් ඇති කිරීම තහවුරු කිරීමේ අදහසින් රට තුළ ප්‍රවීණ පළාත් හා පළාත් පාලන නිලධරයන්ගෙන් හා පිරිස්වලින් සමන්විත සේවක ගණයක් ගොඩනැංවීමෙහිලා සහාය වීම.
3. පළාත් හා පළාත් පාලන කළමනාකරණය පිළිබඳ විශේෂඥයන්ගේ සේවය පළාත් සභාවලට හා පළාත් පාලන ආයතනවලට ලබාගැනීමට සැලැස්වීම.
4. පළාත් සභාවල හා පළාත් පාලන ආයතනවල සංවිධාන පද්ධති හා කළමනාකරණ හැකියාවන් වැඩිදියුණු කිරීමෙන් ඒ ඒ පළාත් සභාවලට හා පළාත් පාලන ආයතනවලට සහාය වීම.
5. පළාත් සභා හා පළාත් පාලන ක්ෂේත්‍රයේ උපදේශක තත්ත්වයේ පැවරුම් භාරගැනීම.
6. පළාත් හා පළාත් පාලන ආයතනවල කළමනාකරණ පද්ධතිවල හා පරිචයන්හි විවේචනාත්මක ඇගයීමක් කිරීමෙහිලා මණ්ඩප ඇති කිරීම.
7. කළමනාකරණ සංවර්ධනය හා වැඩ පිළිබඳ ප්‍රතිමාන ස්ථාපනය කිරීම, වන්දි ගෙවීමේ ක්‍රම නිශ්චය කිරීම සහ සාමාන්‍යයෙන් පළාත් කළමනාකරණ සංවර්ධනය සහ පුහුණු කිරීමේ ඒකකවල සහ පළාත් පාලන ආයතනවල ඵලදායීත්වය වැඩිදියුණු කිරීම පිණිස පළාත් කළමනාකරණ සංවර්ධනය සහ පුහුණු කිරීමේ ඒකකවලට (MDTUs) හා පළාත් පාලන ආයතනවලට සහාය වීම.

8. ආයතනයේ පරමාර්ථ හා සමාන පරමාර්ථ ඇති, ශ්‍රී ලංකාව තුළ හෝ විදේශයන්හී පිහිටි වෙනත් බාහිර සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.
9. පළාත් සහ පළාත් පාලනය පිළිබඳ සම්මේලන හා සම්මන්ත්‍රණ සඳහා අනුග්‍රහය දැක්වීම, පැවැත්වීම සහ ඒ පිළිබඳ පොතපත හා සඟරා පලකිරීම.
10. පළාත් පාලනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සකස් කිරීමේ කාර්යය සඳහා අමාත්‍යවරයාට අවශ්‍ය දත්ත හා තොරතුරු සැපයීම.
11. ආයතනයේ කර්තව්‍ය පිළිබඳ අදාළ ආයතන හා මහජනතාව අතර තොරතුරු පතළ කිරීම.
12. පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල සියලු අංශයන් පිළිබඳව පර්යේෂණ පැවැත්වීම, ප්‍රවර්ධනය කිරීම සහ ඒ සඳහා සහාය දැක්වීම.

**2.9.4. 2025 01.01.සිට 2025.123.1 දක්වා කාර්යසාධනය**

| අංශයේ නම | වැඩමුළුවේ නම | භෞතික ප්‍රගතිය | | | |
|---|---|---|---|---|---|
| | | 2025 ක්‍රියාකාරී සැළැස්ම අනුව සැළසුම් කරන ලද වැඩමුළු සංඛ්‍යාව | පවත්වන ලද වැඩමුළු ගණන | භෞතික ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස (%) | සහභාගීත්වය |
| භෞතික සැලසුම් , පරිසර හා ඉංජිනේරු අංශය | සැලසුම් හා ගොඩනැඟිලි රෙගුලාසි පිළිබඳ පුහුණු වැඩමුළුව | 01 | 01 | 100% | 42 |
| | පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම හා නෛතික ක්‍රියාවලිය පිළිබඳ පුහුණු වැඩමුළුව | 01 | 01 | 100% | 56 |
| | ජාතික භෞතික සැලසුම්කරණය සහ භෞතික සැලසුම්කරණ ප්‍රතිපත්තිය පිළිබඳ පුහුණු වැඩමුළුව | 07 | 04 | 60% | 136 |
| | කොන්ත්‍රාත් කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩමුළුව | 05 | 03 | 60% | 124 |
| | රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය පිළිබඳ පුහුණු වැඩමුළුව | 03 | 02 | 70% | 115 |
| | ප්‍රසම්පාදන ක්‍රම පිළිබඳ පුහුණු වැඩමුළුව | 01 | 01 | 100% | 45 |
| | පළාත් පාලන ආයතන ප්‍රධානීන් සඳහා වන දෙදින පුහුණු වැඩමුළුව | 04 | 03 | 80% | 96 |
| පළාත් පාලන අංශය | වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂණය පිළිබඳ පුහුණු වැඩමුළුව | 03 | 02 | 70% | 137 |
| | පළාත් පාලන ඩිප්ලෝමාව මහජන නියෝජිතයින් ස)දහා (202526/ | 01 | 01 | 20% | 53 |
| | පළාත් පාලන ආයතන ප්‍රධානීන් සඳහා වන දෙදින පුහුණු වැඩමුළුව | 01 | 01 | 100% | 28 |
| නීති හා පොදු කළමනාකරණ අංශය | පළාත් පාලන නීති පිළිබඳ පුහුණු වැඩමුළුව | 02 | 01 | 50% | 46 |
| | අධිකරණ කටයුතු පිළිබඳ පුහුණු වැඩමුළුව | 01 | 01 | 100% | 36 |
| | පළාත් පාලන නීතිය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව | 01 | 01 | 100% | 22 |
| | මූලික විමර්ශනයක් පැවැත්වීම සහ චෝදනාපත්‍ර සකස්කිරීම පිළිබඳ පුහුණු වැඩමුළුව | 01 | 01 | 100% | 32 |
| | කාර්යාල කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩමුළුව | 02 | 01 | 50% | 46 |
| | ආකල්ප වර්ධනය පිළිබඳ පුහුණු වැඩමුළුව | 02 | 01 | 50% | 42 |
| | පළාත් පාලන ආයතන ප්‍රධානීන් සඳහා වන දෙදින පුහුණු වැඩමුළුව | 01 | 01 | 100% | 35 |

| අංශයේ නම | වැඩමුළුවේ නම | භෞතික ප්‍රගතිය | | | |
|---|---|---|---|---|---|
| | | 2025 ක්‍රියාකාරී සැළැස්මඅනුව සැළසුම්කරන ලද වැඩමුළු සංඛ්‍යාව | පවත්වන ලද වැඩමුළු ගණන | භෞතික ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස (%) | සහභාගීත්වය |
| තොරතුරු තාක්ෂණ හා මූල්‍ය කළමනාකරණ අංශය | පළාත් පාලන මූල්‍ය කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව 2026/2025 | 01 | 01 | 25% | 20 |
| | පළාත් පාලන මූල්‍ය කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව 2025/2024 | 01 | 01 | 90% | 18 |
| | පළාත් පාලන මූල්‍ය කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව 2024/2023 | 01 | 01 | 100% | 22 |
| | පළාත් පාලන ආයතන ප්‍රධානීන් සඳහා වන දෙදින පුහුණු වැඩමුළුව | 01 | 01 | 100% | 26 |
| | වැටුප් පරිවර්තනය පිළිබඳ පුහුණු වැඩමුළුව | 09 | 07 | 80% | 224 |
| | අයවැය සකස් කිරීම පිලිබඳ පුහුණු වැඩමුළුව | 01 | 01 | 100% | 43 |
| පර්යේෂණ හා සංවර්ධන අංශය | පළාත් පාලන ආයතනයක කාර්ය සාධනය මැනීම සඳහා ප්‍රමුඛ කාර්ය ඵල දර්ශක )Key Performance Indicators - KPIs) ගොඩ නැගීම | 05 | 03 | 60% | 151 |
| | පළාත් පාලන ආයතන ප්‍රධානීන් සඳහා වන දෙදින පුහුණු වැඩමුළුව | 01 | 01 | 100% | 52 |
| අධ්‍යක්ෂ අංශය | දෙවන අන්තර්ජාතික පර්යේෂණ සමුළුව -2025 | 01 | 01 | 100% | 60 |





සැලසුම් හා ගොඩනැඟිලි රෙගුලාසි පිළිබඳ පුහුණු වැඩමුළුව පැවැත්වීම සහ එහි සහතික පත්‍ර ප්‍රදානය කිරීම







අයවැය සකස් කිරීම පිළිබඳ පුහුණු වැඩමුළුව පැවැත්වීම සහ එහි සහතික පත්‍ර ප්‍රදානය කිරීම

සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසි පිළිබඳ පුහුණු වැඩමුළුව පැවැත්වීම



**එස්.ආලෝකබණ්ඩාර**
ලේකම්/ ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

# 03. පරිච්ඡේදය - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය

## 3.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

## 3.2. අග්‍රිම ගැලපුම් ප්‍රකාශය

## 3.3. මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

## 3.4. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

## 3.5. මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 3.6. ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

රු. ,000

| වත්කම් කේතය | කේත විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | රැස් කළ ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | සංශෝධිත ඇස්තමේන්තුව | මුදල (රු.) | සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව % ලෙස |
| _ | _ | _ | _ | _ | _ |

## 3.7. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්යසාධනය

රු. ,000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | සත්‍ය වියදම | උපයෝගී කරගනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|
| පුනරාවර්තන | 375,000,000.00 | 334,376,812.00 | 89% |
| ප්‍රාග්ධන | 24,153,600,000.00 | 14,089,032,768.00 | 58% |

## 3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

රු. ,000

| වත්කම් කේතය | කේත විස්තරය | **2025.12.31** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | **2025.12.31** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | 10,000 | 10,000 | | 100% |
| 9152 | යන්ත්‍රෝපකරණ | 69,821 | 69,821 | | 100% |
| 9153 | ඉඩම් | 7,000 | 7,000 | | 100% |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | - | - | | - |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | | - |
| 9160 | කෙරීගෙන යන වැඩ | - | - | | - |
| 9180 | බදු දෙන ලද වත්කම් | - | - | | - |

## 3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව

# 04. පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක

| අනු අංකය | විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය නිමැවුම | | |
|---|---|---|---|---|
| | | 100%- 90% | 89%-75% | 74%- 50% |
| 1 | පළාත් සභා හා පළාත් පාලන මට්ටමෙන් පවත්වන ලද ධාරිතා සංවර්ධන වැඩසටහන් සංඛ්‍යාව | | | 74% |
| 2 | පළාත් පාලන සේවා වැඩිදියුණු කිරීම සඳහා අමාත්‍යාංශ අයවැය මඟින් ප්‍රදාන ලද පළාත් පාලන ආයතන සංඛ්‍යාව (පළාත් පාලන ප්‍රදේශ) | | | 45% |
| 3 | අමාත්‍යාංශය මඟින් ලද වාර්ෂික ප්‍රතිපාදන උපයෝගීකිරීමේ ප්‍රතිශතය | | | 58% |
| 4 | "ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ වාර්ෂික සැලසුම්" සකස් කර ක්‍රියාත්මක කරන ලද පළාත් පාලන ආයතන සංඛ්‍යාව (අපද්‍රව්‍ය රැස් කිරීම / කොම්පෝස්ට්කරණය/ ප්‍රතිචක්‍රීකරණ......) | | | 38% |
| 5 | දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණය ස්ථාපනය කර ක්‍රියාත්මක කරනු ලබන පළාත් පාලන ආයතන සංඛ්‍යාව | 100% | | |
| 6 | පවත්වන ලද පළාත් ප්‍රධාන ලේකම්වරුන්ගේ සමුළු සංඛ්‍යාව | | | 50% |
| 7 | විදේශ ආධාර ව්‍යාපෘති සඳහා පවත්වන ලද ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම් සංඛ්‍යාව | | | 56% |
| 8 | සිදු කරන ලද පර්යේෂණ / අධ්‍යයන සංඛ්‍යාව සහ පවත්වන ලද ඇගයීම් සංඛ්‍යාව | – | – | – |

# 05. පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

## 5.1. හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු

එක්සත් ජාතීන්ගේ අපේ ලෝකය පරිවර්තනය කිරීම - තිරසර සංවර්ධනය සඳහා 2030 වැඩසටහන (Trasforming Our World -2030 Agenda for Sustainable Development) මඟින් ප්‍රකාශයට පත්කර ඇති තිරසාර සංවර්ධන ඉලක්ක, අරමුණු හා ගෝලීය දර්ශක රාමුව අනුව මෙම අමාත්‍යාංශයේ පළාත් සභා සහ පළාත් පාලන විෂය පථයට සෘජු සම්බන්ධතාවයන් දැක්වෙන අරමුණු, ඉලක්ක හා ජයග්‍රහණ දර්ශක පහත පරිදි වේ.

| අ.අ. | අරමුණු | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50% - 74% | 75% - 100% |
| 1 | **ඉලක්ක අංක 11**<br>නගර සහ මානව ජනාවාස සියල්ල ඇතුළත්ව, ආරක්ෂිත, ඔරොත්තු දෙන සහ තිරසාර බවට පත්කිරීම. | 11.6 | 11.6.1 - නගරවල ජනනය වන මුළු නාගරික ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය අතරින් නිතිපතා එකතු කෙරෙන සහ නිසි පරිදි බැහැර කෙරෙන නාගරික ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය | **43%** | | |
| 2 | **ඉලක්ක අංක 12**<br>තිරසාර පරිභෝජන සහ නිෂ්පාදන රටාවන් සහතික කිරීම. | 12.5 | 12.5.1 - ජාතික ප්‍රතිචක්‍රීකරණ වේගය, ප්‍රතිචක්‍රීකරණ ද්‍රව්‍ය ටොන් ගණන | **දිනකට ටොන් 02 යි** | | |

## 5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ සහ අභියෝග

ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සහායක මධ්‍යස්ථානය පළාත් සභා සහ පළාත් පාලන අංශය යටතේ ක්‍රියාත්මක වන බැවින් උක්ත ඉලක්ක සඳහා නිරන්තර මැදිහත්වීමක් ලබා දී ඇත. එමෙන්ම පසුගිය වසර ගණනාවක් පුරා සැලකිය යුතු ප්‍රාග්ධන ආයෝජනයන් ද සිදු කර ඇත. ඒ අනුව, පළාත් සභා සහ පළාත් පාලන අංශයට සෘජුව අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක හා දර්ශක යටතේ ලබා ඇති ජයග්‍රහණ ඉහත වගුවේ දැක්වෙන පරිදි වේ. ඉහත 12.5.1 යටතේ දැක්වෙන ජයග්‍රහණ දර්ශකය යටතේ වාර්තා වී ඇත්තේ දැනට දිනකට ටොන් දෙකක් ප්‍රතිචක්‍රීයකරණය වන බවයි. ඒ අනුව, ප්‍රතිශතාත්මක අගයක් ඉදිරිපත් කිරීමට මෙතෙක් අපහසු වී ඇත.

# 06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

## 6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

| අ.අ. | තනතුර | අනුමත තනතුරු සංඛ්‍යාව | සිටින සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|
| 1 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 30 | 25 | 06 |
| 2 | තෘතීය මට්ටම | 04 | 02 | 02 |
| 3 | ද්විතීය මට්ටම | 127 | 113 | 14 |
| 4 | ප්‍රාථමික මට්ටම | 44 | 36 | 08 |
| එකතුව | | **205** | **176** | **30** |

**දෙපාර්තමේන්තු පත්වීම්**

| | | |
|---|---|---|
| 1 | කළමනාකරණ සහකාර | 18 |
| 2 | රියදුරු | 08 |
| 3 | කාර්යාල කාර්ය සේවක | 10 |
| එකතුව | | **36** |

## 6.2. **ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

මෙම ආයතනය සඳහා අනුමත කාර්ය මණ්ඩලයට අනුව මේ වන විට මාණ්ඩලික නිලධාරි තනතුරු, සංවර්ධන නිලධාරි, කළමනාකරණ සේවා නිලධාරි, රියදුරු මෙන්ම කාර්යාල සේවක සේවයේ තනතුරු පුරප්පාඩු පැවතීම මත ආයතනය මඟින් ඉටුවිය යුතු මෙහෙවර සහ අරමුණු කාර්යක්ෂමව සහ කඩිනම්ව සිදුකිරීමට බාධාවක් වී ඇත. ඒ අනුව ආයතනයේ කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා මෙම මානව සම්පත් හිඟය සම්පූර්ණ කිරීම මහඟු පිටුවහලක් වනු ඇත.

## 6.3. මානව සම්පත් සංවර්ධනය

| අ.අ | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය | | වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය) | නිමැනුම / ලබාගත් දැනුම* |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය (රුපියල්) | විදේශීය (ඇ.එ.ජ.ඩොලර් / පවුම්) | | |
| 1 | රාජ්‍ය නිලධරයන්ගේ වැටුප් විධිවිධාන පිළිබඳ වැඩමුළුව | 15 | 2025.03.06 | 101,250.00 | - | දේශීය | වැටුප් සහ දීමනා ව්‍යුහය, වැටුප් සම්බන්ධ විධිවිධාන, වැටුප් වර්ධක ආදියෙහි දැනුම ලබා දීම. |
| 2 | ලිපිගොනුකරණය හා ගොනු සටහන් ලිවීම | 13 | 2025.03.27 | 108,000.00 | - | - | ලිපිගොනුකරණය හා ගොනු සටහන් ලිවීම පිළබඳ පුහුණුව ලබා ගැනීම. |
| 3 | දත්ත විශ්ලේෂණ පිළිබඳ පුහුණුව (MS Excel & Power BI) | 11 | 2025.03.26 සිට 28 දක්වා | 209,000.00 | - | දේශීය | දත්ත විශ්ලේෂණ පිළිබඳ දැනුම |
| 4 | කාර්යාල කාර්ය සහායකයින් සහ රියදුරන්ගේ ආකල්ප හා වෘත්තීය දැනුම ඉහළ නැංවීම පිළිබඳ වැඩමුළුව | 17 | 2025.06.04 | 114,750.00 | - | දේශීය | රියදුරන් සහ කාර්යාල කාර්ය සහායකයින් සඳහා විනය සහ කාර්යාලීය ආචාර විධි පිළිබඳ පුහුණුවක් ලබා දීම. |

| අ.අ | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය | | වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය) | නිමැනුම / ලබාගත් දැනුම* |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය (රුපියල්) | විදේශීය (ඇ.එ.ජ.ඩොලර් / පවුම්) | | |
| 5 | සන්නිවේදන හා මහජන සම්බන්ධතා උසස් ඩිප්ලෝමා පාඨමාලාව | 01 | අවුරුදු 01 | 90,000.00 | - | දේශීය | සන්නිවේදන හා මහජන සම්බන්ධතා පිළිබඳ පුහුණුවක් ලබා දීම. |
| 6 | මහජනතාව ඉදිරියේ කතා කිරීමේ ශිල්පීය ක්‍රම | 12 | 2025.06.26 | 96,000.00 | - | දේශීය | Public Speaking පිළිබඳ දැනුම ලබා දීම. |
| 7 | තොරතුරු දැන ගැනීමේ පනත පිළිබඳ පුහුණු වැඩසටහන | 22 | 2025.06.03 | රාජ්‍ය පරිපාලන අංශය යටතේ සිදු කරන ලදී. | - | දේශීය | තොරතුරු දැන ගැනීමේ පනත පිළිබඳ දැනුම ලබා දීම. |
| 8 | රථ වාහන ධාවනය පිළිබඳ නව නීති හා රියදුරු ආචාර ධර්ම පිළිබඳ පුහුණුව | 05 | 2025.06.20 | රාජ්‍ය පරිපාලන අංශය යටතේ සිදු කරන ලදී. | - | දේශීය | රථ වාහන ධාවනය පිළිබඳ නව නීති හා රියදුරු ආචාරධර්ම පිළිබඳ දැනුම ලබා දීම. |
| 9 | අපේක්ෂිත උද්ධමනය පිළිබඳ සමීක්ෂණය | 10 | - | රාජ්‍ය පරිපාලන අංශය යටතේ සිදු කරන ලදී. | - | දේශීය | - |
| 10 | රාජ්‍ය සේවයේ උපාය මාර්ගික කළමනාකරණය පිළිබඳ පුහුණුව | 05 | 2025.05.27 | රාජ්‍ය පරිපාලන අංශය යටතේ සිදු කරන ලදී. | - | දේශීය | රාජ්‍ය සේවයේ උපාය මාර්ගික කළමනාකරණය පිළිබඳ දැනුම ලබා දීම. |
| 11 | නව ප්‍රසම්පාදනය මාර්ගෝපදේශ සංග්‍රහය පිළිබඳ දින 05 පුහුණුව | 07 | - | රාජ්‍ය පරිපාලන අංශය යටතේ සිදු කරන ලදී. | - | දේශීය | ප්‍රසම්පාදනය පිළිබඳව පුහුණුවක් ලබා දීම. |
| 12 | පෝෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | 60 | 2025.06.30 | ශ්‍රී ලංකා පෝෂණ සංවිධානය මඟින් සිදු කරන ලදී. | - | දේශීය | පෝෂණය පිළිබඳ දැනුවත් කිරීම |
| 13 | කාර්යාල කළමනාකරණය සහ කාර්ය පටිපාටික රීති පුහුණුව | 04 | 2025.07.23 | 30,000.00 | - | දේශීය | කාර්යාල කළමනාකරණය සහ කාර්ය පටිපාටික රීති පිළිබඳ දැනුම ලබා දීම. |
| 14 | රාජ්‍ය සේවයේ ඩිජිටල්කරණය | 06 | 2025.07.28 | රාජ්‍ය පරිපාලන අංශය යටතේ සිදු කරන ලදී. | - | දේශීය | ඩිජිටල්කරණය පිළිබඳ දැනුම ලබා දීම. |

| අ.අ | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය | | වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය) | නිමැනුම / ලබාගත් දැනුම* |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය (රුපියල්) | විදේශීය (ඇ.එ.ජ.ඩොලර් / පවුම්) | | |
| 15 | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පිළිබඳ වැඩමුළුව 2024 | 14 | 2025.07.08 | 99,750.00 | - | දේශීය | ප්‍රසම්පාදනය පිළිබඳ දැනුම ලබා දීම. |
| 16 | Using Microsoft Excel in Your Workshop | 18 | 2025.07.14, 16 | - | - | දේශීය | Microsoft Excel පිළිබඳ දැනුම ලබා දීම. |
| 17 | අමාත්‍ය මණ්ඩල සංදේශ හා නිරීක්ෂණ සකස් කිරීම. | 19 | 2025.07.18 | රාජ්‍ය පරිපාලන අංශය යටතේ සිදු කරන ලදී. | - | දේශීය | අමාත්‍ය මණ්ඩල සංදේශ හා නිරීක්ෂණ සකස් කිරීම පිළිබඳ දැනුම ලබා දීම. |
| 18 | Microsoft Advanced Excel වැඩමුළුව | 08 | 2025.07.14, 16 | 201,600.00 | - | දේශීය | Advanced Excel පිළිබඳ දැනුම ලබා දීම. |
| 19 | රාජ්‍ය නිලධරයන්ගේ වැටුප් විධිවිධාන පිළිබඳ වැඩමුළුව | 11 | 2025.07.29 | 74,250.00 | - | දේශීය | රාජ්‍ය නිලධරයන්ගේ වැටුප් විධිවිධාන පිළිබඳ දැනුම වර්ධනය |
| 20 | CCNA 200-300 VL-1 පරිගණක ජාලකරණ පිළිබඳ පාඨමාලාව | 02 | 2025.08.02 | 70,000.00 | - | දේශීය | පරිගණක ජාලකරණ පිළිබඳ දැනුම ලබා දීම. |
| 21 | රජයේ වාහන නඩත්තුව හා අලුත්වැඩියාව පිළිබඳ දැනුම ලබා දීම. | 02 | 2025.08.14 | රාජ්‍ය පරිපාලන අංශය යටතේ සිදු කරන ලදී. | - | දේශීය | රජයේ වාහන නඩත්තුව හා අලුත්වැඩියාව පිළිබඳ දැනුම ලබා දීම. |
| 22 | පැය 150 ක දෙමළ භාෂා පුහුණු පාඨමාලාව | 01 | 2025.03.03 සිට 2025.04.30 | 10,000.00 | - | දේශීය | දෙමළ භාෂා දැනුම වර්ධනය |
| 23 | පැය 100 ක දෙමළ භාෂා පුහුණු පාඨමාලාව | 01 | 2025.05.26 සිට 2025.07.14 | 5,000.00 | - | දේශීය | දෙමළ භාෂා දැනුම වර්ධනය |
| 24 | රාජ්‍ය සේවාව තුළ භාෂා භාවිතය | 06 | 2025.08.22 | රාජ්‍ය පරිපාලන අංශය යටතේ සිදු කරන ලදී. | - | දේශීය | රාජ්‍ය සේවාව තුළ භාෂා භාවිතය පිළිබඳ දැනුම වර්ධනය |
| 25 | අමාත්‍යාංශ කාර්ය මණ්ඩල නිලධාරීන්ගේ ආකල්ප සංවර්ධනය හා මානසික සුවතා වර්ධන වැඩසටහන | සියලුම නිලධාරීන් | 2025.10.10 | 185,000.00 | - | දේශීය | නිලධාරීන්ගේ ආකල්ප සංවර්ධනය හා මානසික සුවතා වර්ධනය |
| 26 | සමාජීය බලපෑම් කණ්ඩායම් කළමනාකරණය පිළිබඳ පුහුණුව | 08 | 2025.09.26 | රාජ්‍ය පරිපාලන අංශය යටතේ සිදු කරන ලදී. | - | දේශීය | සමාජීය බලපෑම් කණ්ඩායම් කළමනාකරණය පිළිබඳ දැනුම වර්ධනය |

| අ.අ | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය | | වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය) | නිමැනුම / ලබාගත් දැනුම* |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය (රුපියල්) | විදේශීය (ඇ.එ.ජ.ඩොලර් / පවුම්) | | |
| 27 | කාර්යාල ක්‍රම පිළිබඳ පුහුණු වැඩසටහන | 57 | 2025.10.17 | 6,000.00 | - | දේශීය | කාර්යාල ක්‍රම පිළිබඳ දැනුම වර්ධනය |
| 28 | Microsoft Advanced Excel වැඩමුළුව | 08 | 2025.09.22, 23 | 112,000.00 | - | දේශීය | Microsoft Advanced Excel දැනුම වර්ධනය |
| 29 | රාජ්‍ය ප්‍රසම්පාදනය හා වත්කම් කළමනාකරණය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව | 05 | 2025.11.13 | 150,000.00 | - | දේශීය | ප්‍රසම්පාදනය පිළිබඳ දැනුම ලබා දීම. |
| 30 | 2025 අංක 02 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | 06 | 2025.11.17 | ස්වදේශ කටයුතු අංශය යටතේ සිදු කරන ලදී. | - | දේශීය | 2025 අංක 02 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත පිළිබඳ දැනුවත් කිරීම. |
| 31 | ඵලදායිතා සංකල්ප (5S) විගණක පුහුණුව | 01 | 2025.12.09,10 | 8,000.00 | - | දේශීය | ඵලදායිතා පිළිබඳ දැනුම වර්ධනය |
| 32 | කාර්යාල කාර්ය සහායකයින් සහ රියදුරන්ගේ ආකල්ප හා වෘත්තීය දැනුම ඉහළ නැංවීම පිළිබඳ වැඩමුළුව | 05 | 2025.12.16 | 37,500.00 | - | දේශීය | කාර්යාල කාර්ය සහායකයින් සහ රියදුරන්ගේ ආකල්ප හා වෘත්තීය දැනුම ඉහළ නැංවීම. |
| 33 | පළාත් පාලන හුවමාරු සහ සහයෝගීතා සම්මන්ත්‍රණය 2024 | 01 | 2025.02.09 - 2025.02.15 | - | - | විදේශීය | පළාත් පාලන හුවමාරු සහ සහයෝගීතා පිළිබඳ දැනුම |
| 34 | ශබ්ද ද්‍රව්‍ය සඳහා ප්‍රතිචක්‍රීකරණය ප්‍රවර්ධනය සමඟ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා තාක්ෂණය - චක්‍රීය සමාජය (ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනයේ (JICA) දැනුම සහයෝගීතා නිර්මාණ වැඩසටහන) | 01 | 2025.05.06 - 2025.06.25 | - | - | විදේශීය | ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය ප්‍රවර්ධනය සමඟ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා තාක්ෂණය පිළිබඳ දැනුම |

| අ.අ | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය | | වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය) | නිමැනුම / ලබාගත් දැනුම* |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය (රුපියල්) | විදේශීය (ඇ.එ.ජ.ඩොලර් / පවුම්) | | |
| 35 | ශ්‍රී ලංකාවේ සිවිල් සේවකයින් සඳහා ඩිජිටල් පාලනය පිළිබඳ ධාරිතා වර්ධන වැඩසටහන | 05 | 2025.04.21 - 2025.05.05<br>2025.05.26 - 2025.06.06 | - | - | විදේශීය | ශ්‍රී ලංකාවේ සිවිල් සේවකයින් සඳහා අවශ්‍ය ඩිජිටල් පාලනය පිළිබඳ දැනුම |
| 36 | 2025-2026 දේශගුණික මූල්‍යකරණයට ප්‍රවේශ වීම සඳහා ඕස්ට්‍රේලියානු සම්මාන කලාපීය කෙටි පාඨමාලාව (දකුණු ආසියාව සහ මොන්ගෝලියාව) | 01 | - | - | - | විදේශීය | දේශගුණික මූල්‍යකරණයට ප්‍රවේශ වීම පිළිබඳ දැනුම |
| 37 | උතුරු මැද පළාත් සභාවේ සාමය ගොඩනැගීම සහ සමාජ ඒකාබද්ධතාවය සඳහා ග්‍රාම ආර්ථික සංවර්ධනය පිළිබඳ රජයේ නිලධාරීන් සඳහා ධාරිතා වර්ධනය පිළිබඳ KOICA CIAT පුහුණු වැඩසටහන, ශ්‍රී ලංකාව (2024-2026) | 02 | 2025.06.22 - 2025.07.05 | - | - | විදේශීය | උතුරු මැද පළාත් සභාවේ සාමය ගොඩනැගීම සහ සමාජ ඒකාබද්ධතාවය සඳහා ග්‍රාම ආර්ථික සංවර්ධනය පිළිබඳ රජයේ නිලධාරීන් සඳහා ධාරිතා වර්ධනය පිළිබඳ දැනුම |
| 38 | ශ්‍රී ලංකාවේ රජයේ නවෝත්පාදනයන් සඳහා රාජ්‍ය නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය පිළිබඳ 2025 KOICA CIAT පුහුණු වැඩසටහන | 01 | 2025.07.13 - 2025.07.23 | - | - | විදේශීය | ශ්‍රී ලංකාවේ රජයේ නවෝත්පාදනයන් සඳහා රාජ්‍ය නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය |
| 39 | ඕස්ට්‍රේලියානු සම්මාන කලාපීය කෙටිකාලීන පාඨමාලාව - විධායක නායකත්ව සංවර්ධනය 2025 | 01 | 2025.08.13 - 2025.08.23 | - | - | විදේශීය | විධායක නායකත්ව සංවර්ධනය පිළිබඳ දැනුම |
| 40 | "පිරිසිදු නගර, වඩා හොඳ අනාගතයක්: කලාපීය භාවිතයන් සමඟ නාගරික ශ්‍රී ලංකාව පරිවර්තනය කිරීම" යන මාතෘකාව යටතේ ශ්‍රී ලංකාවේ සිවිල් සේවකයින් සඳහා ධාරිතා වර්ධන වැඩසටහන | 03 | 2025.09.25 - 2025.10.03 | - | - | විදේශීය | පිරිසිදු නගර,හොඳ අනාගතයක් සඳහා කලාපීය භාවිතයන් සමඟ නාගරික ශ්‍රී ලංකාව පරිවර්තනය කිරීම පිළිබඳ දැනුම |

| අ.අ | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය | | වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය) | නිමැනුම / ලබාගත් දැනුම* |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය (රුපියල්) | විදේශීය (ඇ.එ.ජ.ඩොලර් / පවුම්) | | |
| 41 | හරිත කර්මාන්ත සහයෝගිතා හුවමාරුව පිළිබඳ චීන-ෂැංහයි සහයෝගිතා සංවිධාන සම්මන්ත්‍රණය (මූලික කාලසටහන) | 01 | 2025.10.11 - 2025.10.20 | - | - | විදේශීය | හරිත කර්මාන්ත සහයෝගිතා හුවමාරුව පිළිබඳ දැනුම |
| 42 | ආසියාවේ මානව හිමිකම් පරිපාලනය වැඩිදියුණු කිරීම පිළිබඳ පළාත් පාලන ආයතන සඳහා ධාරිතා වර්ධනය පිළිබඳ KOICA CIAT පුහුණු වැඩසටහන 2025 | 02 | 2025.10.19 - 2025.11.01 | - | - | විදේශීය | පළාත් පාලන ආයතන සඳහා මානව හිමිකම් පරිපාලනය වැඩිදියුණු කිරීමේ අධ්‍යාපනය සඳහා ධාරිතා වර්ධනය පිළිබඳ දැනුම |
| 43 | ඉන්දියාවේ පරිපාලන ප්‍රතිසංස්කරණ සහ මහජන දුක්ගැනවිලි දෙපාර්තමේන්තුවේ, යහපාලනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානයේ, ශ්‍රී ලංකාවේ සිවිල් සේවකයින් සඳහා "පිරිසිදු නගර, වඩා හොඳ අනාගතයක්: කලාපීය භාවිතයන් සමඟ නාගරික ශ්‍රී ලංකාව පරිවර්තනය කිරීම ii" ධාරිතා වර්ධන වැඩසටහන | 01 | 2025.10.27 - 2025.11.07 | - | - | විදේශීය | පිරිසිදු නගර, වඩා හොඳ අනාගතයක් සඳහා කලාපීය භාවිතයන් සමඟ නාගරික ශ්‍රී ලංකාව පරිවර්තනය කිරීම. |
| 44 | 1028-1110 රාජ්‍ය සේවා වැඩිදියුණු කිරීම සහ නවෝත්පාදනය පිළිබඳ ASEAN සම්මන්ත්‍රණය | 01 | 2025.10.31 – 2025.11.17 | - | - | විදේශීය | රාජ්‍ය සේවා වැඩිදියුණු කිරීම සහ නවෝත්පාදනය පිළිබඳ දැනුම |
| 45 | නාගරික සැලසුම්කරණය පිළිබඳ පාඨමාලාව | 01 | 2025.11.26 – 2025.11.22 | - | - | විදේශීය | නාගරික සැලසුම්කරණය පිළිබඳ දැනුම |

***ආයතනයේ කාර්යසාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන ආකාරය කෙටියෙන් පැහැදිළි කිරීම.**

- දැනට ආයතනයට අනුයුක්තව සිටින නිලධාරීන් සියලුදෙනා වෙතම විෂයානුබද්ධ හා ආයතනික කාර්යභාරය සම්බන්ධයෙන් පුහුණුවක් ලබාදීම මඟින් එම නිලධාරියාගේ කාර්යයන්ට නිවැරදි හා අවබෝධාත්මක කාර්යයක් ලබා ගැනීමට ඇති හැකියාව මත ආයතනයේ කාර්යසාධනය ඉහළ නංවා ගැනීමට අවකාශ ලැබෙනු ඇත.

- පුහුණුව හා සංවර්ධනයේ ඇති වැදගත්කම පිළිබඳ කතාබහ කිරීමේදී එය ප්‍රධාන කරුණු කිහිපයක් යටතේ පෙළ ගැස්විය හැකිය.

1) දුර්වලතා හඳුනා ගැනීම.
2) කාර්යයන් ඉටු කිරීමේ ඵලදායිතාව හා ගුණාත්මකභාවය වැඩි කිරීම.
3) නව ක්‍රමෝපායන් සහ නිෂ්පාදන නවෝත්පාදනය.
4) අඩු සේවක පිරිවැටුම
5) සේවක තෘප්තිය හා විශ්වාසය රඳවා ගැනීම.

# 07. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශන/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ. | - | - |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ. | - | - |
| 1.3 | ව්‍යාපාර හා නිශ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම) | - | - | - |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම | - | - | - |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම | - | - | - |
| 1.6 | වෙනත් | - | - | - |
| **2** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම. (මු.රෙ. 445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | - | - |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | - | - |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | - | - |
| 2.4 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම. | අනුකූල වේ. | - | - |
| 2.5 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | - | - |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | - | - |
| 2.7 | ඉන්වෙන්ට්‍රිගත ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | - | - |
| 2.8 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | - | - |
| 2.9 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | - | - |
| 2.10 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | - | - |
| **3** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතන තුළ බලතල පවරා දී තිබීම. | අනුකූල වේ. | - | - |
| 3.2 | මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම. | අනුකූල වේ. | - | - |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිළධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම. | අනුකූල වේ. | - | - |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම. | අනුකූල වේ. | - | - |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ. | - | - |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ. | - | - |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ. | - | - |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම. | අනුකූල වේ. | - | - |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | - | - |
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කර ඇති දිනට සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම. | අනුකූල නොවේ. | විගණන විමසුම්වලට පිළිතුරු සකස් කිරීමේ දී අමාත්‍යාංශය යටතේ ඇති අංශ හා ව්‍යාපෘතිවලින් තොරතුරු ගෙන්වා ගැනීමේ දී ඇතිවන ප්‍රමාදයන් | අදාළ ප්‍රමාදයන් අවම කිරීමට කටයුතු කිරීම |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මුදල් රෙගුලාසි 134 (2) ප්‍රකාරව විගණකාධිපතිගෙන් උපදෙස් ලබා ගැනීමෙන් පසුව වර්ෂය ආරම්භයේ දී අභ්‍යන්තර විගණන වැඩසටහන පිළියෙල කරන ලදී. | අනුකූල වේ. | - | - |
| 6.2 | සියළු අභ්‍යන්තර විගණන වාර්තාවලට මසක් තුළ පිළිතුරු සපයා ඇත. | අනුකූල නොවේ. | නිකුත් කර ඇති අභ්‍යන්තර විගණන විමසුම් 32 ට අදාළව<br><br>මසක් ඇතුළත විගණන විමසුම් 27 ක් සඳහා පිළිතුරු ලබා දී ඇත.<br><br>විගණන විමසුම් 05 කට ප්‍රමාදවී පිළිතුරු සපයා ඇත.<br><br>විගණන විමසුම් 05 කට පිළිතුරු ලැබීමට ඇති අතර මසක් ඉක්ම ගොස් නැත. | විගණන විමසුම් හා වාර්තා සඳහා පිළිතුරු ලබා දීම සම්බන්ධයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ දී දැනුවත් කිරීම.<br><br>සිහි කැඳවීම් ලිපි යැවීම.<br><br>දුරකතන මාර්ගයෙන් දැනුම් දීම. |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 6.3 | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (14) උප වගන්තිය ප්‍රකාරව සියළු අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. | අනුකූල වේ. | - | - |
| 6.4 | සියළු අභ්‍යන්තර විගණන වාර්තා මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත. | අනුකූල වේ. | - | - |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටුව** | | | |
| 7.1 | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ 1/2019 අනුව වර්ෂය තුළ කළමනාකරණ විගණන කමිටු රැස්වීම් අවම වශයෙන් 04 ක් පවත්වා ඇත. | අනුකූල වේ. | - | - |
| **8** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | - | - |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිළධාරියෙකු පත්කර එම නිළධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම. | අනුකූල වේ. | - | - |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | - | - |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම. | අනුකූල වේ. | - | - |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම. | අනුකූල වේ. | - | - |
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | දෛනික ධාවන සටහන් සහ සංචිත වාහන පිළිබඳ මාසික සාරාංශ සකස් කළ අතර නියමිත දිනයේ දී විගණකාධිපති වෙත භාර දෙන ලදී . | අනුකූල වේ. | - | - |
| 9.2 | අභාවිත වාහන එම තත්ත්වයට පත්වී සය මසක් ගතවීමට පෙර අපහරණය කරන ලදී . | අනුකූල වේ. | ගර්හිත වාහන නොමැත. | - |
| 9.3 | වාහන ලොග් පොත් යාවත්කාලීන කර පවත්වාගන්නා ලදී . | අනුකූල වේ. | - | - |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 9.4 | සෑම රිය අනතුරක් සම්බන්ධයෙන් ම මු .රෙ.103, 104, 109 සහ 110 ප්‍රකාරව පියවර ගන්නා ලදී. | අනුකූල වේ. | - | - |
| 9.5 | 2016.12.29 දිනැති 30/2016 අංක දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන භාවිතය නැවත පරීක්ෂා කරන ලදී. | අනුකූල වේ. | - | - |
| 9.6 | කල් බදු පදනම මත මිලදී ගත් වාහනවල ලොග් පොත්වල පූර්ණ අයිතිය කල්බදු කාලසීමාව අවසන් වීමෙන් පසු පවරන ලදී. | අනුකූල වේ. | - | - |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | - | - |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම. | අනුකූල වේ. | - | - |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබී | අනුකූල වේ. | - | - |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම. | අනුකූල වේ. | - | - |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම. | අනුකූල වේ. | - | - |
| **12** | **රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්ට අනුකූල වීම. | අනුකූල වේ. | - | - |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම. | අනුකූල වේ. | - | - |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම. | අනුකූල නොවේ. | හිඟ ණය ශේෂ පහත පරිදි වේ.<br>1. එම්.ටී.එස්.ගුනවංශ මයා හිඟ ණය ශේෂ - 143,200/- - නීතිපති දෙපාර්තමේන්තුවේ කොළඹ දිසා අධිකරණයේ DMR 4680/2019 අංකය යටතේ නඩු පවරා ඇත. | නඩු තීන්දුවට අනුව ඉදිරි පියවර ගනු ලැබේ. |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | අනුකූල වේ. | - | - |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | - | - |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම. | අනුකූල වේ. | - | - |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ. | - | - |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර නොතිබීම. | අනුකූල වේ. | - | - |
| 14.4 | අග්‍රිම ගිණුම් ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම. | අනුකූල වේ. | - | - |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසිවලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම. | අනුකූල වේ. | - | - |
| 15.2 | රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම. | අනුකූල වේ. | - | - |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | - | - |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත සේවක සංඛ්‍යාව අනුව කාර්ය මණ්ඩලය වෙත ගෙවීම් සිදු කරන ලදී. | අනුකූල වේ. | - | - |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම නිලධාරීන් වෙත ලිඛිතව රාජකාරි ලැයිස්තුවක් නිකුත් කරන ලදී. | අනුකූල වේ. | - | - |
| 16.3 | 2017.09.20 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | - | - |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම.** | | | |
| 17.1 | තොරතුරු දැනගැනීමේ පනතෙහි රෙගුලාසි අනුව තොරතුරු නිලධාරියෙක් පත්කර ඇති අතර විධිමත් තොරතුරු ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලැබේ. | අනුකූල වේ. | - | - |
| 17.2 | වෙබ් අඩවිය මඟින් ආයතනික තොරතුරු මහජනතාව වෙත සපයා ඇති අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා චෝදනා පළකිරීමට පහසුකම් සලසා තිබීම. | අනුකූල වේ. | - | - |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 17.3 | තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන සහ 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම. | අනුකූල නොවේ. | 2025 වර්ෂයේ වාර්ෂික වාර්තාව සැකසීම සඳහා තොරතුරු නිලධාරීන්ගෙන් තොරතුරු කැඳවා ඇත. | - |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.** | | | |
| 18.1 | ආයතනය විසින් රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ චක්‍රලේඛ අංක 05 /2008 සහ 05/2008(1) ප්‍රකාරව පුරවැසි ප්‍රඥප්තිය/ පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය සකස් කර ක්‍රියාත්මක කරනු ලැබේ. | අනුකූල වේ. | - | - |
| 18.2 | චක්‍රලේඛයෙහි 2.3 ඡේදය ප්‍රකාරව පුරවැසි ප්‍රඥප්තිය/ පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය සැකසීම සහ ක්‍රියාත්මක කිරීම නිරීක්ෂණය සහ ඇගයීම සඳහා ක්‍රමවේදයක් සකස්කර තිබේ. | අනුකූල වේ. | - | - |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම.** | | | |
| 19.1 | 2018.01.24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි ඇමුණුම 02 අනුව මානව සම්පත් සැලැස්මක් සකස් කර තිබේ. | අනුකූල වේ. | - | - |
| 19.2 | ඉහත මානව සම්පත් සැලැස්මෙහි කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙක් සඳහා ම වසරකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සලසා තිබේ. | අනුකූල වේ. | - | - |
| 19.3 | ඉහත චක්‍රලේඛයේ ඇමුණුම 01 පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්යසාධන අත්සන් කර තිබේ | අනුකූල නොවේ. | 2023.11.30 දිනැති රා.ප.ච.අංක 02/2018(1) හි 03 ඡේදය අනුව වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීම අවශ්‍ය නොවේ. | - |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කර ඔහු වෙත මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම සහ නිපුණතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීමේ වගකීම පවරන ලදී. | අනුකූල වේ. | - | - |
| **20** | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම.** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම. | අනුකූල වේ. | - | - |

## 3.9 විගණන වාර්තාව

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } PAF/B/MPA/02/2025/04 | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2026 මැයි 29 දින

රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය මූල්‍ය අංශය 2074 03 JUN 2026

CFO 22478 02 JUN 2026

ලේකම්,

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය.

**ශීර්ෂය - 130 රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

යථෝක්ත වාර්තාව හා සහතික කළ මූල්‍ය ප්‍රකාශනයේ මුල් පිටපත (සිංහල, දෙමළ හා ඉංග්‍රීසි) මේ සමඟ එවා ඇත.

එම්.ඩී.එස්. අමරතුංග
නියෝජ්‍ය විගණකාධිපති,
විගණකාධිපති වෙනුවට

පිටපත් : අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව - සම්පිණ්ඩන වාර්තාව හා මූල්‍ය ප්‍රකාශනවල පිටපත මේ සමඟ ඉදිරිපත් කරමි.

CA 06/03

PRO 09

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. PAF/B/MPA/02/2025/04    ඔබේ අංකය / உமது இல. / Your No.    දිනය / திகதி / Date 2026 මැයි 29 දින

ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

**ශීර්ෂය 130 - රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 130 - රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය (සංශෝධිත) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව  இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.  No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34  +94 11 2 88 72 23  ag@auditorgeneral.gov.lk  www.naosl.gov.lk

1.2 **මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මාගේ වාර්තාව රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මාගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

### 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1. ආදායම් නොවන ලැබීම්

සිගාස් ශේෂ පිරික්සුමට අනුව අත්තිකාරම් අයකර ගැනීම්වල එකතුව රු.89,865,826ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි එම අයකර ගැනීම් රු.368,744,550ක් ලෙස දක්වා තිබීමෙන් රු.278,878,724ක වෙනසක් පැවතුණි.

### 1.6.2. අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ශේෂය

(අ) ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය වෙනුවෙන් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් ඍජුවම දරන ලද රු.2,420,126,301ක් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයෙහි වෙනත් දෙපාර්තමේන්තු මගින් ලැබීම් ලෙස ගැළපීම වෙනුවට මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙහි වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් යටතේ දක්වා තිබුණි.

(ආ) භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් බී ගිණුමට කරන ලද හර කිරීම්වල එකතුව රු.29,976,159ක් වුවද, අග්‍රිම සැසඳුම් ප්‍රකාශනයෙහි එය රු.29,809,509ක් ලෙස දක්වා තිබීමෙන් රු.166,650ක වෙනසක් පැවැතුණි.

### 1.6.3. මූල්‍ය නොවන වත්කම්

(අ) මූල්‍ය නොවන වත්කම් අයිතම 04ක ඉකුත් වර්ෂයේ අවසාන ශේෂ හා සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂ අතර රු.680,127,179ක වෙනසක් පැවතුණි.

(ආ) 2022 ඔක්තෝබර් 25 දිනැති අංක අමප/22/1692/601/021 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් නිදහස් මන්දිරය හා අවට ප්‍රදේශය රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයට පවරා දී තිබුණද එහි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) නිල මැදුර පරිශ්‍රයේ ගොඩනැගිලි සැලසුමට අනුව 20 වන මහලේ භෝජනාගාරය සඳහා 2019 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු විදුලි උපකරණ 62කින් ඒකක 91ක් ද ලී බඩු උපකරණ 03කින් ඒකක 08ක් ද මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) 2025 දෙසැම්බර් 31 දිනට වැඩ අවසන්ව නොතිබුණු රාජ්‍ය නිලධාරීන් සඳහා මානව සම්පත් කළමනාකරණ තොරතුරු පද්ධතියක් සහ ලේඛන කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීමේ කොන්ත්‍රාත්තුවට අදාළව කොන්ත්‍රාත් මුදලින් සියයට 50ක් හා සියයට 40ක් වන පරිදි ගෙවා තිබුණු එකතුව රු.22,606,101ක් කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගත නොකර අස්පෘශ්‍ය වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුල අපහරණය කරන ලද ස්වදේශ කටයුතු අංශය සතුව පැවැති රු.21,550,000ක් වූ මෝටර් රථ 02ක වටිනාකම මූල්‍ය නොවන වත්කම්වලින් ඉවත් කර අපහරණ යටතේ දැක්විය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

### 1.6.4. අග්‍රිම ශේෂය

(අ) 2024 වර්ෂයේ මැතිවරණ රාජකාරි වෙනුවෙන් ලැබී සමාලෝචිත වර්ෂයේදී නිරවුල් වී තිබුණු රු.3,716,000ක අත්තිකාරම් මුදලක් අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශයේ ආරම්භක ශේෂයක් ලෙස දක්වා තිබුණ ද වියදම් මගින් නිරවුල් වූ රු.9,362,440,886ක ප්‍රමාණයට එම ශේෂය ගලපා නොතිබීමෙන් අග්‍රිම ගිණුමෙහි රු.3,716,000කින් වැඩියෙන් දැක්වුණි.

(ආ) භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව අග්‍රිම ගිණුමේ ශේෂය රු.653,226ක් වුවද, මාසික ගිණුම් සාරාංශ අනුව එම ශේෂය රු. 9,653,226ක් ව පැවතීමෙන් භාණ්ඩාගාර පොත් හා දෙපාර්තමේන්තු පොත් අතර අග්‍රිම ගිණුමෙහි රු.9,000,000ක වෙනසක් පැවැතුණි.

## 2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1. ආදායම් කළමනාකරණය

මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කරන ලද හිඟ ආදායම දැක්වෙන ප්‍රකාශය අනුව රජයේ ගොඩනැගිලි කුලී හිඟ ආදායම 2025 දෙසැම්බර් 31 දිනට රු.322,603,293කි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කෙරේ.

(අ) රජයේ ගොඩනැගිලි හා නිවාස වැනි වත්කම්වලින් උපයන කුලී ආදායම් 20.02.01.01 දරන ආදායම් සංකේතාංකයට බැර කර තිබුණද එසේ කුලී ආදායම් ලබාගන්නා ගොඩනැගිලි හා නිවාස පිළිබඳව පූර්ව හඳුනාගත් දත්ත පද්ධතියක් නොපවතින බැවින් සම්පූර්ණ ගොඩනැගිලි හා නිවාස කුලී ආදායම නිවැරදිව අයවී සහ ගිණුම්ගත කර ඇති බව තහවුරු නොවුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාල 14ක් ද ඇතුළුව ආයතන 31කින් 2025 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.322,603,293ක් වූ හිඟ ගොඩනැගිලි කුලී මුදලින් රු.195,228,122ක් 2022 වර්ෂයට පෙර සිට අයවිය යුතුව පැවතුණි. තවද, මෙම හිඟකුලී මුදලින් රු.15,901,505ක් මෙම අමාත්‍යාංශය යටතේ පාලනය වන රජයේ බංගලා, සංචාරක බංගලා සහ නිල නිවාසවලින් අයවිය යුතුව පැවතුණි. මෙහිදී,

(i) 2017-2019 කාල පරිච්ඡේදය තුළ අවස්ථා 122කදී අමාත්‍යාංශයේ රාජ්‍ය පරිපාලන අංශය සතු නිවාඩු නිකේතන 07කට අදාලව අයවිය යුතුව තිබුණු රු.2,102,450ක ආදායමක් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ii) 2015-2020 කාලපරිච්ඡේදයේ සිට පැවත එන එකතුව රු.1,720,798ක් වූ ශේෂ 20ක් ද ඇතුළත්ව හිටපු ඇමතිවරුන් සහ මන්ත්‍රීවරුන් 21දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,793,480ක හිඟ නිවාස කුලී මුදලක් අයවිය යුතුව පැවතුණි.

(iii) සමුළු නිවාස 22කින් 2012 සිට 2024 වර්ෂය දක්වා කාලයට අදාළව අයනොවී පවතින හිඟ කුලී රු.1,673,190ක් ද ජයවඩනගම නිවාස 15කින් 2012 සිට 2016 දක්වා කාලයට අදාළව අයනොවී පවතින හිඟ කුලිය රු.8,449,265ක්ද 2020-2022 කාලපරිච්ඡේදය තුළ වෙන්කර දී තිබූ ලෝරිස් නිවාසයකින් අයකරගත යුතු රු.1,456,601ක් ද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වාම අයකරගෙන නොතිබුණි.

(iv) 2009-2016 කාලපරිච්ඡේදය තුළ ජනාධිපති ආරක්ෂක අංශයේ නිලධාරීන් වෙත ලබාදීමට ජනාධිපති කාර්යාලය වෙත ලබාදී තිබූ කොළඹ 05 කැප්පෙටිපොළ මාවතේ සමුළු නිවාස 08කින් අදාළ කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) නිවාස තුළ පැවති අලුත්වැඩියා කටයුතු, සමහර නිවාස වෙන්කළ කාලසීමාවට පෙර නැවත භාරදීම, නිවාසලාභීන් තෝරා පත් කර ගැනීම සඳහා යම් කාලසීමාවක් ගතවීම වැනි හේතු මත 2024 ජූලි සිට 2025 දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළදී මාස 02ත් මාස 12ත් අතර වන පරිදි ගම්පහ නිල පියස, කොළඹ නිල පියස, සමුළු නිවාස, කැප්පෙටිපොළ සාද නිවස සහ ජයවඩනගම නිවාස වශයෙන් නිවාස 20කින් කුලී මුදල් අයවී නොතිබුණි. තවද, ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව වෙත 2023 හා 2025 වර්ෂවලදී වෙන්කරදී තිබුණු රජයේ බංගලා නිවාස 02කින් ද සමාලෝචිත වර්ෂයේදී කුලී අයකරගෙන නොතිබුණි.

### 3.2. වියදම් කළමනාකරණය

මුදල් රෙගුලාසි 50 අනුව වියදම් ඇස්තමේන්තු සියලුම වියදම් ඇතුළත් වන පරිදි නිවැරදිව හා තාත්විකව පිළියෙල කළ යුතුවේ. ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුළු ශුද්ධ පුනරාවර්තන ප්‍රතිපාදනයෙන් රු.1,381,004,107ක් ද, මුළු ශුද්ධ මූලධන ප්‍රතිපාදනයෙන් රු.11,769,073,100ක් ද වශයෙන් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.13,150,077,207ක් එනම් සියයට 43කට වැඩියෙන් ඉතිරිව පැවතුණි.

(ආ) එහිදි, මූලධන වැය විෂයන් 12 ක් සඳහා සලසාගෙන තිබුණු රු.895,000,000ක් හා පුනරාවර්තන වැය විෂයන් 04ක් සඳහා සලසාගෙන තිබුණු රු.5,000,000ක් වූ ප්‍රතිපාදන උපයෝජනය නොකර සම්පූර්ණයෙන් ඉතිරිව පැවතුණි.

(ඇ) එක් එක් වැය විෂයන්හි ඉතිරිවීම් ප්‍රතිශතය සියයට 52ත් සියයට 99ත් අතර පරාසයක වන පරිදි මූලධන වැය විෂයන් 23ක් සඳහා සලසාගෙන තිබුණු රු.8,547,563,302ක් වූ ප්‍රතිපාදනවලින් රු.7,482,928,765ක් ද, එක් එක් වැය විෂයන්හි ඉතිරිවීම් ප්‍රතිශතය සියයට 52ත් සියයට 97ත් අතර පරාසයක වන පරිදි පුනරාවර්තන වැය විෂයන් 20ක් සඳහා සලසාගෙන තිබුණු රු.1,218,060,000ක ප්‍රතිපාදනවලින් රු.704,045,514ක් ද අපේක්ෂිත කාර්යයන් සඳහා වැය නොකර ඉතිරිව පැවතුණි.

(ඈ) පුනරාවර්තන හා මූලධන වැය විෂයයන් 06ක් සඳහා සලසාගෙන තිබූ එකතුව රු.69,400,000ක මූලික වියදම් ඇස්තමේන්තුව හා රු.660,315,670ක් වූ සංශෝධිත වියදම් ඇස්තමේන්තුව අතර සමස්ථ විචලතාවය සියයට 856 ක් විය. ඒ අනුව එක් එක් වැය විෂයයන්හි මූලික වියදම් ඇස්තමේන්තුව සහ සංශෝධිත වියදම් ඇස්තමේන්තුව අතර විචලතාවය සියයට 66ත් සියයට 1000ත් අතර පරාසයක පැවැතුණි.

### 3.3. බැරකම් හා බැදීම්වලට එළඹීම

(අ) මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කළ බැරකම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබූ බැරකම් වටිනාකම රු.24,521,697ක් වූ අතර පරිගණක මුද්‍රිතවල (SA-92) දැක්වෙන බැරකම් වටිනාකම රු. 22,582,999ක් වීමෙන් රු.1,938,698ක වෙනසක් පැවතුණි.

(ආ) පුනරාවර්තන වැය විෂයන් 05ක ඉතිරිවීම් ඉක්මවා එකතුව රු.4,823,589ක බැරකම්වලට එළඹ තිබුණි.

(ඇ) 2021-2024 කාලපරිච්ඡේදයට අදාළව එකතුව රු.178,496ක නිරවුල් නොකළ බැරකම් ශේෂ 03ක් පැවතුණි. මෙම ශේෂ ඊට පසු වර්ෂවලදී නිරවුල් වී තිබුණ ද, 2025 වර්ෂයේ බැරකම් උඩුගත කිරීමේදී පද්ධතියේ සිදුවූ දෝෂයක් මත එම අගයන් ප්‍රවර්තන වර්ෂයේ බැරකම් වශයෙන් පෙන්නුම් කෙරෙන බව දක්වා තිබුණි.

(ඈ) මානව සම්පත් කළමනාකරණ තොරතුරු පද්ධතිය සහ ලේඛන කළමනාකරණ පද්ධතිය ස්ථාපිත කිරීමට අදාළව ඇතිකරගෙන තිබුණු ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාත්තුකරුවන්ට ගෙවිය යුතු සියයට 50ක හා සියයට 60ක ඉතිරි මුදල වූ රු.24.869,135ක් බැඳීම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

## 3.4. නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය XIX පරිච්ඡේදයේ 1.1 හා 2.2 වගන්ති | තනතුරු සඳහා නිවාස ඉදිකර, උපලේඛනගත කළ හැකි අතර 2003 ඔක්තෝබර් 17 දිනැති අංක 11/2003 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව අමාත්‍යාංශයේ පාලනය යටතේ යම් අමාත්‍යාංශ හෝ දෙපාර්තමේන්තු හෝ නිලධාරීන් වෙනුවෙන් උපලේඛනගත නිවාස නොමැති වුවද අමාත්‍යාංශයේ නිලධාරීන් 18දෙනෙකුට සහ අමාත්‍යාංශයෙන් බාහිර තවත් නිලධාරියෙකුට වශයෙන් කොළඹ, ගම්පහ නිල පියස නිවාස හා සමූළ නිවාස 19ක් උප ලේඛණගත කර ලබාදී තිබුණි. ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව උපලේඛනගත නිවසකට හිමිකමක් නැති විවාහක නිලධාරියෙකුගෙන් වැටුපෙන් සියයට 12.5 ක්ද අවිවාහක නිලධාරියෙකුගෙන් වැටුපෙන් සියයට 7.5 ක්ද වශයෙන් කුලී අය කළ යුතු වුවත් උපලේඛනගත කර ලබාදීම හේතුවෙන් මෙම නිවාසවලින් විවාහක නිලධාරියෙකුගෙන් වැටුපෙන් සියයට 10 ක් ද අවිවාහක නිලධාරිනියකගෙන් වැටුපෙන් සියයට 5ක් ද වන පරිදි කුලී අයකර තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 756(6) | ස්වදේශ කටයුතු අංශය විසින් 2023 වර්ෂයේ සිට භාණ්ඩ සමීක්ෂණය අවසන් කළ පසු පොදු 47 වාර්තාවේ සඳහන් භාණ්ඩ සම්බන්ධයෙන් අපහරණ කමිටු පත් කර සුදුසු පරිදි කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 1992 අගෝස්තු 19 දිනැති අංක 92/26 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | රජයට අයත් වාහනවල රාජ්‍ය ලාංඡනය පිංතාරු කළයුතු වුවත් ස්වදේශ කටයුතු අංශයේ වාහන 21ක රාජ්‍ය ලාංඡනය පිංතාරු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ඇ) 2023 අංක 03/2023 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 05 ඡේදය | 2025 දෙසැම්බර් 31 දිනට රජයේ නිලධාරීන්ට අත්තිකාරම් බී ගිණුමේ පාලන ගිණුම අනුව ශේෂය රු. 292,772,156ක් හා භාණ්ඩාගාර පොත් අනුව එම ශේෂය රු.293,137,514ක් වීමෙන් ශේෂ අතර රු. 365,358ක වෙනසක් පැවතුණි. |
| (ඉ) 2017 දෙසැම්බර් 05 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2017 හා 2022 අප්‍රේල් 26 ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 | සති අන්ත හෝ රජයේ නිවාඩු දිනක පවත්වන සම්මුඛ පරීක්ෂණ වෙනුවෙන් නිලධාරීන්ට නිවාඩු දින වැටුප් ගෙවිය හැකි වුවත් 2024-2025 කාලපරිච්ඡේදය තුළ සම්මුඛ පරීක්ෂණ 06ක් පවත්වා තිබූ දින 15කින් දින 14ක් ම සති අන්ත හා නිවාඩු දින වීම හේතුවෙන් ලිත් මසකට දින 04ක් ද ඇතුළුව දින 211ක් සඳහා නිවාඩු දින වැටුප් ගෙවීමට රු.924,697ක් වැයකර තිබුණි. තවද, මෙම සම්මුඛ පරීක්ෂණ සඳහා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පත්කර තිබූ සම්මුඛ පරීක්ෂණ හා සහාය කාර්ය මණ්ඩල නිලධාරීන්ට සහ ඊට අමතරව සහාය සඳහා පත්කර තිබූ තවත් 246ක සහාය කාර්ය මණ්ඩලයට සංග්‍රහ කිරීම සඳහා රු.1,219,476ක් ද වැයකර තිබුණි. |

### 3.5. අවිධිමත් ගනුදෙනු

වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීම වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂණ කාර්ය මණ්ඩලයට විශේෂ දීමනාවක් අමාත්‍යාංශයට පමණක් සීමා වන පරිදි 2013 දෙසැම්බර් 13 දින ආයතන අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලබාදී තිබූ අනුමැතිය මත ගෙවා තිබූ අතර ඒ සඳහා 2022-2025 කාලපරිච්ඡේදය තුළදී රු.1,204,000ක් වැයකර තිබුණි.

### 3.6. තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම

2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව අදාළ කාර්යය නිම කර දින 10ක් තුළ ලබාගත් අග්‍රිමය පියවිය යුතු වුවත් රාජ්‍ය පරිපාලන අංශය විසින් අවස්ථා 08කදී නිලධාරීන් 03දෙනෙකු වෙත නිකුත් කර තිබූ එකතුව රු.625,000ක් අත්තිකාරම් පියවීමට කාර්යය නිම කිරීමෙන් පසු දින 11 - දින 35ත් අතර කාලයක් ගතකර තිබුණි. තවද අත්තිකාරම් මුදලින් වැය නොවී ඉතිරි වූ මුදල් වහාම සරප් වෙත පියවිය යුතු වුවත් අවස්ථා 07 කදී නිලධාරීන් 04 දෙනෙකු වෙත නිකුත් කර තිබූ අත්තිකාරම් මුදල්වලින් ඉතිරිව තිබුණු එකතුව රු.111,640ක් පියවීමට දින 04ත් දින 27ත් අතර කාලයක් ගතවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1. කාර්යභාරය ඉටු නොකිරීම

නියමිත කාලයේදී නිලධාරීන්ගේ ස්ථිර කිරීම හා උසස් කිරීම් සිදුකිරීමේ අරමුණින් දීප ව්‍යාප්ත සේවා 04ක කාර්යක්ෂමතා කඩඉම් විභාග 06ක් සහ ඒකාබද්ධ සේවා 05ක කාර්යක්ෂමතා කඩඉම් විභාග 15ක් පැවැත්වීමට සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර රු.65,260,000ක ප්‍රතිපාදන වෙන්කර තිබුණ ද එම විභාග පවත්වා නොතිබුණි. තවද ඒකාබද්ධ සේවාවලට අදාළව පවත්වා නොතිබුණු විභාග 15න් 09ක් සඳහා පෙර වර්ෂයේ පැවැත්වූ විභාගවල ප්‍රතිඵල මෙතෙක් නිකුත් කර නොතිබීම හා විභාග ප්‍රතිඵල නිකුත් කිරීම ප්‍රමාද වීම හේතුවෙන්ද පවත්වා නොතිබුණි.

#### 4.1.2. ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්

2023 වසරේදී ඊ- පුස්තකාල 50ක් පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ ඉදිකිරීමේ වැඩසටහන යටතේ රු.76,395,826ක් වැය කර පළාත් පාලන ආයතන 08 ක ඊ- පුස්තකාල 42ක ඉදිකිරීම් ආරම්භ කර තිබුණ ද පුස්තකාල 25ක ඉදිකිරීම් නිම නොකර අතහැර දමා තිබුණි. යෝජිත පුස්තකාල 50 සඳහාම ආරම්භයේදී තාක්ෂණික උපකරණ මිලදී ගැනීමට රු.38,917,200ක් ද වැය කර තිබුණි.

#### 4.1.3. ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

රාජ්‍ය නිලධාරීන් සඳහා පොළොන්නරුව නිල පියස නිවාස සංකීර්ණය ඉදිකිරීම සඳහා 2020 වර්ෂයේ රු.125,863,728ක් වැය කිරීමෙන් අනතුරුව ඉදිකිරීම් නතර කර තිබුණු අතර ඉදිකිරීමේ ඉදිරි කටයුතු මෙතෙක් ආරම්භ කර නොතිබුණි.

### 4.2. විදේශ ආධාර ව්‍යාපෘති

#### 4.2.1. විදේශාධාර ව්‍යාපෘතිවල කාර්යසාධනය

(අ) යාපනයේ ඉන්කියුබේටර් (Incubator) සඳහා ව්‍යාපාරික මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක කිරීමට මෘදුකාංග පද්ධතියක් හඳුන්වා දීම සඳහා 130-2-20-008-2104 වැය විෂයය යටතේ විදේශ ප්‍රදාන මගින් රු.30,000,000ක් ද, විදේශ මූල්‍යකරණ වැය විෂයය යටතේ රු.40,000,000ක්ද වශයෙන් ප්‍රතිපාදන සලසාගෙන තිබුණද උපයෝජනය කර නොතිබුණි. ඉකුත් වර්ෂ 03හි ද මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන සලසාගෙන තිබුණු අතර එකතුව රු.605,000,000ක ප්‍රතිපාදනවලින් සියයට 99.8ක්, සියයට 100ක් හා සියයට 100ක් වශයෙන් ප්‍රතිපාදන එම වර්ෂවලදී ඉතිරිව තිබුණි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඉන්දීය රජය හා ශ්‍රී ලංකා රජය අතර එළැඹ තිබූ අවබෝධතා ගිවිසුමද 2022 පෙබරවාරි 21 දිනෙන් අවසන්ව තිබූ අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) මහ කොළඹ ජලය සහ අපජලය කළමනාකරණ වැඩිදියුණු කිරීමේ වැඩසටහන අදියර 03 ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ 130-2-21-005-2506 වැය විෂයය යටතේ යුරෝපීය ආයෝජන බැංකු ණය මගින් රු.4,000,000,000ක් හා විදේශ මූල්‍යකරණ වැය විෂයය යටතේ රු.500,000,000ක් ද වශයෙන් ප්‍රතිපාදන සලසාගෙන තිබුණද රු.2,562,497,403ක් පමණක් වැය කර තිබුණි. ප්‍රසම්පාදන කටයුතු අවසන් කර කොන්ත්‍රාත් පිරිනැමීම ප්‍රමාදවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.1,937,502,597ක සහ ඉකුත් වර්ෂ තුන සඳහා සලසාගෙන තිබූ එකතුව රු.5,458,778,799ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි.

(ඇ) නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 130-2-21-008-2504 වැය විෂයය යටතේ ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිත ආයතනයේ (JICA) ණය යටතේ රු.4,900,000,000ක් ද විදේශ මූල්‍යකරණ වැය විෂයය යටතේ රු.1,100,000,000ක් ද වශයෙන් සලසාගෙන තිබුණු රු.6,000,000,000ක ප්‍රතිපාදනවලින් සියයට 4ක් එනම් රු.210,728,609ක් පමණක් වැයකර තිබුණි. මු.රෙ. 66 මාරු කිරීම් යටතේ රු.1,401,436,698ක් වෙනත් වැය විෂයන්ට මාරුකර තිබුණු අතර මාරුකරන ලද ප්‍රතිපාදනද ඇතුළත්ව රු.5,789,271,391ක ප්‍රතිපාදන උපදේශක බඳවා ගැනීමේ ප්‍රමාදය හේතුවෙන් වැය විෂයේ අරමුණුගත කාර්යයන් සඳහා උපයෝජනය කර නොතිබුණි.

(ඈ) ග්‍රාමීය පාලම් ඉදිකිරීම් ව්‍යාපෘතියෙහි යටිතල පහසුකම් සංවර්ධනය සඳහා එක්සත් රාජධානියේ ණය යටතේ 130-2-21-017-2506 වැය විෂයයට සලසාගෙන තිබුණු රු.183,000,000ක ප්‍රතිපාදන කොන්ත්‍රාත්කරුගේ රැඳවුම් මුදල් නිදහස් නොකිරීම හේතුවෙන් සම්පූර්ණයෙන් ඉතිරිව තිබුණි. ඉකුත් වර්ෂ 02 සඳහාද මෙම ව්‍යාපෘතිය යටතේ සලසාගෙන තිබුණු රු.400,000,000ක් වූ සමස්ථ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ඉ) කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනයේ ප්‍රදාන යටතේ පළාත් පාලන ආයතන හරහා බදු පරිපාලන, තොරතුරු තාක්ෂණ ප්‍රධාන සැලැස්ම ස්ථාපනය කිරීම, කොළඹ මහනගර සභාව සඳහා විද්‍යුත් බදු පද්ධතියක් ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය සහ ඌව පළාත හා උතුරු පළාත කේන්ද්‍ර කර ගනිමින් තිරසාර, ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ හා චක්‍රීය ආර්ථිකයක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා 130-2-21-031-2504 හා 130-2-21-032-2504 වැය විෂයය යටතේ සලසාගෙන තිබුණු එකතුව රු.300,000,000ක ප්‍රතිපාදන එම ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබීමෙන් ඉතිරිව තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ ළමා අරමුදලේ (UNICEF) ප්‍රදාන යටතේ 130-2-21-009-2504 වැය විෂයය සඳහා වෙන්කරගෙන තිබුණු රු.247,600,000ක ප්‍රතිපාදනවලින් රු.201,133,275ක් පළාත් පාලන ආයතනවල විවිධ ළමා සුභසාධන වැඩසටහන් සඳහා වෙන්කර දී තිබුණද එම මුදල් අරමුණුගත කාර්යයන් සඳහා වැයකර අපේක්ෂිත ප්‍රතිඵල ළඟාකරගෙන තිබුණේද යන්න පිළිබඳ අමාත්‍යාංශය විසින් පළාත් පාලන ආයතන වෙතින් පසුවිපරම් කර තහවුරු කරගෙන නොතිබුණි.

## 4.3 දේශීය අරමුදල් යෙදවූ ව්‍යාපෘති

### 4.3.1. දේශීය අරමුදල් යෙදවූ ව්‍යාපෘතිවල කාර්යසාධනය

(අ) පළාත් පාලන ආයතන හරහා ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා 130-2-21-016-2504 වැය විෂයය යටතේ සලසා ගෙන තිබුණු රු.750,000,000ක ප්‍රතිපාදනවලින් සියයට 81ක් එනම් රු.610,259,465ක් ඉතිරිව පැවතුණි.

(ආ) "ඊ-ග්‍රාම නිලධාරී ව්‍යාපෘතිය" ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් 130-2-20-007-2106 හා 130-2-20-007-2509 වැය විෂයය යටතේ සලසාගෙන තිබුණු රු.430,000,000ක ප්‍රතිපාදනවලින් සියයට 69ක් එනම්, රු.295,359,117ක් ඉතිරිව තිබුණි. ව්‍යාපෘතියේ නියමු අදියර යටතේ රු.59,940,000ක් වැය කර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 04ක සිදුකළ ව්‍යාපෘතීන් සම්පූර්ණයෙන් අක්‍රීය වී තිබුණු අතර එහි දෙවන අදියර ලෙස දිස්ත්‍රික්ක 07ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 95ක ආරම්භ කර තිබුණු ව්‍යාපෘති සඳහා 2025 වර්ෂය වන විට රු.490,077,341ක් වැය කර තිබුණද අපේක්ෂිත ඉලක්ක කරා ලඟා වීමට අපොහොසත් වී තිබුණි.

(ඇ) පළාත් පාලන ප්‍රදේශවල සංචාරක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා 130-2-21-028-2509 වැය විෂයය යටතේ සලසාගෙන තිබුණු රු.350,000,000ක ප්‍රතිපාදනවලින් රු. 204,942,928ක එනම් සියයට 59ක ප්‍රතිපාදන ඉතිරිව තිබුණි. ඉකුත් වර්ෂයේදී ද මෙම කාර්යය සඳහා සලසාගෙන තිබුණු රු.1,150,000,000ක ප්‍රතිපාදනවලින් සියයට 55කට වැඩියෙන් එනම් රු.546,893,978ක් ඉතිරි කර තිබුණි.

(ඈ) පළාත් පාලන ආයතනවල යටිතල පහසුකම් සහ ආදායම් උත්පාදන වැඩිදියුණු කිරීම සඳහා 130-2-21-030-2504 වැය විෂයය යටතේ සලසාගෙන තිබුණු රු.675,000,000ක ප්‍රතිපාදනවලින් සියයට 96ක් එනම් රු.647,751,123ක් ඉතිරිව තිබුණු අතර ව්‍යාපෘතියේ සැලසුම් අදියරේ සියයට 41ක භෞතික කාර්යසාධනයක් වාර්තා කර තිබුණි.

(ඉ) 130-2-21-000-2202 දරන වැය විෂයය යටතේ ස්වර්ණපුරවර ජාතික උත්සවය සඳහා සලසාගෙන තිබුණු රු.10,000,000ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරිවී තිබුණි. ක්‍රියාකාරී සැලැස්ම අනුව 2025 ඔක්තෝබර් වන විට ජාතික මට්ටමේ ඇගයීම අවසන් කර නොවැම්බර් මසදී ජාතික උත්සවය පැවැත්වීමට සැලසුම් කර තිබුණ ද 2026 අප්‍රේල් 30 දින වනවිටත් ජාතික මට්ටමේ ඇගයීම් ක්‍රියාවලිය අවසන් කර නොතිබුණි.

(ඊ) ගාල්ල හීන්පැන්දල කොම්පෝස්ට් නිමැවුම් අංගනය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු මගින් 130-2-21-029-2504 වැය විෂයය යටතේ සලසාගෙන තිබුණු රු.105,000,000ක සමස්ත මූලධන ප්‍රතිපාදනයම ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබීමෙන් ඉතිරිව තිබුණි.

(ඥ) රාජ්‍ය නිලධාරීන් සඳහා මානව සම්පත් කළමනාකරණ තොරතුරු පද්ධතියක් සහ ලේඛන කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා නිසි සැලසුමකින් තොරව 130-1-02-000-2106 වැය විෂයය යටතේ සලසාගෙන තිබුණු රු.300,000,000ක් වූ ප්‍රතිපාදනවලින් රු.237,231,986ක් එනම් සියයට 79කට වැඩියෙන් ඉතිරිව තිබුණි. මෙම තොරතුරු පද්ධතියට ආරම්භක අදියරේදී අමාත්‍යාංශය යටතේ ඇති සියලුම දීප ව්‍යාප්ත සහ ඒකාබද්ධ සේවාවන් ඇතුළත් කිරීම දිගු කාලීනව වියදම්වල කාර්යක්ෂමතාවයට හේතුවන බව තාක්ෂණ අමාත්‍යාංශය විසින් ද එය ආර්ථික වශයෙන් ඵලදායී බව අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ අංශය විසින් ද නිර්දේශ කර තිබුණ ද දීප ව්‍යාප්ත සේවා 06ක සහ ඒකාබද්ධ සේවා 03ක නිලධාරීන් 14,000ක් වශයෙන් සීමිත නිලධාරීන් සංඛ්‍යාවක් සඳහා පමණක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. තවද මෙම පද්ධති ද්විත්වයෙහි කාර්යයන් ආයතන 02ක් වෙත ලබාදී තිබීමෙන් පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ හා යාවත්කාලීන කිරීමේ ගැටළු පැන නැගී තිබුණි. 2025 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය අවසන් කිරීමට සැලසුම් කර තිබුණ ද තොරතුරු පද්ධතිය ක්‍රියාත්මක කරනු ලබන ආයතනය විසින් මොඩියුල 19ක් සංවර්ධනය කර 2025 ජූලි 27 දිනට පෙර නිම කළයුතුව තිබුණ ද 2026 ජනවාරි 27 දිනටත් මොඩියුල 02ක කටයුතු පමණක් අවසන් කර තිබීම හේතුවෙන් ව්‍යාපෘති කාලසීමාව 2026 ජූනි 30 දක්වා දීර්ඝ කර තිබුණි. එසේ වුවද මෙවැනි ප්‍රමාදයකදී ක්‍රියා කළයුතු ආකාරය පිළිබඳ කොන්දේසි ගිවිසුමට ඇතුළත් කර නොතිබුණි. ව්‍යාපෘති කාලසීමාව දීර්ඝ කිරීම හේතුවෙන් කාර්යසාධන හා අත්තිකාරම් බැඳුම්කරවල කාල සීමාව දීර්ඝ කර ලබා දෙන ලෙස ආයතන ද්විත්වයෙන්ම ඉල්ලීම් කර තිබුණ ද ලේඛන කළමනාකරණ පද්ධතිය සංවර්ධනය කරනු ලබන ආයතනය එය ප්‍රතික්ෂේප කිරීම නිසා 2026 ජනවාරි 08 දින වනවිටත් පද්ධතියෙහි පළමු මොඩියුලය පමණක් අවසන් කර තිබියදී කොන්ත්‍රාත්කරු ගිවිසුම්ගත බැඳීම් ඉටු නොකිරීම මත කාර්යසාධන බැඳුම්කරය මුදල් කරගෙන තිබුණි.

## 4.4. වත්කම් කළමනාකරණය

(අ) නිලමැදුර ගොඩනැගිල්ලේ වීදුරු පිරිසිදු කිරීමේ අරමුණින් 2021 වර්ෂයේ රු.31,050,000ක් වටිනා ගොන්ඩෝලා යන්ත්‍ර 02ක් මිලදීගෙන තිබුණද, වර්තමානය වන විටත් ඒවා භාවිතයට ගෙන නොතිබුණි.

(ආ) රාජ්‍ය පරිපාලන අංශය සතු නිවාඩු නිකේතන 07ක හා ස්වදේශ කටයුතු අංශය මගින් පාලනය වන සංචාරක බංගලා 33ක ඉඩම්වල අයිතිය පවරා ගැනීමේ කටයුතු අවසන් කර නොතිබිණි.

(ඇ) මෝටර් රථ ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ පරිගණක තොරතුරු පද්ධතිය තුළ පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය නමින් ලියාපදිංචි වාහන 15ක් පැවතිය ද ඒවායේ ලියාපදිංචි සහතික අමාත්‍යාංශය භාරයේ නොතිබුණු අතර වර්තමානයේ එම වාහන කවුරුන් භාරයේ පවතීද යන්න පිළිබඳ විගණනයට තහවුරු නොවුණි.

## 4.5. අනාර්ජික ගනුදෙනු

අමාත්‍යාංශයට ස්ථානමාරු කර තිබූ නිලධාරීන් 49දෙනෙකු, විදේශ අධ්‍යයන හා විශේෂ නිවාඩු අවසන් කර නැවත සේවයට වාර්තා කළ නිලධාරීන් 22දෙනෙකු හා විනය කරුණු හේතුවෙන් නිලධාරීන් දෙදෙනෙකු ද වශයෙන් දිප ව්‍යාප්ත සේවා 04ක, විශේෂ ශ්‍රේණියේ, 1,11 හා 111 ශ්‍රේණිවල නිලධාරීන් 73දෙනෙකු 2024-2025 කාලපරිච්ඡේදය තුළ අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලන අංශයට (සංචිතයට) අනුයුක්ත කර තිබුණි. මෙම නිලධාරීන්ට කිසිදු රාජකාරියක් පැවරීමක් කර නොතිබූ අතර ඇඟිලි සලකුණු මගින් පැමිණීම හා පිටවීම තහවුරු කර ගැනීමෙන් තොරව මාස 01ත් මාස 13ත් අතර කාලයක් සඳහා අමාත්‍යාංශය විසින් වැටුප් හා දීමනා වශයෙන් රු.32,452,224ක් ගෙවා තිබුණි. නිලධාරීන්ට ගෙවන ලද දීමනා අතරට ප්‍රවාහන දීමනාව, ඉන්ධන දීමනාව හා දුරකථන දීමනාව හැර අනෙකුත් සියලු දීමනා ඇතුළත්ව තිබුණු අතර භාෂා දීමනාව ද 2025 ඔක්තෝබර් දක්වා ගෙවා තිබුණි. තවද, මෙම නිලධාරීන්ගේ පැමිණීම හා නිවාඩු වාර්තා කිරීමට අදාළ ලේඛන පරීක්ෂා කිරීමේදී පැමිණීම අත්සන් කළ ඇතැම් නිලධාරීන් පිටවීම අත්සන් කර නොතිබීම, පැමිණීම අත්සන් කර නොතිබුණු නිලධාරීන් නිවාඩු වාර්තා කර නොතිබීම, ඇතැම් නිලධාරීන් අඛණ්ඩව දිනගණන් පැමිණීම අත්සන් කර නොතිබීම, විගණිත දිනට නිලධාරීන් 13දෙනෙකු සංචිතයට අනුයුක්තව සිටිය ද පස්වරු 12.30 වනවිටත් කිසිදු නිලධාරියෙකු පැමිණීම අත්සන් කර නොතිබීම, විගණිත දිනට පෙර දින නිලධාරීන් 04දෙනෙකු පැමිණීම අත්සන් කර තිබුණද පිටවීම අත්සන් කර නොතිබීම, මෙම නිලධාරීන්ගේ නිවාඩු ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ සඳහන් පරිදි පොදු 190 ආකෘති පත්‍රයේ වූ රෙජිස්ටරයක ලේඛනගත කර නොතිබීම, මාස 12කට ආසන්න කාලයක් සංචිතයට අනුයුක්තව සිටි නිලධාරියෙකු එම කාලය තුළ එක් නිවාඩුවක් හෝ ලබාගෙන නොතිබීම වැනි අඩුපාඩු හා ගැටළුකාරී තත්ත්වයන් නිරීක්ෂණය විය. මෙම නිලධාරීන්ගෙන් නිලධාරීන් 61දෙනෙකු 2025 දෙසැම්බර් 31 දින වනවිට සංචිතයෙන් මුදාහැර තිබුණු අතර නිලධාරීන් 12දෙනෙකු තවදුරටත් සංචිතයට අනුයුක්ත කර තිබුණි.

## 4.6. කළමනාකරණ දුර්වලතා

(අ) රජයේ සේවයේ සියලුම සේවාවන් සඳහා නිලධාරීන් පත්කිරීම් සහ උසස්කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය නීතිරීති නිශ්චිත කාලරාමුවක් තුළ සංශෝධනය කිරීම, රාජ්‍ය අංශයේ කුසලතා මත පදනම් වූ උසස් වීම් ක්‍රියාත්මක කිරීම, සියලුම දිප ව්‍යාප්ත සේවා සහ ඒකාබද්ධ සේවාවන්හි ආයතනික පරිපාලන හා පිරිස් කළමනාකරණය, ඒකාබද්ධ සේවා පරිපාලනය අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් යටතට ඇතුළත් වුවද, පරිවාස කාලය සම්පූර්ණ කර තිබුණු එහෙත් සේවයේ ස්ථිර කර නොමැති නිලධාරීන් රැසක් තවදුරටත් සේවයේ යෙදී සිටී. 2025 දෙසැම්බර් 31 දිනට පරිවාස කාලය සම්පූර්ණ කර තිබුණු ඒකාබද්ධ සේවා 05ක නිලධාරීන් 3,894ක් වර්ෂ 01ත්- වර්ෂ 40ත් අතර කාලයක් ද 2012 හා 2013 වර්ෂවල පත්වීම් ලබා පරිවාස කාලය සම්පූර්ණ කර තිබුණු ඒකාබද්ධ සේවයට අයත් සංවර්ධන නිලධාරී සේවයේ නිලධාරීන් 5,227ක් වර්ෂ 12ත් - වර්ෂ 13ත් අතර කාලයක් ද සේවයේ ස්ථිර කර නොමැතිව සේවයේ යෙදී සිටී. මෙම නිලධාරීන්ගෙන් විශාල පිරිසක් ඔවුන් සේවයේ යෙදී සිටින ආයතනවලින් ලිපි ලේඛන එවා නොතිබීම හා නිර්දේශ එවා නොතිබීම මත ද සුළු පිරිසක් කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත් නොවීම, විනය හේතුමත හා වෙනත් විවිධ හේතු මත ද සේවය ස්ථිර කර නොතිබුණි. මෙකී නිලධාරීන් සේවයේ ස්ථිර කිරීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) 2022 දෙසැම්බර් 14 දිනැති අංක 2310/29 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ස්ථාපනය කරන ලද කාර්ය පටිපාටික රීතිවල XVIII පරිච්ඡේදයේ 247 ඡේදයේ සඳහන් අරමුණු ඉටුවන ආකාරයෙන් ඒකාබද්ධ හා දීපව්‍යාප්ත සේවාවල නිලධාරින්ගේ ස්ථානමාරු ක්‍රියාත්මක කර නොතිබුණු අතර අනිවාර්ය ස්ථාන මාරුවීම්වලට යටත් නිලධාරින් සඳහා ස්ථානමාරු ප්‍රතිපත්ති විධිමත්ව ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) 2017 මැයි 03 දින පවත්වා තිබූ රාජ්‍ය ගිණුම් කාරක සභා රැස්වීමේදී අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ඉදිරියේදී පරිගණක දත්ත පද්ධතියක් සකස් කර එම පරිගණක වැඩසටහන් උපයෝගී කර ගනිමින් සියළුම රාජ්‍ය සේවකයන්ට වසර 05න් 05ට ස්ථාන මාරු ලබාදීමට කටයුතු කිරීමට එකඟ වී තිබුණ ද ඒ අනුව කටයුතු කර නොතිබුණි. තවද කාර්යය පටිපාටික රීති ප්‍රකාරව දීප ව්‍යාප්ත හා ඒකාබද්ධ සේවාවන්වල වාර්ෂික ස්ථානමාරුවීම් ක්‍රියාත්මක නොවීම රාජ්‍ය සේවයේ තිබිය යුතු ගුණාත්මකභාවය නැතිවීමට හේතුවක් බැවින් මෙය ප්‍රතිපත්තියකට සීමා නොකර රෙගුලාසියක් බවට පත් කිරීම යෝග්‍ය බව කාරක සභාව ප්‍රකාශ කර තිබුණ ද ඒ අනුව ද කටයුතු කර නොතිබුණි. මෙහිදී,

(i) එකම සේවා ස්ථානයක වසර 06කට වැඩි සේවා කාලයක් සේවයේ යෙදී සිටින ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ හා ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ 1,11 හා 111 ශ්‍රේණිවල නිලධාරීන් ස්ථානමාරු කිරීම සඳහා 2025 වර්ෂයේ අයදුම්පත් කැඳවා තිබුණ ද ඒ සඳහා අයදුම් කර තිබුණේ පිළිවෙලින් නිලධාරීන් 216ක්, 191ක් හා 62ක් පමණක් වන අතර ස්ථාන මාරු කර තිබුණේ නිලධාරීන් 44ක්, 158ක් හා 18ක් පමණි. තවද ඉකුත් වර්ෂ 02 තුළදී මෙන්ම සමාලෝචිත වර්ෂයේදීද මෙම සේවාවල විශේෂ ශ්‍රේණියේ නිලධාරීන් ස්ථාන මාරුකර නොතිබුණි.

(ii) 2024 දෙසැම්බර් 31 දිනට සේවයේ යෙදී සිටින ඒකාබද්ධ සේවයට අයත් සේවා 07ක නිලධාරීන් 128,355ක ගෙන් එකම සේවා ස්ථානයක වසර 05කට වැඩි කාලයක් සේවයේ යෙදී සිටින නිලධාරීන් ස්ථාන මාරු කිරීම සඳහා 2025 වර්ෂයේ අයදුම්පත් කැඳවා තිබුණ ද ඒ සඳහා අයදුම් කර තිබුණේ නිලධාරින් 18,339ක් පමණක් වන අතර ඉන් 4,740ක් සඳහා පමණක් ස්ථානමාරු නියෝග ලබාදී තිබුණි.

(ඈ) 2025 දෙසැම්බර් 31 දිනට වර්ෂ 03කට වැඩි කාලයක් ගතවී තිබුණ ද මියගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.220,000ක ණය ශේෂයක් ද වර්ෂ 03ත් 20ත් අතර කාලයක් ගතවී තිබුණ ද සේවය හැරගිය නිලධාරීන් 07දෙනෙකුගෙන් අයවිය යුතු රු.856,392ක් ද අයකර ගෙන නොතිබුණි.

(ඉ) ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමෙ වැඩසටහන යටතේ 2019 යටතේ මාතර දිස්ත්‍රික්කයේ මාර්ග 03 සංවර්ධනය කිරීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී රජයට සිදු වී තිබුණු රු.18,575,597ක පාඩුව වසර 05ක් ඉක්ම ගොස් තිබුණ ද වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගෙන රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. ව්‍යාපෘති කටයුතුවල නිරත වූ නිලධාරීන් සම්බන්ධයෙන් සිදුකර තිබුණු මූලික විමර්ශනයේදී අනාවරණය වී තිබුණු කරුණු අනුව මාතර හිටපු දිස්ත්‍රික් ලේකම් ඇතුළු නිලධාරීන් 10දෙනෙකු සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීමට නිර්දේශ කර සමාලෝචිත වර්ෂය අවසානය වන විට වසර 03ක් ගත වී තිබුණ ද එම නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඊ) යාපනය පොලිස් අධිකාරීවරයාගේ ඉල්ලීමකට අනුව කොවිඩ් නිරෝධායන මධ්‍යස්ථානයක් ලෙස භාවිතා කිරීම සඳහා කාමර 24කින් යුත් අමාත්‍යාංශය සතු යාපනය නිවාඩු නිකේතනය ලබාදීමෙන් පසුව එයට සිදුවී තිබුණු අලාභහානි එම ආයතනය හෝ අමාත්‍යාංශය විසින් ප්‍රතිසංස්කරණය කර නොතිබීම හේතුවෙන් නිවාඩු නිකේතනය මේ දක්වාම භාවිතයට ගත නොහැකිව තිබුණි. කොවිඩ් මධ්‍යස්ථානයක් ලෙස භාවිතයට ලබාදීමට පෙර 2016-2019 කාලපරිච්ඡේදය තුළදී රු.11,734,000ක ආදායමක් උපයා තිබුණු මෙම නිවාඩු නිකේතනයේ ආදායම් ඉපයීමක් රහිතව නඩත්තු කිරීම සඳහා සේවක වැටුප්, ජල ගාස්තු හා විදුලි ගාස්තු ගෙවීමට පමණක් වර්ෂයකට රු.1,700,000කට ආසන්න මුදලක් මේ වන විට වැය කරමින් පවතී.

## 5. මානව සම්පත් කළමනාකරණය

(අ) 2022 දෙසැම්බර් 14 දිනැති අංක 2310/29 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කරන ලද කාර්ය පටිපාටික රීතිවල IX පරිච්ඡේදයේ 131 (II) වගන්තිය අනුව, අනුමත කාර්ය මණ්ඩලය තුළ ඇති තනතුරක පුරප්පාඩුවක් සඳහා තනතුරට ස්ථිර පත්කිරිමක් කරනු ලබන තෙක් වැඩ බැලීමේ පදනමින් නිලධාරියෙකු පත්කළ හැකි වුවත් ඊට පටහැනිව දිගින් දිගටම පුරප්පාඩු වී ඇති තනතුරු සඳහා සහ සේවයට නොපැමිණෙන නිලධාරීන්ගේ කාර්යයන් ඉටුකිරීම සඳහා වැඩ බැලීමේ පදනම මත තනතුරු දෙකෙහිම සම්පූර්ණ රාජකාරී ඉටුකිරීම සඳහා නිලධාරීන් පත්කර දීමනා ගෙවා තිබුණි. මෙලෙස සමාලෝචිත වර්ෂයේදී ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් 12දෙනෙකු සහ රාජ්‍ය කළමනාකරණ සේවයේ නිලධාරීන් 42දෙනෙකු, සංවර්ධන නිලධාරීවරයෙකු ඇතුළු විධායක නොවන සේවාවල නිලධාරීන් 45දෙනෙකු සඳහා වැඩ බැලීමේ දීමනා වශයෙන් සමාලෝචිත වර්ෂයේදී රු.5,937,386ක් ගෙවා තිබුණි. මෙම නිලධාරීන්ගෙන් නිලධාරීන් 13දෙනෙකු 2023 වර්ෂයේ සිට ද, නිලධාරීන් 24දෙනෙකු 2024 වර්ෂයේ සිටද අඛණ්ඩව වැඩ බැලීමේ නිරතව තිබුණු අතර ඉකුත් වර්ෂ දෙක තුළදී ද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් 19දෙනෙකු ඇතුළු නිලධාරීන් 65දෙනෙකුට මෙලෙස වැඩ බැලීමේ දීමනා වශයෙන් රු.4,748,892ක් ගෙවා තිබුණි.

(ආ) 2025 සැප්තැම්බර් 15 දිනට අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, කොමිෂන් සභා සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 1 ශ්‍රේණියේ තනතුරු 97ක් පුරප්පාඩුව පැවතුණි. අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, කොමිෂන් සභා 113ක ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 11 හා 111 ශ්‍රේණිවල තනතුරු 435ක් පුරප්පාඩුව පැවති අතර කම්කරු අමාත්‍යාංශයේ හා ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ පමණක් තනතුරු පිළිවෙලින් 41ක් හා 70ක් වශයෙන් පුරප්පාඩු පැවතුණි. තවද, දිස්ත්‍රික්ක 24ක ප්‍රාදේශීය ලේකම් කාර්යාල 90ක සහකාර ප්‍රාදේශීය ලේකම් තනතුරු 90ක් ද පළාත් සභා 09ක 1 හා 11 ශ්‍රේණිවල තනතුරු 253ක් ද පුරප්පාඩුව පැවතුණි. මෙම පුරප්පාඩු හේතුවෙන් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 1 ශ්‍රේණියේ ප්‍රාදේශීය ලේකම් තනතුරු 76ක සහ තවත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු 32ක පූර්ණකාලීනව වැඩ බැලීම සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 11 ශ්‍රේණියේ නිලධාරීන් පත්කර තිබුණි.

එම්.ඩී.සුදර්ශනී අමරතුංග
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට